285 වන කාණ්ඩය - 5 වන කලාපය
தொகுதி 285 - இல. 5
Volume 285 - No. 5

2021 ඔක්තෝබර් 04 වන සඳුදා
2021 ஒக்ரோபர் 04, திங்கட்கிழமை
Monday, 04th October, 2021

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන:**
කථානායකතුමාගේ සහතිකය
වරප්‍රසාද: නාගානන්ද කොඩිතුවක්කු මහතා ඉදිරිපත් කර ඇති මූලික අයිතිවාසිකම් පෙත්සම

**ජාතික විගණන කාර්යාලයේ 2022 අයවැය ඇස්තමේන්තුව**

**අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා**

**වරප්‍රසාද:**
ගරු රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමා අත්අඩංගුවට ගෙන රඳවා තබා ගැනීම

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

---

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புக்கள்:**
சபாநாயகரது சான்றுரை
சிறப்புரிமை :திரு. நாகானந்த கொடிதுவக்குவினது அடிப்படை உரிமை மனு

**தேசியக் கணக்காய்வு அலுவலகத்தின்2022 ஆம் ஆண்டுக்கான பாதீட்டு மதிப்பீடு**

**அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள்**

**சிறப்புரிமை:**
மாண்புமிகு றிஸாட் பதியுதீனைக் கைதுசெய்து தடுத்துவைத்திருத்தல்

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

---

# PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Speaker's Certificate
Privilege: Fundamental Rights Petition by Mr. Nagananda Kodituwakku

BUDGET ESTIMATE OF NATIONAL AUDIT OFFICE FOR 2022

MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS

PRIVILEGE:
Arrest and Detention of Hon. Rishad Bathiudeen

ORAL ANSWERS TO QUESTIONS

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2021 ඔක්තෝබර් 04 වන සඳුදා***
*2021 ஒக்ரோபர் 04, திங்கட்கிழமை*
*Monday, 04th October, 2021*

**පූ. භා. 10.00ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப. 10.00 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன] தலைமை வகித்தார்கள்.
The Parliament met at 10.00 a.m.,
MR. SPEAKER [THE HON. MAHINDA YAPA ABEYWARDANA] in the Chair.

## නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

### කථානායකතුමාගේ සහතිකය
### சபாநாயகரது சான்றுரை
### SPEAKER'S CERTIFICATE

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 වැනි ව්‍යවස්ථාව ප්‍රකාරව, 2021 සැප්තැම්බර් 22 දින මවිසින් "පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය (සංශෝධන)" නමැති පනත් කෙටුම්පතෙහි සහතිකය සටහන් කරන ලද බව දැන්වීමට කැමැත්තෙමි.

## II

### වරප්‍රසාද: නාගානන්ද කොඩිතුවක්කු මහතා ඉදිරිපත් කර ඇති මූලික අයිතිවාසිකම් පෙත්සම
### சிறப்புரிமை: திரு. நாகானந்த கொடிதுவக்குவினது அடிப்படை உரிமை மனு
### PRIVILEGE: FUNDAMENTAL RIGHTS PETITION BY MR. NAGANANDA KODITUWAKKU

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු රනිල් වික්‍රමසිංහ මහතා විසින් 2021 සැප්තැම්බර් 07 දින වරප්‍රසාද ප්‍රශ්න යටතේ පාර්ලිමේන්තුවේදී මතු කරන ලද කරුණු ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කිරීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කළ හැකිය.

## ජාතික විගණන කාර්යාලයේ 2022 අයවැය ඇස්තමේන්තුව
## தேசியக் கணக்காய்வு அலுவலகத்தின் 2022ஆம் ஆண்டுக்கான பாதீட்டு மதிப்பீடு
## BUDGET ESTIMATE OF NATIONAL AUDIT OFFICE FOR 2022

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 34 වගන්තිය ප්‍රකාරව, ජාතික විගණන කාර්යාලය විසින් සකස් කරන ලදුව මුදල් අමාත්‍යවරයාගේ නිරීක්ෂණ ද සමඟ ඉදිරිපත් කරන ලද ජාතික විගණන කාර්යාලයේ 2022 අයවැය ඇස්තමේන්තුව මම සභාගත කරමි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (අධ්‍යාපන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - கல்வி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Education and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, "එකී අයවැය ඇස්තමේන්තුව රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුය" යි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා (මහාමාර්ග අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து - நெடுஞ்சாலைகள் அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Johnston Fernando - Minister of Highways and Chief Government Whip)

ගරු කථානායකතුමනි, කම්කරු අමාත්‍යතුමා වෙනුවෙන් මම 1956 අංක 47 දරන ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ පනතේ 20අ වගන්තිය සමඟ කියවිය යුතු 31 වගන්තිය යටතේ කම්කරු අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝගය ඉදිරිපත් කරමි.

මෙම නියෝගය කම්කරු කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

- 2020 වර්ෂය සඳහා කර්මාන්ත අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව; සහ
- 2020 වර්ෂය සඳහා වෙවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව.- [කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවට ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

[ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා]

- 2020 වර්ෂය සඳහා ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;
- 2020 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව; සහ
- 2020 වර්ෂය සඳහා ඉඩම් අමාත්‍යාංශයේ සහ ඉඩම් කළමනාකරණ කටයුතු, රාජ්‍ය ව්‍යාපාර ඉඩම් හා දේපළ සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව.- [ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා
## அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள்
## MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා (වරාය හා නාවික අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன - துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அமைச்சர்)
(The Hon. Rohitha Abegunawardhana - Minister of Ports and Shipping)

ගරු කථානායකතුමනි, වරාය හා නාවික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කරන ලද පහත සඳහන් වාර්තා සහ ගිණුම් සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

(i) 2015 / 2016 වර්ෂය සඳහා සීමාසහිත ලංකා නැව් සංස්ථාවේ වාර්ෂික වාර්තාව සහ ගිණුම්;

(ii) 2018 වර්ෂය සඳහා ජය කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් ආයතනයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම්;

(iii) 2019 වර්ෂය සඳහා ජය කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් ආයතනයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම්; සහ

(iv) 2016 / 2017 වර්ෂය සඳහා සීමාසහිත ලංකා නැව් සංස්ථාවේ වාර්ෂික වාර්තාව.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු උදය ගම්මන්පිල මහතා (බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு உதய கம்மன்பில - வலுசக்தி அமைச்சர்)
(The Hon. Udaya Gammanpila - Minister of Energy)

ගරු කථානායකතුමනි, බලශක්ති කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කරන ලද පහත සඳහන් වාර්තා සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

(i) ඛනිජතෙල් සම්පත් පනත් කෙටුම්පත;

(ii) 2017 වර්ෂය සඳහා සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් ආයතනයේ වාර්ෂික වාර්තාව;

(iii) 2018 වර්ෂය සඳහා සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් ආයතනයේ වාර්ෂික වාර්තාව;

(iv) 2019 වර්ෂය සඳහා සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් ආයතනයේ වාර්ෂික වාර්තාව;

(v) 2018 වර්ෂය සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව; සහ

(vi) 2019 වර්ෂය සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු නිමල් ලාන්සා මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) අහංගම, දික්කුඹුර, යහලවත්ත යන ලිපිනයෙහි පදිංචි ජී.කේ. සේනානායක මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) අහංගම, කතළුව, අලවතුකිස්ස, ලේක්වීව් පාර්ක් යන ලිපිනයෙහි පදිංචි එච්.ජී. රත්නසිරි මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

ගරු කථානායකතුමනි, ඇඹිලිපිටිය, මොරකැටිය, නුගේ හරස් පාර, අංක 3393/5 යන ලිපිනයෙහි පදිංචි ඒ. එදිරිසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු ලලිත් එල්ලාවල මහතා**
(மாண்புமிகு லலித் எல்லாவல)
(The Hon. Lalith Ellawala)

ගරු කථානායකතුමනි, හෝමාගම, පිටිපන උතුර, අංක 50/1 යන ලිපිනයෙහි පදිංචි කළුතන්ත්‍රිගේ කපිල මාතංග පෙරේරා මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු මිලාන් ජයතිලක මහතා**
(மாண்புமிகு மிலான் ஜயதிலக்க)
(The Hon. Milan Jayathilake)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) මල්වාන, යබරළුව, අංක 134/ඒ යන ලිපිනයෙහි පදිංචි එච්.පී. සෝමතිලක මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) කිරිදිවැල, කුට්ටිවිල, අංක 182/4 යන ලිපිනයෙහි පදිංචි ජේ.ඒ.පී.කේ. සෙනෙවිරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremasinghe)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රනිල් වික්‍රමසිංහ මන්ත්‍රීතුමා.

## වරප්‍රසාද: ගරු රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමා අත්අඩංගුවට ගෙන රඳවා තබා ගැනීම
## சிறப்புரிமை: மாண்புமிகு றிஸாட் பதியுதீனைக் கைதுசெய்து தடுத்துவைத்திருத்தல்
## PRIVILEGE: ARREST AND DETENTION OF HON. RISHAD BATHIUDEEN

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremasinghe)
ගරු කථානායකතුමනි, මාහට දහවල් මෙම ගරු සභාවේ සිටීමට නොහැකි වන නිසා මම ඔබතුමාගෙන් අවස්ථාව ඉල්ලා සිටිනවා, කෙටි වරප්‍රසාද ප්‍රශ්නයක් ගැන දැන් සඳහන් කරන්න.

විශේෂයෙන්ම රජය දැන් අපට දැනුම් දීලා තිබෙන්නේ, පාස්කු ඉරිදා ප්‍රහාරය සම්බන්ධ සියලුදෙනාට -ජීවතුන් අතර සිටින අයට- විරුද්ධව නඩු දැමීමට ක්‍රියා කර තිබෙන බවයි. ඒ හැම කෙනාම පිළිබඳව දැන් නඩු ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒ ගැන ප්‍රශ්නයක් නැහැ. පොලීසිය අදාළ විභාග අවසන් කරලා තිබෙන්නේ. ඒ නිසා එම නඩු ඉදිරියට ගෙන යන්න තිබෙනවා. මේ අවස්ථාවේ එක කොටසකට විරුද්ධව වැරැදිකරුවන් හැටියට නඩු දාලායි තිබෙන්නේ. මෙතැන දී අපේ ගරු සභාවට බලපාන ප්‍රශ්නයක් තිබෙනවා. එක මන්ත්‍රීවරයෙක්, ගරු රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමා දැන් රඳවා ගැනීමේ නියෝගයක් යටතේ තමයි අත්අඩංගුවේ තියා ගෙන ඉන්නේ. එතුමා වැරැදිකාරයෙක් නම්, එතුමාට විරුද්ධව සාක්ෂි තිබෙනවා නම් එතුමාට නඩු දාලා ඒ නඩුව පවත්වාගෙන යන්න. එතුමාට විරුද්ධව සාක්ෂි නැත්නම්, ඒ අනුව කටයුතු කරන්න. මෙතැන තිබෙන්නේ, ඒ මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයක් නොවෙයි. එය මේ ගරු සභාවේ ප්‍රශ්නයක්. විශේෂයෙන්ම මන්ත්‍රීවරයෙකු අත් අඩංගුවේ ඉන්නවා නම් ඒ පිළිබඳ චෝදනා තිබෙන්න ඕනෑ. මාසයක්, දෙකක් යනවා විභාග කර බලන්න. එහෙම කරන්නේ නැති නිසා තමයි අපට මේ ගැන අහන්න සිදු වෙලා තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, මම ඔබතුමාගෙන් විශේෂයෙන්ම ඉල්ලා සිටින්නේ දැන් තිබෙන සාක්ෂි අනුව එතුමාට විරුද්ධව නඩුවක් දාන්න පුළුවන් ද, බැරි ද කියලා නීතිපතිතුමාට ලියා අහන්න කියලායි. ත්‍රස්තවාදයට අදාළ කාරණයක් වෙනුවෙන් රඳවා ගැනීමේ නියෝගයක් යටතේ සිටි මන්ත්‍රීවරයා දැන් රඳවාගෙන ඉන්නේ, නඩුවකට සම්බන්ධ වෙලා පරීක්ෂණයට ඇඟිලි ගහයි කියලා. එවැනි සාක්ෂි තිබෙනවා නම් ඒ සාක්ෂි ඉදිරිපත් කරන්න ඕනෑ. මොකද, මේ ගරු සභාවේ මන්ත්‍රීවරයෙකු නඩුවකට ඇඟිලි ගසනවා නම්, ඒක ප්‍රධාන ප්‍රශ්නයක්. මට මේ කාරණය මතු කරන්න සිදු වුණේ මේකයි. අපරාධය සිදු වුණු කාලය තුළදී- එතුමා රඳවා ගැනීමේ නියෝගයක් යටතේ අත් අඩංගුවේ සිටියේ. එතුමා වරදක් කරලා තිබෙනවා නම්, එතුමාට විරුද්ධව තිබෙන සාක්ෂිත් අපට ලබා දෙන්න. එතකොට ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කරන්න පුළුවන්. නැත්නම් ඒවා ඉවත් කරන්න. මොකද, මහෙස්ත්‍රාත්තුමියට ඉදිරිපත් කළ සාක්ෂි මේ ගරු සභාවටත් ඉදිරිපත් කරන්න වුවමනායි කියා මම හිතනවා.

ඊළඟට, පාස්කු ඉරුදින ප්‍රහාරය සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා පත් කළ කොමිෂන් සභා වාර්තාවේ කොටසක් ඉදිරිපත් කරලාත් නැහැ. එම සම්පූර්ණ වාර්තාව පාර්ලිමේන්තුවට ලබා දෙන්න ඕනෑ. එතකොට, ඒ කාරණය සම්බන්ධයෙන් රටේ තිබෙන සමහර ප්‍රශ්නත් අඩු වෙනවා. ඒ සම්පූර්ණ වාර්තාව දෙන්නේ නැත්නම්, ඒ බව අපට කියන්න. ඒ ගැන මම මෙහිදී වැඩිදුර කථා කරන්නේ නැහැ. විපක්ෂ නායකතුමා සහ විපක්ෂයේ සමහර පක්ෂ නායකවරු මේ ගරු සභාවේ දැන් නැහැ. අපි ඒ වාර්තාව ගැන වෙන වෙලාවක කථා කරමු.

සාක්ෂි ගන්නේ කොහොමද කියන කාරණය ගැනයි මම මේ කියන්නේ. මම තව උදාහරණයක් දෙන්නම්. නියෝජ්‍ය පොලිස්පතිවරුන්ට, ඒ වාගේම පොලිස් අධිකාරිවරුන්ට විරුද්ධවත් නඩු පවරා තිබෙනවා. මම එක කාරණයක් කියන්න ඕනෑ. එදා මමයි කටයුතු භාරව සිටියේ. මේ නියෝජ්‍ය පොලිස්පතිවරු, පොලිස් අධිකාරිවරු කරන්න තිබුණු සියලු දේ හොඳට කළා. මට නම් කියන්න බැහැ, ඒ ගොල්ලන් කටයුතු නොකළා කියා. එතැනදී කියන අනෙක් කාරණය තමයි, චක්‍රලේඛය ක්‍රියාත්මක කළේ නැහැ කියන එක. එම චක්‍රලේඛය නිකුත් කිරීමෙන් පසු සාකච්ඡා තිබුණා. එදාට වෙනත් වැඩ කටයුත්තක් එතුමන්ලාට භාර දී තිබුණා. සිංහල අවුරුද්දෙන් පසු පළමුවැනි සති අන්තය තමයි ඒ සති අන්තය. මට මතක විධියට සෙනසුරාදා රෑ සංගීත සංදර්ශන ගණනාවක් තිබුණා. මට මතකයි, බෙන්තොට පැත්තේත් එකක් තිබුණා. මම ඒ ළඟ සිටියේ. ඉරිදා උදේ වැඩියෙන්ම තිබුණේ සයිකල් රේස්. ගරු අධිකරණ ඇමතිතුමනි, ඔබතුමා ඒ ගැන සොයා බලන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නවා එදා කොළඹ තිබුණු උත්සව ගැන. අපි දන්නවා, ගම්පහ තිබුණු උත්සව ගැන. නීතිපතිතුමා මේවා සලකා බලන්න ඕනෑ කියා මම හිතනවා. රජය කියපු නිසා තමයි මේ අය මේ උත්සව ඔක්කොම කරගෙන ගියේ. ඒ වාගේම, නවත්වන්න කියලා අපි කියපු ගමන් ඒවා නැවැත්වූවා.

මම එක කාරණයක් කියන්නම්. පාස්කු ඉරු දින ප්‍රහාරය සිදු වන විට අග්‍රාමාත්‍යවරයා විධියට මමයි සිටියේ. මට නම් කියන්න බැහැ, ඒ ගොල්ලන් වගකීම් අත්හැරියා කියලා. කොළඹ සහ ගම්පහ යන දිස්ත්‍රික්ක දෙකේම නියෝජ්‍ය පොලිස්පතිවරු එම වැඩ කටයුතු කළා. ඒකයි මා අහන්නේ සාක්ෂි ගැන. ඒ ගොල්ලන්ගේ ප්‍රශ්නය තිබෙනවා; රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නය තිබෙනවා. මෙම ගරු සභාවේ අපට පොලීසිය ගැන අහන්න බැහැ. මම නිකම් උදාහරණයක් කිව්වේ. ඒත්, රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමා ගැන අපට අහන්න පුළුවන්, එතුමා සම්බන්ධයෙන් මොකක්ද වෙන්නේ කියලා. නැත්නම් අපේ වරප්‍රසාදවලටත් ප්‍රශ්නයක් වෙන්න පුළුවන්. ඊළඟ වතාවේ අපත් අරගෙන යයි, දන්නා කෙනෙකුගේ නඩුවකට උදවු කරන්න ගියා කියලා. මේකයි ප්‍රශ්නය. අපි නඩු ගැන පොලීසියට කථා කරනවා නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, අපි ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්නම්.

**ගරු මොහමඩ් මුසම්මිල් මහතා**
(மாண்புமிகு மொஹமட் முஸம்மில்)
(The Hon. Mohamad Muzammil)
ගරු කථානායකතුමනි, මටත් පොඩි වෙලාවක් දෙන්න. අපේ පාර්ලිමේන්තුවේ වාහන අවභාවිතාවක් ගැන කියන්න තමයි මා මේ අවස්ථාව ඔබතුමාගෙන් ඉල්ලන්නේ.

[ගරු මොහමඩ් මුසම්මිල් මහතා]

විශේෂයෙන්ම WP-KY 3628 දරන වාහනය විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාට දීලා තිබෙනවා. සාමාන්‍යයෙන් මේ වාහනයට මාසයකට රුපියල් 117,000ක විතර ඉන්ධන යොදා තිබෙනවා. ඒ වාගේම, 2020 සැප්තැම්බර් මාසයේ ඉඳන්ම මේ වාහනය පාවිච්චි කර තිබෙනවා. හැබැයි විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා නොවෙයි, මෙය පාවිච්චි කරන්නේ; වෙනත් මන්ත්‍රීවරයෙක්. මා දන්නා විධියට ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා තමයි මෙය පාවිච්චි කරන්නේ. මෙය පාවිච්චි කරන්න එතුමාට අයිතියක් නැහැ, ගරු කථානායකතුමනි. මේ වාහනයට අවශ්‍ය ටයර්, ඉන්ධන ආදී සියල්ල සඳහා පාර්ලිමේන්තුවෙන් තමයි මුදල් ලබා දෙන්නේ. සම්පූර්ණයෙන්ම, මෙය වාහනයක් අවභාවිත කිරීමක්. ගරු කථානායකතුමනි, මේ පිළිබඳව පරීක්ෂණයක් කරන්න කියා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා.

මීළඟට, වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මා හිතන්නේ, මේක එතුමාට උදෙන්ම අහන්න දෙයක් නැති නිසා අහපු ප්‍රශ්නයක් වාගෙයි. එවැනි වාහනයක් තිබෙනවා. එය පාර්ලිමේන්තුවෙන් වැටුප් ලබන කෙනෙකු නමින් තිබෙන්නේ. [බාධා කිරීම්] අපේ කාර්ය මණ්ඩලයේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි ඒ ගැන සොයා බලන්නම්. [බාධා කිරීම්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
උදේ පාන්දර සිල්ලර දේවල් නේ අහන්නේ. [බාධා කිරීමක්] තුට්ටු දෙකේ දේවල්. අද පත්තරේ තිබෙනවා, පාලක පක්ෂයේ ඥාතීන්ගේ ගිණුම් හෙළිදරව් වෙලා. ඒවා ගැන කථා කරන්නේ නැහැ. [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අනවශ්‍ය විවාදයකට යන්න ඕනෑ නැහැ. ඒක මෙතැනින් නතර කරන්න. අපි ඒ ගැන සොයා බලන්නම්.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, එතුමා මගේ නම කිව්වා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ නම කියපු නිසා තමයි ඔබතුමාට අවස්ථාව දුන්නේ. [බාධා කිරීම්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, staff member කෙනෙක් වාහනයක් පාවිච්චි කෙරුවා; ඉන්ධන වියදම රුපියල් 117,000ක් කිව්වාට, අද පත්තරේ තිබෙනවා, ඇමෙරිකානු ඩොලර් මිලියන ගණනින්- ඇමෙරිකානු ඩොලර් මිලියන 163ක් - හොර ගිණුම්වල දාලා ඒවා හෙළිදරව් වෙලා කියලා. [බාධා කිරීම්] ඒවා ගැන අහන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ ඇති. [බාධා කිරීම්] ඔබතුමාට වේලාව දුන්නා නේ. [බාධා කිරීමක්]
ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremasinghe)
ගරු කථානායකතුමනි, මම කැමැතියි සභානායකතුමාට මේ යෝජනාව කරන්න. වාහනයක් ගැන එහෙම ප්‍රශ්නයක් තිබෙනවා නම්, House Committee එකේ හෝ වෙනත් කමිටුවකදී ඒ ගැන කථා කරන්න. නැත්නම් වෙන්නේ මේ පැත්තෙන් වාහන ගත්තාම, ඒ පැත්තෙන් වාහන ගන්නවා. අන්තිමට මේ ඔක්කෝම සභාවට හොඳ නැති එකක් වනවා. ඒ තිබෙන කාරණා ටික වෙනම කථා කර ගන්න. [බාධා කිරීම්]

**ගරු මොහමඩ් මුසම්මිල් මහතා**
(மாண்புமிகு மொஹமட் முஸம்மில்)
(The Hon. Mohamad Muzammil)
ගරු කථානායකතුමනි, මම කිරිඇල්ල මන්ත්‍රීතුමාට නොවෙයි, දෝෂාරෝපණය කළේ. ඒ වාහනය පාවිච්චි කරන්නේ වෙනත් මන්ත්‍රී කෙනෙක්. එතුමාට ඒක අදාළ නැහැ. මේවා පාර්ලිමේන්තුවේ මුදල් නේ. ඒ නිසා මේ පිළිබඳව පරීක්ෂණයක් කරන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ පිළිබඳව සොයා බලන්නම්. දැන් අනවශ්‍ය විවාදයකට යන්න වුවමනා නැහැ.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)
ගරු කථානායකතුමනි, මට එහෙම වාහනයක් ලැබිලා නැහැ. විපක්ෂයේ සංවිධායකතුමාට තිබෙනවා, කාර්ය මණ්ඩලයක්. ඒ කාර්ය මණ්ඩලයේ කෙනෙකුගේ එකකට තමයි මා පටලවා ගෙන තිබෙන්නේ, පොට වරද්දාගෙන.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, අපි ඒ ගැන සොයා බලන්නම්.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, මම ඔබතුමාට කිහිප වතාවක්ම කියා තිබෙනවා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කළ යුත්තේ ඔබතුමා බව. ඔබතුමා රජතුමාගේ අණවත්, ආණ්ඩුවේ අණවත් පිළිපදින්න ඕනෑ නැහැ. [බාධා කිරීමක්] අපේ රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමා පක්ෂ නායකයෙක්. එතුමා අවුරුදු විස්සක් පාර්ලිමේන්තුවේ සිටි කෙනෙක්. එතුමාට කිසිම චෝදනාවක් නැහැ නේ. [බාධා කිරීමක්] ගරු කථානායකතුමනි, බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ සම්ප්‍රදායක් තිබෙනවා. ඒ අනුව, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙක් අත්අඩංගුවට ගත්තාම, කථානායකවරයාට අයිතියක් තිබෙනවා ලිඛිතව ඒ ගැන අහන්න. හිටපු ගරු අගමැතිතුමා කිව්වේත් ඒකයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම අහලා තිබෙන්නේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
හොඳයි, හොඳයි.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremasinghe)
ගරු කථානායකතුමනි, මම ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා, හාල් මෝල්හිමියන්ගේ ප්‍රකාශ ගැන කියන්න කියලා. මොකද, අපි දැනගන්න කැමැතියි, කවුද රට ගෙනියන්නේ කියලා. රට ගෙනියන්නේ කැබිනට් මණ්ඩලයද, හාල් මෝල්හිමියන්ගේ සංගමයද කියලා. කොහොම නමුත් හෙට නැත්නම් අනිද්දා ආණ්ඩුවෙන් ඒ සම්බන්ධව ප්‍රකාශයක් කළොත්, අපට එතැන ඉඳලා ඉදිරියට යන්න පුළුවන්. මේක රටේ ජනතාව අහන ප්‍රශ්නයක්. මොකද, හාල් මිල - [බාධා කිරීමක්]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, හිටපු අගමැතිතුමාට අපි ගරු කරනවා පාර්ලිමේන්තුවේ සිටින ජ්‍යෙෂ්ඨම මන්ත්‍රීවරයකු හැටියට. එතුමාට වෙන සාකච්ඡාවකට යන්න තිබෙන නිසා, මේ අවස්ථාවේ සියලු ප්‍රශ්න අහන්න අවස්ථාව දීම නම් වැරදියි. හිටපු ගරු අගමැතිතුමනි, ඔබතුමා මගේ පාසල් මිත්‍රයා. යළිත් මම ඔබතුමාට ගෞරවාන්විතව කියන්නේ මේකයි. [බාධා කිරීමක්] Please, let us maintain the normal procedures of the House. Unless it is very urgent, do not waste the time of Parliament. We could calmly allow - [Interruption.] ගරු කථානායකතුමනි, දැන් පාර්ලිමේන්තුවේ වැඩ කටයුතු ඉදිරියට කරගෙන යමු. [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හරි, බොහොම ස්තුතියි. ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා, ප්‍රශ්නය අහන්න. [බාධා

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
# வினாக்களுக்கு வாய்மூல விடைகள்
# ORAL ANSWERS TO QUESTIONS

## කොළඹ ශාන්ත අන්තෝනි බාලිකා මහා විද්‍යාලය: පුරප්පාඩු
## கொழும்பு புனித அந்தோனியார் மகளிர் மகா வித்தியாலயம்: வெற்றிடங்கள்
## ST. ANTHONY'S BALIKA MAHA VIDYALAYA, COLOMBO: VACANCIES

154/2020

**1. ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කොළඹ 15හි පිහිටි ශාන්ත අන්තෝනි බාලිකා මහා විද්‍යාලයේ වාණිජ උපාධි ගුරු තනතුරක සහ ඉංග්‍රීසි, රෝමානු කතෝලික, චිත්‍ර කලාව සහ දෙමළ යන විෂයයන් සඳහා එක් ගුරු පුරප්පාඩුව බැගින් පවතින බවත්;

(ii) මෙම විද්‍යාලයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ ද කාර්යාල සහායක, පුස්තකාල සහායක, කම්කරු සහ මුරකරු තනතුරු සඳහා එක් පුරප්පාඩුව බැගින් පවතින බවත්;

එතුමා දන්නේද?

(ආ) ඉහත පුරප්පාඩු පිරවීම සඳහා අමාත්‍යාංශය මඟින් ගෙන ඇති පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கொழும்பு 15 இல் அமைந்துள்ள புனித அந்தோனியார் மகளிர் மகா வித்தியாலயத்தில் வர்த்தகப் பட்டதாரி ஆசிரியர் பதவியொன்றிலும் ஆங்கிலம், உரோமன் கத்தோலிக்கம், சித்திரம் மற்றும் தமிழ்மொழி ஆகிய பாடங்களில் தலா ஒரு ஆசிரியர் பதவியிலும் வெற்றிடங்கள் காணப்படுகின்றன என்பதையும்;

(ii) மேற்படி வித்தியாலயத்தில் கல்விசாரா பதவியணியிலும் அலுவலக உதவியாளர், நூலக உதவியாளர், தொழிலாளர் மற்றும் காவலாளி ஆகிய பதவிகளில் தலா ஒரு வெற்றிடம் வீதம் காணப்படுகின்றதென்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) மேற்படி வெற்றிடங்களை நிரப்புவதற்காக அமைச்சினால் மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கை யாதென்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Is he aware that -

(i) vacancies for a graduate teacher of Commerce and teachers of English, Roman Catholicism, Art and Tamil exist at St. Anthony's Balika Maha Vidyalaya situated in Colombo 15 with one vacancy for each subject; and

[ගරු එස්.එම්. මරික්කාර් මහතා]

(ii) vacancies exist in the non-academic staff of this school as well for the posts of office helper, library assistant, labourer and watcher with one vacancy for each of the said posts?

(b) Will he inform this House of the steps taken by the Ministry to fill the aforesaid vacancies?

(c) If not, why?

**ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා (අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுசில் பிரேமஜயந்த - கல்விச் சீர்திருத்தங்கள், திறந்த பல்கலைக்கழகங்கள் மற்றும் தொலைக்கல்வி மேம்பாட்டு இராஜாங்க அமைச்சர்)
(The Hon. Susil Premajayantha - State Minister of Education Reforms, Open Universities and Distance Learning Promotion)

ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) මෙම පාසලේ වාණිජ උපාධි (අ.පො.ස. - උ.පෙ. වාණිජ විෂයය ඉගැන්වීම), ඉංග්‍රීසි, චිත්‍ර කලාව, දෙමළ (දෙවන බස) සඳහා ගුරු පුරප්පාඩු නොමැත.

නමුත් රෝමානු කතෝලික විෂයය සඳහා ගුරු භවතෙකුගේ පුරප්පාඩුවක් ඇති අතර, මෙම පුරප්පාඩු තොරතුරු 2021.04.09 දින බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදී පැවැති ගුරු තුලනයේදී හඳුනා ගන්නා ලදී.

උපාධිධාරී අභ්‍යාසලාභීන්ට නුදුරේම පත්වීම් දීම සඳහා දැනට කටයුතු සම්පාදනය වෙමින් පවතිනවා. ඒ අනුව හඳුනාගෙන ඇති උපාධිධාරීන් අතරින් විෂය සඳහා සුදුසුකම් ගැළපෙන උපාධිධාරීන් ලබා දීම සඳහා බස්නාහිර පළාත් සභාවට දන්වා ඇත. ඒ අනුව ලබා දිය හැක.

(ii) කොළඹ 15 ශාන්ත අන්තෝනි බාලිකා මහා විද්‍යාලයේ එක් අනධ්‍යයන සේවකයෙකු පාසල් කාර්යය සහායක තනතුරේ සේවය කරන අතර, ඔහු මේ වර්ෂයේදී විශ්‍රාම යැමට නියමිතය.

පාසල් මුරකරු, පාසල් කම්කරු, පුස්තකාල සේවක යන තනතුරු පුරප්පාඩුව පවතී. පළාත් සභා මඟින් පුරප්පාඩු සපුරාලන ලෙස දන්වා ඇත.

(ආ) මෙම පාසල බස්නාහිර පළාත් සභාවට අයත් පාසලකි.

අනධ්‍යයන තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා බහුකාර්ය කාර්ය සාධන බලකාය මඟින්, දැනට පුහුණුව අවසන් කර ඇති සේවකයන්ගෙන් පුරප්පාඩු පිරවීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතී.

(ඇ) අදාළ නොවේ.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාත් දන්නවා, මේ වෙනකොට පළාත් සභාව ක්‍රියාත්මක තත්ත්වයේ නැති බව. ඒ අනුව, දැන් එතැන දේශපාලන අධිකාරියක් නැහැ. පළාත් සභාව ක්‍රියාත්මක වෙන්නේ ආණ්ඩුකාරතුමා යටතේ. කොළඹ නගරයේ දිගින් දිගටම වතු නිවාස සංස්කෘතියක් බිහි වෙලා තිබෙන්නේ අධ්‍යාපනය දියුණු කරන්නේ නැති නිසායි. උදාහරණයක් විධියට කොළඹ දිස්ත්‍රික්කයේ තිබෙන මැතිවරණ කොට්ඨාස 15න් ජාතික පාසලක් නැති එකම area එක තමයි මේ පාසලත් අයිති උතුරු කොළඹ කොට්ඨාසය. හිටපු අධ්‍යාපන අමාත්‍ය ජී.එල්. පීරිස් මැතිතුමා පොරොන්දු වුණා, මීළඟ ජාතික පාසල් 1,000 නම් කරන විට උතුරු කොළඹ ගැනත් සලකා බලනවා කියලා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා නියෝජනය කරන්නේත් කොළඹ දිස්ත්‍රික්කයයි. මට මතකයි, පසුගිය මහ මැතිවරණයේදී මනාප ගණන් කරන විට ඔබතුමාගේ ජයග්‍රහණයට වැඩිපුරම මනාප ලැබුණේ මැද කොළඹින් සහ උතුරු කොළඹින් බව. එම නිසා කොළඹ තිබෙන වතු නිවාස සංස්කෘතියෙන් එම ජනතාව එළියට ගැනීමට අධ්‍යාපනය දියුණු කිරීම සඳහා උතුරු කොළඹ ආසනයට දක්වන විශේෂ අවධානය මොකක්ද කියලා ඔබතුමා කැමැති නම් පැහැදිලි කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

**ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சுசில் பிரேமஜயந்த)
(The Hon. Susil Premajayantha)

ගරු කථානායකතුමනි, ජාතික පාසල් 1,000ක් අලුතින් හඳුන්වාදීමේ වැඩසටහන යටතේ මේ වෙනකොට කලාප 99ක් හැටියට ඒ ඒ පළාත්වල තිබෙන පාසල් සියල්ල හඳුනාගෙන ඒ සඳහා අවශ්‍ය දැන්වීම් පවා පළකර අවසානයි. ඒ වාගේම, මේ වර්ෂයේ ලබා දෙන රුපියල් මිලියන දෙකේ ප්‍රතිපාදන ලබාදීම සඳහා අවශ්‍ය දැනුම්දීම් කර තිබෙනවා. සමහර පාසල්වල ඒ රුපියල් මිලියන දෙකට අදාළ ඉදිකිරීම් කටයුතු පවා අවසන් කර තිබෙනවා.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අහපු අතුරු ප්‍රශ්නයට මට එකවර උත්තර දෙන්න බැහැ. මගේ මතකයේ හැටියට උතුරු කොළඹ ආසනයේ මෝදර ආනන්ද මධ්‍ය මහා විද්‍යාලය, කොටහේන කුමාර විද්‍යාලය, ඩිලාසාල් විද්‍යාලය හා ශාන්ත අන්තෝනි විද්‍යාලය කියන මේ පාසල් හතරම ජාතික පාසල් බවට පත් කිරීම සඳහා දැනට තෝරාගෙන තිබෙනවා.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය අහනවා වෙනුවට ගරු රාජ්‍ය ඇමතිතුමාට මම යෝජනාවක් කරන්න කැමැතියි.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, අප දෙදෙනාම නියෝජනය කරන්නේ කොළඹ දිස්ත්‍රික්කය. මැතිවරණ කාලයට ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා, ඔබතුමා ඇතුළු කොළඹ දිස්ත්‍රික්කය නියෝජනය කරන ගරු මන්ත්‍රීවරු සියලුදෙනා වාගේ ඡන්ද ව්‍යාපාරය සඳහා කොලොන්නාවට එනවා. කොලොන්නාව ආසනයේ දැනට තිබෙන්නේ ජාතික පාසල් දෙකයි. ඒකෙනුත් එකක් අක්‍රියයි. දැන් තවත් පාසලක් නම් කර තිබෙනවා, ජාතික පාසලක් බවට පත් කරන්න. ඒ, සේදවත්ත සිද්ධාර්ථ මධ්‍ය මහා විද්‍යාලය. කොලොන්නාව කියන්නේ ජන ඝනත්වය අධික ප්‍රදේශයක්. නමුත්, ඒ අවට තිබෙන කඩුවෙල, මහරගම, කෝට්ටේ සහ විශේෂයෙන්ම ජයවර්ධනපුර ව්‍යුහ කලාපය ගත්තාම ඒ කලාප අතර ලැබෙන ඔක්කෝම පහසුකම් බෙදා ගන්නවා. කොලොන්නාවට තමයි අඩු සැලකිලි ලැබෙන්නේ. එම නිසා මුල්ලේරියාව ශ්‍රී රාහුල මහා විද්‍යාලය, මුල්ලේරියාව එදිරිවීර සරච්චන්ද්‍ර විද්‍යාලය හා කොටිකාවත්ත සෝමාදේවි බාලිකා විද්‍යාලය ජාතික පාසල් බවට පත් කරන්න කියලා ඔබතුමාට මම යෝජනාවක් කරනවා. ඒ සඳහා අවශ්‍ය සහයෝගය අපි ලබා දෙන්නම්.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, පසුගිය වසරවල පැවැති සාමාන්‍ය පෙළ විභාග ප්‍රතිඵල හා පහේ ශිෂ්‍යත්ව විභාග ප්‍රතිඵල අරගෙන බැලුවාමත්, ඒ වාගේම විෂය බාහිර ක්‍රියාකාරකම්වලිනුත් එම

පාසල් විශේෂ ස්ථාන ලබාගෙන තිබෙනවා. ගොඩනැඟිලි සෑදීම සඳහාත් එම පාසල්වල ඉඩකඩ තිබෙනවා. එම පාසල්වලට යන්නේ මධ්‍යම පාන්තික පවුල්වල දරුවන්. මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, මේ කටයුත්තට මැදිහත් වෙන්න කියලා. අධ්‍යාපන ඇමතිතුමාත් නියෝජනය කරන්නේ කොළඹ දිස්ත්‍රික්කය. එම නිසා මම එතුමාටත් කියනවා, මේ සඳහා දායක වෙන්න කියලා.

**ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சுசில் பிரேமஜயந்த)
(The Hon. Susil Premajayantha)

අධ්‍යාපන ඇමතිතුමා කොළඹ දිස්ත්‍රික්කය නියෝජනය කරනවා විතරක් නොවෙයි. ඉතිහාසය බැලුවාම පෙනෙනවා, කොලොන්නාව ආසනයට එතුමාගේ ලොකු සම්බන්ධතාවක් තිබෙන බව. මම ඒක කියන්න යන්නේ නැහැ. හිටපු අගමැති රනිල් වික්‍රමසිංහ මැතිතුමාත් ඒ ගැන දන්නවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා සඳහන් කරපු ඒ යෝජිත පාසල් තුනෙන් මුල්ලේරියාව එදිරිවීර සරච්චන්ද්‍ර විද්‍යාලය ආරම්භ කළේ මමයි. ඒ මම ප්‍රධාන ඇමති හැටියට සිටියදී. එම නිසා අපි එම පාසල අනිවාර්යයෙන්ම ජාතික පාසලක් කරන්නම්. අනෙක් පාසල් දෙක ගැන තොරතුරු ලබාගෙන ඒ සම්බන්ධයෙනුත් පළාත් සභාව හරහා සලකා බලන්නම්.

## ශිෂ්‍ය උපදේශන ගුරුවරු: පත්වීම්
### மாணவர் ஆலோசனை ஆசிரியர்கள்: நியமனங்கள்
### STUDENT COUNSELLOR TEACHERS: APPOINTMENTS

786/2020

**2. ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශිෂ්‍ය උපදේශන ගුරුවරුන් බඳවා ගැනීම පිණිස පැවති තරග විභාගයට පෙනී සිටි මුළු අයදුම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම විභාගය සමත් වූ සංඛ්‍යාව කොපමණද;

(iii) එම විභාගය සමත්වූවන්ට මේ වනතෙක් පත්වීම් ලබා දී නොමැති බව දන්නේද;

(iv) එසේ නම්, ඉහත විභාගය සමත්වූවන්ට කඩිනමින් පත්වීම් ලබාදීමට අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மாணவர் ஆலோசனை ஆசிரியர்களை ஆட்சேர்ப்புச் செய்வதற்காக நடத்தப்பட்ட நேர்முகப் பரீட்சைக்குத் தோற்றிய விண்ணப்பதாரர்களின் மொத்த எண்ணிக்கை யாதென்பதையும்;

(ii) அப்பரீட்சையில் சித்தியெய்தவர்களின் எண்ணிக்கை எத்தனையென்பதையும்;

(iii) அப்பரீட்சையில் சித்தியெய்தவர்களுக்கு இதுவரை நியமனங்கள் வழங்கப்படவில்லையென்பதை அவர் அறிவாரா என்பதையும்;

(iv) அவ்வாறாயின், மேற்படி பரீட்சையில் சித்தியடைந்தவர்களுக்கு துரிதமாக நியமனங்களை வழங்குவதற்கு அமைச்சு மேற்கொள்ளும் நடவடிக்கைகள் யாவையென் பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House -

(i) the total number of candidates who sat the competitive examination conducted for the recruitment of student counsellor teachers;

(ii) how many of them have passed the examination concerned;

(iii) whether he is aware that appointments have not yet been given to those who passed the examination; and

(iv) in that case, what measures will be taken by the Ministry to give appointments soon to those who passed the examination?

(b) If not, why?

**ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சுசில் பிரேமஜயந்த)
(The Hon. Susil Premajayantha)

ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ශිෂ්‍ය උපදේශන ගුරුවරු බඳවා ගැනීම පිණිස පැවැති තරග විභාගයට පෙනී සිටි මුළු අයදුම්කරුවන් සංඛ්‍යාව 8,384කි. විස්තර ඇමුණුම 01 යටතේ පහතින් දක්වා ඇත.

*ඇමුණුම 01*

ශිෂ්‍ය උපදේශන ගුරුවරු බඳවා ගැනීම පිණිස පැවැති තරග විභාගයට පෙනී සිටි සහ එම විභාගය සමත් වූ අයදුම්කරුවන් සංඛ්‍යාව සම්බන්ධ තොරතුරු:

| විභාග මාධ්‍යය | විභාගයට පෙනී සිටි සංඛ්‍යාව | විභාගය සමත් සංඛ්‍යාව |
|---|---|---|
| ජාතික පාසල් සිංහල මාධ්‍ය | 4,634 | 3,834 |
| ජාතික පාසල් දෙමළ මාධ්‍ය | 976 | 720 |
| මධ්‍යම පළාත් සිංහල මාධ්‍ය | 651 | 510 |
| මධ්‍යම පළාත් දෙමළ මාධ්‍ය | 160 | 105 |
| වයඹ පළාත් සිංහල මාධ්‍ය | 937 | 734 |
| වයඹ පළාත් දෙමළ මාධ්‍ය | 200 | 134 |
| සබරගමුව සිංහල මාධ්‍ය | 784 | 679 |
| සබරගමුව දෙමළ මාධ්‍ය | 42 | 30 |
| **එකතුව** | **8,384** | **6,746** |

(ii) එම විභාගය සමත් වූ සංඛ්‍යාව 6,746කි. (ඇමුණුම 01)

(iii) මධ්‍යම පළාත හැර ජාතික පාසල් සහ වයඹ හා සබරගමුව පළාත් සඳහා ශිෂ්‍ය උපදේශන ගුරු විභාගය සමත්වූවන්ට දැනටමත් පහත පරිදි පත්වීම් ලබා දී ඇත.

[ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා]

| පාසල් වර්ගය | පත්වීම් ලබාදෙන ලද සංඛ්‍යාව | | පත්වීම් ක්‍රියාත්මක වන දිනය |
|---|---|---|---|
| | සිංහල මාධ්‍ය | දෙමළ මාධ්‍ය | |
| ජාතික පාසල් | 139 | 38 | 2021.01.04 |
| වයඹ පළාත් පාසල් | 277 | 13 | 2021.05.03 |
| සබරගමුව පළාත් පාසල් | 189 | 03 | 2021.04.01 |

මධ්‍යම පළාත සඳහා තරග විභාගය පවත්වන ලද නමුත්, අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා ඇති බැවින්, මධ්‍යම පළාත් ගුරු තනතුරු සංඛ්‍යාව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් සංශෝධනය කිරීමෙන් අනතුරුව බඳවාගැනීම් සිදු කිරීමට නියමිතය.

(iv) දැනට පත්වීම් ලබාදී නොමැති මධ්‍යම පළාත සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් අදාළ තනතුරු සංඛ්‍යාව සංශෝධනය කර අනුමැතිය ලබාගැනීමෙන් අනතුරුව බඳවාගැනීම් සිදුකිරීමට නියමිතය.

(ආ) අදාළ නොවේ.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, මම මේ පිළිබඳව ඔබතුමාට පොඩි මතක් කිරීමක් කරන්න ඕනෑ. ඒ බඳවා ගැනීම් සියල්ලම අදාළ තරග විභාගයෙන් සිද්ධ වෙන්න ඇති කියලා මා විශ්වාස කරනවා. විශේෂයෙන් පසුගිය වසර එකහමාරක්ම පාසල් පැවැත්වුයේ නැහැ. ළමාකමට අවශ්‍ය ක්‍රියාකාරකම් නැතිකම සහ නොයෙකුත් හේතු නිසා, ඒ වාගේම කොම්පියුටර් ස්ක්‍රීන් භාවිතය නිසා ඒ පුංචි දරුවන් දැඩි මානසික පීඩාවලට ලක්වෙලා තිබෙන බව ඔබතුමා දන්නවා. ඒ අතර දරුවන් විශාල අපයෝජන සහ අපචාරවලට ලක් වුණු අවස්ථාත් අපි පසුගිය කාලය පුරාම දැක්කා. ඔබතුමා දකින්න ඇති, ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සභාපතිතුමා කියලා තිබුණා, මේ අවුරුද්දේ මුල් කාර්තුව තුළ ළමා අපචාර සහ අපයෝජන සම්බන්ධයෙන් ඇමතුම් 55,000කට වඩා ලැබුණා කියලා. මෙන්න මෙහෙම තත්ත්වයක් තමයි තිබෙන්නේ.

අපි දන්නවා, උතුරේ යුද්ධයක් තිබිලා වුණත්, "උපදේශනය" කියන එකට ලොකු බර තැබීමක් සිද්ධ වුණේ නැති බව. උතුරේ වැන්දඹුවන් වූ කාන්තාවන් ඉන්නවා, දරුවන් අහිමි වුණු දෙමව්පියෝ ඉන්නවා, දෙමව්පියන් අහිමි වුණු දරුවෝ ඉන්නවා. ඔය ආදී වශයෙන් පිරිස් ඉන්නවා. එම නිසා මම මේ වෙලාවේ ඔබතුමාට යෝජනාවක් කරනවා. මේක මගේ අතුරු ප්‍රශ්නය නොවෙයි. මේ පිළිබඳව ගැඹුරින් කල්පනා කරන්න කියලා මම ඔබතුමාට යෝජනා කරනවා. ඒ වාගේම, මේ පත්වීම් දේශපාලන පත්වීමක් විධියට දුන්නොත් අපට අවශ්‍ය කාර්ය සිද්ධ කරගන්න පුළුවන් කියලා මම හිතන්නේ නැහැ. එම නිසා පාසල්වල ශිෂ්‍ය උපදේශනය සඳහා පිළිගත් විශ්වවිද්‍යාලවල "උපදේශනය" සම්බන්ධයෙන් උපාධි තිබෙන, ඩිප්ලෝමා තිබෙන, පුහුණුව තිබෙන අය විධිමත් ක්‍රමවේදයකට අනුව පත් කරන්න.

අපචාර ගැන කියනකොට මම දෙයක් මතක් කරන්නම්. හිඟුරක්ගොඩ ප්‍රදේශයේ වීවරධාරි විදුහල්පතිවරයෙක් දරුවන් අපයෝජනය කිරීම සම්බන්ධයෙන් පසුගිය දවස්වල උද්ඝෝෂණයක් පැවතුණා. පසුගිය පළමුවැනි දා මම දැක්කා, ඒ පුද්ගලයා ඇප ලබා නැවත ඇවිත් තිබෙන බව. අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් විනය පරීක්ෂණයක් කරනවා නම්, ඒ පුද්ගලයාගේ සේවය අත්හිටුවන්න ඕනෑ. සේවය අත්හිටුවලා තමයි පරීක්ෂණයක් කරන්න ඕනෑ. නමුත් එසේ සිදු වෙලා නැහැ. ඒ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරවමින්, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය අහනවා.

ගරු ඇමතිතුමනි, අපොස (සාමාන්‍ය පෙළ) විභාගයේ ප්‍රතිඵල නිකුත් වුණා. 2015 වසරට කලින් මාතලේ දිස්ත්‍රික්කයේ විල්ගමුව අධ්‍යාපන කලාපය තමයි කලාප 99න් 99 වන ස්ථානයේ සිටියේ. මා සතුටු වෙනවා, විල්ගමුව අධ්‍යාපන කලාපය දැන් 75 වන ස්ථානයට ඇවිල්ලා තිබෙන එක ගැන. නාඋල අධ්‍යාපන කලාපය 76 වන ස්ථානයට ඇවිල්ලා තිබෙනවා. ඒ දවස්වල අපි දැක්කා, online අධ්‍යාපන කටයුතු කර ගන්න බැරුව හිටිය බව. ඕපල්ගල ප්‍රදේශයේ එක තැනකට විතරයි සිග්නල් තිබුණේ. එතැනට ඇවිල්ලා පැලක් හදාගෙන තමයි ළමයි පාඩම් කටයුතු කළේ. හැබැයි අපි මේ වෙලාවේ දකිනවා, මේ ප්‍රතිඵල සමස්ත ගුරු ප්‍රජාවගේ ධෛර්යයෙන් ලබා ගත්ත දෙයක් බව. ඒ අය හැකි තරම් online අධ්‍යාපනය ලබා දුන්නා. රජයේ කිසිම බලපෑමකින් තොරව, සහයෝගයකින් තොරව, ඒ අයගේ කැමැත්තෙන් තමයි මාර්ගගත ක්‍රමයට අධ්‍යාපනය දරුවන්ට ලබා දුන්නේ. නමුත් මා දැක්කේ නැහැ, රජයෙන් ගුරුවරුන්ට ස්තුතියක් පළ වෙන බවක්. රටේ දෙලක්ෂ හතළිස්දහසක් වන ගුරුවරුන් සහ දහසයදහස ඉක්මවන විදුහල්පතිවරුන් දරුවන්ට විභාගය කර ගන්න සහයෝගය ලබා දීමට ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වීම සම්බන්ධයෙන්, online අධ්‍යාපනය ලබා දීමට ඉදිරිපත් වීම සම්බන්ධයෙන් සමඟි ජන බලවේගය ඇතුළු විපක්ෂය වෙනුවෙන් මා මාගේ ගෞරවය පුද කරනවා. නමුත් ආණ්ඩුවෙන් ඒ අයට ලැබුණේ, "කාලකණ්ණි, ත්‍රස්තවාදී" වාගේ නම්බු නාම. Online අධ්‍යාපනය කරනවා නම් රුපියල් පන්දහසක් ලබා දෙනවා කියනවා; කොන්දේසි පහළොවක් පනවා තිබෙනවා. එතකොට ගුරුවරු දෙලක්ෂ හතළිස්දහසම online අධ්‍යාපන කටයුතු කළොත්, මාසයකට රුපියල් බිලියන 1.2ක් අවශ්‍ය වෙනවා.

මේ අයගේ වැටුප් විෂමතාව ගැන කථා කරනකොට අපි දැක්කා, වැඩි වැටුප් ඉල්ලනවා වාගේ ගුරුවරුන්ගේ ගෞරවය කෙළෙසන විධියේ දේවල් සමාජගත කළ ආකාරය. නමුත් මේ අය ඉල්ලන්නේ තමන්ට හිමි වැටුප. මේ ප්‍රශ්නය දිගටම ඇදගෙන යෑම තුළ ඇත්තටම දරුවන්ගේ අනාගතය තමයි විනාශ වෙන්නේ, ගරු රාජ්‍ය ඇමතිතුමා. මම ඔබතුමාගෙන් අහන්නේ මේකයි. මෙවර අය වැයෙන් මේ ප්‍රශ්නය විසඳනවා කියලා කීප අවස්ථාවක් කියනවා අපි දැක්කා. වැටුප් විෂමතාව ඉවත් කිරීම හා එය සංවෘත සේවාවක් කිරීම මෙවර අය වැයෙන් පසුව අහවල් දිනයේදී සිදු කරනවා කියලා චක්‍රලේඛයක් නිකුත් කිරීමේ හැකියාවක් තිබෙනවාද?

**ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சுசில் பிரேமஜயந்த)
(The Hon. Susil Premajayantha)

ගරු කථානායකතුමනි, දීර්ඝ පැහැදිලි කිරීමක් සහ ප්‍රශ්නයක් තමයි එතුමිය මතු කළේ. නමුත් ඉතා කෙටියෙන් මම ඒ ප්‍රශ්නවලට පිළිතුරු ලබා දෙන්නම්. විශේෂයෙන්ම අධ්‍යාපන අමාත්‍යාංශයේ සංඛ්‍යා සහ දත්ත අනුවත්, චක්‍රලේඛ අනුවත්, පාසලේ ශිෂ්‍ය සංඛ්‍යාව, පාසල් වර්ගය අනුව උපදේශනය සඳහා ගුරුවරු - ගුරුවරියන් ස්ථානගත කිරීම සිදු කරනු ලබනවා. බඳවා ගැනීමේ ක්‍රමවේදය සම්බන්ධයෙන් ඔබතුමිය ඇහුවා ප්‍රශ්නයට තමයි මම මුලින් පිළිතුරු ලබා දෙන්නේ. මධ්‍යම පළාතේ පමණක් සේවක සංඛ්‍යාව වැඩි කර ගත්තාට පස්සේ, පත්වීම් දෙන්න පුළුවන් විභාග පවත්වලා තිබෙනවා. උපදේශනය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ ඩිප්ලෝමා උපාධියක් තිබෙනවා. විශේෂයෙන්ම ඒක තමයි දැනට අපට දකින්න තිබෙන්නේ. ඊට අමතරව විවෘත

විශ්වවිද්‍යාලයේ තමයි එම උපාධිය හදාරන්න අවස්ථාව තිබෙන්නේ. උපදේශනය ලබා ගැනීමට කැමති -විශේෂයෙන්ම බාලිකාවන් සඳහා උගන්වන- ගුරුවරියන් පුළුවන් තරම් උනන්දු කරවන්න අපි කටයුතු කරනවා. ඒ යටතේ තමයි බඳවා ගැනීම් කරනු ලබන්නේ. මමත් පිළිගන්නවා, ඔබතුමිය කියන කාරණය.

ශිෂ්‍ය උපදේශනය ඉතා වැදගත් වනවා. කොවිඩ්-19 වසංගතය නිසා 2020 වර්ෂයේ පාසල් දින දර්ශනයේ දින 210න්, දින 65ක් පමණ තමයි දරුවන් පාසල් ගියේ.

2021 වර්ෂයේ ඔක්තෝබර් මාසයේ පළමුවැනි දා දක්වා ගත්තාම - මේ අවුරුද්දට තිබෙන දින 210 හෝ 212න් - පළමුවැනි term එකේ විතරක් දරුවෝ පාසල් ගියා, බස්නාහිර පළාතේ පාසල් හැර අනෙක් පළාත්වල. බස්නාහිර පළාතේ දරුවෝ ඒ කාලය තුළ පාසල් ගියේ දින 5යි. මේක විශාල අභියෝගයක්. ඒ නිසා තමයි රජය ක්‍රියා මාර්ගය ගත්තේ, සමස්ත ගුරු ප්‍රජාව 247,000කටත්, විදුහල්පතිවරු 16,000කටත්, අනධ්‍යයන කාර්ය මණ්ඩල සහ අධ්‍යාපන පරිපාලන සේවයේ 3,000කට ආසන්න ප්‍රමාණයකට සහ ගුරු උපදේශකවරුන්ට එන්නත ලබා දෙන්න. මේ වන විට එන්නත ලබා ගැනීමට කැමැති සියලුදෙනාටම එන්නත් දීලා ඉවරයි. දැන් ඒ සති දෙක අවසන් වෙලාත් ඉවරයි. යම් අතපසුවීමක් වෙලා තිබෙනවා නම් ඒකටත් අවශ්‍ය උපදෙස් දීලා තිබෙනවා. ඒ නිසා ගුරුවරුන්ගේ එන්නත්කරණය හේතුවක් කරගෙන පාසල් අරඹා නොසිටීමට හේතුවක් නැහැ. දැන් යම් යම් අදියර යටතේ පාසල් ආරම්භ කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමා විසින් සෞඛ්‍ය බලධාරීන් සමඟ සාකච්ඡා කරලා, පළාත් බලධාරීන් සමඟ වැඩ පිළිවෙළක් සකස් කරගෙන යනවා.

මම විශ්වාස කරනවා, -ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියත් ගුරු වෘත්තියේ හිටපු මහත්මියක් විධියට මේ කාරණය පිළිගන්නවා ඇති.- මාස 7ක් තිස්සේ ගෙදර ඉන්න දරුවන්ට එකවර පන්ති කාමරයට ගිහිල්ලා ඉගෙනීමේ කටයුතු කිරීමට පෙරාතුව ඒ දරුවන් තුළ පාසලේ පන්ති කාමරයේ මානසිකත්වය අපි සකස් කරන්න ඕනෑ කියලා. ඒ සඳහා පෙරමුණ ගත යුත්තේ උපදේශනය පිළිබඳ ගුරුවරු. ඒ පිළිබඳව යම් orientation එකක් කරලා, විශේෂයෙන් ප්‍රාථමික අංශයේ දරුවන්ට පන්ති කාමරයේ ඉගෙනීම සඳහා අවශ්‍ය මනස හැදීමට දින දෙක තුනක්වත් කටයුතු කරන්න ඕනෑ. ඒ සඳහා අවශ්‍ය උපදෙස් ලබාදීමටත් දැනට කටයුතු කරගෙන යනවා. ඒ ගැන කරුණු දැක්වීම සම්බන්ධයෙනුත් මම ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා.

ඊළඟට, විල්ගමුව කලාපය ගැනත් මම කථා කරන්න ඕනෑ. මම 2005-2010 අතර කාලයේ අධ්‍යාපන ඇමතිතුමා විධියට සිටියදී තමයි සූර්යකෝෂවලින් ලබා ගන්නා විදුලියෙන් ඔබතුමිය කියපු විල්ගමුව කලාපයේ පාසල් කීපයකටම තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන ලබා දුන්නේ. ඒක දුෂ්කර කලාපයක්. ඒ වාගේම, online අධ්‍යාපනය ලබා දෙන්න ඒ towers සංඛ්‍යාව ප්‍රමාණවත් නැහැ. කඳු සහිත ප්‍රදේශවල ඉතාම අමාරුයි connectivity එක ගන්න. ඒක අධ්‍යාපන අමාත්‍යාංශයේ ගැටලුවක් නොවෙයි. ටෙලිකොම් ආයතනය මඟින් ලබාදෙන වැඩ පිළිවෙළ යටතේයි ඒ පහසුකම ලබා දෙන්නේ. කෙසේ වෙතත් අපි ස්තුතිවන්ත වෙන්න ඕනෑ, ඔබතුමිය මේ ගැන කරුණු ඉදිරිපත් කිරීම ගැන. ඔබතුමිය කියපු ඒ කලාප දෙක සම්බන්ධයෙන් මම සොයා බලන්නම්. විල්ගමුව සහ නාඋල කියන කලාප දෙක ඉහළට ඒම ගැන අපි ඉතාම සතුටු වෙන්න ඕනෑ.

ඊළඟට, ගුරුවරුන්ගේ සේවය online ක්‍රමයට ලබා දීමේ අධ්‍යාපන ක්‍රමවේදයක් අපේ රටේ නැහැ. අපේ රටේ අධ්‍යාපන ක්‍රමවේදය වන්නේ පාසලේ පන්ති කාමරයේ ලබා දෙන සාමාන්‍ය අධ්‍යාපනයයි. Online ක්‍රමය මේ කොවිඩ්-19 වසංගතය නිසා පාසල්වලට යම් ප්‍රමාණයකින් හඳුන්වා දෙනු ලැබුවා. ඒ සඳහා දිරිගැන්වීමක් කළා, අමාත්‍යාංශයෙන් සහ පළාත් බලධාරීන්. හැබැයි, ගුරුවරු ස්වේච්ඡාවෙන් තමයි ඒක කළේ. සමහර ගුරුවරු smartphone එකක් loan එකක් දාලා අරගෙනයි දරුවන්ට ඒ අධ්‍යාපනය ලබා දුන්නේ. ඒ ගැන මම අධ්‍යාපන ප්‍රතිසංස්කරණ රාජ්‍ය ඇමතිවරයා හැටියට අමාත්‍යාංශය වෙනුවෙන් මගේ ස්තුතිය මීට කලිනුත් ගුරුවරුන්ට පළ කර තිබෙනවා, ඒවා මාධ්‍යවල පළ නොවුණාට. ගුරුවරුන්ගේ එම සේවාව අපි අගය කරනවා.

ඊළඟට, online මඟින් අධ්‍යාපනය ලබා දීම වෙනුවෙන් රුපියල් පන්දහසක දීමනාවක් ලබා දීමට වඩා, ගුරුවරු දිරිගැන්වීමේ අතුරු වැඩසටහනක් විධියටයි මා දන්නා පරිදි අමාත්‍ය මණ්ඩලය මේ මේ යෝජනාව කළේ. එළැඹෙන අය වැය -ඒ කියන්නේ, නොවැම්බර් මස 12වැනි දා ප්‍රකාශයට පත් කරනු ලබන අය වැය- යෝජනා ලබා දෙන තෙක්, ගුරුවරු දිරිගැන්වීම සඳහා අතුරු වැඩ පිළිවෙළක් හැටියටයි ඒ රුපියල් පන්දහසක දීමනාව ලබා දීම යෝජනා කර තිබුණේ. එය ලබාදීම පිළිබඳව, ඒ සඳහා තොරතුරු ලබා ගැනීම සම්බන්ධයෙන් කටයුතු කරන්නේ පළාත් අධ්‍යාපන බලධාරීන් සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින්.

ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමිය කියන කාරණය මමත් පිළිගන්නවා. ගුරුවරුන්ගේ මේ ප්‍රශ්නය විසඳීම සඳහා එවකට හිටපු අධ්‍යාපන ඇමතිතුමාට මම යෝජනා කළා, "මසකට රුපියල් බිලියන 1.2ක් වියදම් කරනවා නම්, මාස හතරට බිලියන 5ක් විතර වනවා. ඊළඟ අවුරුද්දේ පුනරාවර්තන වියදම් නොවෙයි ප්‍රාග්ධන යෙදුම්වලින් අඩු කරලා තවත් බිලියන 7ක් දැම්මා නම් බිලියන 12කින් සියයට 25ක ප්‍රමාණයකට අර 2018 වැටුප් පරිමාණය ලබා දෙන්න පුළුවන්" කියලා. මට තිබෙන සීමිත වපසරිය තුළයි මම කටයුතු කරන්නේ. මේ යෝජනාව ක්‍රියාත්මක කළා නම්, මේ වෙන කොට අපිට ප්‍රශ්න ගණනාවක් අඩු කර ගන්න තිබුණා. අපි ඉදිරි කාලයේදී බලමු, ගරු මන්ත්‍රීතුමියනි. අපි ධනාත්මකව හිතනවා, ගරු මුදල් ඇමතිතුමා නොවැම්බර් 12වන දා ඉදිරිපත් කරන අය වැයෙන් මේ සඳහා සාර්ථක පිළිතුරක් ලබා දේවි කියලා. අද මාධ්‍ය මඟිනුත් වාර්තා කර තිබෙනවා අධ්‍යාපන ක්ෂේත්‍රයට වැඩිපුර මුදල් ලබා දෙන්න සූදානමක් තිබෙනවා කියලා. එම නිසා අපි ඒ සම්බන්ධයෙන් තව සතියක් බලමු.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය ඇසීමට පෙර පොඩි පැහැදිලි කරගැනීමක් කරගන්න ඕනෑ. ගුරුවරුන්ගේ මේ වැටුප් විෂමතාව ඉවත් කරමින් චක්‍රලේඛයක් නිකුත් කරනවාද? ඇත්තම කියනවා නම්, ඔබතුමාට නම් අධ්‍යාපනය ගැන තේරෙනවා. අධ්‍යාපනය ගැන තේරෙන ඔබතුමාට අධ්‍යාපන ඇමතිකම නොදී වෙනත් අයට දීම තුළ මේ ප්‍රශ්නය තව කුණු වෙනවා. එම නිසා වැටුප් විෂමතාව ඉවත් කරනවා, එහෙම නැත්නම් ගුරු සේවය සංවෘත සේවාවක් කරනවා කියන තහවුරුව චක්‍රලේඛයක් මඟින් හෝ ගුරුවරුන්ට ලබා දෙන්න කියා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சுசில் பிரேமஜயந்த)
(The Hon. Susil Premajayantha)

ගුරු විදුහල්පති සේවය සංවෘත සේවාවක් කිරීම සම්බන්ධයෙන් 2008 අවුරුද්දේ ශ්‍රේෂ්ඨාධිකරණය දුන් නඩු තීන්දුවක් තිබෙනවා. එය සංවෘත සේවාවක් කිරීම සම්බන්ධයෙන් අධ්‍යාපන ක්ෂේත්‍රයේ තිබෙන සේවාවන් අතර පොදු එකඟතාවක් නැහැ. ගුරු සහ විදුහල්පති ශ්‍රේණිවල යම් එකඟතාවක් තිබෙනවා. නමුත් සමහර විදුහල්පති සංගම් එයට එකඟතාවක් නැහැ. එම නිසා ඒක සාකච්ඡා මට්ටමේ පවතිනවා. සියලු දෙනා එකඟ නම් කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරලා ගුරු සහ විදුහල්පති සේවාව සංවෘත සේවාවක් කරන්න පුළුවන්. මගෙත් ස්ථාවරය ඒකයි.

[ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා]

ඊළඟට, විදුහල්පතිවරු අර staff grade එකේ නියම එකට ගත්තා නම් විදුහල්පතිවරුන්ටත් ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. අනෙක, මේක සංවෘත සේවාවක් කරන්නේ වෙනත් රාජ්‍ය සේවාවන් එක්ක මිසක් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ නොවෙයි. එතකොට විදුහල්පතිවරුන්ටත්, ගුරුවරුන්ටත් අධ්‍යාපන පරිපාලන සේවය, ගුරු අධ්‍යාපනඥ සේවය, ගුරු උපදේශක වාගේ ඕනෑම එකකට යන්න පුළුවන්. ඒ සාකච්ඡා අවසන් වුණාම ගරු ඇමතිතුමා ඒ පිළිබඳව පියවරක් ගනීවි.

දෙවැනි කාරණය මෙයයි. චක්‍රලේඛයක් නිකුත් කළ යුත්තේ ඒ පිළිබඳව අවසාන තීන්දුව ලබා ගත්තාට පසු වැටුප් තල සහ සියල්ල සඳහන් කර, එහි ප්‍රතිශතයක් නම් ලබා දෙන්නේ ඒ ප්‍රතිශතයත් එක්ක. නිවැරදිව ඒ ගණනය කිරීම් කරලා තමයි ඒක කරන්න වෙන්නේ. අය වැය ලේඛනයෙන් ඒ පිළිබඳව යෝජනාව ඉදිරිපත් වුණාට පස්සේ එය කිරීමට ඉඩ කඩ තිබෙනවා.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, මම ඒ ප්‍රශ්නය ගැන දිගට කථා කරන්නේ නැහැ. නමුත් ඔබතුමා දන්නවා, මේ ප්‍රශ්නය නිසා ඒකත් දැන් විශාල ප්‍රශ්නයක් වෙලා තිබෙන බව. ඒක නිසා තමයි මම ඇහුවේ, ඒ අයගේ වැටුප් විෂමතාව ඉවත් කරන්න කටයුතු කරනවාද කියලා. ඒ සියලුදෙනා මුදල් අමාත්‍යාංශයත් එක්ක සාකච්ඡාවක් ඉල්ලනවා. මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, ඒ සඳහා මැදිහත් වෙන්න කියලා. ඒ සාකච්ඡාව ලබා දෙන්න කටයුතු කරන්න. එහෙම වුණොත් බොහෝ විට ඔය ප්‍රශ්නය විසඳා ගන්න හැකියාව ලැබෙයි.

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු රාජ්‍ය ඇමතිතුමනි, අපි දැක්කා, අධ්‍යාපන පරිපාලන සේවයේ 80ක් හෝ එවැනි සංඛ්‍යාවක් පුහුණුවක් සඳහා විදේශගත කරන්න යනවා කියලා. ඒ පිළිබඳව කථා කරපු ඇතැම් අයට බොහොම නරක විධියේ ප්‍රතිචාරාත්මක තත්ත්වයන්ට මුහුණ දෙන්න සිදු වුණා. විශේෂයෙන් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ප්‍රභාත් ඒකනායක පීඨාධිපතිතුමාට පවා කැත විධියට, නරක විධියට අපහාස මුඛයෙන් අමාත්‍යාංශයෙන් ප්‍රතිචාර දක්වා තිබුණා. මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, අධ්‍යාපන පරිපාලන සේවයේ අය විදේශ පුහුණුවට යැවීම පිළිබඳව පැහැදිලි කිරීමක් කරන්න කියලා. ඊළඟට උපාධිධාරීන් බඳවා ගැනීම සම්බන්ධයෙන් ඊයේ -පෙරේදා ඔබතුමන්ලා චක්‍රලේඛයක් නිකුත් කර තිබුණා. ඒ ගැනත් පැහැදිලි කිරීමක් කරන්න. මෙය ගුරු අරගළය, එහෙම නැත්නම් ගුරුවරු කරන ඉල්ලීම් නවත්වන්න, ගුරුවරු දණ ගස්වන්න ආණ්ඩුව ගත්ත පියවරක්ද කියාත් අපට හිතෙනවා. ඒ ගැනත් පැහැදිලි කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சுசில் பிரேமஜயந்த)
(The Hon. Susil Premajayantha)

ඒ අතුරු ප්‍රශ්නයේ ප්‍රශ්න තුනක් තිබෙනවා, ගරු කථානායකතුමනි. පළමුවැනි ප්‍රශ්නය තමයි, උපාධිධාරි අභ්‍යාසලාභීන් බඳවා ගැනීම පිළිබඳ කාරණය. පළාත් මට්ටමින් ගත්ත තොරතුරු අනුව, මේ වන විට 18,000ක් පමණ -හරියටම ගණන කියන්න බැහැ.- උපාධිධාරින් අභ්‍යාසලාභීන් හැටියට පාසල්ගත කර තිබෙනවා. ඒ 18,000ම ගුරු සේවයට කැමැති අය නොවෙයි. මෙයින් කොටසක් ගුරු සේවාවට කැමැතියි. සමහරු අකැමැතියි. ගුරු සේවයට කැමැති අය අධ්‍යාපන ක්ෂේත්‍රයේ නොවන වෙනත් අමාත්‍යාංශවලට අනුයුක්ත කරලාත් තිබෙනවා. හැබැයි, කැබිනට් මණ්ඩලයට ගිය පත්‍රිකාවක් මඟින් Cabinet Subcommittee on Establishments විසින් ගත්ත තීන්දුව අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ඒක යොමු කරලා, එම කොමිෂන් සභාවෙන් ලැබුණු උපදෙස් අනුව යම් ක්‍රමවේදයක් සකස් කරලා තිබෙනවා, ඒ අය හඳුනා ගැනීම හා පත්වීම් ලබා දීම සම්බන්ධයෙන්. ඊට අමතරව, අභ්‍යාසලාභී උපාධිධාරීන් 53,000කට ස්ථිර පත්වීම් මාස තුනක් ඇතුළත ලබා දීම සඳහා ගරු අධ්‍යාපන ඇමතිතුමාගේ සභාපතිත්වයෙන් ගරු වාසුදේව නානායක්කාර ඇමතිතුමාගේත්, ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් ඇමතිතුමාගේත් සහභාගිත්වයෙන් යුතු කමිටුවක් පත් කරන්න දැනට සති දෙකකට පෙර අමාත්‍ය මණ්ඩලය තීන්දුවක් ගත්තා. ඒ කමිටුව දැන් රැස්වීමට නියමිතව තිබෙනවා. අභ්‍යාසලාභී ගුරුවරුන්ගේ ප්‍රශ්නයට විසඳුම් ලබා දීම සඳහා දැන් එම කමිටුව එය අධ්‍යයනය කරමින් සිටිනවා. අදාළ නිරීක්ෂණ ඉතාම කඩිනමින් ඒ කමිටුවට ලබා දෙනවා. එතකොට අභ්‍යාසලාභී උපාධිධාරින් ගුරු සේවයට යෙදවීම පිළිබඳ ප්‍රශ්නය අපට පහසුවෙන් විසඳා ගන්න පුළුවන්. ඒක ඔබතුමිය අහපු පළමුවැනි කාරණයට පිළිතුර. ඔබතුමිය අහපු දෙවැනි කාරණය මට මතක නැහැ.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන් පිරිසක් විදේශ පුහුණුව සඳහා තෝරා ගැනීම සම්බන්ධවයි මම ඇහුවේ, ගරු රාජ්‍ය ඇමතිතුමනි.

**ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சுசில் பிரேமஜயந்த)
(The Hon. Susil Premajayantha)

අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන් කණ්ඩායමක් -දැන් නොවේ මීට සැහෙන කලකට ඉහත දී- විදේශාධාර යටතේ ලැබුණු ව්‍යාපෘතියක් යටතේ ශිෂ්‍යත්ව ලබාදීලා පුහුණුව සඳහා විදේශවලට යවන්න තෝරා ගෙන තිබෙනවා. ඒ තෝරා ගැනීම පිළිබඳ යම් යම් ප්‍රශ්න, ගැටලු තිබෙනවා. ඒ නිසා ඊට අවසාන විසඳුමක් ලබා ගැනීම සඳහා නැවත එය අධ්‍යයනය කිරීමට අමාත්‍යාංශ ලේකම් විසින් දැනට කටයුතු කරගෙන යනවා. ඒක අවසානාත්මක ලේඛනය නොවෙයි. මම කනගාටු වෙනවා කවුරුන් හෝ එහෙම යමක් කිව්වා නම්. මොකද මම භාරව ඉන්නේ රාජ්‍ය අමාත්‍යාංශයයි. නමුත්, ඒ කාරණය පිළිබඳව මතු කරපු අයට අමාත්‍යාංශයේ කවුරුන් හෝ යමක් කිව්වා ද කියලා මා දන්නේ නැහැ. ඇත්ත වශයෙන්ම ඒ කාරණය මතු කරපු අයට ස්තුතිවන්ත වෙන්න ඕනෑ, එය නිවැරදි කර ගැනීමට අවස්ථාවක් ලබා දීම ගැන. ඒක තමයි මගේ ස්ථාවරය. ඔබතුමිය තුන්වැනි කරුණ විධියට ඇහුවේ මොකක්ද?

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

මම හිතන විධියට ඒ කරුණ සහ ගුරු සේවයට බඳවා ගැනීම් සම්බන්ධයෙන් මේ ගුරු අරගළය ඇතිවීමට,- [බාධා කිරීමක්]

**ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சுசில் பிரேமஜயந்த)
(The Hon. Susil Premajayantha)

ගුරුවරුන්ගේ ප්‍රශ්නය විසඳීම සඳහා ආණ්ඩුව ධනාත්මකව කටයුතු කරගෙන යනවා. ඇමති අනුකමිටුව මඟින් ඒ සඳහා ඉතාම සාධනීය විසඳුම් සහිත තීරණයක් දීලා තිබුණා. ඒ තීරණය කැබිනට් මණ්ඩලය අනුමත කර තිබෙනවා. ඒ මූල්‍ය ප්‍රශ්නය විසඳීම සඳහා අය වැයෙන් කටයුතු කරනවා.

## ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව: චිත්‍රපට සංරක්ෂණය
## தேசிய சுவடிக்கூடத் திணைக்களம்: திரைப்படங்களைப் பாதுகாத்தல்
## DEPARTMENT OF NATIONAL ARCHIVES: PRESERVATION OF FILMS

40/2020

**3. ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව විසින් චිත්‍රපට සංරක්ෂණය සඳහා වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේද;

(ii) එසේ නම්, මේ වන විට සංරක්ෂණය කර ඇති චිත්‍රපට සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ චිත්‍රපට සංරක්ෂණයට අදාළ අංශයේ නිලධාරීන්ට චිත්‍රපට සංරක්ෂණය සඳහා විදේශ පුහුණුව ලබා දෙන්නේද;

(ii) එසේ නම්, විදේශ පුහුණුව සඳහා යොමු කරනු ලබන රට සහ ආයතන කවරේද;

(iii) පසු ගිය කාලය තුළ විදේශ පුහුණුව ලබා දී ඇති පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) தேசியச் சுவடிக்கூடத் திணைக்களத்தினால் திரைப்படங்களைப் பேணிப் பாதுகாப்பதற்கு ஏதேனும் வேலைத்திட்டம் நடைமுறைப்படுத்தப் படுகின்றதா என்பதையும்;

(ii) ஆமெனில், இதுவரையில் பேணிப் பாதுகாக்கப் பட்டுள்ள திரைப்படங்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) தேசியச் சுவடிக்கூடத் திணைக்களத்தில் திரைப் படங்களைப் பேணிப் பாதுகாக்கும் பிரிவின் அலுவலர்களுக்குத் திரைப்படங்களைப் பேணிப் பாதுகாப்பது தொடர்பில் வெளிநாட்டுப் பயிற் சிகள் வழங்கப்படுகின்றனவா என்பதையும்;

(ii) ஆமெனில், வெளிநாட்டுப் பயிற்சிக்கென அனுப் பப்படும் நாடுகள் மற்றும் நிறுவனங்கள் யாவை என்பதையும்;

(iii) கடந்த காலப்பகுதியில் வெளிநாட்டுப் பயிற்சிகள் வழங்கப்பட்ட ஆட்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddhasasana, Religious and Cultural Affairs:

(a) Will he inform this House-

(i) whether the Department of National Archives is implementing a programme for the preservation of films; and

(ii) if so, the number of films that have been preserved so far?

(b) Will he also inform this House -

(i) whether overseas training in preservation of films is given to the officers attached to the relevant division of the Department of National Archives which carries out conservation of films;

(ii) if so, the names of the country and the institutions to which they will be referred for overseas training; and

(iii) the number of personnel who have been given overseas training recently?

(c) If not, why?

**ගරු විදුර වික්‍රමනායක මහතා (ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு விதுர விக்கிரமநாயக்க - தேசிய மரபுரிமைகள், அருங்கலைகள் மற்றும் கிராமியச் சிற்பக்கலைகள் மேம்பாட்டு அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Vidura Wickramanayaka - State Minister of National Heritage, Performing Arts and Rural Arts Promotion)

(අ) (i) ඔව්.

(ii) 603කි.

(ආ) (i) ඔව්.

(ii) ඉන්දියාව. Film Heritage Foundation and International Federation of Film Archives.

(iii) චිත්‍රපට සංරක්ෂණය පිළිබඳ විදේශ පුහුණුව ලබා දී ඇති පුද්ගලයන් සංඛ්‍යාව 5කි.

(ඇ) අදාළ නොවේ.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

ගරු කථානායකතුමනි, මම ගරු රාජ්‍ය අමාත්‍යතුමාට ස්තුතිවන්ත වෙනවා, එම පිළිතුර ලබා දීම සම්බන්ධව. ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, මම ඊට අදාළව පළමුවැනි අතුරු ප්‍රශ්නය ඔබතුමාගෙන් අහන්න කැමැතියි. ඔබතුමා කියපු චිත්‍රපට 603 රට තුළ මේ දක්වා සංරක්ෂණය කරපු සම්පූර්ණ චිත්‍රපට සංඛ්‍යාව වෙන්න ඇති කියා මම හිතනවා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, පෞද්ගලික අංශය පවා චිත්‍රපට සංරක්ෂණය කිරීමේ දී මීට වඩා යම්කිසි ආකාරයක වැඩි මැදිහත් වීමක් කරනවා. ඒ අයට මේ සම්බන්ධයෙන් මීට වඩා ඕනෑකමක් තිබෙන බව අපි දන්නවා.

ඔබතුමා රාජ්‍ය අමාත්‍යවරයා විධියට පත් වෙලා තවම කෙටි කාලයයි ගත වෙලා තිබෙන්නේ. ඉතිහාසය පුරා මේ වගකීම දැරූ අමාත්‍යවරු මේ වෙනුවෙන් අවශ්‍ය ක්‍රියා මාර්ග ගෙන තිබෙනවාද, ගරු රාජ්‍ය ඇමතිතුමනි? ඒ වාගේම, මේ සංරක්ෂණ ක්‍රියාවලිය තුළ දැනට සංරක්ෂණය කර තිබෙන චිත්‍රපට ප්‍රමාණය ගැන ඔබතුමා සෑහීමට පත් වෙනවාද?

**ගරු විදුර වික්‍රමනායක මහතා**
(மாண்புமிகு விதுர விக்கிரமநாயக்க)
(The Hon. Vidura Wickramanayaka)

ගරු කථානායකතුමනි, ජාතික චිත්‍රපට සංස්ථාවෙන් 270කුත්, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවෙන් 215කුත්, පෞද්ගලික එකතුවක් හැටියට 18කුත් වශයෙන් ලබාගෙන තමයි මේ වනවිට චිත්‍රපට 603ක් සංරක්ෂණය කර තිබෙන්නේ. ඔබතුමා මගෙන් ඇහුවා, ඒ සංඛ්‍යාව ගැන මා සෑහීමට පත් වෙනවාද කියලා. ඒ ප්‍රමාණය ගැන මා සෑහීමට පත් වන්නේ නැහැ, ගරු මන්ත්‍රීතුමනි. ගරු කථානායකතුමනි, මේ සඳහා අවශ්‍ය පහසුකම් මේ වන කොට අපි ලබා දෙමින් යනවා. අපට විශේෂයෙන්ම රසායනාගාර පහසුකම් නැහැ. දැන් රසායනාගාර පහසුකම් සකස් කරමින් පවතිනවා. ඒ වාගේම පුහුණු කාර්ය මණ්ඩලයක් අපි ඇති කර ගත යුතුයි. NVQ 6 මට්ටමේ පුහුණුවක් ලබා දී, ඒ සුදුසුකම් මට්ටමට ඒ කාර්ය මණ්ඩලය පුරුදු පුහුණු කරලා මේ කටයුත්තට යොදවන්නයි අපි බලාපොරොත්තු වන්නේ.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පි ප්‍රවර්ධන කටයුතු ගරු රාජ්‍ය අමාත්‍යතුමා වන ඔබතුමාගෙන් මා දෙවන අතුරු ප්‍රශ්නය අහනවා. ඔබතුමා දන්නවා අවුරුදු දෙකකට ආසන්න කාලයක් තිස්සේ පවතින කොරෝනා වසංගතය හමුවේ මේ වන කොට රටේ සියලුම කර්මාන්ත කඩා වැටී තිබෙන බව. ඒ අතර තිබෙන ප්‍රධාන කර්මාන්තයක් තමයි චිත්‍රපට කර්මාන්තය. චිත්‍රපට කර්මාන්තය ගත්තාම, අපට පෙනෙන පිරිසට වඩා නොපෙනෙන පිරිසක් එය ජීවිකාව කරගෙන තිබෙනවා. ලයිට් එක අල්ලන මනුස්සයාගේ සිට, කැමරාකරණය, අධ්‍යක්ෂණය, නිෂ්පාදනය කරන අය, රංගන ශිල්පීන්, වේශ නිරූපණ ශිල්පීන් ආදී වශයෙන් විශාල පරාසයක් තුළ මේ කර්මාන්තය විහිදී යන බව ඔබතුමා දන්නවා. ටෙලි නාට්‍ය ක්ෂේත්‍රයත් එහෙමයි. සංගීත ක්ෂේත්‍රයත් එහෙමයි.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා මේ කාරණාව ගැන ඉතා සංවේදී අමාත්‍යවරයෙකු බව මා දන්නවා. චිත්‍රපට කර්මාන්තයේ යෙදෙන අයට එම කර්මාන්තය කඩා වැටීම වෙනුවෙන් අඩු පොලී යටතේ ණය පහසුකම් දෙනවා, ආධාර දෙනවා කියමින් විටින් විට ඔබතුමන්ලාගේ ආණ්ඩුව යම් යම් යෝජනා ගෙන ආ බව අපි දැක්කා. නමුත්, ගරු රාජ්‍ය ඇමතිතුමනි, මේ කර්මාන්තය හා සම්බන්ධ ගායක ගායිකාවන්, රංගන ශිල්පීන්, අධ්‍යක්ෂවරුන්, සහාය අධ්‍යක්ෂවරුන් ඇතුළු කණ්ඩායම වෙනුවෙන්, තමන්ගේ ජීවිකාව -වෘත්තීය- කඩා වැටීම නිසා අසාධාරණයට ලක් වෙලා සිටින, අපේ රටේ සමස්ත සමාජයම සතුටු කරන ඒ පිරිස වෙනුවෙන් ආණ්ඩුව මේ වන කොට ගෙන තිබෙන ක්‍රියා මාර්ග ගැන සෑහීමට පත් වෙන්න බැහැ. මේ වන කොට කොරෝනා වසංගත තත්ත්වයේ යම් පාලනයක් තිබෙන නිසා ඔබතුමා ඒ අය වෙනුවෙන් යම් පියවරක් ගන්න කටයුතු කරනවාද කියලා මම දැනගන්න කැමැතියි.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඉතිහාසයේ සිදු වුණු සමහර සිද්ධි අපි දැක්කා. යමෙකුට ගෞරවයක් දෙන්න ඕනෑ වෙලාවට ඔබතුමන්ලා ඒ ගෞරවය දෙනවා වාගේ පෙන්වනවා. ඩබ්ලිව්.ඩී. අමරදේව මැතිතුමා මේ රටට අහිමි වුණු වෙලාවේ එතුමා වෙනුවෙන් අනුස්මරණ ශාලාවක් හදන බව, ව්‍යාපෘතියක් කරන බව කිව්වා. නමුත් දැන් ඒ ඉදිකිරීම් කැලෑවට ගිහිල්ලා. ඔබතුමන්ලාගේ ආණ්ඩුවේත් කලාකරුවන් ඉන්නවා. නමුත්, ඒ අයවත් මේ රටේ කලාකරුවන් වෙනුවෙන් කථා කරන්නේ නැහැ. මේ වනවිට කලාකරුවන් වෙනුවෙන් යම්කිසි ක්‍රියා මාර්ගයක් ගෙන තිබෙනවාද, ඉදිරියේ දී ඔවුන් වෙනුවෙන් යම් ක්‍රියා මාර්ගයක් ඉතා කඩිනමින් ගන්න කටයුතු කරනවාද කියා මා ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි, ගරු රාජ්‍ය ඇමතිතුමනි.

**ගරු විදුර වික්‍රමනායක මහතා**
(மாண்புமிகு விதுர விக்கிரமநாயக்க)
(The Hon. Vidura Wickramanayaka)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ඒකට අවශ්‍ය දීර්ඝ පිළිතුරක් ද, කෙටි පිළිතුරක් ද?

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, දීර්ඝ පිළිතුරක් ලබා දුන්නා නම් එය මට වඩා වැදගත් වෙනවා, මේ හා සම්බන්ධ ශිල්පීන් සහ ඒ ක්ෂේත්‍රයට අදාළ අයට. මොකද, එමඟින් ඒ අය ඔබතුමා සිටින මතය ගැන අවබෝධයක් ලබා ගන්නවා.

**ගරු විදුර වික්‍රමනායක මහතා**
(மாண்புமிகு விதுர விக்கிரமநாயக்க)
(The Hon. Vidura Wickramanayaka)

ගරු කථානායකතුමනි, කොවිඩ් - 19 වසංගත තත්ත්වය නිසා මුලින්ම පහර වැදුණේ කලාකරුවන්ට සහ ශිල්පීන්ට. මෙම වසංගත තත්ත්වය යටතේ අවසානයටම යම් ප්‍රතිලාභයක් ලැබෙනවා නම් ලැබෙන්නේත් කලාකරුවන්ට සහ එම ශිල්පීන්ට තමයි. අපි කනගාටු වෙනවා, ඔවුන් ඉල්ලන සියලු දේ අපට ලබා දෙන්න බැරි වීම ගැන. ඔවුන් වෙනුවෙන් අපි යම් ණය ක්‍රමයක් ක්‍රියාත්මක කළා. නමුත්, අපට ඒකත් නවත්වන්න සිද්ධ වුණා. මේ විෂයය භාර කැබිනට් අමාත්‍යවරයා හැටියට ගරු අග්‍රාමාත්‍යතුමා මේ පිළිබඳව විමසා අලුත් වැඩ පිළිවෙළක් නිර්මාණය කරන්නයි බලාපොරොත්තු වන්නේ. මේ වන කොට ඒ පිළිබඳව සාකච්ඡා කරගෙන යනවා. නැවත ප්‍රසංග පැවැත්වීම ගැන, චිත්‍රපටශාලා විවෘත කරලා නැවත චිත්‍රපට පෙන්වීම ගැන, ගමේ ගොඩේ තොවිලයක්, බලි යාගයක් වැනි දේවල් කරන්න පුළුවන් ආකාරය ගැන දැනට සාකච්ඡා කරගෙන යනවා. එම වැඩ පිළිවෙළ පිළිබඳව මේ වනවිට අපි සාකච්ඡා කරමින් සිටිනවා. ඉදිරි සති දෙක ඇතුළත සෞඛ්‍ය බලධාරීන් සමඟත් එම සාකච්ඡාමය කටයුත්ත කෙරෙනවා.

ගරු කථානායකතුමනි, ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා කියපු ආකාරයට මේ කටයුත්තේ යම් යම් දුර්වලකම් තිබෙනවා; අඩු පාඩු තිබෙනවා. අපි සතුටු වන්නේ නැහැ, කලාකරුවන්ට සහ ශිල්පීන්ට ලබා දුන් සහන පිළිබඳව. අපි ඒක බොහොම විවෘතව කියනවා. කලාකරුවන්ට සහ ශිල්පීන්ට මීට වඩා සහන ලැබිය යුතුයි.

අපි බලාපොරොත්තු වෙනවා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයටත්, ඒ වාගේම අපේ රාජ්‍ය අමාත්‍යාංශයටත් ඒ අවශ්‍ය කරන ප්‍රතිපාදන ඉදිරි අය වැයෙන් ලැබේවි කියලා. එතැන් සිට අපට ඒ කටයුත්තත් ලබන අවුරුද්දේ ඉඳන් ඉදිරියට කරගෙන යන්න පුළුවන්. ඔබතුමන්ලාගේ අදහස්, යෝජනා අපි ඉතාම ගෞරවයෙන් පිළිගන්නවා. [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔබතුමාගේ අතුරු ප්‍රශ්න දෙකම අසා අවසානයි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

ගරු කථානායකතුමනි, ගරු රාජ්‍ය ඇමතිතුමාගෙන් පොඩි පැහැදිලි කරගැනීමක් අවශ්‍යයි. ඒ සඳහා සුළු වෙලාවක් ලබාදෙන්න.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, මම දන්නා විධියට මේ කාරණය මේ පාර්ලිමේන්තුවේ කවුරුත් කැමැති කාරණාවක්. අපේ රටේ තරුණ පරම්පරාවේ අලුත් ගායිකාවක් අද ජාත්‍යන්තරයට ගිහින් තිබෙනවා. ලංකාවේ අයට වඩා ජාත්‍යන්තරය -විශේෂයෙන්ම ඉන්දියාවේ ජනතාව- අද යොහානි ද සිල්වා කියන අපේ ගායිකාවට ආදරය කරනවා. නමුත් ඒ තරුණ ගායිකාව වෙනුවෙන් රජය විධියට ඔබතුමන්ලා දැනෙන කිසිම දෙයක් මේ වනවිට කරලා නැහැ. පෞද්ගලික රූපවාහිනී මාධ්‍යවලින් එම ගායිකාවට දෙන හයිය විතරයි අපට පෙනෙන්නේ. මා ඒ කාරණය ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය ඇමතිතුමා වන ඔබතුමාගේ අවධානයට යොමු කරවනවා. අපේ රට වැටිලා තිබෙන මේ වෙලාවේ අපේ රටේ නම ජාත්‍යන්තරයේ කථා බහට ලක් වන තැනට ගෙන ගිය ඒ තරුණ ගායිකාව වන යොහානි ද සිල්වා වෙනුවෙන් මේ වෙලාවේ ආණ්ඩුවෙන් කළ යුතු යුතුකමක් තිබෙනවා. ඒ නිසා ආණ්ඩුව ඇය වෙනුවෙන් යම් දෙයක් කරන්න අදහස් කරනවාද කියන ප්‍රශ්නයට ඔබතුමා පිළිතුරක් ලබා දුන්නොත් එය වඩා වැදගත් වනවා.

**ගරු විදුර වික්‍රමනායක මහතා**
(மாண்புமிகு விதுர விக்கிரமநாயக்க)
(The Hon. Vidura Wickramanayaka)

ගරු කථානායකතුමනි, විෂයය භාර ගරු අමාත්‍යවරයා හැටියට ගරු අග්‍රාමාත්‍යතුමා ඒ කටයුතු මේ වන කොටත් ආරම්භ කර තිබෙනවා. රාජ්‍ය සම්මානයකින් ඒ කලාකාරියට ගෞරවය උපහාරය පුද කරන්නටත්, එතැන් පටන් අලුත් වැඩ පිළිවෙළක් යටතේ කටයුතු කරන්නත් අපි බලාපොරොත්තු වනවා.

ගරු කථානායකතුමනි, ඔබතුමාත් දන්නවා, විශේෂයෙන්ම අපේ රටේ කලාවට සම්බන්ධ, කලා කෘති සංරක්ෂණය කිරීමේ හෝ ඒ අයගේ අයිතිය තහවුරු කිරීමේ වැඩ පිළිවෙළක් නැති බව. අපි අන්න ඒ වැඩ පිළිවෙළ දැන් ආරම්භ කර තිබෙනවා. එවැනි දේ මඟිනුත් මෙවැනි කලාකරුවන්ගේ අයිතීන් ආරක්ෂා වන, වරප්‍රසාද ආරක්ෂා වන වැඩ පිළිවෙළක් අපි නිර්මාණය කරන්න ඕනෑ. එක වෙලාවක විතරක් සම්මානයක් පුද කරලා, එක වෙලාවක විතරක් වේදිකාවක් මත ගෞරවය පුද කරලා කලාකරුවෙකු සතුටු කරන්න බැහැ. ඒ ක්‍රමවේදවලට අපි එකඟ නැහැ. ජීවිත කාලය පුරා ගෞරවයක්, අභිමානයක් එක්ක කලාකරුවාට එම කටයුතුවල යෙදිය හැකි වැඩ පිළිවෙළක් ඇති කිරීමටයි අප බලාපොරොත්තු වන්නේ. අපි යොහානි ද සිල්වා කලාකාරියටත් අනිවාර්යයෙන්ම ඒ ගෞරවය පුද කරනවා. ශ්‍රී ලංකාවේ නම මෑතකදී ජාත්‍යන්තරයට ගෙනගිය කලාකාරිනිය වන එතුමියටත් අපගේ ගෞරවය හා උපහාරය පුද කරනවා. විශේෂයෙන් කලා ක්ෂේත්‍රයේ සියලුදෙනාටම ලබා දිය යුතු ගෞරව හා උපහාර පුද කරමින් ඔවුන්ට අභිමානයක් ඇතුව ජීවත්වීමේ වටපිටාව නිර්මාණය කරන්නයි අපි බලාපොරොත්තු වෙන්නේ. ස්තුතියි.

## මිරිදිය ධීවර කර්මාන්තය: පොළොන්නරුව දිස්ත්‍රික්කය

நன்னீர் மீன்பிடிக் கைத்தொழில்: பொலன்னறுவை மாவட்டம்

FRESHWATER FISHING INDUSTRY: POLONNARUWA DISTRICT

730/2020

**4. ගරු අමරකීර්ති අතුකෝරළ මහතා**
(மாண்புமிகு அமரகீர்த்தி அதுகோரல)
(The Hon. Amarakeerthi Athukorala)
ධීවර අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) ශ්‍රී ලංකාවේ -
(i) වාර්ෂික මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය සහ අවශ්‍යතාව කොපමණද;
(ii) ඉහළම මිරිදිය මත්ස්‍ය අස්වැන්නක් ලබා දෙන දිස්ත්‍රික්කය කවරේද;
(iii) එම කර්මාන්තයේ නියැලෙන මුළු පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ -
(i) මිරිදිය මත්ස්‍ය කර්මාන්තය ජීවිකාව කරගත් පවුල් සංඛ්‍යාව කොපමණද;
(ii) මාසික මිරිදිය මත්ස්‍ය අස්වැන්න කොපමණද;
(iii) එම කර්මාන්තය සිදුකරන වැව් හා ජලාශ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වැව් හා ජලාශවලට මුදාහරින ලද මත්ස්‍ය පැටවුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;
(ii) ඉහත කාලය තුළ එම වැව් හා ජලාශවලින් ලද අස්වැන්න වෙන් වෙන් වශයෙන් කොපමණද;
(iii) මුදා හරින ලද මත්ස්‍ය පැටවුන්ට සාපේක්ෂව ලද අස්වැන්න පිළිබඳව සෑහීමකට පත්වන්නේද;
(iv) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ඈ) කුඩා වැව් ආශ්‍රිතව මිරිදිය මත්ස්‍ය කර්මාන්තය සංවර්ධනය සඳහා ගත් ක්‍රියාමාර්ග කවරේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

கடற்றொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) இலங்கையில் -
(i) வருடாந்த நன்னீர் மீன் உற்பத்தி மற்றும் தேவை யாது என்பதையும்;
(ii) ஆகக்கூடிய நன்னீர் மீன் அறுவடையைப் பெற்றுத்தரும் மாவட்டம் யாது என்பதையும்;
(iii) நன்னீர் மீன்பிடிக் கைத்தொழிலில் ஈடுபடும் மொத்தக் குடும்பங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) பொலன்னறுவை மாவட்டத்தில் -
(i) நன்னீர் மீன்பிடிக் கைத்தொழிலை வாழ்வாதாரமாகக் கொண்டுள்ள குடும்பங்களின் எண்ணிக்கை யாது என்பதையும்;
(ii) மாதாந்த நன்னீர் மீன் அறுவடை எவ்வளவு என்பதையும்;
(iii) நன்னீர் மீன்பிடிக் கைத்தொழில் மேற்கொள்ளப் படுகின்ற குளங்கள் மற்றும் நீர்த்தேக்கங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) (i) 2015ஆம் ஆண்டு தொடக்கம் 2019ஆம் ஆண்டு வரை பொலன்னறுவை மாவட்டத்திலுள்ள குளங்கள் மற்றும் நீர்த்தேக்கங்களில் விடப்பட்ட மீன் குஞ்சுகளின் அளவு தனித்தனியாக யாது என்பதையும்;
(ii) அக்காலப் பகுதியில், மேற்படி குளங்கள் மற்றும் நீர்த்தேக்கங்களிலிருந்து பெறப்பட்ட மீன் அறுவடை தனித்தனியாக யாது என்பதையும்;

[ගරු අමරකීර්ති අතුකෝරළ මහතා]

(iii) விடப்பட்ட மீன் குஞ்சுகளுக்கு ஒப்பீட்டு ரீதியாகப் பெறப்பட்ட மீன் அறுவடை தொடர்பில் திருப்தி அடைவாரா என்பதையும்;

(iv) இன்றேல், அதற்கான காரணம் யாது என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(ஈ) சிறிய குளங்களைச் சார்ந்து நன்னீர் மீன்பிடிக் கைத்தொழிலை அபிவிருத்தி செய்வதற்காக எடுக்கப்பட்ட நடவடிக்கைகள் யாவை என்பதை அவர் மேலும் இச்சபையில் அறிவிப்பாரா?

(உ) இன்றேல், ஏன்?

asked the Minister of Fisheries:

(a) Will he inform this House, in respect of Sri Lanka -
  (i) the annual freshwater fish production and the requirement;
  (ii) the district that produces the highest freshwater fish yield; and
  (iii) the total number of families who are engaged in that industry?

(b) Will he also inform this House, in respect of the Polonnaruwa District -
  (i) the number of families who have made freshwater fishing their livelihood;
  (ii) the monthly freshwater fish yield; and
  (iii) the tanks and reservoirs used for that industry?

(c) Will he state -
  (i) the number of fingerlings released to the tanks and reservoirs in the Polonnaruwa District from 2015 to 2019;
  (ii) the yield obtained from those tanks and reservoirs during the above period;
  (iii) whether the yield is satisfactory compared to the fingerlings released; and
  (iv) if not, the reason for that?

(d) Will he further inform this House of the measures that have been taken to develop the freshwater fishing industry related to small tanks?

(e) If not, why?

**ගරු කංචන විජේසේකර මහතා (විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர - அலங்கார மீன்கள், நன்னீர் மீன்கள், இறால்களை வளர்த்தல், கடற்றொழில் துறைமுகங்கள் அபிவிருத்தி, பலநாள் கடற்றொழில் அலுவல்கள் மற்றும் மீன் ஏற்றுமதி இராஜாங்க அமைச்சர்)
(The Hon. Kanchana Wijesekera - State Minister of Ornamental Fish, Inland Fish and Prawn Farming, Fishery Harbour Development, Multiday Fishing Activities and Fish Exports)

ගරු කථානායකතුමනි, ධීවර අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) 2019 වර්ෂයේදී නිෂ්පාදනය - මෙට්‍රික්ටොන් 90,340කි.

අවශ්‍යතාව - මෙට්‍රික්ටොන් 150,000-200,000 පමණ.

(ii) අනුරාධපුර දිස්ත්‍රික්කය.

(iii) 75,000ක් පමණ.

(ආ) (i) 6,000ක් පමණ.

(ii) සාමාන්‍ය වශයෙන් මෙට්‍රික්ටොන් 760ක් පමණ.

(iii) ඔව්.

ප්‍රධාන ජලාශ - 05, මධ්‍යම ජලාශ - 03, කුඩා පරිමාණ - 76, කාලීන ජලාශ - 90, විල්ලු - 08

ජලාශ නාම ලේඛනය ඇමුණුමෙහි දක්වා ඇත. ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමාගේ දැන ගැනීම සඳහා එම ඇමුණුම මම **සභාගත*** කරනවා.

(ඇ) (i)

| වර්ෂය | මත්ස්‍ය ඇඟිල්ලන් ගණන (ලක්ෂවලින්) | මිරිදිය ඉස්සන් පසුකීටයන් ගණන (ලක්ෂවලින්) |
|---|---|---|
| 2015 | 29.2 | 15.9 |
| 2016 | 42.4 | 57.0 |
| 2017 | 61.3 | 64.2 |
| 2018 | 139.0 | 75.6 |
| 2019 | 58.6 | 35.4 |

(ii)

| වර්ෂය | නිෂ්පාදනය (ලක්ෂවලින්) |
|---|---|
| 2015 | 7,160 |
| 2016 | 3,530 |
| 2017 | 8,310 |
| 2018 | 11,600 |
| 2019 | 9,960 |

(iii) ඔව්.

(iv) පැන නොනඟී.

(ඈ) ඔව්.

1. ජලාශවල නොමිලේ මත්ස්‍ය ඇඟිල්ලන් තැන්පත් කිරීම.

2. නිසි ක්‍රමවේදයට අනුකූලව මත්ස්‍ය අස්වැන්න නෙළීම.

3. අඟල් 3.5ට වැඩි ඇස් සහිත දැල් මසුන් ඇල්ලීමට භාවිත කිරීම.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

4. ජලාශවල මසුන් ඇල්ලීමට යෑමට හා ගොඩට ඒමට වේලාවක් නියම කිරීම.

5. අල්ලන මාළු සෑම කිලෝග්‍රෑම් එකකටම රුපියල් 20.00 බැගින් එකතු කර, ධීවර සමිතිය විසින් අරමුදලක් ගොඩ නංවා එමඟින් නැවත ජලාශයේ මත්ස්‍ය ඇඟිල්ලන් තැන්පත් කිරීමට කටයුතු කිරීම.

6. ජලාශවල වගාපාදක ධීවර කර්මාන්තයේ වැදගත්කම හා තාක්ෂණික දැනුම ලබා දීම හා දැනුවත් කිරීම.

7. ධීවරයන්ගේ සහභාගිත්වයෙන් ජලාශයේ විධිමත් කළමනාකරණයක් ස්ථාපිත කිරීමට කටයුතු කිරීම.

8. මිරිදිය යාත්‍රා ලියාපදිංචි කර ධීවරයන්ට මෙහෙයුම් බලපත්‍ර ලබා දීම.

9. ධීවර පනතට අනුව නීති රෙගුලාසි ක්‍රියාත්මක කිරීම.

(ඊ) පැන නොනඟී.

**ගරු අමරකීර්ති අතුකෝරළ මහතා**
(மாண்புமிகு அமரகீர்த்தி அதுகோரல)
(The Hon. Amarakeerthi Athukorala)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ධීවර ජනතාව වෙනුවෙන් මා ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඔබතුමා අමාත්‍යාංශය භාර ගත්තාට පස්සේ විශාල සේවාවක් ඉටු කරනවා. විශේෂයෙන් විසිතුරු මත්ස්‍ය වගා වැඩ කටයුතු සඳහා තරුණයන් දිරි ගන්වා ඒ ව්‍යාපෘති ඉතා සාර්ථකව කරගෙන යනවා.

මම ඔබතුමාගෙන් පළමුවැනි අතුරු ප්‍රශ්නය අහන්න කැමතියි. ඩොලර් සංචිත සීමා වී තිබෙන මේ අවස්ථාවේ අපි ආනයනය කරන ලැයිස්තුවේ fish fillets තිබෙනවා. මම නියෝජනය කරන මින්නේරිය ආසනයේ ධීවර සංස්ථා සංකීර්ණයේ ඉතා සාර්ථකව මේ fish fillets සකස් කර විශාල ආදායමක් උපදවා ගත්තා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, දැන් වසර ගණනාවක් තිස්සේ ඒ සංකීර්ණය වල් බිහි වෙලා, විනාශ වෙලා තිබෙනවා. මේක නැවත ආරම්භ කිරීමට අවස්ථාවක් තිබෙනවාද කියලා මම දැනගන්න කැමතියි.

**ගරු කංචන විජේසේකර මහතා**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
ඒ ප්‍රශ්නය යොමු කිරීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු කථානායකතුමනි, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මින්නේරියේ තිබෙන මේ පරිශ්‍රය පෞද්ගලික රාජ්‍ය හවුල් ව්‍යාපාරයක් වශයෙන් අභිලාශ කැඳවා නැවත ඒ කටයුත්ත කිරීමට අපි බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන් පසුගිය කාලයේ සීමාවකින් තොරව රටට මත්ස්‍ය සම්පත ආනයනය කිරීම නිසා අපේ අපනයන ආනයන පරතරය ඩොලර් මිලියන 20කට වඩා අඩු ප්‍රමාණයකට වැටී තිබුණා. 2014 තමයි අපි ධීවර කර්මාන්තය ආශ්‍රිත අපනයනවලින් වැඩිම අපනයන පරතරය ලබා ගත්තේ. ඒ වේලාවේ ඩොලර් මිලියන 122ක පරතරයක් තිබුණා. ඒක පසුගිය කාලයේ ඩොලර් මිලියන 20ට පමණ අඩු වෙලා තිබුණා. මේ අවුරුද්දේ නැවත වතාවක් අපි ඩොලර් මිලියන 100ක පරතරයක් තියලා තිබෙනවා. අපි ඉහළම අපනයන ආදායමක් ලබාගෙන තිබෙනවා. ඒ වාගේම අපි දේශීය වශයෙන් නිෂ්පාදකයන් වැඩි කිරීම නිසා ආනයනය කරන ප්‍රමාණය ඉදිරියේදී අවශ්‍ය වෙන්නේ නැහැ කියා මම හිතනවා. ඔබතුමා කියපු ආකාරයට පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මින්නේරියේ වාගේම අනෙකුත් හැම දිස්ත්‍රික්කයකම මිරිදිය මත්ස්‍ය වගාව වර්ධනය කිරීම සඳහා අපට රුපියල් මිලියන 390ක මුදලක් -වැඩිම මුදල- අපට පසු ගිය අය වැයෙන් වෙන් කරලා දුන්නා. ඒ තුළින් ලැබෙන නිෂ්පාදනය තුළින් මේ කර්මාන්තශාලා දියුණු කරගෙන අවශ්‍ය පහසුකම් ටික ලබා දෙන්න අපි බලාපොරොත්තු වෙනවා.

**ගරු අමරකීර්ති අතුකෝරළ මහතා**
(மாண்புமிகு அமரகீர்த்தி அதுகோரல)
(The Hon. Amarakeerthi Athukorala)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, මේ වන විට "වාරි සෞභාග්‍යා" වැඩසටහන යටතේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වැව් විශාල ප්‍රමාණයක් ප්‍රතිසංස්කරණය කරලා තිබෙනවා. දැන් මාස් කන්නය එන්නේ. එතකොට වැව්වලට මේ මාසයේ ඉඳලා වර්ෂාව පතිත වෙනවා. එවිට මේ වැව් ටික පිරී ඉතිරී යනවා. ඒ අවස්ථාවල මේ වැව් සඳහා මත්ස්‍යයන් ලබාදීමේ වැඩ පිළිවෙළක් තිබෙනවාද කියලා මම දැනගන්න කැමැතියි.

**ගරු කංචන විජේසේකර මහතා**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
ගරු කථානායකතුමනි, මේ වන විටත් "වාරි සෞභාග්‍යා" වැඩසටහන යටතේ සංරක්ෂණය වෙන, ප්‍රතිසංස්කරණය වෙන සහ අලුතින් ඉදිවෙන වැව් පිළිබඳව අප දැනුවත් කරලා තිබෙනවා. NARA ආයතනයෙන් සහ NAQDA ආයතනයෙන් පරීක්ෂණ කරලා ඒ ජලාශවල තැන්පත් කිරීමට සුදුසුකම ඇති මත්ස්‍ය පැටවුන් තැන්පත් කිරීමේ කටයුත්ත කරන්න තමයි අපි බලාපොරොත්තු වන්නේ. අපි දැනටමත් ඊළඟ අවුරුද්දේ අය වැයෙන් ඒ සඳහා මුදලක් වෙන් කර ගන්නට මුදල් අමාත්‍යතුමාත් සමඟ සාකච්ඡා කරලා තිබෙනවා. අපට ඒ සඳහා මුදලක් වෙන් කරන බවට දැනුවත් කරලා තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා, ප්‍රශ්න අංක 5.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, ප්‍රශ්නය අහන්නට කලින් මා යමක් කියන්න කැමැතියි. මීට පෙර අපට අතුරු ප්‍රශ්න තුනක් අහන්න අවස්ථාව තිබුණා, කාලය මදි නිසා දැන් ඒක අතුරු ප්‍රශ්න දෙකකට සීමා කරලා තිබෙනවා. එම නිසා මේ වාගේ අවස්ථාවක, දිනට ප්‍රශ්න 40ක් ඇසීමට අවස්ථාව දෙන දිනවලදීවත් ඒ තුන්වැනි අතුරු ප්‍රශ්නය ඇසීමට අවස්ථාව දෙන ලෙස ඉල්ලීමක් කරනවා.

ගරු කථානායකතුමනි, අනෙක් කාරණය මේකයි. අද අහන හැම ප්‍රශ්නයකටම පිළිතුරු තිබෙනවාද? එහෙම නැත්නම් මේ සභාවේ ඉන්න අපේ කාලය අපරාදේ. මොකද, පිළිතුර නොදී සභාගත කරන්න පුළුවන්, එහෙම නැත්නම් පිළිතුර "නැහැ" කියන්න පුළුවන්. පිළිතුර නොදෙනවා නම් මන්ත්‍රීවරුන්ට අසාධාරණයක් වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්නය ඇහුවා නම් දැනගන්න පුළුවන් උත්තර තිබෙනවාද කියලා.

**ගරු ගාමිණී ලොකුගේ මහතා (විදුලිබල අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி லொக்குகே - மின்சக்தி அமைச்சர்)
(The Hon. Gamini Lokuge - Minister of Power)
මම එතුමාගේ ප්‍රශ්නයට උත්තරය දෙනවා, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්නයට උත්තරය තිබෙනවා. කෙටියෙන් අහන්න, දැනටමත් පැයක් ගිහින් තිබෙනවා, නමුත් ප්‍රශ්න 5යි අහලා තිබෙන්නේ. [බාධා කිරීමක්] හරි, ඔබතුමා ප්‍රශ්නය අහන්න, ඒකනේ ඔබතුමාට අවස්ථාව දුන්නේ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මට මෙහෙත් ප්‍රශ්න තිබෙනවා, එහෙත් ප්‍රශ්න තිබෙනවා. වැඩිපුරම ප්‍රශ්න තිබෙන්නේ මට. මට වැඩියෙන් කාලය දෙන්න, ගරු කථානායකතුමනි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඔය පැත්තේ ප්‍රශ්න තිබෙනවා නම් මේ පැත්තට එන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් ප්‍රශ්නය අහන්න, චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා.

## ලංකා විදුලිබල මණ්ඩලය ලබාගෙන ඇති ණය: විස්තර

### இலங்கை மின்சார சபை பெற்ற கடன்: விபரம்

LOANS OBTAINED BY CEYLON ELECTRICITY BOARD: DETAILS

143/2020

**5. ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
විදුලිබල අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ලංකා විදුලිබල මණ්ඩලය විසින් ණය ලබා ගෙන ඇති රාජ්‍ය ආයතනවල සහ බැංකුවල නම් කවරේද;

(ii) 2015 වර්ෂයේ සිට මේ දක්වා ලංකා විදුලිබල මණ්ඩලය විසින් එකී ආයතනවලට හා බැංකුවලට ගෙවීමට ඇති ණය ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ලංකා විදුලිබල මණ්ඩලය මූල්‍යමය වශයෙන් ශක්තිමත් කිරීමට අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

மின்சக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை மின்சார சபை கடன் பெற்றுக் கொண்டுள்ள அரசாங்க நிறுவனங்கள் மற்றும் வங்கிகளின் பெயர்கள் யாவை;

(ii) 2015ஆம் ஆண்டு முதல் இதுவரையில் இலங்கை மின்சார சபையானது மேற்படி நிறுவனங்கள் மற்றும் வங்கிகளுக்குச் செலுத்த வேண்டியுள்ள கடன் தொகை வெவ்வேறாக யாது;

(iii) இலங்கை மின்சார சபையை நிதிரீதியில் பலப்படுத்துவதற்கு அமைச்சு மேற்கொள்ளும் நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Power:

(a) Will he inform this House -

(i) the names of the Government institutions and banks from which the Ceylon Electricity Board has obtained loans;

(ii) the sums of those loans which remain to be paid to such institutions and banks from the year 2015 up to now, separately; and

(iii) what courses of action the Ministry will take in order to strengthen the Ceylon Electricity Board financially?

(b) If not, why?

**ගරු ගාමිණී ලොකුගේ මහතා**
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) මහජන බැංකුව

ජාතික ඉතිරි කිරීමේ බැංකුව

ලංකා බැංකුව

සෙලාන් බැංකුව

සම්පත් බැංකුව

සමෘද්ධි අධිකාරිය

ලංකා විදුලි පුද්ගලික සමාගම

නේෂන්ස් ට්‍රස්ට් බැංකුව

(ii)

**Ceylon Electricity Board**
**Loan Schedule 2015 - 2021 (June)**

**(Rs.'000)**

| Loans (Bank/Govt. Institution) | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 (June) |
|---|---|---|---|---|---|---|---|
| **Bank Loans - Working Capital** | | | | | | | |
| People's Bank | 33,074,221 | 25,968,553 | 18,091,660 | 62,426,172 | 58,669,892 | 56,178,815 | 64,173,325 |
| National Savings Bank | 8,750,000 | 7,500,000 | 6,250,000 | 5,000,000 | 3,750,000 | 7,498,750 | 6,875,000 |
| Bank of Ceylon | - | - | - | - | 15,000,000 | 20,000,000 | 20,000,000 |
| Seylan Bank | - | - | - | - | 2,000,000 | 2,000,000 | 2,000,000 |
| NSB + Sampath + Seylan | - | - | - | - | 10,000,000 | 10,000,000 | 8,600,000 |
| NTB | | | | | | 972,000 | 776,000 |
| **Total - Bank Loans** | **41,824,221** | **33,468,553** | **24,341,660** | **67,426,172** | **89,419,892** | **96,649,565** | **102,424,325** |
| **Loans Provided by Other Govt. Institutions** | | | | | | | |
| Samurdhi Authority | 1,036,934 | 901,487 | 577,237 | 301,612 | 132,073 | 43,813 | 17,925 |
| (To facilitate electricity connections to low income earners) | | | | | | | |
| Loan Provided by Related Parties | | | | | | | |
| Lanka Electricity Company | - | - | - | - | - | 2,000,000 | 2,000,000 |
| (In order to settle the CPC/Coal) | | | | | | | |
| **Total** | **42,861,155** | **34,370,040** | **24,918,897** | **67,727,784** | **89,551,965** | **98,693,378** | **104,442,250** |

(iii) 2020 දෙසැම්බර් 31 දිනට කරන ලද ගණනය කිරීම් අනුව පාරිභෝගිකයන් වෙත බෙදා හරිනු ලබන විදුලි ඒකකයක (කිලෝවොට් පැයක - kWh -) සාමාන්‍ය මිල රුපියල් 17.27ක් වන අතර, ඒකකයක සාමාන්‍ය නිෂ්පාදන වියදම රුපියල් 21.04ක් වේ. එබැවින් ලංකා විදුලිබල මණ්ඩලය අළෙවි කරක සෑම විදුලි ඒකකයක් සඳහාම ඒකකයකට රුපියල් 3.77ක අලාභයක් දරන අතර, එය ලංකා විදුලිබල මණ්ඩලයේ අයහපත් මූල්‍ය තත්ත්වයට ප්‍රධාන හේතුවක් වේ.

විදුලිබල මණ්ඩලය මූල්‍යමය වශයෙන් ශක්තිමත් කිරීමට නම් මෙම අලාභය අවම කරගත යුතු අතර, එය පාරිභෝගික ජනතාව වෙත වැය බරක් නොකර උත්පාදන වියදම අවම කිරීමේ උපාය මාර්ගවලට යොමු වීම අමාත්‍යාංශයේ ප්‍රතිපත්තිය වේ.

ඒ අනුව විදුලිබල උත්පාදන වියදම් අඩු කිරීම සඳහා auto diesel හා දැවි තෙල්වලට වඩා ලාභදායක ඉන්ධනයක් වන ද්‍රවීකෘත ස්වාභාවික වායුව විදුලි උත්පාදනය සඳහා හඳුන්වා දීම සහ පුනර්ජනනීය බලශක්තිය මඟින් විදුලිය උත්පාදනයේ දායකත්වය වැඩි කිරීම මඟින් විදුලි උත්පාදන වියදම අඩු කිරීමට අමාත්‍යාංශය සහ ලංකා විදුලිබල මණ්ඩලය කටයුතු කරමින් සිටී. ඊට අමතරව ලංකා විදුලිබල මණ්ඩලය මූල්‍යමය වශයෙන් ශක්තිමත් කිරීමට පහත සඳහන් ක්‍රියා මාර්ග ගනිමින් ඇත.

* රජයේ ආයතන පියසි මත solar panels සවි කිරීම.

* පාසල් සිසුන් ලක්ෂ 42ක් කේන්ද්‍ර කරගත් බලශක්ති සංරක්ෂණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

* විදුලි පරිහරණයේ කාර්යක්ෂමතාව වැඩි වන සේ සැලසුම් කළ නව ගොඩනැඟිලි ඉදිකිරීමට උනන්දු කිරීම.

* නව තාක්ෂණය හඳුන්වා දීමෙන් ජාතික විදුලිබල පද්ධතියට සිදු කරනු ලබන වැඩිදියුණු කිරීම් මඟින් පද්ධතියේ සම්ප්‍රේෂණ හා බෙදා හැරීම් හානිවීම් - transmission and distribution losses - අඛණ්ඩව අඩු කිරීම. ඒ අනුව 2005, 2014 සහ 2019 වර්ෂවල වාර්තා වූ හානිවීම් පිළිවෙළින් 17.27%, 10.47%ක් සහ 8.23%ක් වූ බවද සඳහන් කරමි.

* පහත දැක්වෙන බලශක්ති කාර්යක්ෂමතාව වැඩි කිරීමේ උපාය මාර්ග මඟින් විදුලි ඉල්ලුම අඩු කිරීම.

✓ බලශක්ති කාර්යක්ෂමතාවෙන් යුක්ත විදුලි උපකරණවල අළෙවිය ප්‍රවර්ධනය කිරීම සඳහා එම උපකරණ ලේබල් කිරීම. (දැනටමත් සිවිලිම් විදුලි පංකා, සංයුක්ත ප්‍රතිදීප්ත පහන් - CFL - සහ ප්‍රතිදීප්ත පහන් - fluorescent lamps - ලේබල් කර ඇති අතර වතුර පොම්ප, රූපවාහිනී යන්ත්‍ර සහ rice cookers මීළඟ අදියරේදී ලේබල් කිරීමට නියමිතය.)

✓ ලංකා විදුලිබල මණ්ඩලය සහ ලංකා විදුලි සමාගම විසින් බලශක්ති කාර්යක්ෂමතාවෙන් යුක්ත LED විදුලි බුබුළු පාරිභෝගිකයන් අතර ප්‍රචලිත කිරීම.

(ආ) පැන නොනඟී.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු ඇමතිතුමනි, පිළිතුර ලබා දීම ගැන ස්තුතියි.

ගරු කථානායකතුමනි, මගේ ප්‍රශ්නයේ (අ) (iii) කොටසට පිළිතුර ලෙස එතුමා ලාභ ලැබීම සඳහා ගනු ලබන ක්‍රියා මාර්ග ගණනාවක් කිව්වා. ගරු ඇමතිතුමනි, නමුත් ඔබතුමන්ලා ක්‍රියාත්මක කරන්නේ ඒවා නොවෙයි. බලශක්ති අර්බුදය විසඳා ගැනීම සඳහා විදුලිබල අමාත්‍යාංශය ඔබතුමා කියන පියවර ගන්නවා නම්, පුරවැසියන් හැටියට අපට සතුටු වෙන්න පුළුවන්. ගරු කථානායකතුමනි, මම ජූලි 08වැනි දා අපේ බලශක්ති ඇමතිවරයාගෙන් ප්‍රශ්නයක් ඇහුවා. එදින මේ පාර්ලිමේන්තුවට ඓතිහාසික දිනයක්. මොකද, ඔබතුමාටත් මතක නම් ඒ අපේ ද්විත්ව පුරවැසි මුදල් ඇමතිතුමා වැඩ භාර ගත් දවස. මෙම අතුරු ප්‍රශ්නය අහන්න මම ඒ ප්‍රශ්නයත් උපයෝගී කර ගන්නවා, ගරු කථානායකතුමනි.

ගරු ඇමතිතුමනි, මම අහන්නේ කෝටි 60,000ක ටෙන්ඩරය ඇමෙරිකාවට ලබා දීම ගැන දැන් රටේ පවතින ආන්දෝලනාත්මක ප්‍රශ්නය ගැනයි. ඇමෙරිකාවේ පුරවැසියෙකුගේ හෝ ඇමෙරිකාවේ තානාපතිගේ බලපෑමකට යටත්ව මේ ටෙන්ඩරය ලබා දෙනවාද කියලා අපට කියන්න.

ගරු කථානායකතුමනි, දේශප්‍රේමී ඇමතිවරයෙකු හැටියට උදය ගම්මන්පිල මැතිතුමා කළ ප්‍රකාශයක් සඳහන් හැන්සාඩ් වාර්තාවක් මා ළඟ තිබෙනවා. මම මේ හැන්සාඩ් වාර්තාවේ සඳහන් වෙලා තිබෙන සියලු දේ කියවන්න යන්නේ නැහැ. අදාළ ප්‍රකාශය පමණක් කියවීමට මම ඔබතුමාගෙන් අවසර ඉල්ලා සිටිනවා.

2021 ජූලි 08 වන දින හැන්සාඩ් වාර්තාවේ තීරු අංක 1781හි මෙසේ සඳහන් වෙනවා:

> "ගරු කථානායකතුමනි, මා මේ අමාත්‍ය ධුරයට පත් කර තිබෙන්නේ, ගරු අග්‍රාමාත්‍යතුමාගේ නිර්දේශ යටතේ, අතිගරු ජනාධිපතිතුමායි. මට ඉහළින් සිටින්නේ එතුමන්ලා පමණයි. එතුමන්ලා දෙදෙනා මගේ අමාත්‍යාංශයේ කටයුතුවලට කවදාවත් කිසිම බලපෑමක් කරලා නැහැ. උපදෙස් දීලා තිබෙනවා, තොරතුරු විමසා තිබෙනවා. නමුත්, කවදාවත් බලපෑමක් කර නැහැ. තානාපතිවරුන්ගේ පැත්තෙන් ගත්තොත්, තානාපතිවරුන් මා හමු වී කළ සාකච්ඡා පිළිබඳව මම අතිගරු ජනාධිපතිතුමාත්, ගරු අග්‍රාමාත්‍යතුමාත් දැනුවත් කළා. ඒ තානාපතිවරුන් තමන්ගේ රටේ දැවැන්ත සමාගම් වෙනුවෙන් පෙනී සිටිමින්, මට ඉදිරිපත් කළ අදහස් දැක්වීම්වලදී මම ඒ තානාපතිවරුන්ට ලිඛිතව අපේ ස්ථාවරය දැනුම් දුන්නා. 'ලංකා ඉතිහාසයට එක් වන දැවැන්තම ව්‍යාපෘතිය මේකයි, කොහොම කළත් මේකෙදි විවිධ චෝදනාවලට ලක් වෙන්න පුළුවන්, ඒ නිසා මේක විවෘත ටෙන්ඩර් කැඳවීමකින්, ලංකාවට වඩාත් වාසිදායක ටෙන්ඩරය තියෙන කෙනාට තමයි ලබා දෙන්නේ, ඔබටත් පුළුවන්, ඒ ටෙන්ඩරයට සහභාගි වෙන්න'..."

ගරු කථානායකතුමනි, ගරු උදය ගම්මන්පිල ඇමතිතුමා මේ කියන්නේ යුගදනවි බලාගාරය ගැනයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා ඉක්මනට ප්‍රශ්නය අහන්න. කාලය සීමිතයි.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මට මේක කියන්න දෙන්න. මේක හැන්සාඩ් වාර්තාවේ සඳහන් දෙයක්. එතුමාටත් මේක වැදගත් වෙනවා.

විෂය භාර ඇමතිතුමනි, කාලය ඉතිරි කරගන්න ඕනෑ නිසා අවසානයට තිබෙන දේ පමණක් මම කියන්නම්. කුමන බලපෑමක් ආවත්, ඇමෙරිකානු පුරවැසියෙක් හෝ වේවා, ඇමෙරිකානු තානාපතිවරයා හෝ වේවා කවුරු කිව්වත්, ඇමෙරිකාවට යටත් නොවී විවෘත ටෙන්ඩර් කැඳවීමකින් මෙය ලබාදෙනවාය කියන කාරණය තමයි මෙතැනදී ඔබතුමා කියා තිබෙන්නේ. නමුත්, ලාභ ලබනවා කියලා ගරු ඇමතිතුමා පෙන්වන්නේ වෙන කාරණයක්. හැබැයි, වෙන කණ්ඩායමක් ලාභ ලබනවා කියලා අත යට ගනුදෙනු මත මේ ටෙන්ඩරය ලබාදීම පිළිබඳව වගකිව යුතු, රටට ආදරය කරන ඇමතිවරයකු හැටියට ඔබතුමා මොකක්ද කියන්නේ? මොකද, ඔබතුමාගේ ආසනයට තවත් ආසන තුනක් මෙහා තිබෙන ආසනයේ සිටින ඇමතිතුමිය තමයි එක පුරෝහිතයෙක් හැටියට කිව්වේ, "මෙහෙම ගියොත් එහෙම අපට රජුත් එක්ක වැළලෙන්න වෙනවා, ඒ නිසා මේකෙන් අයින් වුණු එක හොඳයි" කියලා. මේ ආණ්ඩුවේ පුරෝහිතයෙකු හැටියටත්, දේශප්‍රේමීත්වය තිබෙන ඇමතිවරයෙකු හැටියටත් රට විකුණන්නේ නැහැ කියන කාරණයේදී ඔබතුමා මොකක්ද කියන්නේ කියලායි මම අහන්නේ. ගරු ඇමතිතුමනි, මේ හැන්සාඩ් වාර්තාවේත් තිබෙනවා, එහෙම දෙන්නේ නැහැ කියලා. නමුත්, දැන් දීලා ඉවරයි. ඇමතිවරයෙකු හැටියට ඔබතුමාත් දැන් පෙරළන්නේ "සෞභාග්‍යයේ දැක්ම" පොත. සෞභාග්‍යයේ දැක්මේ ඒක ලියලා තිබෙනවා කියලා ඔබතුමා ඒ පොත පෙන්වන්න හදනවා. හැබැයි, මේ රටේ ඔබතුමන්ලාට ඡන්දය දුන් හැටනව ලක්ෂයක ජනතාවට ඒ පොත හරියටම පෙන්වූවාද, නැද්ද කියන කාරණය අපට කියන්න. ඒ වාගේම කොමිස් අරගෙන මේ ව්‍යාපෘතිය ලබා දීලා විදුලිබල අමාත්‍යාංශය ලාභ ලබන්නේ කොහොමද කියලාත් කියන්න. ලාභ ටික ඔක්කොම ඇමෙරිකාවට නේ යන්නේ, ගරු ඇමතිතුමනි.

**ගරු ගාමිණී ලොකුගේ මහතා**
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
ගරු කථානායකතුමනි, LNGවලට ගියාම දැන් රුපියල් 21ට ගන්න විදුලි ඒකකයක් රුපියල් 16කට වඩා අඩු වෙනවා. ඒ වාසිය ලැබෙන්නේ කාටද? මේ රටට. ඔබතුමන්ලා ඒකට විරුද්ධද? දැව්තෙල්වලින් ක්‍රියාත්මක වන යන්ත්‍ර LNGවලට පරිවර්තනය කළාම, දැනට ඒකකයක් සඳහා රුපියල් 21ක් වන cost එක රුපියල් 16ට වඩා අඩු වෙනවා. ඒක හොඳද, නරකද? ඔබතුමන්ලා ඒකට විරුද්ධද?

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ඒක හොඳයි. ඔබතුමන්ලා පැහැදිලිවම ගිවිසුම්ගත වෙලා තිබෙන්නේ සෘජු ටෙන්ඩරයක් සඳහා නේ? ඔබතුමා ඔය කියන කාරණය රටේ ජනතාව දන්නේ නැහැ. ඒ වාගේම ඔබතුමා දන්නේත් නැහැ, අමාත්‍ය මණ්ඩලය දන්නේත් නැහැ, හිටපු ඇමති දන්නේත් නැති බව තමයි රටේ ප්‍රචාරය වෙන්නේ. ඒ දේ වෙනවා නම් අපේ රටට හොඳයි. ගරු කථානායකතුමනි, හැබැයි අපි දන්නා දේ තමයි, මැතකදී කොළඹ වරායේ බටහිර ජැටියේ සියයට 85ක් අදානි කොම්පැනියට දීලා තිබෙන බව.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, ප්‍රශ්නය තමයි අහන්නේ. ගරු කථානායකතුමනි, මේ කාලය අපි 225දෙනාටම බණින කාලයක්. අපි ඡන්දය ගන්න, මැතිවරණය දිනන්න යමක් කියලා,

මැතිවරණයෙන් පස්සේ වැරැදි ගමනක් යනවා නම්, නැවතත් දේශපාලනය කරනවාද, නැද්ද කියන කාරණය ගැන අපි හිතන්න ඕනෑ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
තව ප්‍රශ්න 35ක් අහලා අවසන් කරන්න ඕනෑ. කරුණාකර ඉක්මන් කරන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු ඇමතිතුමනි, ඔබතුමා කියන විධියට විදුලිය ඒකකයක් රුපියල් 16ට වඩා අඩුවෙන් දෙනවාය කියන එක ස්ථිරවම කියන්න පුළුවන්ද? එහෙම නැත්නම් ඔබතුමා මෙතැනින් එළියට ගියාට පස්සේ, "ඒක එහෙම නොවෙයි" කියලා කියයි. එහෙම දෙනවාද? නැත්නම්, ඇමෙරිකාවට ඕනෑ විධියට බලශක්තිය ඔවුන් අතට දුන්නාම ඔවුන් ගන්නා තීන්දුත් එක්ක අපට කටයුතු කරන්න වෙනවා. ඩඩ්ලි සිරිසේන මහත්මයා නේ, දැන් හාල් මිල තීන්දු කරන්නේ. ඒ වාගේ ඇමෙරිකාවත් මේ රටේ විදුලි බලය සම්බන්ධයෙන් වූ බලය අතට අරගෙන ඔවුන් එහි මිල තීන්දු කළොත් අපි කොහේද යන්නේ, ගරු ඇමතිතුමනි? විකුණපු කෙනා නම් ඇමෙරිකාවට යයි. අපි කොහේද යන්නේ?

**ගරු ගාමිණී ලොකුගේ මහතා**
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
තමුන්නාන්සේගේ ඒ ප්‍රශ්නය වෙනම අහනවා නම් මට මීටත් වඩා හොඳින් පැහැදිලි කරන්න තිබුණා. අපි ආණ්ඩුවක් පිහිටුවනකොට රටට ප්‍රතිපත්ති ප්‍රකාශයක් නිකුත් කරනවා. අපේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ තිබෙනවා, මේ රට දියුණු කිරීම සඳහා අපි රාජ්‍ය අංශය සහ පෞද්ගලික අංශය එකතු වූ ව්‍යාපාර ආරම්භ කරනවා කියලා. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කළේ මොකක්ද? ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව තිබුණේ ලංකාවට අයිති තනි ආයතනයක් විධියට. නමුත් අපි රට භාර ගන්නකොට කොහොමද තිබුණේ? අපේ තෙල් සංස්ථාව දෙකට බෙදලා "කොළොන්නාව ටර්මිනල්" කියලා ආයතනයක් ආරම්භ කරලා, IOC කියන ඉන්දියානු සමාගම ගෙනැල්ලා ලංකාවේ හොඳම petrol sheds 100ක් ඒ IOC සමාගමට දීලා, තෙල් බෙදා හැරීමට IOC සමාගමත් කොටස්කාරයෙක් කර ගත්තා. කොළොන්නාවේ ටර්මිනල් එකෙන් තුනෙන් එකක් IOC සමාගමට දුන්නා. ඒ කාලයේ මැතිවරණය තිබුණේ නැත්නම් තවත් තුනෙන් එකක් ඒ සමාගමට දෙනවා. නමුත්, හොඳ වෙලාවට මහින්ද රාජපක්ෂ මැතිතුමා බලයට පත් වීමෙන් පසු තුනෙන් එකක් මහා භාණ්ඩාගාරය යටතට ගත් නිසා අද තුනෙන් දෙකක් අයිති ශ්‍රී ලංකාවට. නැත්නම් තුනෙන් එකක් පමණයි අපට අයිති වෙන්නේ. තමුන්නාන්සේලා ටෙන්ඩර් කැඳවලාද අපේ තෙල් සංස්ථාවෙන් තුනෙන් එකක් දුන්නේ? ඒ කාලයේ හිටපු ඇමතිවරු, ගරු විපක්ෂ නායකතුමා ඇතුළු සියලුදෙනා දැනුත් ඉන්නවා. කරු ජයසූරිය මහත්මයා තමයි ඒ කාලයේදී විෂය භාර අමාත්‍යවරයා වශයෙන් කටයුතු කළේ. තෙල් ටැංකි ඉන්දියාවට පමණක් දෙන්න ඕනෑ කියලා ගිවිසුම අත්සන් කළේ කවුද? රනිල් වික්‍රමසිංහ මැතිතුමා එදා තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ නායකයා. තමුන්නාන්සේලා ඒ ආණ්ඩුවේ හිටියා. අද මේ අහන ප්‍රශ්න එකක්වත් තමුන්නාන්සේලා එදා ඇහුවේ නැහැ නේ. මේ වන විට ඒ ගිවිසුම් කාලය අවසන් වෙලා දෙවැනි ගිවිසුමට ඇවිල්ලා තිබෙනවා. ඒක අත්සන් කරන්න එපා කියලා තමුන්නාන්සේලා කියනවා. මුලින් ඒක දීලා, ඒකට පාර කපලා, දැන් කියනවා, "අත්සන් කරන්න එපා" කියලා. කෙරවලපිටිය- [බාධා කිරීමක්] එම සමාගම විදුලිබල මණ්ඩලයට අයිති සමාගමක් නොවෙයි, නමුත් ඒ ආයතනය - [බාධා කිරීමක්] 2035 වසර වනකොට ශ්‍රී ලංකාවට අයිති වෙනවා. ඊට අමතරව මෙගාවොට් හාරදහස් පන්සියයක ඩීසල් බලාගාරයක් ඇති කරනවා. ඒකටත් ඒ අය ආයෝජනය කරනවා. රටට ප්‍රයෝජනවත් වැඩ පිළිවෙළක් ආරම්භ කරලා තිබෙනවා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මට අවස්ථාව දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ අතුරු ප්‍රශ්න දෙක ඇහුවා නේ. [බාධා කිරීමක්] දැන් විනාඩි දහයක් ගත්තා. එක ප්‍රශ්නයකට විනාඩි දහයක් ගත්තොත් අපි කොහොමද මේවා ඉවර කරන්නේ?

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මම කෙටියෙන් අහන්නම්.

ගරු ඇමතිතුමනි, බලශක්ති ඇමතිතුමාත් සභාවේ ඉන්නවා. එතුමාම පැහැදිලිවම කියනවා, LNG බලාගාරය තුළ ගෑස් හදන්න ගියොත් එතුමා හොයා ගත්ත ගෑස් ටික ගන්න එකටත් අර්බුදයක් ඇති වෙනවා කියලා. දැන් මේ පරස්පරයත් එක්ක ඔබතුමා ඔය කියන විධියේ ඉන්ධන මිල අඩුවීම, එහෙම නැත්නම් විදුලිබිල අඩුවීම කියන සියලු කාරණාත් ගැන බරපතළ ගැටලුවක් තිබෙනවා. ඒ නිසා ඔබතුමන්ලා අවසානයේ හොයා ගත්ත නිධි ටිකෙන් ගෑස් අරගෙන ඒ හරහා පිරිමැසුම්දායී විධියට රටේ ඉන්ධන සහ බලශක්ති ප්‍රශ්නයට යම් විසඳුමක් දෙන්න. ගරු ඇමතිතුමා බලශක්ති ඇමතිතුමා හැටියට කියනවා, මේක ලබා දුන්නාට ප්‍රශ්නයක් නැහැ, හැබැයි ලබා දීමේදී එකඟතාව තිබෙන යම් යම් කොන්දේසි මත රටට බරපතළ හානියක් තිබෙනවා කියලා, 2028 දක්වා යැමේදී. ඒ නිසා ඔබතුමා කිව්වා වාගේ ඒ ප්‍රශ්නය විසඳෙන්නේ නැහැ. ඒ වාගේම මා අහනවා, ඔබතුමා ඉන්නේ මොන පුරෝහිත ගොඩේද කියලා.

**ගරු ගාමිණී ලොකුගේ මහතා**
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
මම ඉන්නේ ආණ්ඩුව පැත්තේ, ආයෙත් ප්‍රශ්න දෙකක් නැහැ.

## ජාතික සමුපකාර මණ්ඩල ගොඩනැඟිල්ල: සිදු කළ අලුත්වැඩියා කටයුතු
தேசிய கூட்டுறவுச் சபைக் கட்டிடம்: திருத்தப் பணிகள்
BUILDING OF NATIONAL CO-OPERATIVE BOARD: REPAIR WORK DONE

272/2020

**6. ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය පවත්වාගෙන යනු ලබන ගොඩනැඟිල්ලේ 2017 වර්ෂයේදී අභ්‍යන්තර අලුත්වැඩියා කටයුතු සිදුකර ඇති බවත්;

(ii) එහිදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය උල්ලංඝනය කරමින් කටයුතු කර ඇති බවත්;

(iii) ඒ හේතුවෙන් විශාල මූල්‍යමය පාඩුවක් සිදු වී ඇති බවත්;

එතුමා දන්නේද?

[ගරු බුද්ධික පතිරණ මහතා]

(ආ) (i) එම අලුත්වැඩියා කටයුතු සඳහා ටෙන්ඩර් කැඳවා තිබේද;

(ii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතනවල නම් කවරේද;

(iii) එම එක් එක් ආයතනය ඉදිරිපත් කරන ලද ටෙන්ඩරයේ වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) අදාළ ටෙන්ඩරය ප්‍රදානය කරන ලද ආයතනයේ නම කවරේද;

(v) එම ආයතනයට එම ටෙන්ඩරය ප්‍රදානය කිරීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ඇ) (i) අදාළ ටෙන්ඩරය ප්‍රදානය කරන ලද ආයතනයේ කාර්ය මණ්ඩල සාමාජිකයෙකු හා ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලයේ ප්‍රවාහන අංශයේ ලිපිකරුවෙකු අතර ඥාති සම්බන්ධතාවක් පවතින බව දන්නේද;

(ii) නොඑසේ නම්, ඒ පිළිබඳව පරීක්ෂණයක් සිදුකරන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

வர்த்தக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கைத் தேசிய கூட்டுறவுச் சபை இயங்கி வருகின்ற கட்டிடத்தில் 2017ஆம் ஆண்டில் உள்ளகத் திருத்தப் பணிகள் மேற்கொள்ளப் பட்டுள்ளன என்பதையும்;

(ii) அதன்போது பெறுகைச் செயன்முறையினை மீறி நடவடிக்கைகள் மேற்கொள்ளப் பட்டுள்ளன என்பதையும்;

(iii) அதன் காரணமாக நிதிரீதியான பாரிய நட்டம் ஏற்பட்டுள்ளதென்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி திருத்த நடவடிக்கைகளுக்காகக் கேள்வி மனு கோரப்பட்டுள்ளனவா என்பதையும்;

(ii) ஆமெனில், கேள்வி மனுக்களைச் சமர்ப்பித்த நிறுவனங்களின் பெயர்கள் யாவை என்பதையும்;

(iii) மேற்படி ஒவ்வொரு நிறுவனமும் சமர்ப்பித்துள்ள கேள்வி மனுக்களின் பெறுமதி வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(iv) குறித்த கேள்வி மனு வழங்கப்பட்ட நிறு வனத்தின் பெயர் யாதென்பதையும்;

(v) மேற்படி நிறுவனத்திற்குக் குறித்த கேள்வி மனு வழங்கப்பட்டமைக்கான காரணங்கள் யாவை என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(இ) (i) மேற்படி கேள்வி மனு வழங்கப்பட்ட நிறுவனத் தின் பதவியணியைச் சேர்ந்த உறுப்பின ரொருவருக்கும் இலங்கைத் தேசிய கூட்டுறவுச் சபையின் போக்குவரத்துப் பிரிவில் எழுதுவினை ஞராகக் கடமையாற்றும் ஒருவருக்கும் இடையில் உறவுமுறைத் தொடர்பு உள்ளதென்பதை அவர் அறிவாரா என்பதையும்;

(ii) இல்லையெனில், அதுதொடர்பில் விசாரணை நடத்தப்படுமா என்பதையும்;

அவர் மேலும் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Trade:

(a) Is he aware that -

(i) internal repairs have been done on the building in which the National Co-operative Board of Sri Lanka is housed in the year 2017;

(ii) the procurement process has been violated therein; and

(iii) a massive financial loss has taken place as a result?

(b) Will he state -

(i) whether tenders have been called for those repair work;

(ii) if so, the names of the institutions that submitted tenders;

(iii) the value of the tender submitted by each such institution, separately;

(iv) the name of the institution to which the tender was awarded; and

(v) the reasons for awarding the tender to that institution?

(c) Will he also state -

(i) whether he is aware that there is a relationship between a staff member of the institution to which the tender was awarded and a clerk attached to the transport section of the National Co-operative Board of Sri Lanka; and

(ii) if not, whether an inquiry would be conducted on that?

(d) If not, why?

**ගරු ලසන්ත අලගියවන්න මහතා (සමුපකාර සේවා, අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு லசந்த அலகியவன்ன - கூட்டுறவுச் சேவைகள், சந்தைப்படுத்தல் அபிவிருத்தி மற்றும் நுகர்வோர் பாதுகாப்பு இராஜாங்க அமைச்சர்)

(The Hon. Lasantha Alagiyawanna - State Minister of Co-operative Services, Marketing Development and Consumer Protection)

ගරු කථානායකතුමනි, වෙළෙඳ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) සමුපකාර සංවර්ධන කොමසාරිස්/ සමිති රෙජිස්ට්‍රාර් මඟින් ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය විසින් ලබා දී ඇති තොරතුරු අනුව ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය පවත්වාගෙන යනු ලබන ගොඩනැඟිල්ලේ 2017 වසරට අදාළ සුළු අභ්‍යන්තර අලුත්වැඩියාවලට අමතරව සිව්වන මහලේ නේවාසිකාගාරයේ කාමර අලුත්වැඩියාව පමණක් සිදු කර ඇත.

(ii) මෙහිදී ප්‍රසම්පාදන ක්‍රියාවලියක් උල්ලංඝනය වී ඇති බව විගණන වාර්තාවෙන් හෝ වෙනත් ලේඛන මඟින් හෙළි වී නොමැත.

(iii) උක්ත (අ) (ii) අනුව පැන නොනඟී.

(ආ) (i) නැත. මණ්ඩලීය ගෘහ නිර්මාණ ශිල්පී අංශයේ අධීක්ෂණයෙන් වැඩ කුලී පදනම මත සිදු කරවාගෙන ඇත.

(ii) ටෙන්ඩර් කැඳවීමක් සිදු වී නොමැති අතර අදාළ එක් එක් ද්‍රව්‍යයන්ට අදාළව මිල ගණන් කැඳවා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතනයන්ගෙන් මිලදී ගැනීම සිදුකර ඇත.

(iii) උක්ත (ආ) (i) අනුව පැන නොනඟී.

(iv) උක්ත (ආ) (i) අනුව පැන නොනඟී.

(v) උක්ත (ආ) (i) අනුව පැන නොනඟී.

(ඇ) (i) උක්ත (ආ) (i) අනුව පැන නොනඟී.

(ii) උක්ත (ආ) (i) අනුව පැන නොනඟී.

(ඈ) පැන නොනඟී.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මම රාජ්‍ය ඇමතිතුමාගෙන් සමුපකාර ක්ෂේත්‍රයට අදාළ කාරණයක් අහනවා. සමුපකාර ජාතික ප්‍රතිපත්තිය මේ වනකොට රටට එළි දක්වලා අවසානයි. විශේෂයෙන්ම සමුපකාර බැංකු පනත් කෙටුම්පත අලුතින් ගෙනෙන්නත්, සමුපකාර සමිති පනත සංශෝධනය කරන්නත් කටයුතු කරමින් සිටිනවා. මේ කටයුතු දීර්ඝ කාලයක් ඇදීගෙන යනවා. මේ කටයුත්තට මම හිතන හැටියට මේ වනකොට අවුරුදු තුනකට වැඩි කාලයක් ගතවෙලා තිබෙනවා. මම සමුපකාර විෂයය භාර කැබිනට් ඇමතිවරයා විධියට සිටියදීත් මේ පිළිබඳව වැඩ මුළු පවත්වලා අවසාන එකඟතාවකට ආපු බව මට මතකයි. මේ රජය බලයට පත්වෙලා මේ වනකොට අවුරුදු දෙකක් පමණ වනවා. සමුපකාරය කියන්නේ, ගමේ තිබෙන, ගමට වැදගත්ම සංවිධානය. මේ අතරේ, සතොස franchise අළෙවි සැල් දමන්න ගියොත් හෝ සතොස යටතේ පාලනය වන කඩ ගමේ දමන්න ගියොත් සමුපකාරය වැනසෙනවා. ඒ නිසා කළ යුතුව තිබෙන්නේ සමුපකාරයට සම්පත් ලබා දීලා, සමුපකාරයට උදවු කරනවා වාගේම, සණස ව්‍යාපාරයට උදවු කරන එකයි. ඒ වාගේම විවිධ සේවා සමුපකාර සමිති තිබෙනවා. ඒ සමිතිවලට උදවු කරන්න ඕනෑ. ඒ සමිති ශක්තිමත් කරන්න නම් බැංකු පනතටත්, සමුපකාර සමිති පනතටත් අදාළ මේ කෙටුම්පත් දෙක කඩිනමින් පාර්ලිමේන්තුවට ගෙනෙන්න ඕනෑ. මේ පනත් කෙටුම්පත් දෙක ගෙනෙන්න තිබෙන බලපෑම සහ ප්‍රශ්නය මොකක්ද?

**ගරු ලසන්ත අලගියවන්න මහතා**
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)

ඔබතුමන්ලා විසින් සකස් කරන ලද පනත් කෙටුම්පතට පසු, මම රාජ්‍ය අමාත්‍යවරයා විධියට පත්වීමෙන් අනතුරුව වෙළෙඳ අමාත්‍යතුමාගේ මඟ පෙන්වීම යටතේ මේ පනත් කෙටුම්පත් දෙකම ගෙනෙන්න කටයුතු කළා. ඇත්ත වශයෙන්ම බැංකු පනත් කෙටුම්පත සකස් කරලා තිබුණේ නැහැ. සමුපකාර සමිති පනත් කෙටුම්පත විතරයි සකස් කරලා තිබුණේ. සකස් කරලා තිබුණු සමුපකාර සමිති පනත් කෙටුම්පතත්, අලුතින් බැංකු සඳහා පනතකුත් කෙටුම්පත් කරලා මේ වනකොට ඒවා අවසාන අදියරේ තිබෙන්නේ. මේ සම්බන්ධයෙන් අදහස් හා යෝජනා එවන්න කියලා අපි සියලු පළාත් සභාවල සභාපතිවරුන්ට දන්වලා තිබෙනවා. නමුත් බැංකු පනත් කෙටුම්පතට සමුපකාර සමිතිවලින් යම්කිසි ආකාරයක විරෝධයක් තිබෙනවා. ඒ පිළිබඳව අදත් පළාත් මට්ටමින් සාකච්ඡා ගණනාවක් පැවැත්වෙනවා. ඒ කෙසේ වෙතත්, අපි කඩිනමින් මේ පනත් කෙටුම්පත් දෙක ගෙනා යුතුයි. එහෙම ගෙනෙන්නේ නැත්නම් සමුපකාර ක්ෂේත්‍රය දියුණු කරන්න පුළුවන්කමක් නැහැ කියන කාරණය රාජ්‍ය අමාත්‍යවරයා විධියට මාත් පිළිගන්නවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, එක්තරා වකවානුවක සමුපකාරයට අවශ්‍ය තොග ලබා දීම සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව - සතොස- තමයි කළේ. ඔබතුමා දන්නවා, මේ දවස්වල සතොස සහ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය "වහා ගිනි ඇවිළෙනසුලු" ආයතන බවට පත්වෙලා තිබෙන බව.

මම සමුපකාර විෂයය පිළිබඳ කැබිනට් අමාත්‍යවරයා වශයෙන් හිටපු වකවානුව -කෙටි කාලය තුළ- පිළිබඳව ඔබතුමා හොයලා බලන්න. නිලධාරින් ඒ සම්බන්ධයෙන් සාක්ෂි දෙයි. මේ ආයතනවල මොනවා හෝ චෝදනාවක් පුවත් පතක පළ වුණු විගස මම කවුරු හෝ පත් කරලා, ඒ ගැන ගැඹුරු පරීක්ෂණයක් කළා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 225දෙනාම උපදේශක කාරක සභාවට කැඳවලා, එහි පිටපත් ලබා දීලා, හොයා ගත් තොරතුරු මත කටයුතු කළා.

ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා මෙතැන හිටියා නම් කියයි, නැඟෙනහිර හේවාගම් කෝරළයේ සමුපකාර සමිතියේ වෙච්ච ප්‍රශ්නයකදී මම කටයුතු කරපු ආකාරය. ඒ වාගේම, සතොස වාහන අපහරණය කිරීම පිළිබඳව චෝදනා එල්ල වෙච්ච අවස්ථාවේදී මම කටයුතු කරපු ආකාරය පිළිබඳවත් එතුමා කියාවි. මම ඔබතුමාට කියන්නේ මෙයයි. මේ කාරණා ගැන ඔබතුමාත්, වෙළෙඳ ඇමතිතුමාත් මොකක් හෝ උත්තරයක් දෙනවාට අමතරව ගැඹුරු පරීක්ෂණයක් කරන්න බැරි ඇයි? දැන් උළු පිළිබඳවත්, සබන් පිළිබඳවත්, විශේෂයෙන්ම පසුගිය දවස්වල ප්‍රශ්නගත වුණු සීනි, සුදු ලූනු සහ ප්‍රශ්නගත වුණු අනෙකුත් ආහාර ද්‍රව්‍ය පිළිබඳවත් යමක් කිව යුතුයි. වරායෙන් කන්ටේනර් වැලිසර ගබඩාවට එනවා. තනි පුද්ගලයෙක් වැලිසර ගබඩාවෙන් කුඩා කිලෝ ගණනක් විකුණුවාට, මේ විධියට ටොන් ගණන් විකුණන්න බැහැ. මෙතැන වෙලා තිබෙන්නේ සුදු ලූනු කිලෝග්‍රෑම් 56,000ක වංචාවක්. එතකොට ඒ විධියට සුදු ලූනු විකුණුවා නම් ඒක කොහොමද විකුණුවේ? ඊළඟට, ආපහු එතැනින් සතොසට එනවා. කිලෝග්‍රෑම් එකක් දෙන්නේ රුපියල් 117ට; රුපියල් 125ට. ඊට පස්සේ මිලදී ගන්නේ කිලෝග්‍රෑම් එකක් රුපියල් 450ට. ඔබතුමා මේක සොයා බලන්න, CCTV පද්ධතිය හිතාමතා විනාශ කරලා තිබෙනවා. සතොස billing system එක හිතාමතාම අවුල් සහගත තත්ත්වයට පත් කරනවා; CCTV කඩනවා. මේ පිළිබඳව සොයා බලන්න ඔබතුමන්ලා සියලුදෙනාටම වගකීමක් තිබෙනවා. ඔබතුමන්ලා මේවාට ප්‍රාථමිකව උත්තර දෙන්න යන්නේ නැතිව ගැඹුරින් සොයා බලන්න බැරි ඇයි? මම මේ කියන්නේ උදාහරණයක් විතරයි. වැලිසර ගබඩාවට උළු කන්ටේනරයක් ආවා නම්, ඒ කන්ටේනරය ව්‍යාපාරිකයෙකු අතට ගිහිල්ලා නැහැ. කන්ටේනරය ගබඩාව ඇතුළේ තිබෙන්නේ. හැබැයි, ලියකියවිලි අනුව කන්ටේනරය ව්‍යාපාරිකයෙකු වෙනුවෙන් එළියට ගිහිල්ලා තිබෙනවා. ඒ උළු කන්ටේනරයම ආයෙත් ඒ ව්‍යාපාරිකයාගෙන් සතොස අරගෙන තිබෙනවා. එතකොට කන්ටේනරය physically ඇතුළේ තිබෙනවා; භෞතිකව වැලිසර ගබඩාවේ තිබෙනවා. කන්ටේනරය වැලිසර ගබඩාවේ තිබෙනවා; නමුත් ලියකියවිලිවලින් මේක විකිණිලා ආයෙත් ඇතුළට ඇවිල්ලා. මෙවැනි දේවල් වෙලා තිබෙනවා, රාජ්‍ය ඇමතිතුමා. මේ සම්බන්ධයෙන් මට දැන් උත්තරයක් ඕනෑ නැහැ. ඔබතුමා මේවා ගැන ගැඹුරින් හොයන්න. රහස් පොලීසිය ඇතුළු අදාළ සියලු කණ්ඩායම් යොදවා මේ පිළිබඳව හොයන්න. මම මේ ගැන කියන්නේ මමත් මේ තත්ත්වය ගැන යම් ආකාරයකින් දන්නා නිසායි. ඔබතුමා දන්නවා, මම විවේචනයක් කරන්නේ යම්කිසි සහේතුක හේතුවක් එක්ක බව. ඔබතුමාත් එක්ක අපි රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වැඩ කරපු විධිය ඔබතුමා දන්නවා. එවකට ඔබතුමා ඒ කාරක සභාවේ සභාපතිවරයා. ඒ නිසා ඔබතුමාත් දන්නවා, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ කටයුතු කරනකොට නිලධාරින් කටයුතු කරපු ආකාරය පිළිබඳව. හමුදාවේ

[ගරු බුද්ධික පතිරණ මහතා]

කෑම ටෙන්ඩරය සම්බන්ධයෙනුත් ඔබතුමා සෘජුව කටයුතු කළා. මම කියන්නේ මේ ප්‍රශ්නයේදීත් අන්න ඒ වාගේ ගැඹුරින් හොයන්න කියලායි. ඒ ගැන මොකක් හෝ උත්තරයක් පාර්ලිමේන්තුවට දෙන්න එපා. කැබිනට් ඇමතිතුමාටත් ඒක කියන්න.

**ගරු ලසන්ත අලගියවන්න මහතා**
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)
ගරු කථානායකතුමනි, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය සහ සතොස කියන්නේ ආයතන දෙකක්. ඒ ආයතන දෙක තුළ මොනම විධියකින්වත් ගැටීමක් ඇති වෙලා නැහැ. ඒක විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ. ඒ වාගේම, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියත්, සමුපකාර දෙපාර්තමේන්තුවත් රාජ්‍ය අමාත්‍යාංශය යටතට තමයි ගැසට් කරලා තිබෙන්නේ. සතොස ආයතනය ගැසට් කරලා තිබෙන්නේ වෙළෙඳ අමාත්‍යාංශය යටතට. ඒ අනුව, පසුගිය දිනවල ඇතිවුණු සුදු ලූනු වංචාව පිළිබඳව විශේෂයෙන්ම ගරු වෙළෙඳ අමාත්‍යතුමාගේ මහ පෙන්වීම යටතේ මේ වන විට රහස් පොලීසිය ඉහළම මට්ටමේ පරීක්ෂණයක් සිදු කරමින් පවතිනවා. ඒ සම්බන්ධව ඔබතුමන්ලාටත් යම්කිසි ආකාරයක හෝ තොරතුරු තිබෙනවා නම් කරුණාකර අපට ඉදිරිපත් කරන්න. අපි දන්නවා, විශේෂයෙන්ම මේ ආයතනවල වංචා අදටත් සිද්ධ වෙන බව. අපි ඒක පිළිගන්න ඕනෑ. මේවා අවම කර ගැනීමයි අපේ ඉලක්කය. මීට සම්බන්ධ ඔබතුමන්ලා දන්නා තොරතුරු තිබෙනවා නම් කරුණාකර අපට ඉදිරිපත් කරන්න. අපට ඕනෑ මේවා නවත්වා ගන්නයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා, 7වැනි ප්‍රශ්නය අහන්න.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මම ඒ ප්‍රශ්නය අහන්න කලින් වෙළෙඳ ඇමතිතුමාට මේ ගැනත් කියන්න ඕනෑ. රහස් පොලීසියේ නිලධාරින්ට කියන්න, තුෂාන් ගුණවර්ධන මහත්මයා මේ ගැන ආන්දෝලනාත්මක ප්‍රකාශ දෙකක් චමුදිත සමරවික්‍රම මහත්මයාගේ YouTube channel එකේ කරලා තිබෙන බව. ඒ නිසා රහස් පොලීසියට කියන්න තුෂාන් ගුණවර්ධන මහත්මයාගෙන් මේ ගැන ප්‍රශ්න කරන්න කියලා. තවම එතුමාගෙන් ප්‍රශ්න කරන්නේ නැහැ. එතුමා ජනාධිපතිතුමා අද ලංකාවට එනතුරු බලාගෙන ඉන්නවා files වගයක් දෙන්න. එතුමා ජනාධිපතිතුමාට files ටික දෙනවා වාගේම, රහස් පොලිස් නිලධාරින්ටත් කියන්න තුෂාන් ගුණවර්ධන මහත්මයා කැඳවලා මේ ප්‍රශ්න කිරීම් කරන්න කියලා. ඇයි එතුමා කැඳවන්නේ නැත්තේ? බන්දුල ගුණවර්ධන මැතිතුමාගේ ප්‍රකාශය ගැන විතරයි රහස් පොලීසිය එතුමාගෙන් ප්‍රශ්න කරන්නේ.

**ගරු ලසන්ත අලගියවන්න මහතා**
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)
රහස් පොලීසියට කැඳවන්නේ කවුද, කැඳවන්නේ නැත්තේ කවුද කියන එක ගැන වෙළෙඳ ඇමතිතුමාටවත්, මටවත් තීරණය කරන්න බැහැ. පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම පමණයි අපට කරන්න පුළුවන්කමක් තිබෙන්නේ. ඒ අනුව, උපරිම පරීක්ෂණයක් කිරීම රහස් පොලීසියේ අයට පැවරෙන වගකීමක්. එම නිසා මම හිතන විධියට අනිවාර්යයෙන්ම එතුමා රහස් පොලීසියට කැඳවිය යුතුයි. එතුමා කැඳවලා ඒ තොරතුරුත් ලබාගෙන විශේෂයෙන්ම මේ පරීක්ෂණ කටයුතු නිම කරයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 7 -325/2020- (2), ගරු බුද්ධික පතිරණ මහතා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු කථානායකතුමනි, එතුමාගේ ප්‍රශ්නයට ඇමතිතුමා උත්තර දෙන්නයි හිටියේ. නමුත් ඇමතිතුමාට හදිසි රැස්වීමක් නිසා යන්න සිද්ධ වුණා. මේ ප්‍රශ්නයට ඔබතුමාට ඉදිරියේදී උත්තර දෙන්නම්.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, 7වැනි ප්‍රශ්නයත්, 8වැනි ප්‍රශ්නයත් අසා තිබෙන්නේ වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් නිසා එම ප්‍රශ්නවලට උත්තර දෙවැනි වටයේදී ලබා ගනිමු. ගරු ඇමතිතුමා දෙවැනි වටයට කලින් ගරු සභාවට ආවොත් උත්තර ලබා ගන්න බලමු.

## වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව පවරා ගත් ඉඩම්: උතුරු පළාත
### வனசீவராசிகள் பாதுகாப்புத் திணைக்களம் சுவீகரித்துள்ள காணிகள்: வட மாகாணம்
### LANDS ACQUIRED BY WILDLIFE CONSERVATION DEPARTMENT: NORTHERN PROVINCE

579/2020

**9. ගරු චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)
වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (3):

(අ) (i) වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් උතුරු පළාතේ එක් එක් දිස්ත්‍රික්කයෙන් පවරාගෙන ඇති ඉඩම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ප්‍රමාණය උතුරු පළාතේ සමස්ත භූමි ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) මෙලෙස ඉඩම් පවරා ගැනීමේදී, පෞද්ගලික ඉඩම්, කෘෂිකාර්මික වැව්, කෘෂිකාර්මික ඉඩම් සහ පශු සම්පත් සඳහා වූ තෘණ භූමි ඉඩම් ද පවරාගෙන ඇති අතර එය ජනතාවගේ ජීවනෝපායට මෙන්ම සහජීවනයටද අහිතකර ලෙස බලපෑම් කර ඇති බව එතුමා දන්නේද?

(ඇ) උක්ත ඉඩම් පවරා ගැනීමේදී දිස්ත්‍රික් ලේකම්වරයාගේ, ප්‍රාදේශීය ලේකම්වරයාගේ සහ පළාත් ඉඩම් කොමසාරිස්වරයාගේ උපදෙස් ලබා නොගැනීමට හේතු කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

வனசீவராசிகள் மற்றும் வனப் பாதுகாப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வட மாகாணத்தின் ஒவ்வொரு மாவட்டத்திலும் வனசீவராசிகள் பாதுகாப்புத் திணைக்களத் தினால் சுவீகரிக்கப்பட்டுள்ள காணிகளின் பரப்பளவு தனித்தனியாக எவ்வளவென் பதையும்;

(ii) அந்த அளவானது வட மாகாணத்திற்கான மொத்தக் காணிப் பரப்பளவின் எத்தனை சதவீதம் என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இவ்வகையில் காணிகள் சுவீகரிக்கப்படும்போது, தனியார் காணிகள், விவசாய வாவிகள், விவசாயக் காணிகள் மற்றும் கால் நடைகளுக்கான புற்றரைகளும் சுவீகரிக்கப்பட்டுள்ளதோடு, அது மக்களின் வாழ்வா தாரத்தின் மீது மட்டுமன்றி சகவாழ்வின் மீதும் பாதகமான தாக்கத்தினை ஏற்படுத்தியுள்ளதென்பதை அவர் அறிவாரா?

(இ) மேற்படி காணிகள் சுவீகரிக்கப்படும்போது, மாவட்டச் செயலாளர், பிரதேச செயலாளர் மற்றும் மாகாணக் காணி ஆணையாளர் ஆகியோரின் ஆலோசனைகள் பெற்றுக்கொள்ளப்படாமைக்கான காரணங்கள் யாவை என்பதையும் அவர் இச் சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Wildlife and Forest Conservation:

(a) Will he inform this House-

(i) separately, the extent of land acquired by the Wildlife Conservation Department from each district in the Northern Province; and

(ii) the extent of the aforesaid land area as a percentage from the total extent of land in the Northern Province?

(b) Is he aware that private lands, agricultural tanks, agricultural lands and grass lands for livestock have been acquired in that manner and it has an adverse impact on the livelihood and the co-existence of the people?

(c) Will he also inform this House the reason for not taking advice from the District Secretary, Divisional Secretary and the Provincial Land Commissioner when such lands are acquired?

(d) If not, why?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු කථානායකතුමනි, වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් උතුරු පළාත තුළ එක් එක් දිස්ත්‍රික්කයේ ඉඩම් පවරා ගැනීමක් සිදු කර නොමැති අතර, පහත ඉඩම් ප්‍රමාණ රක්ෂිත ලෙස ප්‍රකාශයට පත් කර ඇත.

ප්‍රකාශයට පත් කර ඇති වනජීවී රක්ෂිතවල තොරතුරු (අ) (ii) මඟින් දැක්වේ.

(ii)

| දිස්ත්‍රික්කය | රක්ෂිතයේ නම | ප්‍රකාශිත දිනය | භෞමික වර්ග ප්‍රමාණය (හෙක්ටෙයාර) | දිස්ත්‍රික්කයේ රක්ෂිතවල සමස්ත භෞමික වර්ග ප්‍රමාණය (හෙක්ටෙයාර) | උතුරු පළාතෙන් ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| මන්නාරම දිස්ත්‍රික්කය | ආදම්ගේ පාලම ජාතික උද්‍යානය | 2015.06.22 | 0 | | |
| | මඩු පාර ජාතික උද්‍යානය | 2015.06.22 | 163067.39 | | |
| | වෙඩිතලතිව් ස්වභාව රක්ෂිතය | 2016.03.01 | 6711.4 | 175947.69 | 19.8% |
| | වාන්කාලෙයි අභය භූමිය | 2008.09.08 | 1838.8 | | |
| | යෝධ වැව අභය භූමිය | 1954.09.24 | 4330.1 | | |
| යාපනය දිස්ත්‍රික්කය | ඩෙල්ෆ්ට් ජාතික උද්‍යානය | 2015.06.22 | 1735.5 | | |
| | නාගර් කෝවිල් ස්වභාව රක්ෂිතය | 2016.03.01 | 2679.9 | 15567.63 | 1.7% |
| | පරෙයිතිතිව් අභය භූමිය | 1973.05.18 | 0 | | |
| මුලතිව් දිස්ත්‍රික්කය | නයාරු ස්වභාව රක්ෂිතය | 2017.01.24 | 3529.52 | | 0.3% |
| | නන්දිකඩාල් ස්වභාව රක්ෂිතය | 2017.01.24 | 2991.1 | 7059.04 | |
| | වවුනිකුලම් අභය භූමිය | 1963.06.21 | 538.42 | | |
| වවුනියා දිස්ත්‍රික්කය | - | - | - | - | - |
| කිලිනොච්චි දිස්ත්‍රික්කය | චුන්ඩිකුළම් ජාතික උද්‍යානය | 2015.06.22 | 19565.33 | 19565.33 | 1.9% |
| එකතුව | | | | | 23.7% |

[ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා]

(ආ) ජාතික රක්ෂිත ප්‍රකාශයට පත් කිරීමේදී ජනතාව පදිංචි ඉඩම් ඉවත් කර ප්‍රකාශයට පත් කර ඇත. නමුත් අභය භූමිය තුළ රජයේ මෙන්ම පෞද්ගලික ඉඩම්, ගොවිබිම් පැවතිය හැක. පෞද්ගලික ඉඩම් පවරා ගැනීමක් සිදු කර නැති අතර, අභය භූමි තුළ පාරම්පරික ඉඩම්වල කෘෂිකාර්මික කටයුතු සිදු කර ගෙන යා හැකිය.

(ඇ) ඔව්.

රක්ෂිතවලින් වැඩි කොටසක් ප්‍රකාශයට පත් කිරීම සිදු කරන ලද්දේ 2009 යුද්ධය නිමවීමත් සමඟ උතුරු පළාත සඳහා රාජ්‍ය ආයතන 30ක් පමණ සම්බන්ධ වී සකස් කළ ISEA (Integrated Strategic Environmental Assessment of Northern Province) මඟිනි. මෙම ක්‍රියාවලිය අවසන් කර එම තොරතුරු එවකට සේවය කළ දිස්ත්‍රික් ලේකම්වරු හා ප්‍රාදේශීය ලේකම්වරු වෙත ඉදිරිපත් කර එකඟතාව ලබා ගෙන ඇත.

(ඈ) අදාළ නොවේ.

**ගරු චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)

நன்றி, கௌரவ அமைச்சர் அவர்களே! வன இலாகா திணைக்களத்தினதும் வனசீவராசிகள் திணைக்களத்தினதும் செயற்பாடுகள் காரணமாக எங்களுடைய பிரதேசத்தில் பல்வேறுபட்ட பிரச்சினைகள் எழுந்திருக்கின்றன. பிரதேச செயலாளரினது அனுமதியைப் பெற்றுத்தான் இது தொடர்பான வர்த்தமானி அறிவித்தல் வெளியிடப்பட்டதாக தற்பொழுது நீங்கள் கூறினீர்கள், GPSமூலம் வனப் பிரதேசங்களை அடையாளப்படுத்தி, அவற்றை gazette பண்ணும்போது, பல தரப்பட்ட நிலங்கள் அதாவது, மக்களுடைய விவசாய நிலங்கள், வாழ்வாதார நிலங்கள், பாடசாலை விளையாட்டு மைதானங்கள், கத்தோலிக்க ஆலயங்கள் என்பனவும் அதில் உள்ளடங்கி இருக்கின்றன.

கௌரவ அமைச்சர் அவர்களே, மக்கள் சென்று தங்களுடைய பிரச்சினைகளைக் கூற முற்படுகின்றபோது, அவர்களை வேற்று இன மக்களாகக் கருதுகின்ற அல்லது இனரீதியாக வஞ்சிக்கின்ற செயற்பாடுகளைத்தான் வன இலாகா மற்றும் வனசீவராசிகள் திணைக்கள அதிகாரிகள் குறிப்பாக வன்னி மாவட்ட அதிகாரிகள் தொடர்ச்சியாகச் செய்துகொண்டு வருகின்றார்கள். நான் இது தொடர்பாக கௌரவ அமைச்சர் சீ.பி. ரத்நாயக்க அவர்களிடமும் கூறியிருக்கின்றேன். அண்மையில் முல்லைத்தீவு மாவட்டத்தின் கரைதுரைப்பற்றுப் பிரதேச செயலகத்திற்குட்பட்ட தண்ணிமுறிப்பு பிரதேசத்தில் குருந்தூர் குளத்துக்குக்கீழ் இருக்கின்ற வயல்நிலங்களில் பயிர்செய்வதை வன இலாகா திணைக்களத்தினர் எதேச்சையாகத் தடுத்து நிறுத்தி இருக்கின்றார்கள். யுத்தம் முடிந்ததன் பின்பு, தொடர்ச்சியாக நெற்செய்கை மேற்கொள்ளப்பட்டு வந்த இந்தப் பிரதேசத்தில், தற்பொழுது நெற்செய்கை மேற்கொள்வதற்குத் தடைவிதித்திருக்கிறார்கள். இது தொடர்பாக அமைச்சுக்குத் தெரியப்படுத்தியபோது, வன இலாகா திணைக்களத்தின் பணிப்பாளர் கூறுகின்றார், “நான் இவ்விடயம் தொடர்பில் ஒரு report கேட்டிருக்கின்றேன்; அது இன்னும் கிடைக்கவில்லை” என்று. வன இலாகா திணைக்களத்துக்கும் வட மாகாணத்தில் இருக்கின்ற அதிகாரிகளுக்கும் இடையில் ஒரு கடிதப் போக்குவரத்துக்கு கிட்டத்தட்ட ஒரு வருட காலம் செல்கின்றது.

அதேபோல, முல்லைத்தீவு மாவட்டத்துக்கும் மன்னார் மாவட்டத்துக்கும் இடையில் இருக்கின்ற கூராய்க் குளத்தை தங்களுடைய அரசாங்கத்தின் நிதிஒதுக்கீட்டில் - 60 மில்லியன் ரூபாய் செலவில் - புனரமைப்புச் செய்யமுற்பட்டபோது, அதுவும் வன இலாகா திணைக்களத்தினால் நிறுத்தப்பட்டிருக்கின்றது. இவ்வாறு பிரச்சினைகள் தொடர்ந்துகொண்டு இருக்கின்றன. ஆகையால், இவற்றை நீங்கள் எவ்வாறு முடிவுக்குக் கொண்டுவரப்போகின்றீர்கள்? என நான் கேட்க விரும்புகின்றேன்.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු මන්ත්‍රීතුමනි, ඔය ප්‍රශ්නය තිබෙන්නේ ඔබතුමන්ලාගේ දිස්ත්‍රික්කයට විතරක් නොවෙයි. අපේ ප්‍රදේශවලත් ඔය ප්‍රශ්නය තිබෙනවා. [බාධා කිරීමක්] Wait. I will answer that.

**ගරු චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)

Forest Department එක, Wildlife Conservation Department එක ලංකාවේම- [බාධා කිරීමක්] අපට තිබෙන ප්‍රශ්නය මේකයි. ඒ නිලධාරින්ට report එක ගන්න එහේ ඉඳන් කොළඹට එන්න සැහෙන කාලයක් යනවා. එම නිසා අපේ මිනිස්සු කුඹුරු කරන්නේ නැතිව නිකම් ඉන්නවා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ප්‍රශ්න ගණනාවක් කිව්වා. ඒවා අපේ ප්‍රදේශවලත් තිබෙනවා. එම නිසා තමයි ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා කිව්වේ, මේවා නිවැරැදි කරන්න කියලා. එහෙම කිව්වාම ඔබතුමා නොවෙයි, හුඟක් අය "පරිසරය විනාශ කරන තීන්දු අරගෙන තිබෙනවා" කියලා ජනාධිපතිතුමාට පහර ගැහුවා. ඇත්තටම අපේ ප්‍රදේශවලත් ප්‍රශ්න තිබෙනවා. එක්කෝ ගෙදර තිබෙන්නේ වනජීවී කලාපයට අයත් ඉඩමේ. නැත්නම් ගෙදර වැසිකිළිය තිබෙන්නේ වනජීවී කලාපයට අයත් ඉඩම් කොටසේ. එහෙම නැත්නම් වැසිකිළිය තිබෙන්නේ එක පැත්තක; ගෙදර තිබෙන්නේ අනික් පැත්තේ. මේ වාගේ ප්‍රශ්න අපේ ප්‍රදේශවලත් තිබෙනවා. හැබැයි, ඒවා නිවැරැදි කරන්න ගියාම ඒ කාරණය දේශපාලනයට හරවා ගත්තා. [බාධා කිරීමක්] ඔබතුමා නොවෙයි, සමහර අය. මම ඔබතුමාට නොවෙයි කියන්නේ. සමහර අය ඒ කාරණය දේශපාලනයට හරවා ගත්තා. මේවා නිවැරැදි කළ යුතුයි.

ඊළඟට, මුලතිව් දිස්ත්‍රික්කයේ වනජීවී කලාප ලෙස ගැසට් කර තිබෙන්නේ නයාරු රක්ෂිතයයි, නන්දිකඩාල් රක්ෂිතයයි විතරයි. 2017 වර්ෂයේදී තමයි ඒවා ගැසට් කර තිබෙන්නේ. මුලතිව්වල වනජීවී කලාප විධියට ගැසට් කරලා තිබෙන්නේ ඒවා විතරයි. අනෙක් තැන්වල එහෙම ප්‍රශ්නයක් තිබෙනවා නම් ඔබතුමා ඒ විස්තර අපිට දන්වන්න.

**ගරු චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)

ගරු ඇමතිතුමනි, තැන් කිහිපයක ඒ ප්‍රශ්නය තිබෙනවා. වව්නියාව, මන්නාරම, මුලතිව්වල තිබෙන Forest Department එකේ සහ Wildlife Conservation Department එකේ ප්‍රශ්න ටිකක් වැඩියෙන් තිබෙනවා. ජනතාව බොහොම අමාරුවෙන් ජීවත් වෙන්නේ. ඔබතුමන්ලා team එකක් එවන්න. ඒ තිබෙන ප්‍රශ්න ටික මම පෙන්වන්නම්. එහෙම පෙන්වූවාට පස්සේ ආණ්ඩුව විධියට ඔබතුමන්ලා තීන්දුවක් ගන්න.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු කථානායකතුමනි, එතුමාගේ ඉල්ලීම ගැන මම වනජීවී හා වන සංරක්ෂණ ඇමතිතුමා දැනුවත් කරන්නම්. එතුමා තව ටිකකින් ඒවි.

**ගරු චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)

කොවිඩ් ඇවිල්ලා අවුරුද්දකට වැඩි කාලයක් වෙනවා නේ. අපේ ප්‍රදේශවලට විතරයිද, කොවිඩ් තිබෙන්නේ? කොවිඩ් තිබුණත් අනෙක් ප්‍රදේශවල වැඩ කරනවා. අපේ ප්‍රදේශවල නිලධාරින් හරියට වැඩ කරන්නේ නැහැ. Forest Department එකේ හා Wildlife Conservation Department එකේ ඉන්න උතුරු ප්‍රදේශයේ ඉන්න නිලධාරින් හරියට වැඩ කරන්නේ නැහැ. අපේ ජනතාවට දිගටම ප්‍රශ්න දානවා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රදේශයේ විතරක් නොවෙයි, මගේ ආසනයේත් -නිකවැරටියේත්- ගිය මාසයේ අලි ගහලා තුන්, හතර දෙනෙක් මැරුණා. නිලධාරින් ගෙන්වා ගන්න අමාරු වුණා. කොවිඩ් අර්බුදයත් එක්ක ඒ වාගේ ප්‍රශ්න තිබෙනවා. අපි ඒක නැහැයි කියන්නේ නැහැ. ඔබතුමාගේ දිස්ත්‍රික්කයට කියලා වෙනස් විධියකට අපි සලකන්නේ නැහැ. එහෙම ප්‍රශ්නයක් ඇති කර ගන්න එපා. අපටත් එවැනි ප්‍රශ්න තිබෙනවා. මම ඇමතිවරයෙක් වෙලාත් මට ඒ වාගේ ගැටලුවක් ඇති වුණා. නිකවැරටියේ ඒ වාගේම සිදුවීමක් වුණා. ඊයේ මම යාපහුවේ සිටියා. යාපහුවේත් ඒ වාගේම ප්‍රශ්නයක් තිබෙනවා. කොවිඩ් වසංගතය තිබුණත් සමහරු මහන්සි වෙලා වැඩ කරනවා. වරායේ සේවකයෝ සම්පූර්ණයෙන්ම වැඩ කරනවා. සෞඛ්‍ය ක්ෂේත්‍රය ගත්තාම වෛද්‍යවරයාගේ ඉඳලා සනීපාරක්ෂක කම්කරුවා දක්වා හැමෝම වැඩ කරනවා. ත්‍රිවිධ හමුදාවේ අය වැඩ කරනවා. පොලීසියේ අය වැඩ කරනවා. නගර සභාවල පාරවල් පවිත්‍ර කරන අය වැඩ කරනවා. පඩි අරගෙන ගෙවල්වල ඉන්න අයත් ඉන්නවා. අපි නැහැයි කියන්නේ නැහැ. ඒක ගැටලුවක්. ඒකයි, රට වහනවාට මම පෞද්ගලිකවම විරුද්ධ. ඒක ආණ්ඩුවේ මතය නොවෙයි, මගේ මතය. මගේ මතය වැඩක් නැහැ. රජයේ මතයයි අන්තිමට ක්‍රියාත්මක වෙන්නේ. අපි විශ්වාස කරනවා, කොවිඩ් අර්බුදයෙන් අපට ඉක්මනට මිදෙන්න පුළුවන් වෙයි කියලා. Vaccines සියලුදෙනාට ලබා දුන්නාට පසු අපට පුළුවන් වෙයි, ඒ ප්‍රශ්නවලට විසඳුම් දෙන්න. මම සී.බී. රත්නායක ඇමතිතුමාට කථා කරලා ඔබතුමාගේ ප්‍රශ්නය එතුමාට කියලා team එකක් යවලා ඒ ප්‍රශ්න ටික විසඳන්න කටයුතු කරන්නම්.

## කිලිනොච්චි දිස්ත්‍රික් මහ රෝහල: හදිසි ප්‍රතිකාර ඒකකය

### கிளிநொச்சி மாவட்ட பொது மருத்துவமனை: திடீர் விபத்துப் பிரிவு

### KILINOCHCHI DISTRICT GENERAL HOSPITAL: EMERGENCY TREATMENT UNIT

594/2020

**10. ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කිලිනොච්චි දිස්ත්‍රික් මහ රෝහල සඳහා අනුමත සේවක සංඛ්‍යාව;

(ii) එම රෝහලේ මේ වනවිට සිටින සේවක සංඛ්‍යාව;

(iii) එම රෝහලේ මේ වනවිට පවතින පුරප්පාඩු සංඛ්‍යාව;

(iv) රෝහලේ රාජකාරියේ යෙදී සිටින වෛද්‍යවරුන් සහ හෙදියන්ගේ සංඛ්‍යාව ඔවුන්ගේ සන්නිවේදන භාෂාව අනුව වෙන් වෙන් වශයෙන්;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) කිලිනොච්චි දිස්ත්‍රික් මහ රෝහල සඳහා හදිසි අනතුරු ප්‍රතිකාර ඒකකයක් ඉදිකිරීම සඳහා 2019.02.15 දින මුල්ගල් තැබූ බව දන්නේද;

(ii) එම ඒකකය ඉදිකිරීම සඳහා මුදල් වෙන් කර තිබේද;

(iii) එසේ නම්, එම ඉදිකිරීම් කටයුතු මේ වනතෙක් ආරම්භ නොකිරීමට හේතු කවරේද;

(iv) මුදල් වෙන් කර නොමැති නම්, ඒ සඳහා හේතු කවරේද;

(v) එම රෝහලේ හදිසි අනතුරු ප්‍රතිකාර ඒකකය ආරම්භ කරනු ලබන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கிளிநொச்சி மாவட்ட பொது மருத்துவமனைக்கான அங்கீகரிக்கப்பட்ட ஊழியர்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) மேற்படி மருத்துவமனையில் தற்போதுள்ள ஊழியர்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(iii) மேற்படி மருத்துவமனையில் இன்றளவில் நிலவும் பதவி வெற்றிடங்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(iv) மருத்துவமனையில் கடமையில் ஈடுபட்டுள்ள மருத்துவர்கள் மற்றும் தாதியர்களின் எண்ணிக்கை இவர்களின் தொடர்பாடல் மொழிக்கமைய வெவ்வேறாக யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) கிளிநொச்சி மாவட்ட பொது மருத்துவ மனைக்குத் திடீர் விபத்துப் பிரிவொன்றை நிறுவு வதற்கு 2019.02.15 ஆம் திகதியன்று அடிக்கல் நாட்டப்பட்டதென்பதையும்;

(ii) மேற்படி பிரிவை நிறுவுவதற்கு நிதி ஒதுக்கப் பட்டுள்ளதா என்பதையும்;

(iii) ஆமெனில், மேற்படி நிர்மாணப்பணிகள் இது வரை ஆரம்பிக்கப்படாமைக்கான காரண ங்கள் யாவை என்பதையும்;

(iv) நிதி ஒதுக்கப்படவில்லையெனில், அதற்கான காரணங்கள் யாவையென்பதையும்;

(v) மேற்படி மருத்துவமனையில் திடீர் விபத்துப் பிரிவு ஆரம்பிக்கப்படும் திகதி யாதென் பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health:

(a) Will he inform this House-

(i) the approved cadre of the Kilinochchi District General Hospital;

(ii) the cadre attached to that hospital at present;

(iii) the number of vacancies existing in that hospital at present; and

(iv) the number of doctors and nurses employed in the hospital in relation to their language of communication, separately?

[ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා]

(b) Will he also inform this House-

(i) whether he is aware that the foundation stone was laid to construct an Emergency Treatment Unit at the Kilinochchi District General Hospital on 15.02.2019;

(ii) whether funds have been allocated to construct that unit;

(iii) if so, the reason for not commencing construction activities of that unit;

(iv) if funds have not been allocated, the reasons for that; and

(v) the date when the Emergency Treatment Unit of that hospital would be commenced?

(c) If not, why?

**ගරු (මහාචාර්ය) චන්න ජයසුමන මහතා (ඖෂධ නිෂ්පාදනය, සැපයීම හා නියාමන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) சன்ன ஜயசுமன - ஔடத உற்பத்திகள், வழங்குகைகள் மற்றும் ஒழுங்குறுத்துகை இராஜாங்க அமைச்சர்)
(The Hon. (Prof.) Channa Jayasumana - State Minister of Production, Supply and Regulation of Pharmaceuticals)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) කිලිනොච්චි දිස්ත්‍රික් මහ රෝහල සඳහා අනුමත සේවක සංඛ්‍යාව පන්සිය දහනවයකි.

(ii) එම රෝහලේ මේ වන විට සිටින සේවක සංඛ්‍යාව හාරසිය දහනවයකි.

(iii) එම රෝහලේ මේ වන විට පවතින පුරප්පාඩු සංඛ්‍යාව සියයකි.

(iv) රෝහලේ රාජකාරියේ යෙදී සිටින වෛද්‍යවරු හා හෙදියන්ගේ සංඛ්‍යාව ඔවුන්ගේ සන්නිවේදන භාෂාව අනුව වෙන් වෙන් වශයෙන් පහත දැක්වේ.

| තනතුර | සිංහල හා ඉංග්‍රීසි | දෙමළ හා ඉංග්‍රීසි |
|---|---|---|
| වෛද්‍ය | 27 | 35 |
| හෙද | 65 | 49 |

(ආ) (i) ඔව්.

(ii) මුදල් වෙන් කර නොමැත.

(iii) හදිසි අනතුරු ප්‍රතිකාර ඒකකය ඉදිකිරීම සඳහා ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී තිබුණද මුදල් වෙන්වීමක් සිදුවී නොමැති අතර මුල් ගල තැබීම පමණක් සිදුව ඇත.

මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ 2020.09.03 දිනැති 05/2020 ජාතික අයවැය චක්‍රලේඛ මඟින් පවතින සීමිත මූල්‍ය රාමුව යටතේ නව ඉදිකිරීම් ආරම්භ කිරීම අවුරුදු දෙකක් සඳහා කල් තබන ලෙස දැනුම් දී ඇති බැවින් මෙම ගොඩනැඟිලි සංකීර්ණය ඉදිකිරීම් මෙම වර්ෂයේ ආරම්භ කළ නොහැකි අතර 2023 වර්ෂය සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමට අපේක්ෂා කරනු ලැබේ.

(iv) පැන නොනඟී.

(v) 2023 වර්ෂයේ මුදල් වෙන් කිරීමට අපේක්ෂා කරන බැවින් හදිසි අනතුරු ඒකකය ආරම්භ කරනු ලබන දිනය දැනට නිශ්චිතව ප්‍රකාශ කළ නොහැක.

(ඇ) පැන නොනඟී.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ இராஜாங்க அமைச்சர் அவர்களே, கிளிநொச்சி மாவட்ட பொது வைத்தியசாலைக்கான பணியாட்டொகுதியில் நூற்றுக்கும் மேற்பட்ட வெற்றிடங்கள் இருக்கின்றன. உங்களுடைய தகவலின்படி, இவ்வைத்தியசாலையிலே வைத்தியர்கள், தாதியர்கள், ஏனைய உத்தியோகத்தர்கள் என நூறு வெற்றிடங்கள் இருக்கின்றன. இவற்றை நிரப்பாமல் எவ்வாறு அந்த வைத்தியசாலையினால் தனது சேவைகளை முழுமையாக அந்த இடத்திலே முன்னெடுத்துச் செல்லமுடியும்? உங்களால் அதற்கான மாற்றுவழி எதனையேனும் சொல்லமுடியுமா?

**ගරු (මහාචාර්ය) චන්න ජයසුමන මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) சன்ன ஜயசுமன)
(The Hon. (Prof.) Channa Jayasumana)

ගරු මන්ත්‍රීතුමනි, ලංකාවේ රෝහල් බොහොමයක වෛද්‍ය සහ හෙද නිලධාරින්ගේ පුරප්පාඩු තිබෙනවා. තවත් කණ්ඩායම් දෙකක් ඉදිරියේදී හෙද නිලධාරින් ලෙස සේවයට එකතු වෙන්න නියමිතයි. ඔවුන් අවශ්‍ය ස්ථානගත කිරීම් කරනවා. ඒ වාගේම වෛද්‍යවරුන්ගේ නව පත්වීම් ඉදිරි සති කිහිපයකදී ලබා දෙන්න නියමිතයි. ඒ අනුව කිලිනොච්චි රෝහලේ තිබෙන අඩු පාඩුත් සියල්ලම නොවුණත් හැකි උපරිමයෙන් සම්පූර්ණ කරන්න උත්සාහ දරනවා.

ඒ රෝහලේ වාගේම රට පුරා තිබෙන අනෙක් රෝහල්වලත් කාර්ය මණ්ඩලවල අඩු පාඩු තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. මෙය කිලිනොච්චි දිස්ත්‍රික් මහ රෝහලට පමණක් විශේෂිත වූ ප්‍රශ්නයක් නොවෙයි. මහ රෝහල්වල සහ දිස්ත්‍රික් මහ රෝහල්වල තිබෙන මේ අඩු පාඩු සම්පූර්ණ කිරීමට අපි හැකි ඉක්මනින් කටයුතු කරනවා.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ இராஜாங்க அமைச்சர் அவர்களே, உங்களுடைய தகவலின்படி, அங்கு சிங்களம் மற்றும் ஆங்கில மொழி பேசுகின்ற வைத்தியர்கள், தாதியர்கள் மற்றும் ஏனைய உத்தியோகத்தர்கள் 65 சதவீதம் அளவில் இருக்கின்றார்கள். கிளிநொச்சி மாவட்டமானது, நூற்றுக்கு நூறு சதவீதம் தமிழ் மொழி பேசுகின்றவர்களைக் கொண்டதாகும். மொழி ரீதியான பிரச்சினைகளால் அந்த மக்கள் வைத்தியத்துறை சார்ந்து பல அசௌகரியங்களைச் சந்திக்கின்றார்கள். ஆகவே, தமிழ் மொழி சார்ந்த உத்தியோகத்தர்கள், வைத்தியர்கள், தாதியர்களை எதிர்வருங் காலங்களில் அங்கு நியமிக்கக்கூடிய சாத்தியப்பாடுகள் உண்டா?

**ගරු (මහාචාර්ය) චන්න ජයසුමන මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) சன்ன ஜயசுமன)
(The Hon. (Prof.) Channa Jayasumana)

ගරු මන්ත්‍රීතුමනි, මේ වෛද්‍යවරුන්, හෙද නිලධාරින් ආදී සියලු දෙනා තමන්ගේ රාජකාරි කටයුතු ආරම්භ කරන්න ඉස්සෙල්ලා දෙමළ භාෂාව පිළිබඳ පරීක්ෂණයෙන් සමත් වෙන්න ඕනෑ. ඒ වාගේම, මේ වෛද්‍යවරුන් සහ හෙද නිලධාරින් තමන්ගේ විභාගවලින් ලබා ගන්නා ලකුණු මත - ඒ rankings මත

- තමයි ඔවුන්ට හිමි ස්ථාන ලැබෙන්නේ. මොකද, වෛද්‍යවරුන් ගත්තොත්, ඉහළම ලකුණු ලබා ගන්නා අය සම්බන්ධයෙන් කොළඹ, යාපනය වාගේ ශික්ෂණ රෝහල්වලට තමයි වැඩිම ඉල්ලුමක් තිබෙන්නේ. ඒ අනුව අනුපිළිවෙළින් ආවාට පසුව තමයි අවසාන විභාගයේ ලබා ගන්නා ලකුණු සංඛ්‍යාව මත තමන්ගේ ස්ථානය ලැබෙන්නේ. ඒක රජය මැදිහත් වෙලා හෝ අමාත්‍යාංශය මැදිහත් වෙලා කරන දෙයක් නොවෙයි. මේ වෛද්‍යවරුන්, හෙද නිලධාරින් ලබා ගන්නා ලකුණු මත තමයි මේ ක්‍රියා පටිපාටිය තීරණය වෙන්නේ. ඔවුන්ගේ කැමැත්ත මත තමයි ඒ ස්ථානය ලැබිලා තිබෙන්නේ. ඉතින් දෙමළ භාෂාව දන්නා අය පමණක් මේ ස්ථානයට යොදවන්න කියා මැදිහත් වීමක් කරන්න අපට බැහැ බැහැ. මොකද, දීර්ඝ කාලයක් තිස්සේ වෛද්‍යවරුන්ගේ ස්ථාන මාරුවීම් හා තමන් ලබා ගන්නා ස්ථානය ඔවුන් අවසන් විභාගයේදී ලබා ගන්නා ලකුණු සංඛ්‍යාව මත තමයි පදනම් වෙන්නේ. කෙසේ නමුත්, විශේෂයෙන්ම උතුර සහ නැගෙනහිර පළාත්වල සේවය කරන වෛද්‍ය සහ හෙද නිලධාරින් සියලු දෙනා දෙමළ භාෂාව පිළිබඳ ප්‍රවීණත්වයක්, නිපුණතාවයක් ලබා ගත යුතුමයි. ලංකාවේ අනෙක් ප්‍රදේශවලත් එහෙමයි. රැකියාව ලබා ගන්න නම් ඔවුන් ඒ අදාළ විභාගයෙන් සමත් විය යුතුයි.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Yes, Hon. Sivagnanam Shritharan?

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ சபாநாயகர் அவர்களே, மேலதிக விளக்கமொன்றைக் கோர விரும்புகின்றேன். வவுனியாவிலிருந்து யாழ்ப்பாணம் வரையுள்ள பாரிய இடைவெளியிலே பல்வேறுபட்ட நேரங்களில் அதிகமான விபத்துச் சம்பவங்கள் நடைபெறுகின்றன. கிளிநொச்சி மாவட்ட பொது வைத்தியசாலையில் திடீர் விபத்துப் பிரிவொன்றை நிறுவுவதற்காக 04 வருடங்களுக்கு முன்பு அடிக்கல் நாட்டப்பட்டது. கௌரவ இராஜாங்க அமைச்சர் அவர்களே, 2023ஆம் ஆண்டுக்கு அதனைப் பிற்போடுவது அந்த மக்களைப் பொறுத்தவரையில் அவர்கள் படுகின்ற துன்பங்களுக்கு ஒரு தீர்வாக அமையப்போவதில்லை. இதனை விரைவாகச் செய்யக்கூடிய வகையில் தீர்க்கமான வழிமுறையொன்றை ஆராயுமாறு நான் தயவாக இந்த இடத்திலே உங்களிடம் கேட்டுக்கொள்கின்றேன்.

**ගරු (මහාචාර්ය) චන්න ජයසුමන මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) சன்ன ஜயசுமன)
(The Hon. (Prof.) Channa Jayasumana)

ඔව්, ගරු මන්ත්‍රීතුමනි. එහි අලුත් ගොඩනැඟිල්ල ඉදිකිරීම යම් ආකාරයකින් කල් ගිහින් තිබෙන නිසා තමයි යම් ප්‍රමාදයක් සිදු වන්නේ. නමුත් ඒ සඳහා අවශ්‍ය වෛද්‍ය උපකරණ සහ අනෙක් උපකරණ ලබා දීමේ කිසිම අඩුවක් වෙලා නැහැ. කිලිනොච්චි රෝහලේ පමණක් නොවෙයි, අනුරාධපුර ශික්ෂණ රෝහලේත් මේ ප්‍රශ්නය තිබෙනවා. 2017 වර්ෂයේ දී මුල් ගල තැබුවාට මේ වන තෙක් එහි ඉදිකිරීම් කටයුතු කරන්න වුණේ නැහැ. එයට මුල්ගල තබපු කොන්ත්‍රාත්කරුවා පවා එම ස්ථානයෙන් ගිහිල්ලායි තිබෙන්නේ. ඔවුන්ගෙන් ඒ වන්දි ලබා ගැනීම කරනවා. විශේෂයෙන්ම අලුත් ඉදිකිරීම් කටයුතු සම්බන්ධයෙන් ලංකාවේ රෝහල් ගණනාවක මේ ප්‍රශ්නය තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාගේ ඉල්ලීම සෞඛ්‍ය අමාත්‍යාංශයේ අවධානයට යොමු කරන්නම්. ඒ කටයුතු ඉක්මනින් කිරීම සඳහා අපි හැකි උපරිම උත්සාහය දරනවා.

## ශ්‍රී ලංකා වෛද්‍ය සභාව: පුරප්පාඩු
## இலங்கை மருத்துவச் சபை: வெற்றிடங்கள்
## SRI LANKA MEDICAL COUNCIL: VACANCIES

621/2020

**11. ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ මේ වන විට පවතින පුරප්පාඩු සංඛ්‍යාව එක් එක් තනතුරු නාමය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම පුරප්පාඩු පිරවීමට අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை மருத்துவச் சபையில் தற்போது காணப்படுகின்ற வெற்றிடங்களின் எண்ணிக்கை ஒவ்வொரு பதவிப் பெயரின் பிரகாரம் வெவ்வேறாக எத்தனை;

(ii) மேற்படி வெற்றிடங்களை நிரப்புவதற்காக அமைச்சினால் மேற்கொள்ளப்படும் நடவடிக் கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health:

(a) Will he inform this House -

(i) separately, of the number of vacancies that exist at present in the Sri Lanka Medical Council on per designation basis; and

(ii) of the steps that will be taken by the Ministry to fill those vacancies?

(b) If not, why?

**ගරු (මහාචාර්ය) චන්න ජයසුමන මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) சன்ன ஜயசுமன)
(The Hon. (Prof.) Channa Jayasumana)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍ය ගරු කෙහෙළිය රඹුක්වැල්ල මැතිතුමා මේ වෙලාවේ හදිසි රැස්වීමකට සහභාගි වී සිටිනවා. සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ මේ වන විට පුරප්පාඩු 09ක් පවතී.

- වෛද්‍ය ආඥා පනතේ 39 A වගන්තිය යටතේ ලියා පදිංචි වී ඇති වෛද්‍ය විශේෂඥයන් විසින් තෝරා පත් කර ගත යුතු සාමාජිකයන් තුනක් (03).

[ගරු (මහාචාර්ය) චන්න ජයසුමන මහතා]

- වෛද්‍ය ආඥා පනතේ 29 වගන්තිය යටතේ ලියා පදිංචි වී ඇති වෛද්‍ය වෘත්තිකයන් විසින් තෝරා පත් කර ගත යුතු සාමාජිකයන් පහක් (05).
- වෛද්‍ය ආඥා පනතේ 43 වගන්තිය යටතේ ලියා පදිංචි වී ඇති දන්ත ශල්‍ය වෛද්‍යවරුන් විසින් තෝරා පත් කර ගත යුතු එක් (01) සාමාජිකයෙක්.

(ii) ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ මැතිවරණ පැවැත්වීමට අදාළ රෙගුලාසි නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව විසින් සකස් කරමින් පවතින අතර, එය සම්පූර්ණ වූ පසු ගැසට් කිරීමට කටයුතු කරනු ලැබේ.

(ආ) පැන නොනඟී.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ස්තුතියි, ගරු රාජ්‍ය ඇමතිතුමනි. මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, කථාවක් තිබෙනවා, බල්ලාගේ වැඩේ බූරුවාට භාර දුන්නාම බූරුවාත් බැණුම් අහනවා, බල්ලාත් බැණුම් අහනවා කියලා. කොරෝනා අර්බුදය විසඳීමේදී කණ්ඩායම් දෙකක් කටයුතු කරනවා. ඒ තමයි, ආරක්ෂක හමුදා සහ වෛද්‍ය කණ්ඩායම්. පසු ගිය කාලයේ උතුරේ ත්‍රස්තවාදින්ට එරෙහි යුද්ධය තිබෙන කොට ආරක්ෂක හමුදාව ඉදිරියෙන් සිටියා; supporting units හැටියට වෛද්‍ය කණ්ඩායම් ගියා. හැබැයි, මේ කොරෝනා අර්බුදයේදීත් තමුන්නාන්සේලා ආරක්ෂක හමුදාව තමයි ඉස්සර කරලා තිබෙන්නේ; වෛද්‍ය හමුදාව තමයි පිටුපසට කරලා තිබෙන්නේ.

ඊයේ පෙරේදා එන්නත් ලබා ගන්න විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ට යුද්ධ හමුදා රෝහලට එන්න කියලා, අන්තිමේදී එන්නත් නැහැ කියපු නිසා එදා ඒ ළමයි ආපසු ගියා. දකුණේ මාතරින්, ගාල්ලෙන්, ඒ වාගේම යාපනයෙන් ආදී වශයෙන් මේ රටේ හැම තැනකින්ම ශිෂ්‍යයෝ ඇවිල්ලා ආපසු ගියා. ආපසු ගියේ නිකම් නොවෙයි, යුද්ධ හමුදාවටත් බැණ බැණ. අපරාදේ යුද්ධ හමුදාව බැණුම් අහනවා! බොහෝ දුරට හැම විශ්වවිද්‍යාලයකම පාහේ වෛද්‍ය පීඨයක් තිබෙනවා. ඒ නැතත් හැම විශ්වවිද්‍යාලයකම medical centre එකක් තිබෙනවා. අවශ්‍ය එන්නත් ටික විශ්වවිද්‍යාලයේ medical centre එකට, වෛද්‍ය පීඨයට යවලා එහි සිටින වෛද්‍යවරුන් මඟින්, ඒ විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ට එන්නත් කරන්න හැකිව තිබියදී ඒකත් යුද්ධ හමුදාවට භාර දීම නිසා යුද්ධ හමුදාවත් බැණුම් අහනවා; වෛද්‍යවරුත් බැණුම් අහනවා. ගමේ කියන විදියට, බල්ලාගේ වැඩේ බූරුවාට භාර දුන්නාම සිද්ධ වන දේ ඒකයි. එතකොට බල්ලාත් බැණුම් අහනවා, බූරුවාත් බැණුම් අහනවා. තමුන්නාන්සේලා මේක තවමත් තේරුම් ගෙන නැද්ද කියන එක තමයි මගේ පළමුවන අතුරු ප්‍රශ්නය.

**ගරු (මහාචාර්ය) චන්න ජයසුමන මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) சன்ன ஜயசுமன)
(The Hon. (Prof.) Channa Jayasumana)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කළ ඒ චෝදනාව මම ප්‍රතික්ෂේප කරනවා. කොවිඩ් මර්දනයේදී විශේෂයෙන්ම ආරක්ෂක අංශය ඉතාම සුවිශේෂී දායකත්වයක් ලබා දුන්නා. හැබැයි, එන්නත්කරණය පිළිබඳ තීන්දු තීරණ ගැනීමේදී වෛද්‍ය විශේෂඥයන්ගේ අදහස්, ඔවුන්ගේ මතය අනුව තමයි හැම වෙලාවේම කටයුතු කළේ. ඒ සඳහා ආරක්ෂක අංශය ලබා දුන් දායකත්වය කිසිසේත් අවතක්සේරු කරන්න බැහැ. සෞඛ්‍ය අමාත්‍යාංශය හැටියට අපි ඔවුන්ගේ කාර්යභාරය විශේෂ ඇගයීමකට ලක් කරනවා. විශේෂයෙන්ම විදේශගත වීමට බලාපොරොත්තුවෙන් ලියාපදිංචි වී සිටින විශ්වවිද්‍යාල සිසුන් සඳහා තමයි යුද්ධ හමුදා රෝහලේදී ඒ අවස්ථාව ලබා දුන්නේ. ඔබතුමා කියන ආකාරයේ ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා නම් - එන්න කියා දින ලබා දීලා හැරිලා යන්න සිදුවී තිබෙනවා නම්- ඒ ගැන අපි අනිවාර්යයෙන් සොයා බලනවා කියා මා ඔබතුමාට මේ ගරු සභාවේදී ප්‍රකාශ කරනවා.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
බල්ලාගේ වැඩේ බූරුවාට, බූරුවාගේ වැඩේ බල්ලාට භාර දුන් එකයි මා ඉස්මතු කළේ. ඒකටයි මට උත්තරයක් ඕනෑ.

**ගරු (මහාචාර්ය) චන්න ජයසුමන මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) சன்ன ஜயசுமன)
(The Hon. (Prof.) Channa Jayasumana)
ගරු මන්ත්‍රීතුමනි, සෞඛ්‍ය අංශයේ හෝ ආරක්ෂක අංශයේ බල්ලෝ සහ බූරුවෝ නැහැ. මනාව සුදුසුකම් ලත් වෛද්‍යවරුන්, හෙද නිලධාරින් සහ ආරක්ෂක අංශ සාමාජිකයන් තමයි සිටින්නේ. ඒ නිසා එහෙම අපහාස කරන්න එපා කියා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි.

දැන් මේ සෞඛ්‍ය සේවයේ සිටින වෛද්‍යවරුන්ට සහ අනෙකුත් කාර්ය මණ්ඩලවල සිටින සියලුදෙනාට ලොකු අං තට්ටුවක් දීලා තිබෙනවා. ඒ අං තට්ටුව තමයි, "සුව විරුවා" කියන අං තට්ටුව. එක එක විරුවෝ ඉන්නවා නේ. රණ විරුවෝ ඉන්නවා, රට විරුවෝ ඉන්නවා. දැන් මේ සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ නිරත වන වෛද්‍යවරුන්, සහායකයන් ඇතුළු සියලු අයට දීලා තිබෙන අං තට්ටුව සහිත ඔටුන්න තමයි "සුව විරුවා" කියන නාමය. හැබැයි, "සුව විරුවා" කියන නාමය දීලා තිබියදී, කොරෝනා අර්බුදය ඔඩු දුවා තිබෙන අවස්ථාවක, ඒ අයගේ ජීවිත අවදානමත් නොතකා කටයුතු කරන අවස්ථාවක, මීට අවුරුද්දකට ඉස්සෙල්ලා චීනයෙන් කොරෝනා එනකොට පාවිච්චි කළ ඉටි කොළ ඇඳුම ම තමයි ඒ අය තවමත් භාවිත කරන්නේ. නමුත්, ඇමෙරිකාව ඇතුළු ලෝකයේ බොහෝ රටවල් ඒ සඳහා නවීන තාක්ෂණය භාවිත කරනවා. හැබැයි, අපේ රටේ? අපේ සෞඛ්‍ය අංශයේ අයගේ ප්‍රවාහන පහසුකම් ගෙන බලන්න. කුරුණෑගල රෝහලෙන් මට කිව්වා, රට වහලා තිබුණු කාලයේ 4.00ට duty off වුණාම ඒ ගොල්ලන්ට ගෙවල්වලට යන්න 6.00 වනකල් වාහනයක් එන්නේ නැහැ කියලා. දොස්තර මහත්වරුන්ට cars තිබුණාට, පෞද්ගලික වාහන තිබුණාට අභිංසක සුළු සේවකයන්ට එහෙම නැහැ. එතකොට "සුව විරුවා" කියන නම්බු නාමය දුන්නාට ඒ අයගේ සුව පහසුකම් වැඩිවීමක් වෙලා නැහැ.

**ගරු (මහාචාර්ය) චන්න ජයසුමන මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) சன்ன ஜயசுமன)
(The Hon. (Prof.) Channa Jayasumana)
ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ පුරප්පාඩු පිළිබඳ තමයි එතුමා ප්‍රශ්නය යොමු කර තිබුණේ.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ප්‍රශ්නය පටලවාගෙන ද දන්නේ නැහැ. ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ පුරප්පාඩු පිළිබඳ ප්‍රශ්නය ගැන තමයි අපි කථා කරන්නේ, ගරු මන්ත්‍රීතුමනි.

## ශ්‍රී ලංකාව වෛද්‍ය සභාව: ලියාපදිංචි වෛද්‍යවරුන්
## இலங்கை மருத்துவச் சபை: பதிவு செய்யப்பட்ட மருத்துவர்கள்
## SRI LANKA MEDICAL COUNCIL: REGISTERED DOCTORS

622/2020

**12. ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකා වෛද්‍ය සභාව යටතේ ලියාපදිංචි වී සිටින මුළු වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත සඳහන් වෛද්‍යවරුන් අතර සුදුසුකම් නොමැති වෛද්‍යවරුන් ද සිටින බව දන්නේද;

(iii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை மருத்துவச் சபையின் கீழ் பதிவு செய்யப்பட்ட மருத்துவர்களின் மொத்த எண்ணிக்கை எத்தனை;

(ii) மேற்குறிப்பிட்ட மருத்துவர்கள் மத்தியில் தகைமைகளைக் கொண்டிராத மருத்துவர்களும் உள்ளனர் என்பதை அறிவாரா;

(iii) ஆமெனில், அது தொடர்பாக அமைச்சு மேற்கொள்ளும் நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச் சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health:

(a) Will he inform this House -

(i) the total number of doctors who have got registered under the Sri Lanka Medical Council;

(ii) whether he is aware that quacks are also among the above-mentioned registered doctors; and

(iii) if so, the measures that will be taken by the Ministry with pertinence to this matter?

(b) If not, why?

**ගරු (මහාචාර්ය) චන්න ජයසුමන මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) சன்ன ஜயசுமன)
(The Hon. (Prof.) Channa Jayasumana)
ගරු කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ශ්‍රී ලංකා වෛද්‍ය සභාව යටතේ ලියාපදිංචි වී සිටින මුළු වෛද්‍යවරුන් සංඛ්‍යාව 40,201යි.

(ii) සියලු ලියකියවිලි සත්‍යාපනය කිරීමෙන් අනතුරුව ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් වෛද්‍යවරුන් ලියාපදිංචිය සිදු කරනු ලබයි. අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති වෛද්‍යවරුන් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි කිරීමත් සිදු නොකරනු ලැබේ.

(iii) පැන නොනඟී.

(ආ) පැන නොනඟී.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
බොහොම ස්තුතියි, ගරු රාජ්‍ය ඇමතිතුමනි.

මම අහපු ප්‍රශ්නවලට තමුන්නාන්සේ බොහොම සාර්ථකව උත්තර දුන්නා. තමුන්නාන්සේත් සම්බන්ධ වෙන NMRA එකට අයිති දත්ත රාශියක් අතුරුදහන් වුණාය කියන කාරණය තමුන්නාන්සේත් දන්නවා.

**ගරු (මහාචාර්ය) චන්න ජයසුමන මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) சன்ன ஜயசுமன)
(The Hon. (Prof.) Channa Jayasumana)
ඔබතුමා අහපු මේ ප්‍රශ්නයට ඒ කාරණය අදාළ නැහැ, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
නැහැ, ඒ ප්‍රශ්නයට අදාළවම තමයි මේ අහන්නේ. NMRA එකේ දත්ත ප්‍රතිෂ්ඨාපනය කරන්න කියලා තමුන්නාන්සේලා පංච පුද්ගල කමිටුවක් පත් කර තිබෙනවා.

**ගරු (මහාචාර්ය) චන්න ජයසුමන මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) சன்ன ஜயசுமன)
(The Hon. (Prof.) Channa Jayasumana)
ඒක මෙතැනට අදාළ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, අදාළ නැත්නම් ඔබතුමා උත්තර නොදී ඉන්න.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
අදාළ නැහැ කියන්න එපා. ගරු කථානායකතුමනි, මේක මේ රටේ ජනතාවගේ ජීවිත හා සම්බන්ධ වග කියන කාරණයක්. ඒක කොහොමද අදාළ නොවන්නේ? අපි මිනිස්සු හැටියට, පුරවැසියෝ හැටියට මේවා දැන ගන්න ඕනෑ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අහපු ප්‍රශ්නයට අදාළ ප්‍රශ්න අහන්න.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
මම අහන්නේ NMRA එකේ දත්ත ප්‍රතිෂ්ඨාපනය කරන්න පත් කර තිබෙන කමිටුවට කවුද පත් කරලා තිබෙන්නේ කියලා. ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, මේ සම්බන්ධයෙන් ඔබතුමාට චෝදනා තිබෙනවා; ICTA එකට චෝදනා තිබෙනවා; Epic කියන ආයතනයට චෝදනා තිබෙනවා.

**ගරු (මහාචාර්ය) චන්න ජයසුමන මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) சன்ன ஜயசுமன)
(The Hon. (Prof.) Channa Jayasumana)
ගරු කථානායකතුමනි, NMRA කියන්නේ ජාතික ඖෂධ නියාමන අධිකාරිය. තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමා ප්‍රශ්නය අහලා තිබෙන්නේ ශ්‍රී ලංකා වෛද්‍ය සභාව - SLMC - සම්බන්ධයෙන්. මේ, ආයතන දෙකක්. මම හිතන හැටියට එතුමා ඒක පටලවාගෙන තිබෙන්නේ. එම නිසා මෙම ප්‍රශ්නය එතුමා අහපු ප්‍රධාන ප්‍රශ්නයට අදාළ වන්නේ නැහැ, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න, ගරු මන්ත්‍රීතුමා. අදාළ ප්‍රශ්නයක් අහන්න.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
අදාළ ප්‍රශ්නයක් කියන්නේ මේකයි. ගරු කථානායකතුමනි, ජනතාවගේ ජීවිත හා සම්බන්ධව නේ මේ කථා කරන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මූලික ප්‍රශ්නයට අදාළ ප්‍රශ්නයක් අහන්න.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ගරු කථානායකතුමනි, මගේ හතරවැනි අතුරු ප්‍රශ්නය. [බාධා කිරීම්] Sorry, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක තමයි. ඔබතුමා දැන් ප්‍රශ්න හතරක් විතර ඇහුවා.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
තමුන්නාන්සේලා දැන් සෑම නිවසකටම ඖෂධීය මංජුසාවක් දෙන්න යනවා. ඒකට වෙනිවැල්ගැට, පාවට්ටා කොළ අයිති වෙයි. එතකොට ලංකාවේ හැම ගෙදරකින්ම වෙනිවැල්ගැට ඉල්ලුවොත්, මොරටුවට ලී පටවාගෙන යනවා වාගේ වෙනිවැල්ගැට ලොරි පිටින් පටවාගෙන යනවා. මේකත් තව එක ගැහිල්ලක්ද?

**ගරු (මහාචාර්ය) චන්න ජයසුමන මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) சன்ன ஜயசுமன)
(The Hon. (Prof.) Channa Jayasumana)
ගරු කථානායකතුමනි, එතුමා ප්‍රශ්නය යොමු කර තිබෙන්නේ, බටහිර වෛද්‍ය විද්‍යාවට අදාළ වන ශ්‍රී ලංකා වෛද්‍ය සභාව සම්බන්ධයෙන්. මේක ඇත්තටම ආයුර්වේද වෛද්‍ය සභාවට අදාළ වෙන ප්‍රශ්නයක්. එම නිසා එම ප්‍රශ්නය වෙනම යොමු කළා නම් ඒකට උත්තර දෙන්න පුළුවන්, ගරු කථානායකතුමනි.

## අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඔසුසල් ජාලය: තවදුරටත් ව්‍යාප්තිය
## அநுராதபுர மாவட்ட ஒசுசல வலையமைப்பு: மேலும் விஸ்தரித்தல்
## OSUSALA NETWORK IN ANURADHAPURA DISTRICT: EXPANSION

533/2020

**13. ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටි රජයට අයත් වන ඔසුසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ඔසුසල් පිහිටා ඇති ස්ථානවල ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) රජයේ ඔසුසල් ශාඛා ජාලය, අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ තවදුරටත් ව්‍යාප්ත කිරීමට අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அநுராதபுரம் மாவட்டத்தில் அமைந்துள்ள அரசாங்கத்திற்குச் சொந்தமான மருந்தகங்களின் (ஒசுசல) எண்ணிக்கை எத்தனை;

(ii) குறிப்பிட்ட மருந்தகங்கள் அமைந்துள்ள இடங்களின் முகவரிகள் யாவை;

என்பதை அவர் இச்சபைக்குத் அறிவிப்பாரா?

(ஆ) அரச மருந்தகக் கிளை வலையமைப்பினை அநுராதபுரம் மாவட்டத்தில் மேலும் விஸ்தரிப்பதற்கு அமைச்சினால் மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும் அவர் இச்சபைக்குத் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health:

(a) Will he inform this House -

(i) the number of pharmacies (Osusala) that belong to the Government in the Anuradhapura District; and

(ii) the addresses of the locations of those pharmacies?

(b) Will he also inform this House of the measures to be taken by the Ministry to further expand the network of government pharmacies within Anuradhapura District?

(c) If not, why?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! Before the Question is answered, will an Hon. Member propose the Hon. Velu Kurmar to the Chair?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

Sir, I propose that the Hon. Velu Kumar do now take the Chair.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු වෙලු කුමාර් මහතා මූලාසනාරූඪ විය.*
*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, மாண்புமிகு வேலு குமார் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. SPEAKER *left the Chair, and* THE HON. VELU KUMAR *took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමා උත්තර දෙන්න.

**ගරු (මහාචාර්ය) චන්න ජයසුමන මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) சன்ன ஜயசுமன)
(The Hon. (Prof.) Channa Jayasumana)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටි රජයට අයත් ඔසුසල් සංඛ්‍යාව 02 කි.

(ii) එම ඔසුසල් පිහිටා ඇති ස්ථානවල ලිපිනයන් වන්නේ,

- 414/4, දෙවන පියවර, ගොඩගේ මාවත, අනුරාධපුර.
- අංක 50, නුවර පාර, මැදවච්චිය.

(ආ) කැකිරාව ප්‍රාදේශීය සභාව මගින් ඉදිකර ඇති වෙළෙඳ සංකීර්ණයෙන් ගොඩනැගිලි පහසුකම් ලබාදීමට එකඟ වී ඇති බැවින්, කැකිරාව රාජ්‍ය ඔසුසල කඩිනමින් ආරම්භ කිරීමට කටයුතු සිදු කරමින් පවතී.

මීට අමතරව ඉලෙක්ට්‍රොනික ක්‍රමයට ලබා ගන්නා වට්ටෝරුවලට පාරිභෝගිකයින් අතටම ඖෂධ ප්‍රවාහනය කර ලබා දීමේ "ගෙදරටම බෙහෙත්" නියමු ව්‍යාපෘතිය ද අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් ආරම්භ කර ක්‍රියාත්මක වෙමින් පවතින අතර ඖෂධ බෙදාහැරීමේ කටයුතු තැපැල් දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලැබේ.

රජයේ ඔසුසැල් ජාලය අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ තවදුරටත් ව්‍යාප්ත කිරීම සඳහා කටයුතු යෙදා තිබෙනවා. අනුරාධපුර දිස්ත්‍රික්කයේ මූලික රෝහල් පිහිටා තිබෙන කහටගස්දිගිලිය, කැකිරාව සහ තඹුත්තේගම යන නගරවල ඔසුසල් පිහිටුවන්න මේ වෙනකොට අපි යෝජනා කර තිබෙනවා. ඒ සඳහා කටයුතු කරගෙන යනවා. කැකිරාව ඔසුසල මේ වසර ඇතුළත විවෘත කරන්න අපි බලාපොරොත්තු වෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

(ඇ) පැන නොනඟී.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)

බොහොම ස්තුතියි, ගරු රාජ්‍ය අමාත්‍යතුමනි. එම කටයුතු ටික ඉක්මන් කරන්න. ඒක අපේ ප්‍රදේශයේ ජනතාවට පහසුවක් වෙනවා. ඒ වාගේම, ගරු රාජ්‍ය ඇමතිතුමනි, මම මේ කාරණය ඔබතුමාගෙන් අහන්න කැමැතියි. ඔබතුමන්ලා සහ අපි දකින, විවිධ විවාදවලට ලක් වෙන කාරණයක් තමයි, අලුතින් ඖෂධ නිෂ්පාදනය කිරීම, පරණ ඖෂධවලට ලේබල් ඇලවීම වැනි කාරණා.

හැබැයි, අපි ප්‍රධාන කාරණයක් විධියට දකිනවා, අපේ රටේ ඖෂධ වර්ග 300කට ආසන්න ප්‍රමාණයක් මේ වෙනකොට නිෂ්පාදනය කරන බව. ප්‍රෙෂර් පෙත්ත, විටමින් සී ඇතුළු සැහෙන ඖෂධ වර්ග ප්‍රමාණයක් -ඖෂධ 300ක්- නිෂ්පාදනය කරනවා. හැබැයි, අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ගෙනැල්ලා වරායේ හිරවෙලා තිබෙනවා වාගේ දේවල් සිදු වෙනවා. අලුතින් ඖෂධ නිෂ්පාදනය කරන්න අපි උත්සාහ කරනවා. ඒ සඳහා වෙනම ව්‍යාපෘති යන අතරේ, ඖෂධ නිෂ්පාදනය කරන්නා වූ නිෂ්පාදන ආයතනවලට අවශ්‍ය අමු ද්‍රව්‍ය ගෙන්වා ගැනීම ඇතුළු තවත් කාරණා සම්බන්ධව මේ වෙනකොට ඔවුන් එවැනි විවිධ අපහසුතාවලට මුහුණ දෙමින් ඉන්නවා. ඔබතුමා ඒ ගැන දැනුවත් ඇති. ඒ නිසා අලුතින් ඖෂධ නිෂ්පාදනය කරනවාට වඩා තිබුණු ටිකවත් සාර්ථකව ඉස්සරහට ගෙන යෑම වෙනුවෙන් ඔබතුමා මොකක් හරි සාර්ථක වැඩ පිළිවෙළක් කරලා තිබෙනවාද? මේ අයට ඒ අමු ද්‍රව්‍ය සහ අවශ්‍ය දේවල් ගෙන්වා ගැනීමට ඔබතුමාට දෙන්න පුළුවන් දායකත්වය මොකක්ද?

**ගරු (මහාචාර්ය) චන්න ජයසුමන මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) சன்ன ஜயசுமன)
(The Hon. (Prof.) Channa Jayasumana)

ගරු මන්ත්‍රීතුමනි, මේ සම්බන්ධයෙන් අපි මුදල් අමාත්‍යතුමා සමඟත්, මුදල් අමාත්‍යාංශය සමඟත් සාකච්ඡා කළා. ඖෂධ නිෂ්පාදනයට අදාළ අමු ද්‍රව්‍ය හා ඊට අදාළ වන අනෙකුත් දේවල් කඩිනමින් නිදහස් කර ගැනීම සඳහා මූලිකත්වයක් ලබා දෙන ලෙස ගරු මුදල් අමාත්‍යතුමා නිලධාරින්ට, රේගුව ඇතුළු සියලු පාර්ශ්වවලට මේ වෙනකොට උපදෙස් ලබා දීලා තිබෙනවා. ඒ නිසා ඒ සම්බන්ධ ප්‍රමාදයක් ඇති වෙන්නේ නැහැ, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)

ඔබතුමා ඒ පිළිබඳ වගකීම භාර ගන්නවා? ස්තුතියි.

එහෙම නම්, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. මේ කාරණය ඔබතුමාටත් මටත්, දෙදෙනාටම බලපාන ප්‍රශ්නයක්. මගේ ආසනයේ කැබිතිගොල්ලෑව රෝහලේ වෛද්‍යවරයෙක් සම්බන්ධ ප්‍රශ්නයක්. මම හිතන්නේ ඔබතුමාත් මේකට මැදිහත් වුණා. නමුත් මේ ප්‍රශ්නය තවමත් විසඳිලා නැහැ. දිනේෂ් කුමාර කියන අපේ හිතවත් වෛද්‍යවරයා පිළිබඳ ප්‍රශ්නයක්. එතුමා අපිත් එක්ක නොවෙයි, ප්‍රදේශයේ ජනතාව එක්ක බොහොම හිතවත්ව කටයුතු කරපු දක්ෂ වෛද්‍යවරයෙක්. ප්‍රදේශයේ ජනතාවට ලොකු කාර්යභාරයක් ඉෂ්ට කරපු වෛද්‍යවරයෙක්. අපි මේ කාරණයට මැදිහත් නොවුණොත් මම හිතන හැටියට විශාල ප්‍රශ්නයකට මුහුණ දෙන්න වෙයි. ස්වාමීන් වහන්සේලා ඇතුළු ප්‍රදේශයේ ජනතාව ලොකු ප්‍රශ්නයකට මැදිහත් වෙලා ඉන්නවා. එතුමා අතින් යම්කිසි අත්වැරැද්දක් වෙලා තිබෙනවා නම්, ඒකට ජනතාවට දඬුවම් නොකර ප්‍රශ්නය විසඳා ගත යුතුයි. මොකද, මේ නිසා දඬුවම් විඳින්න වෙලා තිබෙන්නේ ජනතාවට. එතුමා ජනතාවට හොඳ කාර්යභාරයක් ඉෂ්ට කරපු වෛද්‍යවරයෙක්. මේ කාරණය යථා තත්ත්වයට පත් කරන්න ඔබතුමාට මැදිහත් වෙන්න පුළුවන් ද? මේ සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ගය මොකක්ද කියලා තමයි මම අහන්නේ.

**ගරු (මහාචාර්ය) චන්න ජයසුමන මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) சன்ன ஜயசுமன)
(The Hon. (Prof.) Channa Jayasumana)

ගරු මන්ත්‍රීතුමනි, මේ කාරණය සම්බන්ධයෙන් මම දැනුවත්. ඒ විශේෂඥ වෛද්‍යවරයා පුහුණුව සඳහා විදේශගත වෙන්න බලාපොරොත්තුවෙන් සිටින කෙනෙක්. එම විශේෂඥ වෛද්‍යවරයාට විරුද්ධව එම රෝහලේම වෛද්‍යවරු කණ්ඩායමක් තමයි පැමිණිලි කරලා තිබෙන්නේ. ඉතින්, ඒ පිළිබඳව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා, ඒ වාගේම සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා මැදිහත් වෙලා විනය පරීක්ෂණයක් සිදු කරනවා. සාමාන්‍යයෙන් වෛද්‍යවරු සම්බන්ධ විනය

[ගරු (මහාචාර්ය) චන්න ජයසුමන මහතා]

පරීක්ෂණවලට අමාත්‍යවරු හැටියට හෝ දේශපාලනඥයන් හැටියට අපි මැදිහත්වීමක් කරන්නේ නැහැ. එම පරීක්ෂණ කටයුතු ස්වාධීනව පවත්වා නිමා කරලා එහි තීන්දුව ලැබුණාට පසුව ඒ පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් තීරණයක් ගන්නවා. සම්ප්‍රදායක් හැටියට ඔබතුමාත් දන්නවා, මොන රජයක් වුණත්, සෞඛ්‍ය ඇමතිවරු හෝ වෙනත් දේශපාලනඥයන් වෛද්‍යවරුන්ගේ විනය පරීක්ෂණවලට මැදිහත්වීමක් කරන්නේ නැහැ කියන කාරණය. මම හිතනවා, මේ වෙනකොට කරගෙන යන විනය පරීක්ෂණයේ ප්‍රතිඵල නොබෝ දිනකින් ලැබෙයි කියලා. ඒ අනුව අපි ඔවුන්ට අවස්ථාව ලබා දෙනවා, සුදුසු තීරණ ගන්න. නමුත් කිසිසේත්ම කැබිතිගොල්ලෑව ප්‍රදේශයේ ජනතාවට ඉන් අගතියක් වෙන්න අපි ඉඩ තියන්නේ නැහැ, ගරු මන්ත්‍රීතුමනි.

## ආසිරි ශල්‍ය රෝහල පිහිටි ඉඩම පවරා දීම: ගිවිසුම
## ஆசிரி சத்திரசிகிச்சை வைத்தியசாலைக்கு ஒப்படைக்கப்பட்ட காணி: ஒப்பந்தம்
## TRANSFER OF LAND OCCUPIED BY ASIRI SURGICAL HOSPITAL: AGREEMENT

854/2020

**14. ගරු අජිත් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு அஜித் ராஜபக்ஷ)
(The Hon. Ajith Rajapakse)
ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (2):

(අ) කොළඹ 05, කිරිමණ්ඩල මාවත යන ලිපිනයේ පවත්වාගෙන යනු ලබන සී/ස ආසිරි ශල්‍ය රෝහල පිහිටි ඉඩම, එම රෝහල ඉදිකිරීමට ප්‍රථම රජය සතුව පැවති ඉඩමක් බව එතුමා දන්නේද?

(ආ) (i) එම ඉඩම, ඉහත සඳහන් රෝහල ඉදිකිරීම සඳහා පවරා දුන් පදනම කවරේද;

(ii) එම ඉඩම, ඉහත සඳහන් රෝහල ඉදිකිරීම සඳහා පවරා දීමේදී, එළැඹි ගිවිසුමේ සහතික කළ පිටපතක් මෙම සභාවට ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

காணி அமைச்சரைக் கேட்ட வினா:

(அ) கொழும்பு 05, கிரிமண்டல மாவத்தை எனும் முகவரியில் பேணிச் செல்லப்படும் வ/ப ஆசிரி சத்திரசிகிச்சை வைத்தியசாலை அமைந்துள்ள காணியானது அவ் வைத்தியசாலையை நிர்மாணிப்பதற்கு முன்னர் அரசாங்கத்திற்குச் சொந்தமானதாக இருந்ததென்பதை அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி காணி, மேற்குறிப்பிடப்பட்ட வைத்திய சாலையை நிர்மாணிப்பதற்காக ஒப்படைக்கப் பட்ட அடிப்படை யாதென்பதையும்;

(ii) மேற்குறிப்பிடப்பட்ட வைத்தியசாலையை நிர்மாணிப்பதற்காக இக்காணி ஒப்படைக்கப் பட்டபோது, ஏற்படுத்திக்கொள்ளப்பட்ட ஒப்பந் தத்தின் அத்தாட்சிப்படுத்தப்பட்ட பிரதி யொன்றை இச்சபையில் சமர்ப்பிப்பாரா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Lands:

(a) Is he aware that the land located at Kirimandala Mawatha, Colombo 05 in which the Asiri Surgical Hospital Limited functions has been a land belonging to the Government, prior to the construction of the said hospital?

(b) Will he inform this House -

(i) the basis on which the said land has been granted for the construction of the above hospital; and

(ii) whether a certified copy of the agreement entered into with relevance to the transfer of the said land for the construction of the above-mentioned hospital will be presented to this House?

(c) If not, why?

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා (ඉඩම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன - காணி அமைச்சர்)
(The Hon. S.M. Chandrasena - Minister of Lands)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) ඔව්.

මෙම ඉඩම රජයේ ඉඩමක් වන අතර මූ.පි.කො. 6922 පිඹුරේ කැබලි අංක 2 දරන ඉඩම් කොටස වේ.

(ආ) (i) එම ඉඩම 4/10/16394 දරන නිදහස් දීමනා පත්‍රය මඟින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත පවරා දී ඇති අතර ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මඟින් Asiri Medical Services Limited ආයතනය වෙත අංක 458 හා 2000.06.01 දිනැති බදු ඔප්පුව මඟින් බදු පදනම මත පවරා දී ඇත.

(ii) ඔව්.

අදාළ නිදහස් දීමනා පත්‍රය හා බදු ඔප්පුවේ සහතික කරන ලද පිටපත් මේ සමඟ අමුණා ඇත.

එකී ලේඛන **සභාගත*** කරමි.

(ඇ) අදාළ නොවේ.

**ගරු අජිත් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு அஜித் ராஜபக்ஷ)
(The Hon. Ajith Rajapakse)
ගරු ඇමතිතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

මේ එළැඹි ගිවිසුමෙන් අඩු ආදායම්ලාභීන්ට, නැත්නම් රටේ ජනතාවට විශේෂ වරප්‍රසාදයක් හැටියට බලපාන මොනවා හෝ කොන්දේසි තිබෙනවාද කියා මම දැන ගන්න කැමැතියි.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
නැහැ. අපි රජයේ ඉඩම් සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් ආයෝජකයන්ට ලබා දීමට කටයුතු කරනවා. අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි විශේෂයෙන්ම අපේ රටේ වගා කරන්න පුළුවන් දේවල් පිටරටින් ගෙන්වීම දැනට නවත්වා තිබෙනවා. කහ, ඉඟුරු වාගේ භෝග වර්ග 16ක් අපි එසේ නම් කර තිබෙනවා. එම භෝග වගා කටයුතුවලට වාර්ෂික බදු ක්‍රමය යටතේ සහ තිස්තුන් අවුරුදු බදු ක්‍රමය යටතේ ඉඩම් ලබා දීමට අපි කටයුතු කරගෙන යනවා.

---
** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

## ජනතාවට ලබා දුන් රජයේ ඉඩම් සඳහා වන ඔප්පු: පසු උරුමකරුවන් නම් කිරීම
பொது மக்களுக்கு வழங்கப்பட்ட அரச காணிகளுக்கான உறுதிகள்: உரித்தாளர்களைப் பெயர் குறிப்பிடல்
DEEDS ON STATE LANDS GRANED TO PUBLIC: NOMINATION OF HEIRS

1801/2021

**15. ගරු රෝහණ දිසානායක මහතා**
(மாண்புமிகு ரோஹண திஸாநாயக்க)
(The Hon. Rohana Dissanayaka)
ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ජනතාවට ලබා දෙන ලද රජයේ ඉඩම් සඳහා නිකුත් කර ඇති ඔප්පු වර්ගවල නම් කවරේද;

(ii) එම ඔප්පු වර්ග අතරින් පසු උරුමකරු නම් කර ලබා දෙනු ලබන ඔප්පු වර්ගවල නම් කවරේද;

(iii) එම ඔප්පු යටතේ ලබා දෙන ලද ඉඩම්, පවුලේ සෙසු සාමාජිකයන් අතර නීත්‍යානුකූල ලෙස පහසුවෙන් බෙදා දීම සඳහා ක්‍රමවේදයක් සැකසීමට අමාත්‍යාංශය පියවර ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

காணி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மக்களுக்கு வழங்கப்பட்டுள்ளதான அரச காணி களுக்காக வழங்கப்பட்டுள்ள காணி உறுதி வகைகளின் பெயர்கள் யாவை என்பதையும்;

(ii) அத்தகைய உறுதி வகைகளில், பின் உரித்தாள வரைக் குறிப்பிட்டு வழங்கப்படும் உறுதி வகைகளின் பெயர்கள் யாவை என்பதையும்;

(iii) அத்தகைய உறுதிகளுக்கு உட்பட்ட வகையில் வழங்கப்பட்ட காணிகளை, குடும்பத்தின் ஏனைய அங்கத்தவர்களிடையே சட்ட ரீதியாக எளிமையாகப் பிரிக்கும் வழிமுறையொன்றைத் தயாரிக்க அமைச்சு நடவடிக்கை எடுத்துள்ளதா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Lands:

(a) Will he inform this House -

(i) the types of deeds issued on State lands that are granted to the people;

(ii) the types of deeds that name the heirs; and

(iii) whether the Ministry has taken steps to devise a mechanism for easy distribution of lands granted under aforesaid deeds among the other members of the family lawfully?

(b) If not, why?

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i)

| කාලය | දීමනාපත්‍ර නාමය |
|---|---|
| 1982-1994 | ස්වර්ණභූමි |
| 1995-1999 | ජයභූමි |
| 2004-2006 | |
| 2000-2001 | ඉසුරුභූමි |
| 2006-2014 | රන්බිම |
| 2015 මේ දක්වා | ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ දීමනාපත්‍රය (නාමකරණය සිදුකර නොමැත.) |

(ii) ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ නිකුත් කරන ලද අවසරපත්‍ර හෝ දීමනාපත්‍රවල හිමිකරුට තමාගෙන් පසුව ඉඩමේ උරුමය ලබා දිය යුත්තේ කා සඳහා ද, යන්න නම් කර තැබීමට අවස්ථාව හිමි වේ. එය පනතෙහි සඳහන් වන්නේ "පසු උරුමය නම් කිරීම" ලෙසිනි. පසු උරුමකරුවෙකු ලෙස තමාගේ කලත්‍රයා හෝ පනතේ III වන උපලේඛනයේ සඳහන් ලේ ඥාතියෙකු නම් කර තැබිය හැකිය. අවසරපත්‍රකරුගේ හෝ දීමනාපත්‍රකරුගේ මරණින් පසු නම් කරන ලද පුද්ගලයා/පුද්ගලයන් වෙත මුල් උරුමය හිමි වේ.

(iii) ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ නිකුත් කරන ලද දීමනාපත්‍ර/අවසරපත්‍ර සඳහා පසු උරුමකරුවෙකු නම් කර නොමැති අවස්ථාවකදී එම පනතේ 72 වගන්තිය ප්‍රකාරව පනතේ III උපලේඛනය අනුව උරුමය ලබා දිය යුතු වේ. එහිදී එම උපලේඛනයේ සඳහන් පිළිවෙළ අනුව පවුලේ වැඩිමල් පිරිමි දරුවා වෙත ප්‍රමුඛතාව හිමි වේ. ඉඩමේ බුක්තිය දරන අය හෝ පවුලේ සියලු දරුවන් වෙත අයිතිය ලබා දීමට පනතේ ප්‍රතිපාදන නොමැති බැවින්,

1. ඉඩම බුක්ති විඳින අය වෙත ප්‍රමුඛතාව ලබා දීමටත්,

2. පනතේ III වන උපලේඛනයේ ඇති ස්ත්‍රී පුරුෂ විභේදනය ඉවත් කර සියලු දරුවන්ට සමාන හිමිකමක් ලබා දීමටත්, හැකිවන පරිදි ඉඩම් සංවර්ධන ආඥා පනත සංශෝධනය කිරීමට අවශ්‍ය කටයුතු ආරම්භ කර ඇත. අදාළ සංශෝධන දැනටමත් නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේ නිර්දේශ සහිතව නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර තිබේ.

(ආ) අදාළ නොවේ.

**ගරු රෝහණ දිසානායක මහතා**
(மாண்புமிகு ரோஹண திஸாநாயக்க)
(The Hon. Rohana Dissanayaka)
ගරු ඇමතිතුමනි, ලබා දුන් පිළිතුර පිළිබඳව ඉතා සතුටු වන අතර, ඔබතුමාට ඒ සම්බන්ධව ස්තුතිවන්ත වෙනවා. අපේ රටේ ස්වර්ණභූමි, ජයභූමි, රන්බිම, ඉසුරුභූමි යනාදී වශයෙන් වන මෙම ඉඩම් ප්‍රතිලාභී දහස් සංඛ්‍යාත, ලක්ෂ සංඛ්‍යාත ජනතාවක් සිටිනවා. අද ඉන්නේ ඔවුන්ගේ දෙවැනි, තුන්වැනි හෝ හතරවැනි පරම්පරාව. පවුලක අම්මාට හෝ තාත්තාට තම ඉඩම ලැබී තිබෙන්නේ 1935 අංක 19 දරන ඉඩම් සංවර්ධන ආඥා පනත

[ගරු රෝහණ දිසානායක මහතා]

අනුවයි. එහිදී සමහර අයට ඉඩම් අක්කර පහක් පමණ මඩින් සහ ගොඩින් ලැබී තිබුණා. නමුත්, අද වෙනකොට එම ඉඩම් ප්‍රමාණය පර්චස් ගණනකට සීමා වෙන තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ඊට හේතුව වන්නේ ප්‍රමාණවත් ඉඩම් ප්‍රමාණයක් නොතිබීමයි.

කෙසේ වුවත් ගරු අමාත්‍යතුමනි, මේ තුළ අපි දකින ප්‍රධාන කාරණයක් තිබෙනවා. මේ රටේ පැවැති සංස්කෘතියත් සැලකිල්ලට ගෙන, අම්මා, තාත්තා, අයියලා, මල්ලිලා, නංගිලා, දුවලා, පුතාලා කියන මේ ඔක්කෝම අය ගැන හිතා බලා තමයි සුදු ආණ්ඩු කාලයේ මේ තීන්දු ගෙන තිබෙන්නේ. හැබැයි, මේ රටේ තිබුණු එම සංස්කෘතියෙන් පොඩ්ඩක් එහාට ගිහිල්ලා අද වෙනකොට එම කටයුතු සිදු වෙනවා කියන කාරණය අපට තේරුම් යනවා. ඒ අනුව යම්කිසි ඉඩමක් උරුමයෙන් එම පවුලේ සිටින වැඩිමහල් සහෝදරයාට ලැබුණු පසු සමහර විට එම පවුලේ නංගිලා, මල්ලිලා පිට රටකට වාගේ ගොස් නැවත පැමිණ හෝ වෙනත් රැකියාවල නිරත වෙමින් රුපියල් ලක්ෂ ගණන්, කෝටි ගණන් වටිනා නිවාස එම ඉඩමේම හදනවා. එසේ ලැබුණු ඉඩමක මොකුත් හදාගන්න බැරි දුගී පිරිසකුත් ඒ අතර ඉන්නවා. හැබැයි, ඉඩම නොපවරා තිබීම නිසා, පසු උරුමය නම් නොකර තිබීම නිසා පවුලේ අනෙක් අය එසේ ගෙවල් හැදුවාට පසු, ඒ වෙනුවෙන් වටිනා මුදලක් වියදම් කළාට පසු, අයියා තමන්ගේ නංගිට, එහෙම නැත්නම් මල්ලිට කියනවා, "නුඹලාට ඉඩම් දෙන්න විධියක් නැහැ. නුඹලා පලයල්ලා" කියලා. එහෙම කිව්වාම එම පවුලේ අනෙක් සියලුදෙනාට විශාල අසාධාරණයක් සිද්ධ වෙනවා කියා මා හිතනවා.

ගරු අමාත්‍යතුමනි, අපි මේ කරුණ ගැන තවත් තොරතුරු දැනගන්න කැමැතියි. මගේ ප්‍රශ්නයට උත්තරය ඔබතුමාගෙන් ලැබුණා. ඒ වුණත් අපට ඒක වඩාත් තහවුරු කර ගන්න අවශ්‍යයි. සහෝදරයන් අතර ඇති වී තිබෙන මෙවැනි ඉඩම් ප්‍රශ්න නිසා ඔවුන්ගේ දරුවන් පාසලකට දමාගන්න විධියක් නැහැ. ඔවුන්ට බැංකු ණයක්, රජයේ ආධාරයක් ලබා ගන්න විධියක් නැහැ. මේ නිසා නිරන්තරයෙන් පවුල් ආරවුල් ඇති වෙනවා. මේ පිළිබඳව අණ පනත් ගෙනැල්ලා නීති කෙටුම්පත් අංශයට යොමුකර එම කටයුතු අවසන් කර ගන්න කොයි තරම් කාලයක් ගතවෙයිද, ගරු ඇමතිතුමනි?

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)

ගරු මන්ත්‍රීතුමනි, අපි මේ වෙනකොට ඉඩම් සංවර්ධන ආඥා පනත සංශෝධනය කිරීමට අවශ්‍ය කැබිනට් අනුමැතිය ලබාගෙන එය නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට යොමු කර තිබෙනවා. අපට එය ලැබුණාම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා. ගරු මන්ත්‍රීතුමා නැඟුවේ හොඳ ප්‍රශ්නයක්. මොකද, අපේ රටේ උසාවිවල වැඩියෙන්ම තිබෙන්නේ ඉඩම් නඩු. අද ඉඩම් ආරවුල් නිසා දෙමව්පියන්, දරුවන් මරා ගන්නවා, ඥාති සම්බන්ධතා නැති වෙනවා. ඔබතුමා සඳහන් කළ පරිදි පියාගෙන් පසු කලත්‍රයා හැටියට බිරිඳටත්, වැඩිමහල් දරුවාටත් තමයි එ් ඉඩමේ අයිතිය ලැබෙන්නේ. දරුවෝ හය හත්දෙනෙක් හිටියොත් අනෙක් දරුවන්ට ඉඩමේ අයිතිය ලැබෙන්නේ නැහැ. අපට දැන් අත්දැකීමෙන්ම තේරෙන දෙයක් තමයි, වැඩිමහල් දරුවා ඉඩම අනවශ්‍ය විධියට භාවිත කිරීමෙන් අනෙක් සහෝදරයන්ට අසාධාරණයක් සිදුවන බව. එම නිසා තමයි අවුරුදු ගණනකට පසු අපි දැන් ඉඩම් සංවර්ධන ආඥා පනත සංශෝධනය කර උසාවිවලට යන නඩු ප්‍රමාණය අඩු කිරීමට කටයුතු කරන්නේ. එවිට එම නඩු ප්‍රමාණය අපට බොහෝ දුරට -සියයට 10කට විතර- අඩු කර ගන්න පුළුවන් වෙයි. මේ සංශෝධන සම්මත වුණාම මේ ඉඩම් නිසා පවුල් අතර ඇතිවන ගැටුම්, ඥාතීන් අතර ඇතිවන ගැටුම් බොහෝදුරට අඩු කර ගන්න පුළුවන්. ඒ සඳහා අවශ්‍ය සහයෝගය ඉදිරියේදී ලබාදෙන්න කියලා අපි ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා. ඉඩමක් කියන්නේ පුරවැසියෙකුට අවශ්‍ය ප්‍රධානම දෙයක්. ඔබතුමා දැනුවත් කළ ආකාරයට, මේ ඉඩම් ගැටලුව විසඳීමට අපි කඩිනමින් කටයුතු කරනවා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු රෝහණ දිසානායක මහතා**
(மாண்புமிகு ரோஹண திஸாநாயக்க)
(The Hon. Rohana Dissanayaka)

ගරු අමාත්‍යතුමනි, ඔබතුමාගේ පිළිතුර මම පිළිගන්නවා. විශේෂයෙන්ම විෂයානුබද්ධව වගකියන ගරු අමාත්‍යවරයකු වශයෙන් ඔබතුමාගේ කාර්ය භාරය පිළිබඳව අපි සතුටු වෙනවා. මේ රටේ හැම දිස්ත්‍රික්කයකම ඉඩම් පිළිබඳ ප්‍රශ්න තිබෙනවා. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුන්සිය ගණනින් සියයට 99ක පමණ ජනතාව තම බලාපොරොත්තු ඉෂ්ට වනතෙක් දෑස් දල්වාගෙන ඉන්නේ. මේ අය තමන්ගේ ප්‍රශ්නවලට විසඳුම් සොයාගෙන සෑම දිනකම වාගේ ප්‍රාදේශීය ලේකම්වරු හමුවීමට එනවා. ඒ වාගේම දේශපාලනඥයන් හමුවීමට එනවා. එම නිසා අතිගරු ජනාධිපතිතුමාගේ "සෞභාග්‍යයේ දැක්ම" තුළ සඳහන් වන පරිදි ඉඩම් ඔප්පු පිළිබඳ ගැටලු නිරාකරණය කිරීමට විෂය භාර අමාත්‍යතුමා වශයෙන් ඔබතුමා කැපවෙලා මෙතෙක් මේ කාර්යය කළා සේ ඉදිරියටත් ඒ කටයුතු කර දෙන ලෙස මම ඉල්ලා සිටිනවා. ඔබතුමා අද මේ ප්‍රශ්නයට පිළිතුරු ලබා දී තම වගකීම ඉෂ්ට කිරීම සම්බන්ධයෙන් මම නැවතත් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

## ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයට අයත් ඉඩම්: විස්තර

களப் பயிர்கள் ஆராய்ச்சி மற்றும் அபிவிருத்தி நிறுவனத்துக்குச் சொந்தமான காணிகள்: விபரம்
LAND BELONGING TO FIELD CROP RESEARCH AND DEVELOPMENT INSTITUTE: DETAILS

604/2020

**16. ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) මහඉලුප්පල්ලම පිහිටි ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයට අයත් වන සම්පූර්ණ භූමි ප්‍රමාණය;

(ii) ඒ අතරින් බීජ නිෂ්පාදන මධ්‍යස්ථානය සඳහා වෙන් කර ඇති භූමි ප්‍රමාණය;

(iii) ක්ෂේත්‍ර පර්යේෂණ මධ්‍යස්ථානය සඳහා වෙන් කර ඇති භූමි ප්‍රමාණය;

(iv) ගොවිපොළ යාන්ත්‍රික මධ්‍යස්ථානය සඳහා වෙන් කර ඇති භූමි ප්‍රමාණය;

(v) වගා කටයුතුවලට යොදා නොගන්නා භූමි ප්‍රමාණය;

අක්කරවලින් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) වගා කටයුතු සඳහා යොදා නොගන්නා භූමි ප්‍රමාණය වගා කටයුතු සඳහා යොදා ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மஹாஇலுப்பல்லமவில் அமைந்துள்ள களப் பயிர்கள் ஆராய்ச்சி மற்றும் அபிவிருத்தி நிறுவனத்துக்குச் சொந்தமான முழு நிலப்பரப்பின் அளவு;

(ii) அவற்றில் விதை உற்பத்தி நிலையத்திற்கு ஒதுக்கப்பட்டுள்ள நிலப்பரப்பின் அளவு;

(iii) கள ஆராய்ச்சி நிலையத்திற்கு ஒதுக்கப்பட்டுள்ள நிலப்பரப்பின் அளவு;

(iv) பண்ணை பொறித்தொகுதி நிலையத்திற்கு ஒதுக்கப்பட்டுள்ள நிலப்பரப்பின் அளவு;

(v) பயிர்ச்செய்கை நடவடிக்கைகளுக்குப் பயன்படுத்தப்படாத நிலப்பரப்பின் அளவு;

ஏக்கர்களில் எவ்வளவென்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) பயிர்ச்செய்கை நடவடிக்கைகளுக்குப் பயன்படுத்தப்படாத நிலப்பரப்பினை பயிர்ச்செய்கை நடவடிக்கைகளுக்குப் பயன்படுத்துவதற்கு மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture:

(a) Will he inform this House, in acres -

(i) the total extent of land that belongs to the Field Crop Research and Development Institute located in Mahailuppallama;

(ii) out of that extent of land, the extent that has been reserved for the Seed Production Centre;

(iii) the extent of land that has been reserved for the Field Research Centre;

(iv) the extent of land that has been reserved for the Farm Mechanical Centre; and

(v) the extent of land that is not used for cultivation purposes?

(b) Will he also inform this House of the measures to be taken to utilize the extent of land which is not used for cultivation at present, for cultivation purposes?

(c) If not, why?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා (කෘෂිකර්ම අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே - கமத்தொழில் அமைச்சர்)
(The Hon. Mahindananda Aluthgamage - Minister of Agriculture)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) අක්කර 857කි.

(ii) බීජ නිෂ්පාදන මධ්‍යස්ථානය ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය යටතේ පවතින ආයතනයක් නොවේ. එම ආයතනය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානයට අයත් වන අතර පර්යේෂණ ආයතනයට යාබද ඉඩමක අක්කර 487.5ක භූමි ප්‍රමාණයක පිහිටා ඇත.

(iii) ක්ෂේත්‍ර පර්යේෂණ මධ්‍යස්ථානය ලෙස කොටසක් වෙනම හඳුනාගෙන නොමැති අතර ඉහත (i)හි දක්වා ඇත්තේ මහඉලුප්පල්ලම ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයට අයත් මුළු භූමි ප්‍රමාණයයි. එම භූමි ප්‍රමාණයෙන් ආයතනයට අදාළ බෝගවල ක්ෂේත්‍ර පර්යේෂණ සඳහා අක්කර 179ක පමණ භූමි ප්‍රමාණයක් භාවිත කරන අතර, මේ යටතට ප්‍රභේද අභිජනනයේදී අත්‍යවශ්‍ය තාක්ෂණික උපක්‍රමයක් වන පරාග එක් එක් ක්ෂේත්‍ර අතර ගමන් කිරීම අවහිර කරන, වන තීරු ද අයත් වේ.

(iv) අක්කර 18කි.

මෙම ආයතනය ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයට අයත් අනුබද්ධ ආයතනයක් වේ.

(v) ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයට අයත් වගා කටයුතුවලට යොදා නොගන්නා භූමි ප්‍රමාණය අක්කර 325කි. (යෝධ ඇළ කොටස)

(ආ) ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයට අයත් ඉහත කී භූමිය වගා කටයුතු සඳහා යොදා ගැනීමට ප්‍රධාන බාධක වන්නේ ජල සම්පාදන පහසුකම් නොමැතිකම, අධික ලවණතාව සහ වන අලි තර්ජන පැවතීමයි. කෙසේ වෙතත් මෙම කොටසේ වගා ළිං දෙකක් ඉදිකොට 2019 වසරේ සිට අක්කර 10ක පමණ භූමි ප්‍රමාණයක් වගාව සඳහා යොදාගෙන ඇත. ඉතිරි භූමි ප්‍රමාණය 2022 වසරේදී අන්තර්ජාතික ආහාර හා කෘෂිකාර්මික සංවිධානය මඟින් ලැබී ඇති ව්‍යාපෘතියක් යටතේ තවදුරටත් ජල සැපයුම් පද්ධති පුළුල් කොට, අලි වැටක්ද ඉදිකිරීම මඟින් වගාව සඳහා යොදා ගැනීමට අපේක්ෂා කෙරේ.

(ඇ) අදාළ නොවේ.

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)

පිළිතුරු ලබා දුන්නාට ස්තුතියි, ගරු ඇමතිතුමනි. මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, ඔබතුමාත් දන්නවා, මේ වෙනකොට ලංකාවේ තිබෙන බරපතළම ප්‍රශ්නය තමයි ගොවි මහත්වරුන්ට පොහොර නොමැතිකම. විශේෂයෙන්ම මගේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවි මහත්වරුන් සියලුදෙනාම ඉදිරි කන්නය වගා කරන්න සූදානම් වෙලා ඉන්නවා. මේ අතරේදී, රසායනික පොහොර පාවිච්චි කළාම වකුගඩු රෝග හැදෙනවා කියලා සමහර පරිසරවේදීන් නඩු දමන්න යනවා. 1948 දී අපි නිදහස ලබා ගත් දවසේ ඉඳලා මෙතෙක් ලංකා ඉතිහාසය ගත්තාම හැම දාම රසායනික පොහොර පාවිච්චි කරලා තිබෙනවා. නඩු දමනවා කියලා බල බලා හිටියා නම් මිනිසුන්ට කන්න හාල් රටින් තමයි ගෙනැල්ලා දෙන්න වෙන්නේ. ගරු ඇමතිතුමනි, මේකට ඔබතුමාගේ උත්තරය මොකක්ද?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු මන්ත්‍රීතුමා, මේ අතුරු ප්‍රශ්නය ඔබතුමා අහපු ප්‍රශ්නයට අදාළ නැහැ. නමුත්, මම උත්තරය දෙන්නම්. ඊයේ විපක්ෂ නායකතුමා හම්බන්තොට ගිය එක ගැනත් යමක් කියලා ඔබතුමාට

[ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා]

උත්තරය දෙන්නම්, ගරු මන්ත්‍රීතුමනි. විපක්ෂ නායකතුමා ලුණුගම්වෙහෙර, වීරවිල කුඹුරකට බැහැලා තිබෙනවා. මම හිතන විධියට ජීවිතයේ පළමුවැනි වතාවටයි විපක්ෂ නායකතුමා කුඹුරකට බැහැලා තිබෙන්නේ. අද එතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා නැත්තේ කකුලේ නියපොතුවල මඩ සුද්ද කරන්න ඕනෑ නිසා වෙන්න ඇති.

ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂ නායකතුමාට සහ විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ට මම කියන්න ඕනෑ හම්බන්තොට දිස්ත්‍රික්කයේ අක්කර 88,290ක වී වගා කරන බව. ඒ අක්කර 88,290ට අපි පොහොර මෙට්‍රික් ටොන් 9,147ක් ලබා දෙන්න ඕනෑ. අපි ඒ ඉඩම්වලට පොහොර මෙට්‍රික් ටොන් 8,533ක් දීලා තිබෙනවා. ලුණුගම්වෙහෙරට අඩුවෙලා තිබෙන්නේ පොහොර මෙට්‍රික් ටොන් 100ක් පමණයි. හැම කෙනෙකුටම වාගේ ඒ අවශ්‍ය පොහොර ටික දීලා තිබෙනවා. විපක්ෂ නායකතුමා ගිය කුඹුර පහුවෙලා වගා කරපු එකක්. එහෙම ප්‍රශ්නයක් තමයි එතැන තිබෙන්නේ. ඒ හැරෙන්නට සමස්තයක් ලෙස හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගොවීන්ට සියයට 99.5ක් පොහොර දීලා තිබෙනවා. [බාධා කිරීමක්] මම මේ කියන්නේ විපක්ෂ නායකතුමා හම්බන්තොට ගිය එක ගැන, ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමා ඇහුවේ, ගොවිතැන් සඳහා ලබාදෙන පොහොර පිළිබඳවයි. ගරු මන්ත්‍රීතුමා, කිසිදු පොහොර හිඟයක් ඇති වෙන්නේ නැහැ. ඔක්තෝබර් මාසයේ 15වන දා තමයි මහ කන්නය පටන් ගන්නේ. එතකොට අපි ඔක්තෝබර් මාසයේ 15වන දාට මහ කන්නය සඳහා අවශ්‍ය පොහොර ටික දෙන්න ඕනෑ. මේ වෙනකොට ඔබතුමාගේ දිස්ත්‍රික්කය ඇතුළු අනෙක් දිස්ත්‍රික්කවල වී ගොවීන් සඳහා පොහොර වර්ග 4ක් ලබා දෙන්න එකඟ වෙලා තිබෙනවා. ඉන් පළමුවන වර්ගය තමයි, වී ගොවිතැන සඳහා කොම්පෝස්ට් ජෛව පොහොර ලබාදීම. මේ වන විට අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවීන් අවශ්‍ය කොම්පෝස්ට් පොහොර හදලා තිබෙනවා. අපි ගොවීන්ට ඒ සඳහා මුදල් ගෙවලා තිබෙනවා. සියලු කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කරලා ඉවරයි.

ඒ වාගේම අපි ජෛව දියර පොහොර ලීටර 10ත් 15ත් අතර ප්‍රමාණයක් වී ගොවීන්ට ලබා දෙනවා. ඒ සියල්ල නිෂ්පාදනය කරලා ඉවරයි. ඒවා අපි ඔක්තෝබර් මාසයේ 15වන දා වනවිට ගොවිජන සේවා මධ්‍යස්ථානවලට යවනවා. ඒ වාගේම පොටෑසියම් ක්ලෝරයිඩ් ආනයනය කරනවා. පොටෑසියම් ක්ලෝරයිඩ් පොහොර හෙට වෙනකොට ලංකාවට එනවා. ඔක්තෝබර් 15වන දා වෙනකොට ඒ සියලු පොහොර ගොවිජන සේවා මධ්‍යස්ථානවලට යවනවා. ඒ වාගේම අපි -මේක පටලවා ගන්න එපා.- නයිට්‍රජන් නිස්සාරකයක්, ඒ කියන්නේ booster එකක්, ගොවීන් සඳහා නයිට්‍රජන් extract එකක් ගෙන්වන්න හැදුවා. මේක අමතර නිස්සාරකයක්. චීනයෙන් ආනයනය කිරීමේදී යම් ප්‍රශ්නයක් ඇති වුණේ ඒවා සම්බන්ධවයි. අපි ඒ පිළිබඳව චීනය සහ ඉන්දියාව සමඟ සාකච්ඡා කරගෙන යනවා. ඒක අපි වැඩිමනත් දෙන්න ගිය පොහොර වර්ගයක්. එම නිසා ගොවීන්ට කිසිදු ප්‍රශ්නයක් ඇති වෙන්නේ නැහැ.

එළඹෙන මහ කන්නය ඔක්තෝබර් මාසයේ 15වන දා තමයි පටන් ගන්නේ. ඔක්තෝබර් 15වන දා වෙනකොට හැම ගොවිජන සේවා මධ්‍යස්ථානයකටම කොම්පෝස්ට් පොහොර ටිකත්, ජෛව දියර පොහොර ටිකත්, පොටෑසියම් ක්ලෝරයිඩ් පොහොර ටිකත් දෙනවා. අපි පොස්පේට් දෙන්නේ නැහැ. මොකද, මහ පොළොවේ ඕනෑවටත් වැඩියෙන් පොස්පේට් තිබෙනවා. අපි පස පරීක්ෂා කරලා තිබෙනවා, පොළොවේ ඕනෑවටත් වඩා පොස්පේට් තිබෙනවා. එම නිසා ගොවීන්ට කිසිදු ප්‍රශ්නයක් ඇති නොකර අපි පොහොර ටික ලබා දෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
**(மாண்புமிகு இஷாக் ரஹுமான்)**
**(The Hon. Ishak Rahuman)**

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, 1905දී, සුද්දන්ගේ කාලයේ තමයි මහඉලුප්පල්ලම ගොවිපොළේ හණ වගාව ආරම්භ කර තිබෙන්නේ. ඊළඟට, MI 2 කියන මිරිස් වගාව හඳුන්වා දෙමින් 1956දී මහඉලුප්පල්ලම ගොවිපොළේ තමයි බීජ නිෂ්පාදනය ආරම්භ කළේ. එම බීජ මුළු රටටම බෙදා හැරලා, රමණීය වගාවක් තුළින් විශාල ආදායමක් ගත්ත තැනක් තමයි මහඉලුප්පල්ලම ගොවිපොළ.

ගරු ඇමතිතුමනි, ලංකාව ලෝකය එක්ක ගනුදෙනු කරනවා. ඔබතුමා දන්නවා greenhouse කියන අලුත්ම වගා ක්‍රමය ගැන. ඒ යටතේ වගා කටයුතු කරනකොට වැහි කාලයට සහ අව්ව වැඩි කාලයට මහ පොළොවට ඇති වන පීඩා, ඒ වාගේම කෘමි සතුන්ගෙන් ඇති වන හානිවලින් එම ගොවි මහතුන්ට තම වගාව බේරා ගන්න පුළුවන් වෙන්න ඕනෑ. ලංකාවේ තවම කීප දෙනෙක් පමණයි greenhousesවල වගා කරන්නේ. එයින් විශාල ආදායමක් ගන්න පුළුවන්. හැබැයි, අවශ්‍ය බීජ අපි පිට රටින් තමයි ගෙනෙන්නේ. එම නිසා අපිට විශාල මුදලක් ගෙවන්න වෙලා තිබෙනවා. කෘෂිකර්ම ඇමතිවරයා විධියට ඔබතුමා මෙයට මැදිහත් වෙලා, ගොවි මහතුන්ට සහන මිලට බීජ ලබා දීලා, ලංකාවේ නිෂ්පාදනය වැඩි කරන්න කටයුතු කරන්න කියලා මා ඉල්ලා සිටිනවා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
**(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)**
**(The Hon. Mahindananda Aluthgamage)**

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කියන දේ නිවැරදියි. අපි නවීන තාක්ෂණය කරා යන්න ඕනෑ. අපේ ගොවිපොළවල් 18ම නව තාක්ෂණය සමඟ දියුණු කරන්න කෙසේද කියන එක ගැන අපි පසුගිය සිකුරාදාත් සාකච්ඡා කරලා, අවසන් තීන්දුවකට ආවා. අපි වර්ග අඩි ලක්ෂයක polytunnels දෙනවා, ගොවිපොළකට. විසුරුම් ජල පද්ධතියත් එක්ක අපි ඒ සියල්ල ලබා දෙනවා. ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා අවශ්‍ය යැයි කියන නව තාක්ෂණය කරා අපි යනවා.

ගරු මන්ත්‍රීතුමනි, මේ වනකොට අපි බීජ වර්ග 28ක් ආනයනය කරනවා. අපේ මිරිස් පරිභෝජනය මෙට්‍රික් ටොන් 50,000යි. ඒ අවශ්‍ය මිරිස් ප්‍රමාණයෙන් සියයට සියයම අපි ආනයනය කරනවා. ඔබතුමා නියෝජනය කරන ප්‍රදේශයේ තමයි අපි මිරිස් බීජ හැදුවේ. අපි ඉදිරි වසර තුළ මිරිස් ආනයනය සම්පූර්ණයෙන් නතර කරනවා. මේ වන විට මහනුවර දිස්ත්‍රික්කයේ නාවලපිටිය ප්‍රදේශයේ අලුත්ගම ගම්මානයේ වර්ග අඩි 150,000ක රටේ අවශ්‍යතාවට සරිලන බීජ සියල්ල නිෂ්පාදනය කරනවා. මුලසුනේ සිටින ගරු මන්ත්‍රීතුමාත් ඒ කටයුත්ත කරනවාට විරුද්ධ වුණා. අපට හෙක්ටෙයාර 10,000ක් අවශ්‍යයි මිරිස් වගා කරන්න. ඒ සඳහා විශේෂයෙන්ම උතුරු, නැඟෙනහිර ඇතුළු ප්‍රදේශ ගණනාවක් හඳුනාගෙන තිබෙනවා. රටට අවශ්‍ය මිරිස් බීජ ටික අපි හදලා ඉවරයි. අපි ඉදිරි වසර තුළ මිරිස් වගා කරලා, පිට රටින් මිරිස් ආනයනය සම්පූර්ණයෙන් නතර කරනවා.

ඒ විතරක් නොවෙයි. අපි දඹුල්ල දිගන්පතන ප්‍රදේශයේ ගොවීන් 50දෙනෙකු හඳුනාගෙන, එක් ගොවියෙකුට ලක්ෂ 25 ගණනේ දීලා, ඔවුන් ලවා අවශ්‍ය ලූනු බීජ නිෂ්පාදනය කරලා, ඊළඟ අවුරුදු තුන ඇතුළත ලූනු ආනයනය සම්පූර්ණයෙන් නතර කරන්න කටයුතු කරනවා. අපි සීතාඑළිය ගොවිපළේ අල බීජ නිෂ්පාදනය සියයට 300කින් වැඩි කරලා, පිට රටින් අල ගෙනෙන එක නතර කරලා, රටට අවශ්‍ය අල ප්‍රමාණය නිෂ්පාදනය කරන්න කටයුතු කරනවා. අපේ බලාපොරොත්තුව යැපුම් ආනයන ආර්ථිකයෙන් මිදිලා නිෂ්පාදන ආර්ථිකයකට යාමයි. අපි පිට රටින් ගෙනෙන සියලු භෝග රටේම හදන වැඩ පිළිවෙළ සකස් කරලායි

තිබෙන්නේ. රටට බීජ ගෙන්වන එක නවත්වලා, බීජ අපේ රටේ හදලා, අපේ මහ පොළොවේ වගා කරන සියලු වැඩ පිළිවෙළ සකස් කරලා ඉවරයි. රටට වැඩියෙන්ම ගෙන්වන අල, ලූනු හා මිරිස් ආනයනය ඉදිරි වසර තුන තුළ නතර කිරීම කෙරෙහි අපේ අවධානය යොමු වෙලා තිබෙනවා. අපි හෝග වර්ග 16ක් හඳුනා ගෙන තිබෙනවා. එම හෝග 16ම අපේ රටේ නිෂ්පාදනය කරලා, අපේ රට ස්වයංපෝෂිත කරන්න බලාපොරොත්තු වනවා.

## 1983 වර්ෂයට පෙර උතුරු පළාතේ පැවැති ඉන්ධන පිරවුම්හල්: විස්තර

1983க்கு முன்பு வட மாகாணத்தில் செயற்பட்ட எரிபொருள் நிரப்பு நிலையங்கள்: விபரம்

FILLING STATIONS EXISTED IN NORTHERN PROVINCE PRIOR TO 1983: DETAILS

38/2020

**17. ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) 1983 වර්ෂයේදී සිවිල් යුද්මය තත්ත්වය ආරම්භ වීමට පෙර උතුරු පළාතේ පැවති ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට අයත් ඉන්ධන පිරවුම්හල්-

(i) සංඛ්‍යාව;

(ii) පිහිටා තිබූ ස්ථානවල ලිපිනය;

(iii) එම ඉන්ධන පිරවුම්හල්වල අයිතිකරුවන්ගේ නම්;

(iv) ඔවුන්ගේ ලිපිනය;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) ඉහත (අ) (iii) හි සඳහන් අයිතිකරුවන් අතරින් උතුරු පළාතේ පැවති සිවිල් යුද්මය කාල සීමාව තුළ ඝාතනය වීමෙන්, අතුරුදහන් වීමෙන් හෝ මිය යෑමෙන් එම පිරවුම්හල්වල අයිතිය වෙනස් වූයේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) එම පිරවුම්හල්වල නව අයිතිය ලබා ගත් අයිතිකරුවන්-

(i) සංඛ්‍යාව;

(ii) ඔවුන්ගේ නම්;

(iii) ලිපිනය;

(iv) පසු අයිතිකරුට, මුල් අයිතිකරුගේ ඥාතිත්වයක් තිබේ නම්, එම ඥාතිත්වය;

කවරේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

வலுசக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) 1983ஆம் ஆண்டில் உள்நாட்டு யுத்த நிலைமை ஆரம்பிக்க முன்னர், வடக்கு மாகாணத்தில் காணப்பட்ட இலங்கைப் பெற்றோலியக் கூட்டுத்தாபனத்திற்குரிய எரிபொருள் நிரப்பு நிலையங்களின் -

(i) எண்ணிக்கை எவ்வளவு என்பதையும்;

(ii) அமைக்கப்பட்டிருந்த இடங்களின் முகவரிகள் யாவையென்பதையும்;

(iii) மேற்குறிப்பிட்ட எரிபொருள் நிரப்பு நிலையங்களின் உரிமையாளர்களது பெயர்கள் யாவை என்பதையும்;

(iv) அவர்களது முகவரிகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) மேற்குறிப்பிட்ட (அ)(iii) இல் குறிப்பிட்ட உரிமையாளர்களுள், வட மாகாணத்தில் இடம்பெற்ற உள்நாட்டு யுத்த காலப் பகுதியினுள் கொலை செய்யப்பட்டு, காணாமல்போனதன் காரணமாக அல்லது இறப்பின் காரணமாக குறிப்பிட்ட எரிபொருள் நிரப்பு நிலையங்களின் உரிமையானது மாற்றமடைந்ததா என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) மேற்குறிப்பிட்ட எரிபொருள் நிரப்பு நிலையங்களில் புதிதாக உரித்தினைப் பெற்றுக்கொண்ட உரிமையாளர்களின் -

(i) எண்ணிக்கை எவ்வளவு என்பதையும்;

(ii) அவர்களின் பெயர்கள் யாவை என்பதையும்;

(iii) முகவரிகள் யாவை என்பதையும்;

(iv) பின் உரிமையாளர்களுக்கு, முன் உரிமையாளர்களது உறவுமுறைமையொன்று காணப்படுமாயின் குறித்த உறவுமுறை யாது என்பதையும்;

அவர் இச்சபைக்கு மேலும் அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Energy:

(a) Will he inform this House in regard to the fuel filling stations that existed in the Northern Province before the commencement of the civil war in the year 1983 -

(i) the number of filling stations;

(ii) the addresses of the places in which they were situated;

(iii) the names of the owners of the aforesaid filling stations; and

(iv) the addresses of the owners of the aforesaid filling stations?

(b) Will he also inform this House whether the ownership of the aforesaid filling stations was changed due to the fact that the owners referred to in (a) (iii) above were killed, went on missing or died during the period in which the civil war existed in the Northern Province?

(c) Will he further inform this House in regard to the persons who obtained the new ownership of the aforesaid filling stations-

(i) the number of owners;

(ii) their names;

(iii) their addresses; and

(iv) the relationship of the subsequent owner to the original owner, if there is any?

(d) If not, why?

**ගරු උදය ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய கம்மன்பில)
(The Hon. Udaya Gammanpila)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) පිරවුම්හල් 34කි.

(ii) ඇමුණුම් අංක (01) හි තීරු අංක 05 යටතේ දක්වා ඇත.

ඇමුණුම් අංක (01)/ ANNEXURE (01)

**CEYLON PETROLEUM CORPORATION OWNED DEALER OPERATED(CODO) OUTLETS IN NORTHERN AREA (BEFORE 1983)**

| No. - (තීරු අංක 01/ Col No. 01) | A/C No. - (තීරු අංක 02/ Col No. 02) | Location - (තීරු අංක 03/Col No. 03) | Dealer - (තීරු අංක 04/Col No. 04) | Address - (තීරු අංක 05/Col No. 05) |
|---|---|---|---|---|
| **JAFFNA DISTRICT** | | | | |
| 1 | 1035 | Pandatherippu | Mr.N.Vignarajah | Lanka Filling Station, Pandatharippu. |
| 2 | 1065 | Chavakachcheri | Chavakachcheri MPCS Ltd. | Chavakachcheri MPCS Ltd., Kandy Road, Chavakachcheri. |
| 3 | 1069 | Mallakam | Ala/Mallakam MPCS Ltd. | Alaveddy / Mallakam MPCS Ltd., Co-op. Road., Alaveddy. |
| 4 | 1154 | Jaffna | Jaffna MPCS Ltd. | Jaffna MPCS Ltd., No. 127, KKS Road, Jaffna. |
| 5 | 1166 | Jaffna | Saravanapavan S. | Mr.S.Saravanapavan, Lanka Filling Station, Main Street, Jaffna. |
| 6 | 1211 | Kankesanthurai | Tellipalai MPCS | Tellipalai MPCS Ltd., Tellipalai. |
| 7 | 1243 | Maruthanamadum | Mr.K.M.Vickneswararajah | Lanka Filling Station, Maruthanamadum. |
| 8 | 1260 | Sithankerny | Mr.M.Sakthivel | Lanka Filling Station, Chankanai. |
| 9 | 1381 | Jaffna | Lexsiva Purchase & Sales Ltd. | Lanka Filling Station, No. 128, Kasthuriyar Road, Jaffna. |
| 10 | 1407 | Karainagar | Shanmugaratnam K. | Mr.K.Shanmugaratnam, Lanka Filling Station, Karainagar. |
| 11 | 1443 | Nelliyady | Kaddaively MPCS Ltd. | Kaddaively Nelliyady MPCS Ltd., Nelliyady, Karaveddy. |
| 12 | 1473 | Manipay | Manipay Parish MPCS Ltd. | Manipay Parish MPCS Ltd., Ponnallai Road, Manipay. |
| 13 | 1522 | Kodikamam | Then. East MPCS Ltd. | Then. East MPCS Ltd., Kodikamam. |
| 14 | 1535 | Jaffna | Mrs.J.C.S.Pathmanathan | Lanka Filling Station, No. 21, Clock Tower Road, Jaffna. |
| 15 | 1676 | Point Pedro | Point Pedro MPCS Ltd. | Point Pedro MPCS Ltd., Point Pedro. |
| 16 | 1720 | Nallur | Mr.S.Singaravadevelu | Lanka Filling Station, Kalviyankaddu. |
| 17 | 1742 | Atchuvely | Vali East (N/D) MPCS Ltd. | Vali East Nothern Division MPCS Ltd., Atchchuvely, Puttur. |
| 18 | 1776 | Chunnakam | Nagalingam & sons N.S. | M/s. N.S.Nagalingam & sons, Lanka Filling Station, Chunnakam. |
| 19 | 1788 | Kopay | Vali East (S/D)MPCS Ltd. | Vali East Southern Division MPCS Ltd., Neervely. |
| 20 | 1917 | VVT | Mrs.R.Shanmugavadivel | Lanka Filling Station, Valvettithurai. |
| 21 | 1949 | Jaffna | Markfed Ltd. | Markfed Ltd., No. 165, Kasthuriyar Road, Jaffna. |
| 22 | 1970 | Velanai | Velanai MPCS Ltd. | Velanai MPCS Ltd., Velanai. |
| 23 | 1985 | Puloly | Puloly MPCS Ltd. | Puloly MPCS Ltd., Puloly East, Point Pedro. |
| 24 | 1341 | Paranthan | Karaichy North MPCS | Karaichy North MPCS Ltd., Paranthan. |
| 25 | 1687 | Pallai | M/s. Segaram & Sons | Lanka Filling Station, Pallai |
| 26 | 1758 | Killinochi | Karaichy South MPCS | Karaichy South MPCS Ltd., Kilinochchi. |
| **MULLAITIVU DISTRICT** | | | | |
| 27 | 1496 | Mullaitivu Town | Maritimappattu MPCS Ltd. | Maritimapattu MPCS Ltd., Mullaitivu. |
| 28 | 1968 | Mankulam | Vavuniya North MPCS | Vavuniya North MPCS Ltd., Nedunkerney, Vavuniya. |
| **VAVUNIYA DISTRICT** | | | | |
| 29 | 1074 | Vavuniya | Vavuniya South MPCS Ltd. | Vavuniya South MPCS Ltd., Station Road, Vavuniya. |
| 30 | | Vavuniya | Mrs.Pulenthiran | A/9 Road, Vavuniya. |
| **MANNAR DISTRICT** | | | | |
| 31 | 1234 | Madhu Road | Mr.M.M.Mohamed Ratnam | Lanka Filling Statio, Maddu Junction, Maddu. |
| 32 | 1378 | Murunkan | Mr.S.Anton | Mr.S.Anton, Lanka Filling Station, Murunkan Piddy, Murunkan. |
| 33 | 1432 | Uiylankulam | Manthai South MPCS | Manthai South MPCS Ltd., Uyilankulam |
| 34 | 1882 | Mannar | Manthai West MPCS | Manthai West MPCS Ltd., Thirukketheeswaram, Mannar. |

(iii) එම ඉන්ධන පිරවුම්හල්වල පූර්ණ අයිතිය ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සතු වේ.

(iv) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, අංක 609, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 09.

(ආ) ඉහත දක්වන ලද ඉන්ධන පිරවුම්හල් කිසිවක අයිතිය වෙනස් වී නොමැති අතර එම ඉන්ධන පිරවුම්හල් සියල්ලෙහිම පූර්ණ අයිතිය මේ දක්වාම ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සතු වේ.

(ඇ) (i) අදාළ නොවේ.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(iv) අදාළ නොවේ.

(ඈ) අදාළ නොවේ.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට ගරු ඇමතිතුමාගෙන් දැනගන්න අවශ්‍ය වෙලා තිබුණේ, අපේ රටේ යුදමය තත්ත්වය ආරම්භ වීමට පෙර උතුරු පළාතේ තෙල් බෙදා හැරීම සඳහා පෞද්ගලික නියෝජිත ඉන්ධන පිරවුම්හල් තිබුණාද කියලායි. එතුමාගේ පිළිතුර අනුව නම් එහෙම එකක්වත් නැහැ, සියලුම ඒවා රජය මැදිහත්වෙලා කළා කියන අදහසයි ඉදිරිපත් වෙන්නේ.

**ගරු උදය ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய கம்மன்பில)
(The Hon. Udaya Gammanpila)

ගරු මන්ත්‍රීතුමනි, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව යටතේ තිබෙන ඉන්ධන බෙදන පිරවුම්හල් වර්ග දෙකක් තිබෙනවා. ඉන් එකක්, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සතු පිරවුම්හල්. ඒවා නියෝජිතයෙකුට භාර දීලා තිබෙනවා, කොමිස් මුදලක් ලබාගෙන තෙල් බෙදා හරින්න. අනෙක් ඒවා පෞද්ගලික හිමිකාරිත්වයේ තිබෙන ඒවායි. ඒවා අපෙන් තෙල් මිලදී ගෙන බෙදා හැරීම කරනවා. උතුරු පළාතේ දීර්ඝ කාලයක් යුද්ධය පැවැති නිසා අර දෙවන ගණයේ පිරවුම්හල් ආරම්භ වන විට උතුරට ඒවා හඳුන්වා දීමක් සිද්ධ වෙලා නැහැ.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඔබතුමා පළමුවන අතුරු ප්‍රශ්නය ඇහුවා නේ.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒක පැහැදිලි කර ගැනීමක්.

මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, මේ දවස්වල රටේ ජනතාව ඔබතුමාගේ අමාත්‍යාංශය පිළිබඳව උනන්දුවෙන් බලනවා. ඊයේ පෙරේදා ඉන්දීය විදේශ ලේකම්වරයා ලංකාවට පැමිණ ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි බලන්න ගියා. මේ තෙල් ටැංකි පිළිබඳ කාරණයේ ඉතිහාසය ගත්තාම, අනිවාර්යයෙන්ම ඔබතුමා කියන්නේ මෙය 2003 වසරේදී එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව පටලවපු එකක් කියලායි. ඉතිහාසයේ එහෙම වරදක් වෙලා තිබෙනවා නම් ඒක සුද්ද කරන්න මම උත්සාහ කරන්නේ නැහැ. නමුත්, මා දන්නා තරමින් එදා ඉන්ධන පිරවුම්හල් - filling stations- 103ක් සහ තෙල් ටැංකි 12ක් සඳහා අවශ්‍ය ගිවිසුම් පත්‍ර සකස් වුණා. ඉන්ධන පිරවුම්හල් සඳහා අවුරුදු 20ක කාල සීමාවක් ඇතුළත් වුණා. මා වැරදි නම්, නිවැරදි කරන්න. ඒ කියන්නේ, 2003 සිට 2023 දෙසැම්බර් වෙනකොට මා දන්නා තරමින් ඒ ගිවිසුම් කාලය අවසානයි. මෙවැනි වටපිටාවක් තුළ IOC සමාගමට ලබාදී තිබෙන ඉන්ධන පිරවුම්හල්වලට අදාළ ගිවිසුම්වල කාල සීමාව 2023 වසරේ අවසන් වෙනවා. එතැනින් එහාට අවශ්‍ය කටයුතු කරන්න මේ වෙනකොට ඔබතුමා කැබිනට් මණ්ඩලය හරහා මේ සම්බන්ධ පනත සංශෝධනය කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග අරගෙන තිබෙනවා. ඉන්දියාවේ ඉල්ලීම තෙල් ටැංකි 12න් නවතින්නේ නැහැ, තව ප්‍රමාණයක් ඕනෑය කියන තැන ඉන්දියාව ඉන්නවා කියා මම හිතනවා. අපිට තව ආරංචි වෙනවා, "භාරත් පෙට්‍රෝලියම්" කියන ඉන්දියානු සමාගමත් මෙහාට එන්න ඉල්ලීම් කර තිබෙනවා කියලා. මේ ඔක්කොම මම ඉදිරිපත් කරන ප්‍රශ්නවලට වඩා සමාජය තුළ කතිකා වන ප්‍රශ්න.

මා ළඟ දැන් තිබෙනවා, ගරු වමින්ද විජේසිරි මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නයකට ඔබතුමා දීපු උත්තරයක් ඇතුළත් හැන්සාඩ් වාර්තාව. ඔබතුමා ගරු සභාවේ නොමැති වේලාවක එතුමා ඒක ආපහු සැරයක් පාර්ලිමේන්තුවේ කියෙව්වා. එතුමා, බැසිල් රාජපක්ෂ අමාත්‍යවරයා මෙවර පාර්ලිමේන්තු ඇවිල්ලා දිවුරුම් දුන් දිනයේම ඔබතුමාගෙන් ඇහුවා ජාතික දේපළ විකුණන්න ඔබතුමාට බල කළොත් ඔබතුමා ගන්නා තීන්දුව මොකක්ද කියලා. ඒ වේලාවේ ඔබතුමා කෙළින් කිව්වා, "මම හිතට එකඟව එවැනි තීන්දුවක් ගන්නේ නැහැ, මම කාටවත් වග කියන්නේ නැහැ, මම වග කියන්නේ ජනාධිපතිතුමාටයි, අගමැතිතුමාටයි විතරයි" කියලා. ඒ භයිය තුළ ඉඳගෙන ඔබතුමා මේ මොහොතේදී කටයුතු කරනවා ඇතැයි මම විශ්වාස කරනවා. ඩලස් අලහප්පෙරුම ඇමතිතුමා දිගින් දිගටම හිර කරන්න හැදුවා. අන්තිමේදී එතුමා අමාත්‍ය ධුරය දාලා ගියා කියලා මේ රටේ දේශපාලනය ගැන තේරෙන පුංචි දරුවෙක් වුණත් දන්නවා. හැබැයි, දැන් ඒකට ඩම්යක් තියලා තියෙනවා. මම භය නැතිව අහනවා, ඇමති ඩම්යක් තබාගෙන මේ රටේ සම්පත් විකුණන වේලාවක ඔබතුමාත් මේ උගුලට හසුවෙලා ඉන්නවාද, එහෙම නැත්නම් එහෙම දෙයක් වෙන්ට දෙන්නේ නැහැ කියන සහතිකය නැවත වතාවක් ජාතියට දෙන්න ඔබතුමාට පුළුවන්ද කියලා.

**ගරු උදය ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய கம்மன்பில)
(The Hon. Udaya Gammanpila)

ගරු මන්ත්‍රීතුමනි, ඉතාම වැදගත් ප්‍රශ්නයක් මතු කිරීම ගැන ඔබතුමාට මගේ ප්‍රණාමය පුද කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තෙල් ටැංකි සම්බන්ධයෙන් මේ දිනවල පැතිරී යන්නේ හුඹස් බියක්. පුංචි ඇත්තක් මත ලොකු බොරුවක් හදන්න පුළුවන් සමහර දේවල් තිබෙනවා. මේකේ පුංචි ඇත්තක්වත් නැහැ. "ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි ටික දෙන්න යනවා, ඉන්දියානු විදේශ ලේකම්වරයායි, බලශක්ති අමාත්‍යවරයායි ගමන් කරපු හෙලිකොප්ටරය මෙන්න" කියලා විපක්ෂයේ හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා හෙලිකොප්ටරයක් පෙන්වමින් ජනමාධ්‍ය හමුවකදී කිව්වා මම දැක්කා. එතුමා හිතනවා ඇති, මේ රටේ ජනතාව කන්නේ තණකොළ කියලා. එතුමා අපහාස කළේ මේ රටේ ජනතාවටයි. ඉන්දියානු විදේශ ලේකම්වරයා මාව හමු වෙන්න අවස්ථාවක්වත් ඉල්ලා නැහැ. එහෙම හමුවීමේ අවශ්‍යතාවක් මතු වෙලාත් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තෙල් ටැංකි ඉන්දියාවට දෙන්න දෙයක් නැහැ. තෙල් ටැංකි 100ම ඉන්දියාවට දීලා ඉවරයි; සදාකාලිකවම දීලා ඉවරයි. ඉන්දු-ලංකා ගිවිසුමේ කොටසක් ලෙස

[ගරු උදය ගම්මන්පිල මහතා]

සැලකෙන, ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාත්, රජීව් ගාන්ධි අගමැතිතුමාත් අතර හුවමාරු වූ ලිපියේ- [බාධා කිරීමක්] මට මේක කියන්න දෙන්න. රජීව් ගාන්ධි අගමැතිතුමාත්, ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාත් අතර හුවමාරු වූ ලිපියේ දෙවැනි ඡේදයේ තුන්වැනි උපඡේදයේ ඉතා පැහැදිලිව සඳහන් වෙනවා, "ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි සංවර්ධනය කළ හැක්කේ ඉන්දියාව සමඟ පමණයි" කියලා. 1987දීත්, 2003දීත් තමුන්නාන්සේලා එම තෙල් ටැංකි ටික ඉන්දියාවට දීලා ඉවරයි. ඒ තෙල් ටැංකි යළි අප සතු කර ගැනීමේ වැඩ පිළිවෙළක් සකස් කර ගන්න තමයි මම ඉන්දියාව සමඟ හැප්පෙමින් වසරක් පුරා බරපතළ වෑයමක යෙදී ඉන්නේ. දැන් දෙන්න දෙයක් නැහැ. දුන්නේ තමුන්නාන්සේලායි. දැන් මම උත්සාහ කරන්නේ තමුන්නාන්සේලා දුන්නු දේ ආපහු ගන්නයි. ආපහු ගන්න හදනකොට කවුරු හරි "දෙනවෝ, දෙනවෝ" කියලා කෑ ගහනවා නම්, ඒ අය ඉන්දියාවේ වුවමනාවක් ඉටු කරන අය මිසක්, ලංකාවේ වුවමනාවක් වෙනුවෙන් පෙනී සිටින අය නොවෙයි කියන එක මම ඉතාම වග කීමෙන් ප්‍රකාශ කරන්න ඕනෑ.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු ඇමතිතුමනි, ඔබතුමා මගේ නම කියපු නිසායි මම කථා කරන්නේ. ඔබතුමා කිව්වා, හාමු මහත්තයාගේ ගෙදර බල්ලා වාගේ තමයි ඔබතුමා මේ දවස්වල ආණ්ඩුවේ ඉන්නේ කියලා. අනෙක් තෙල් ටැංකි 75ම ඉන්දියාවට දෙනවාද, නැද්ද කියලා මේ ගරු සභාවට ස්ථිර වශයෙන් කියන්න.

**ගරු උදය ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய கம்மன்பில)
(The Hon. Udaya Gammanpila)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා කථා කරන එක බොහොම හොඳයි. කථා කරන්න කලින් එතුමා කරුණු හැදෑරීමක් කරලා කථා කරනවා නම්, ඒක එතුමාට ඡන්දය දුන් ජනතාවට කරන ගෞරවයක් විධියට මා සලකනවා. ගරු මන්ත්‍රීතුමනි, එම තෙල් ටැංකි 100ම තමුන්නාන්සේලා ඉන්දියාවට දීලා ඉවරයි. අපට අමුතුවෙන් දෙන්න දෙයක් නැහැ. ටැංකි 100ම දීලායි තිබෙන්නේ. 2003දී අත්සන් කරපු ගිවිසුම බලන්න. මම ඒ වගන්තිත් එක්කයි කිව්වේ. ඒක බලන්න. තමුන්නාන්සේලා කිසි දෙයක් කියවන්නේ නැතුව මෙතැනට ඇවිල්ලා බොරුවට කථා කරන්න එපා. 2023දී ආපහු දෙන්නේ නැහැ. පවතින ගිවිසුම වසර 35ක් සඳහා අත්සන් කරපු ගිවිසුමක්. ඒ වසර 35 ඉවර වුණාම නැවතත් ඉන්දියාවටම තමයි අයිති වෙන්නේ. ඉන්දු-ලංකා ගිවිසුමේ දෙවැනි ඡේදයේ තුන්වැනි උපඡේදයෙන් ඒ තෙල් ටැංකි සදහටම ඉන්දියාවට දෙන්න බැඳිලා ඉවරයි. අපි මේ උත්සාහ කරන්නේ, තමුන්නාන්සේලා සදහටම ඉන්දියාවට දුන්නු දේ යළි ලංකාව සතු කර ගන්නයි.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්න මෙයයි.

ගරු ඇමතිතුමනි, මා දන්නා තරමින් දීලා තිබෙන්නේ තෙල් ටැංකි 12යි. ඔබතුමා 100ක් කියනවා. එම තෙල් ටැංකි 100ම අපට ගන්න පුළුවන් නම්, ඔබතුමාගේ ඒ ක්‍රියාමාර්ගය ගැන මේ රටේ ජනතාව අනාගතයේත් කතා කරාවි, "මෙන්න, ඉතිහාසයේ මෙවැනි ඇමතිවරයෙක් මේ වාගේ කාල සීමාවක මේ විධියට කටයුතු කර තිබෙනවා" කියලා. ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් අහන මේ ප්‍රශ්නයට ඔබතුමා සාධාරණ උත්තරයක් දෙන්න. මොකද, අනෙක් ඇමතිවරයාගෙන් අහලා වැඩක් නැහැ. ප්‍රශ්නය ඇහුවාට ඒ ඇමතිතුමාට උත්තර දෙන්න තේරෙන්නේ නැහැ. ඔබතුමා කැබිනට් එකේ ඉන්න, මේ විෂයයට සම්බන්ධ ඇමතිවරයකු විධියට මම ඔබතුමාගෙන් මේ ප්‍රශ්නය අහනවා. LNG බලාගාරය සම්බන්ධ ගිවිසුම - agreement - පසුගිය දිනක රාත්‍රී 12.06ට අත්සන් කළා කියලා කථා වෙනවා. නමුත්, අපි තවමත් ඒ ගිවිසුම දැක්කේ නැහැ. එම ගිවිසුමේ තිබෙන කාරණා ගැන අද රටේ ජනතාව තවම හරියට දන්නේ නැහැ. ඔබතුමා තෙල් ටැංකි ටික බේරාගන්න මෙහේ ඉඳලා උත්සාහ ගන්නකොට, LNG බලාගාර නිර්මාණය වෙලා, LNG සැපයීමේ ඒකාධිකාරයක් ඇමෙරිකානු සමාගමක් විසින් නිර්මාණය කර ගැනීමේ අනතුරක් තිබෙනවාද? ඔබතුමා එක පාරටම "එහෙම එකක් නැහැ" කියනවා නම් මා තවත් කාරණයක් දැන ගන්න කැමැතියි. ඒ තමයි එවැනි තත්ත්වයකට ආවොත්, ඇමෙරිකාව මෙහේ supplying power තබා ගත්තොත් අපට අනතුරක් තිබෙනවාද කියන ප්‍රශ්නයට මට උත්තරයක් දෙන්න.

ඒ වාගේම, ඔබතුමන්ලාගේ ගරු ජනාධිපතිතුමා සහ කැබිනට් මණ්ඩලය පොරොන්දු වුණා, මේ රටේ දේපළ කිසිවක් විකුණන්නේ නැහැ, පසුගිය යහපාලන ආණ්ඩුව විකුණපු දේපළ, වරාය පවා නැවත අයිති කර ගන්නවා කියලා. නමුත් දැන් විකුණන දේපළ අපට නම් කරලා කියන්න පුළුවන්. [බාධා කිරීමක්] නැහැයි කිව්වාට විකුණනවා නේ, නැත්නම් බදු දෙනවානේ. මේ ප්‍රශ්නය හැම කෙනාගෙන්ම අහන්න බැහැ. රටට ආදරය කරන, යම් කිසි දැනුමක් තිබෙන, මේ රට ගැන ආදරයක් තිබෙන ඇමතිවරයකු වන ඔබතුමා ඒ ස්ථාවරයට එකඟව මේ ගරු සභාවේ වාඩි වෙලා නැහැ කියා මම විශ්වාස කරනවා. නමුත්, මේ වෙනුවෙන් සාධනීය මැදිහත් වීමක් වෙන්න ඔබතුමාට හයියක් තිබෙනවාද? මේ වෙනුවෙන් යම් කිසි ක්‍රියාමාර්ගයක් ගන්න තිබෙන අවස්ථාවක, අඩුම ගණනේ ඩලස් අලහප්පෙරුම ඇමතිතුමා ගත් ක්‍රියාමාර්ගයවත් අරගෙන මේ රට වෙනුවෙන් යම් පණිවුඩයක් දෙන්න ඔබතුමා සූදානම්ද කියන කාරණය මා දැන ගන්න කැමැතියි. මම මේ ප්‍රශ්නය ඔබතුමාගෙන් අහන්නේ, මේක හැම කෙනෙකුගෙන්ම අහලා වැඩක් නැති නිසා සහ උදය ගම්මන්පිලගේ band එක මේකට විරුද්ධ band එකක් කියා විශ්වාස කරන නිසායි.

**ගරු උදය ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய கம்மன்பில)
(The Hon. Udaya Gammanpila)

ගරු මන්ත්‍රීතුමනි, තෙල් ටැංකි 100ක් වුණේ කොහොමද කියලා ඔබතුමා ඇහුවා. ගුවන් හමුදාවට අයත් යානයක් කඩා ගෙන වැටිලා එක ටැංකියක් විනාශවෙලා තිබුණු නිසා තමුන්නාන්සේලාගේ ආණ්ඩුව කාලයේ තෙල් ටැංකි 99යි LIOC එකට භාර දුන්නේ. භාර දුන්නේ තෙල් ටැංකි 99ක් වුණත්, LIOC එක එම ටැංකිය යළි එතැන හදලා තිබෙන නිසා දැන් ටැංකි 100ක් බවට පත්වෙලා තිබෙනවා. LNG සම්බන්ධයෙන් අහපු ප්‍රශ්නයට උත්තරය වෙන්නේ, "ඔව්, ඒ සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලයට පත්‍රිකාවක් ඉදිරිපත් වුණා" කියන එකයි.

උපාය මාර්ගික වශයෙන් වැදගත් සම්පත් රැක ගැනීම වෙනුවෙන් අපි පෙනී ඉන්නවා. ගරු මන්ත්‍රීතුමනි, පෞද්ගලික අංශය බලශක්තිය හා සම්බන්ධ ව්‍යාපාරවලට සම්බන්ධ වනවාට අපි විරුද්ධ නැහැ. එසේ සියයට 40ක් කොටස් මිලදී ගැනීම සම්බන්ධයෙන් මට නම් ප්‍රශ්නයක් නැහැ. මගේ ප්‍රතිපත්තිවලට එයින් කිසිම බාධාවක් නැහැ. අද අපේ රටේ සියයට 100ක් පෞද්ගලික අංශයට අයිති mini-hydros තිබෙනවා. සියයට 100ක් පෞද්ගලික අංශයට අයිති සූර්ය විදුලි බලාගාර, සුළං විදුලි බලාගාර තිබෙනවා. ඒ නිසා ඔය කියන සියයට 40 කොටස් මිලදී ගැනීම ගැන නම් කිසි ප්‍රශ්නයක් නැහැ. [බාධා කිරීමක්] ඔව්. ඇමෙරිකානු සමාගමට ගෑස් පිළිබඳ ඒකාධිකාරය ලබා දීම අපට ප්‍රශ්නයක් තමයි. එය අපේ බලශක්ති සුරක්ෂිතතාවට බලපාන්නේ කොහොමද, යහ පාලනයට බලපාන්නේ කොහොමද, රාජ්‍ය

තාන්ත්‍රික සබඳතාවලට බලපාන්නේ කොහොමද වාගේම අප කැණීමට බලාපොරොත්තු වන මන්නාරම් ද්‍රෝණියේ ගෑස් නිධි සඳහා ආයෝජකයන් ආකර්ෂණය කිරීමට බලපාන්නේ කොහොමද කියා මා අමාත්‍ය මණ්ඩලයට නිරීක්ෂණ දෙකක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ කාරණා අමාත්‍ය මණ්ඩලය ඇතුළේ තිබේවි.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සිවඥානම් ශ්‍රීතරන් මන්ත්‍රීතුමා.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
வலுசக்தி அமைச்சர் கௌரவ உதய கம்மன்பில அவர்களிடம் விசேடமான ஒரு கோரிக்கையை முன்வைக்க விரும்புகின்றேன். Hon. Minister, Please.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමා, ඔබතුමා කැමැති නම් පැහැදිලි කිරීමක් කරන්න.

**ගරු උදය ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய கம்மன்பில)
(The Hon. Udaya Gammanpila)
ගරු මන්ත්‍රීතුමා, එහෙම නම් අහන්න.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
கௌரவ அமைச்சர் அவர்களே, உங்களுடைய விடைகள் பொருத்தமானதாக இருந்ததை நான் அவதானித்தேன். ஆனால், வடக்கு மாகாணத்திலே இருந்த ஒரேயொரு எரிபொருள் சேகரிப்பு நிலையமான கிளிநொச்சி எரிபொருள் சேகரிப்பு நிலையமானது, இன்று அடியோடு இல்லாமல்போய் விட்டது. அந்த இடத்தின் முற்பகுதியில் தனியாருக்கு எரிபொருள் விற்பனை நிலையமொன்று மட்டும் அமைத்துக் கொடுக்கப்பட்ட நிலையில், அந்தக் காணியின் மிகுதிப் பகுதி வெறுமையாக இருக்கின்றது. யாழ்ப்பாணம், கிளிநொச்சி, வவுனியா, மன்னார் மற்றும் முல்லைத்தீவு ஆகிய 05 மாவட்டங்களையும் உள்ளடக்கும் வகையில் ஒரு பெரிய நிலப்பரப்பில் கிளிநொச்சியில் இருந்த எரிபொருள் சேகரிப்பு நிலையம் இதுவரை புனரமைக்கப்படவில்லை. நான் இந்தப் பாராளுமன்றத்திற்கு வந்து கிட்டத்தட்ட 12 ஆண்டு களாகின்றன. இக்காலப் பகுதியில் இது சம்பந்தமாகப் பல கேள்விகளைக் கேட்டிருக்கின்றேன். இது சம்பந்தமான கேள்வி ஒன்றை உங்களுக்கும் முன்வைத்திருந்தேன். ஆனால், இதுவரை அதற்கு விடை கிடைக்கவில்லை. ஆகையால், தயவுசெய்து அந்த எரிபொருள் சேகரிப்பு நிலையத்தைப் புனரமைத்துத் தருமாறு கேட்டுக்கொள்கின்றேன்.

கடந்த காலங்களில் தென்பகுதியிலிருந்து புகையிரதம் மூலம் எரிபொருள் கொண்டுவரப்பட்டு அங்கு சேகரிக் கப்பட்டது. அங்கிருந்துதான் ஏனைய இடங்களுக்கு எரிபொருள் விநியோகிக்கப்பட்டது. இப்பொழுது, கொழும்பி லிருந்து நேரடியாகவே bowsers மூலம் எரிபொருள் கொண்டுவருகின்ற நிலைமை இருக்கின்றது. ஆகவே, அந்த எரிபொருள் சேகரிப்பு நிலையத்தைப் புனரமைப்பதற்கு ஏதேனும் வாய்ப்பு உண்டா? தயவுசெய்து, இதைப் பற்றி ஏதாவது சொல்ல முடியுமா?

**ගරු උදය ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய கம்மன்பில)
(The Hon. Udaya Gammanpila)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා ඉතා වැදගත් ප්‍රශ්නයක් මතු කළේ. හරි නම්, උතුරු පළාතේ කිලිනොච්චිය වාගේ ප්‍රදේශයක තමයි අපේ ඉන්ධන ගබඩාව තිබිය යුත්තේ. එසේ නොවන හින්දා, එතුමා ඉතා නිවැරැදිව සඳහන් කළා වාගේ අපේ තෙල් බවුසර් කන්කසන්තුරේට අරගෙන ගිහින්, වව්නියාව දක්වා ආපහු පහළට අරගෙන එනවා. හැබැයි ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් දන්නවා- [බාධා කිරීමක්] මම පිළිතුර දෙන්නම්. ඒ නිසා අපි දැන් බලාපොරොත්තු වෙනවා,- [බාධා කිරීමක්] එය කන්කසන්තුරේට ගෙන ගිය හේතුව මේකයි. යුද සමයේ අපේ ඒ-9 මාර්ගය වසා තැබුණා. හදිසි අවශ්‍යතාවකදී ගොඩබිම් මාර්ගයෙන් වාගේම නැව් මඟිනුත් ඉන්ධන ගෙන යන්න පුළුවන්කම තිබෙන්න ඕනෑ නිසා තමයි ඉන්ධන ගබඩාව කන්කසන්තුරේ පවත්වාගෙන යන්නේ. ඉන්ධන ගබඩාව රට මැදට ගෙන එමු කියන යෝජනාව මා අපේ නිලධාරින්ට ඉදිරිපත් කළා. එතකොට අපේ නිලධාරින් කිව්වා, ඉන්ධන අවශ්‍යතාවෙන් සියයට 85ක්ම යාපනය අර්ධද්වීපයට වන නිසා එය කන්කසන්තුරේ පැවැතීම ගැටලුවක් නැහැ කියලා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දකින මේ ප්‍රශ්නය මේ පාර්ලිමේන්තු සතිය ඇතුළත ලිඛිතව මට ඉදිරිපත් කළොත්, මා ඒ ප්‍රශ්නය ගැන නිලධාරින් සමඟ යළි සාකච්ඡා කරලා, ඔබතුමාට පිළිතුරක් එවන්නම්.

## මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළේ වී ගබඩා කිරීම: විස්තර

### மத்தள ராஜபக்ஷ சர்வதேச விமான நிலையத்தில் நெல் களஞ்சியப்படுத்தல்: விபரம்

### STORAGE OF PADDY AT MATTALA RAJAPAKSA INTERNATIONAL AIRPORT: DETAILS

1019/2020

**18.** **ගරු යූ.කේ. සුමිත් උඩුකුඹුර මහතා**
(மாண்புமிகு யூ.கே. சுமித் உடுகும்புர)
(The Hon. U.K. Sumith Udukumbura)
සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ ශ්‍රී ලංකාවට සම්පතක් වන බවත්;

(ii) පසු ගිය රජය සමයේදී එහි වී ගබඩා කරන ලද බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) ඉහත සඳහන් ගුවන් තොටුපළ තුළ වී ගබඩා කිරීමට හැකියාවක් තිබේද;

(ii) එම ගුවන් තොටුපළේ වී ගබඩා කරන ලද ස්ථානය කවරේද;

(iii) ගබඩා කරන ලද වී ප්‍රමාණය කොපමණද;

(iv) ඒ සඳහා උපදෙස් දෙන ලද පුද්ගලයන්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

[ගරු යූ.කේ. සුමිත් උඩුකුඹුර මහතා]

(ඈ) (i) වී ගබඩා කර තැබීමෙන් පසු එම පරිශ්‍රය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(ii) ඒ සඳහා වගකිව යුතු පුද්ගලයන්ගෙන් එම මුදල අය කර ගැනීමට කටයුතු කර තිබේද;

(iii) නො එසේ නම්, ඉදිරියේදී අය කර ගැනීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) ජාත්‍යන්තර ගුවන් තොටුපළක් තුළ වී ගබඩා කිරීමෙන් ශ්‍රී ලංකාව අන්තර්ජාතික වශයෙන් අපකීර්තියට පත් වූයේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඉ) නො එසේ නම්, ඒ මන්ද?

சுற்றுலாத்துறை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மத்தள ராஜபக்ஷ சர்வதேச விமான நிலையம் இலங்கைக்குப் பெரும் சொத்தாக உள்ளதென் பதையும்;

(ii) கடந்த ஆட்சிக் காலத்தில் அதில் நெல் களஞ்சியப் படுத்தப்பட்டதென்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) மேற்குறிப்பிட்ட விமான நிலையத்தில் நெல் களஞ்சியப்படுத்தும் சாத்தியம் உள்ளதா என்ப தையும்;

(ii) மேற்படி விமான நிலையத்தில் நெல் களஞ்சியப் படுத்தப்பட்ட இடம் யாதென்பதையும்;

(iii) களஞ்சியப்படுத்தப்பட்ட நெல்லின் அளவு எவ்வளவென்பதையும்;

(iv) இதற்காக ஆலோசனை வழங்கிய ஆட்களின் பெயர்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) நெல் களஞ்சியப்படுத்தப்பட்ட பின்னர் அவ் வளாகத்தை மீளப் புனரமைப்பதற்குச் செலவிடப் பட்ட தொகை எவ்வளவென்பதையும்;

(ii) அதற்குப் பொறுப்புக்கூறவேண்டிய ஆட்களிட மிருந்து அப்பணத்தை அறவிடுவதற்கு நடவடிக்கை எடுக்கப்பட்டுள்ளதா என்பதையும்;

(iii) இன்றேல், எதிர்காலத்தில் அறவிடுவதற்கு நடவடிக்கை எடுக்கப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) சர்வதேச விமான நிலையமொன்றில் நெல் களஞ்சியப் படுத்தியதன்மூலம் இலங்கை சர்வதேச ரீதியாக அபகீர்த்திக்கு உள்ளானதா என்பதையும் அவர் மேலும் இச்சபைக்கு அறிவிப்பாரா?

(உ) இன்றேல், ஏன்?

asked the Minister of Tourism:

(a) Is he aware that -

(i) the Mattala Rajapaksa International Airport is an asset for Sri Lanka; and

(ii) paddy was stored there under the former Government?

(b) Will he inform this House -

(i) whether it is possible to store paddy in the said Airport;

(ii) the place where paddy was stored in that Airport;

(iii) the amount of paddy stored there; and

(iv) the names of persons who advised to do so?

(c) Will he also inform this House -

(i) the amount of money spent for rehabilitating the premises subsequent to the storing of paddy;

(ii) whether action has been taken to recover that amount from the persons responsible for that; and

(iii) if not, whether action will be taken to recover that in due course?

(d) Will he further inform this House whether Sri Lanka's international reputation was tarnished as a result of storing paddy at an international airport?

(e) If not, why?

**ගරු ඩී. වී. චානක මහතා (ගුවන් සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு டி.வி. சானக - விமானச் சேவைகள் மற்றும் ஏற்றுமதி வலயங்கள் அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. D.V. Chanaka - State Minister of Aviation and Export Zones Development)

ගරු කථානායකතුමනි, සංචාරක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළ ශ්‍රී ලංකාවට සම්පතක් වේ.

(ii) ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගම හා වී අලෙවි මණ්ඩලය අතර 2015 සැප්තැම්බර් 15 දින ඇති කරගත් අවබෝධතා ගිවිසුමෙහි එකඟතාව මත මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළෙහි ගුවන් බඩු පර්යන්තයේ වී ගබඩා කර ඇත. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගම වෙනුවෙන් එවකට එහි සභාපති ආනන්ද විමලසේන මහතා හා වී අලෙවි මණ්ඩලය වෙනුවෙන් එවකට එහි සභාපති එම්.බී. දිසානායක මහතා මෙම ගිවිසුමට අත්සන් කර ඇති අතර, එහි පිටපතක් ඇමුණුම 01 වශයෙන් ඉදිරිපත් කරමි.

වී ගබඩා කිරීම සඳහා වූ අවබෝධතා ගිවිසුමට එළඹීමට පෙර වී අලෙවි මණ්ඩලයේ සභාපතිවරයා විසින් 2015.08.05වන දිනැතිව "සභාපති, ශ්‍රී ලංකා ගුවන් සේවා අධිකාරිය" ලෙස අමතන ලද ලිපියට අනුව 2015 යල කන්නයේ වී මිලදී ගැනීමට ප්‍රමාණවත් ගබඩා පහසුකම් වී අලෙවි මණ්ඩලය සතුව නොමැති හෙයින් මත්තල ගුවන් තොටුපොළෙහි ඇති ගබඩාවල වී තොග ගබඩා කිරීමට ඇති හැකියාව පිළිබඳව සොයා බලන ලෙස එවකට ගරු අග්‍රාමාත්‍යතුමා විසින් උපදෙස් ලබා දී ඇති බව සඳහන් කර ඇත.

එම ලිපිය ඇමුණුම 02 වශයෙන් ඉදිරිපත් කරමි.

ඇමුණුම් 01 සහ 02 **සභාගත*** කරමි.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ඒ අනුව, 2015.09.01 දින සිට මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ ගුවන් බඩු පර්යන්ත ගොඩනැඟිල්ල වී අලෙවි මණ්ඩලයේ බලය ලත් නිලධාරියෙකු විසින් භාර ගත් බවත්, ඒ අනුව අවබෝධතා ගිවිසුමක් අත්සන් කළ යුතු බවත්, 2015.10.01 දිනැතිව ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගමේ සභාපතිවරයා විසින් වී අලෙවි මණ්ඩලයේ සභාපති වෙත දන්වා ඇත.

(ආ) (i) ජාත්‍යන්තර ගුවන් තොටුපොළක එලෙස වී ගබඩා කිරීමේ හැකියාවක් නැත.

(ii) එම ගුවන් තොටුපොළේ වී ගබඩා කරන ලද්දේ ගුවන් බඩු පර්යන්ත ගොඩනැඟිල්ල තුළ ය.

(iii) වී බුසල් 197,794.88කි. (4,054,795kg)

(iv) 2015.08.05 වන දිනැතිව "සභාපති, ශ්‍රී ලංකා ගුවන් සේවා අධිකාරිය" ලෙස අමතන ලද ලිපියට අනුව 2015 යල කන්නයේ වී මිලදී ගැනීමට ප්‍රමාණවත් ගබඩා පහසුකම් වී අලෙවි මණ්ඩලය සතුව නොමැති හෙයින් මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ ඇති ගබඩාවල වී තොග ගබඩා කිරීමට ඇති හැකියාව පිළිබඳව සොයා බලන ලෙස ගරු අග්‍රාමාත්‍යතුමා විසින් උපදෙස් ලබා දී ඇත.

ඒ අනුව ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගමේ සභාපතිවරයා විසින් 2015.09.01 දිනැති ලිපියෙන් වී අලෙවි මණ්ඩලයේ සභාපතිවරයා වෙත මත්තල ගුවන් තොටුපොළේ වී ගබඩා කිරීමට අදාළ අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලෙසට දන්වා යවන ලදී. එම ලිපියට අනුව අවබෝධතා ගිවිසුමට ගුවන් තොටුපොළ හා ගුවන් සේවා සමාගම වෙනුවෙන් එහි සභාපතිවරයා විසින් අත්සන් කර ඇත.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please!

දිවා විවේකයට පෙර, මේ ප්‍රශ්නයට සම්පූර්ණ පිළිතුර ලබා දීම සඳහා අවශ්‍ය කාලය ලබා දීමට ගරු සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வி. சானக)
(The Hon. D.V. Chanaka)

(ඇ) (i) මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළෙහි වී ගබඩා කර තැබීමෙන් පසු එම පරිශ්‍රය යළි ප්‍රතිසංස්කරණය කිරීමේදී VRV වායු සමීකරණ පද්ධතිය හා සන්නිවේදන පද්ධතිය - fiber splicing - අලුත්වැඩියා කිරීම සඳහා සහ එකී පරිශ්‍රය පිරිසිදු කර යථා තත්ත්වයට පත් කිරීමට රුපියල් 1,130,089.55ක මුදලක් ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම වැය කර ඇත.

ගුවන් බඩු පර්යන්තයේ සවි කර ඇති පාලම් තරාදිය අලුත්වැඩියා කිරීම හා වායු සමීකරණ යන්ත්‍ර නැවත ස්ථාපනය කිරීම සඳහා ශ්‍රීලංකන් ගුවන් සමාගමට පිළිවෙළින් රුපියල් 1,179,360.00ක් හා රුපියල් 1,141,000.00ක මුදලක් ද වැය වී ඇත. ඒ අනුව, ශ්‍රීලංකන් ගුවන් සමාගම වැය කර ඇති මුළු මුදල රුපියල් 2,320,360.00ක් වේ.

(ii) රුපියල් 1,130,089.55ක් වූ, ගුවන් තොටුපොළ හා ගුවන් සේවා සමාගමට සිදු වූ පාඩුව වෙනුවෙන් මුදල් ලබා දෙන ලෙස 2017.01.02, 2019.12.10 හා 2021.01.11 දිනැතිව අවස්ථා ගණනාවකදීම වී අලෙවි මණ්ඩලයට දන්වා ඇත.

2021.02.24 දිනැතිව වී අලෙවි මණ්ඩලයේ සභාපති දන්වා ඇත්තේ මෙකී මුදල් ගෙවීමට තීරණයක් ගනු ලැබුවද ඒ සඳහා මුදල් ගෙවීමට ප්‍රතිපාදන ආයතනය සතුව නොපවතින බවයි.

(iii) වී අලෙවි මණ්ඩලයෙන් එකී මුදල අය කර ගැනීමට සිහි කැඳවීමක් වර්ෂ 2019 දෙසැම්බර් මස 10වන දින යවා ඇතත්, ඊට ද පිළිතුරක් නොලැබුණු හෙයින් වර්ෂ 2021 පෙබරවාරි මස 11 දිනැතිව ද වී අලෙවි මණ්ඩලය වෙත නැවත ලිපියක් යොමු කර ඇත.

එම ලිපියට පිළිතුරු වශයෙන් 2021.02.24 දිනැති පිළිතුරු ලිපියෙන් දන්වා ඇත්තේ මත්තල ගුවන් තොටුපොළේ වී ගබඩාව සම්බන්ධයෙන් ජනාධිපති කොමිෂන් සභාව මඟින් කරුණු විමර්ශනය කර ඇති බවට වාර්තා වන හෙයින් එම කොමිෂන් සභාවේ නිර්දේශයන් සම්බන්ධයෙන් රජය ගනු ලබන තීරණ මත ඉදිරි ක්‍රියා මාර්ග ගැනීම සුදුසු බවත්, මේ වන විට වී අලෙවි මණ්ඩලය කටයුතු කරනු ලබන්නේ මහා භාණ්ඩාගාරයෙන් ලබා දෙන්නා වූ ප්‍රතිපාදන මඟින් හා බැංකුවලින් ලබා දෙන ණය පදනම් කරගෙන බැවින් මෙම අලාභය ගෙවීමට මුදල් ප්‍රතිපාදන වී අලෙවි මණ්ඩලය සතුව නොමැති බවත් ය.

(ඈ) මේ පිළිබඳව ජාත්‍යන්තර මාධ්‍ය තුළින් කරන ලද ප්‍රචාර හේතු කොටගෙන මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළෙහි සක්‍රියභාවය පිළිබඳව යම් යම් විමසීම් කරන ලදී.

මත්තල ගුවන් තොටුපොළේ වී ගබඩා කිරීම නිසා දෙපළවලට සිදු වූ මූල්‍යමය පාඩුව රුපියල් 2,088,049.55කි. ඊට අමතරව වැඩිපුර මාස හය හමාරක කාලයක් වී ගබඩා කර තිබීම සඳහා වූ නොගෙවන ලද බදු මුදල රුපියල් 5,428,359.63ක් වන අතර නොගෙවූ විදුලි සහ ජල බිල්පත්වල වටිනාකම 2021.01.31වන විට රුපියල් 545,125.97කි. සමාජමය හා ජාත්‍යන්තර වශයෙන් මත්තල ගුවන් තොටුපොළට සිදු වූ අලාභය මූල්‍යමය වශයෙන් ගණනය කර නොමැත. මේ අතර වී ගබඩා කිරීම හේතුවෙන් වූ අහිතකර මාධ්‍ය ප්‍රචාරය සහ ගුවන් භාණ්ඩ හා මඟී මෙහෙයුම් සිදු නොවීම ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගමට ශ්‍රීලංකන් ගුවන් සමාගම මෙන්ම ජාතික ආදායමට දායක වන රේගුව ඇතුළු රාජ්‍ය හා පෞද්ගලික ආයතනයන්ට සෘජුව හා වක්‍රව සිදු වූ හානිය විශාල ය.

(ඉ) අදාළ නොවේ.

**ගරු යූ.කේ. සුමිත් උඩුකුඹුර මහතා**
(மாண்புமிகு யூ.கே. சுமித் உடுகும்புர)
(The Hon. U.K. Sumith Udukumbura)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

විශේෂයෙන්ම මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ වී ගබඩා කරන්න උපදෙස් දී තිබෙන්නේ එවකට අග්‍රාමාත්‍යවරයා වූ

[ගරු යූ.කේ. සුමිත් උඩුකුඹුර මහතා]

රනිල් වික්‍රමසිංහ මැතිතුමා බව පිළිතුරේ සඳහන් වනවා. රනිල් වික්‍රමසිංහ හිටපු අග්‍රාමාත්‍යතුමාත්, ඒ වාගේම අවුරුදු 20ක් හම්බන්තොට දිස්ත්‍රික්කයට නායකත්වය ලබා දුන් සජිත් ප්‍රේමදාස මැතිතුමාත් -වර්තමාන විපක්ෂ නායකතුමාත්- තමයි ඒ නියෝගය ක්‍රියාත්මක කරන්න නිලධාරින්ට අවශ්‍ය උපදෙස් ලබා දී තිබෙන්නේ. මම අපේ ගරු රාජ්‍ය අමාත්‍යතුමාගෙන් අහන්න කැමැතියි, මේ ආකාරයට ද්වේෂයෙන් එම ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ වී ගබඩා කරන්න නියෝගය නිකුත් කරන්නේ ජාත්‍යන්තර ගුවන් තොටුපොළක් හම්බන්තොට දිස්ත්‍රික්කයේ, මත්තල පවත්වාගෙන යෑම නුසුදුසු නිසාද කියලා.

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வி. சானக)
(The Hon. D.V. Chanaka)

ගරු මන්ත්‍රීතුමනි, මම පැහැදිලිවම කියන්න ඕනෑ, එම ගුවන් තොටුපොළ වී ගබඩාවක් කිරීමට ගත් තීරණය වෛරයකින්, ද්වේෂයකින් ගත් තීරණයක් බව. අවුරුදු 20ක් සජිත් ප්‍රේමදාස මැතිතුමා එම දිස්ත්‍රික්කයේ නායකයා වශයෙන් සිටියදී එය වී ගබඩාවක් කිරීමට යන විට ඊට සහයෝගය ලබා දීම පිළිබඳව අපි කනගාටු වෙනවා. විශේෂයෙන් මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළ සෑදීමේදී අවශ්‍ය පාරිසරික වාර්තා, feasibility reports - ඒ සියලු දේවල් - අරගෙන තමයි හදලා තිබෙන්නේ.

ඒ වාගේම එදා ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා එය තනි ව්‍යාපෘතියක් වශයෙන් නොවෙයි ආරම්භ කළේ. වරාය, ගුවන් තොටුපොළ, highway එක ආදි සියල්ල කේන්ද්‍ර කරගෙන තමයි මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළ එතුමා ආරම්භ කළේ. ඒ තුළින් එක පැත්තකින් Industrial Park එක හැදෙනවා. ගුවන් තොටුපොළ, වරාය එක්ක රට විශාල සංවර්ධනයක් කර ගෙන යන්න තමයි ඒ ගුවන් තොටුපොළ හැදුවේ. අවාසනාවකට, රටට ලැබෙන්න තිබුණු ආදායම එය වී ගබඩාවක් කිරීම නිසා අහිමි වුණා. අවුරුදු තුනකට වැඩි කාලයක් ඒ ගුවන් තොටුපොළ වසා දමා තිබුණා. ඒ නිසා ලංකාවට ලැබෙන්න තිබුණු රුපියල් බිලියන පහකට -රුපියල් කෝටි 500කට- වැඩි මුදලක් අහිමි වෙලා තිබෙනවා. තවත් පැත්තකින්, ජාත්‍යන්තර ගුවන් තොටුපොළවල් දෙකක් තිබීමේ වාසිය ලබා ගන්න බැරි වුණා. අපේ ගුවන් කලාපය ඉහළින් ගුවන් යානා ගමන් කළත් ඒ වෙනුවෙන් ආදායමක් ලැබෙන බව අපි දන්නවා. ඒ සියල්ල අහිමි වෙලා තිබුණා. හැබැයි, අද වන කොට එය නැවත වතාවක් යථා තත්ත්වයට පත් වෙමින් යනවා.

**ගරු යූ.කේ. සුමිත් උඩුකුඹුර මහතා**
(மாண்புமிகு யூ.கே. சுமித் உடுகும்புர)
(The Hon. U.K. Sumith Udukumbura)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. විශේෂයෙන්ම අපේ ගරු රාජ්‍ය අමාත්‍යතුමා ප්‍රකාශ කළා, මේ රටට ලැබෙන්න තිබුණු රුපියල් බිලියන පහක මුදලක් රටට අහිමි කළා කියලා. ඒ කටයුත්ත සඳහා උපදෙස් ලබා දී තිබෙනවා, එවකට අග්‍රමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහත්මයා. ඒ වාගේම, ඒ නිලධාරින් මේ පාඩුවට වග කියන්න ඕනෑ. මේ පාඩුව තවම රජයට අය වෙලා නැති බව මා විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. අදත් උදෙන්ම රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඇවිල්ලා පාස්කු ඉරු දින ප්‍රහාරය සම්බන්ධයෙන් අත්අඩංගුවට අරගෙන ඉන්න මන්ත්‍රීතුමා වෙනුවෙන් කිඹුල් කඳුළු හෙළුවා. විශේෂයෙන්ම අපි මතක් කරන්න ඕනෑ, එතුමන්ලා එදා ගත්තේ වැරදි තීන්දු බව. ISIS පුහුණුව ලබපු ත්‍රස්තවාදීන් මේ රටේ ඉන්නවා කියලා අපේ රටේ බුද්ධි අංශ ආරක්ෂක කවුන්සලයට මුලින්ම දැනුම් දුන්නේ පාස්කු ඉරු දින ප්‍රහාරයට කලින් 2016 වර්ෂයේදී. එදා ඒවා තුට්ටුවකට ගණන් ගන්නේ නැතිව සිටියා. ඒ නිසා තමයි 2019 වර්ෂයේ පාස්කු ඉරු දින ප්‍රහාරය මේ රටේ සිද්ධ වුණේ. ඒ වාගේ කටයුතු කරපු අය අද උදේම පාර්ලිමේන්තුවට ඇවිල්ලා අහනවා, "මොනවාද චෝදනා?" කියලා. එතුමාට චෝදනා කියලා දෙන්න අපට අවශ්‍ය නැහැ. එතුමා දැනුවත් කරන්න අපට අවශ්‍ය නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමා, අදාළ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

**ගරු යූ.කේ. සුමිත් උඩුකුඹුර මහතා**
(மாண்புமிகு யூ.கே. சுமித் உடுகும்புர)
(The Hon. U.K. Sumith Udukumbura)

මේ රටේ ජනතාවට අපි මතක් කර දෙනවා, එදා බලයට පත් වෙච්ච අගමැතිවරයා රාජපක්ෂලාට විරුද්ධව, රාජපක්ෂලාගෙන් පළිගන්න කළේ මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ වී ගබඩා කළ බව. අපේ ගරු රාජ්‍ය ඇමතිතුමාගෙන් මම අහන්නේ, ඒ ජාත්‍යන්තර ගුවන් තොටුපොළ මඟින් අපේ රටට ලබා දෙන සේවය කුමක්ද කියලායි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඒ ප්‍රශ්නය අදාළ නැහැ. [බාධා කිරීමක්] ඔබතුමා අදාළ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න. [බාධා කිරීමක්] ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

**ගරු යූ.කේ. සුමිත් උඩුකුඹුර මහතා**
(மாண்புமிகு யூ.கே. சுமித் உடுகும்புர)
(The Hon. U.K. Sumith Udukumbura)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එවකට හිටපු රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යතුමා ඒ විනාශය කරපු ඒ ගුවන් තොටුපොළ අද අපේ රටට ලබා දෙන දායකත්වය කුමක්ද කියලා මම අපේ රාජ්‍ය අමාත්‍යතුමාගෙන් අහන්න කැමැතියි.

**ගරු ඩී. වී. චානක මහතා**
(மாண்புமிகு டி.வி. சானக)
(The Hon. D.V. Chanaka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඕනෑම රටක ජාත්‍යන්තර ගුවන් තොටුපොළවල් එකකට වැඩි සංඛ්‍යාවක් තිබෙන බව අපි දන්නවා. අපේ රටේ මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපොළ එදා වී ගබඩාවක් බවට පත් කළා. විශේෂයෙන්ම එදා කියපු දෙයක් තමයි, මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපොළ දියුණු කරන්න බැහැ කියන එක. හැබැයි අපි දන්නවා, මේ තිබෙන්නේ ලෝකයේ ගුවන් ක්ෂේත්‍රය සම්පූර්ණයෙන්ම කඩා වැටිච්ච මොහොතක් බව. මේ වන විට ලෝකයේ සියලු ගුවන් තොටුපොළවල පාහේ ආදායම කඩා වැටිලා තිබෙනවා. ගුවන් මඟී ප්‍රවාහනය සම්පූර්ණයෙන් කඩා වැටිලා. මෙය, cargo services පවා කඩා වැටිච්ච මොහොතක්. ලෝකයේම ගුවන් තොටුපොළවලින් කීපයක් විතරයි, තමන්ගේ ගුවන් ගමන් වාර ප්‍රමාණය වැඩි කරගෙන ඉදිරියට ගිහින් තිබෙන්නේ. ඒ කීපය අතරට අද මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළත් ඇතුළත් වෙලා තිබෙනවා. අද එහි ගුවන් ගමන් සාමාන්‍ය තත්ත්වයට පත් කරගෙන තිබෙනවා. විශේෂයෙන්ම ලංකාවට සංචාරකයන් පැමිණීමේදී යොදා ගන්නා ප්‍රධානම ගුවන් තොටුපොළක් බවට අද මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළ පත් වෙලා තිබෙනවා. මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළ හදපු දවසේ ඉඳන් අද දක්වා ගත්තාම, මෙච්චර ව්‍යසනයක් මැදත් එම ගුවන් තොටුපොළ මඟින් ලංකාවට වැඩිම ගුවන් මඟීන් සංඛ්‍යාවක් ගෙන්වා ගන්න මේ අවුරුද්දේ කටයුතු කර තිබෙනවා. සංචාරක කර්මාන්තයේ දියුණුවට වන විශාල දායකත්වය දැකලා තමයි මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා එදා ඒ ගුවන් තොටුපොළ

හැදුවේ. ඉදිරියේදී ලංකාවට වැඩිම ඩොලර් ගෙන එන එක් මූලස්ථානයක් බවට මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපොළ පත් වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please!

දිවා ආහාර විවේකය සඳහා පස් වරු 1.30 වන තෙක් සභාවේ කටයුතු තාවකාලිකව අත් හිටුවනවා.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.30ට නැවත පවත්වන ලදී.***
*அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 1.30 மணிக்கு மீண்டும் ஆரம்பமாயிற்று.*
*Sitting accordingly suspended till 1.30 p.m. and then resumed.*

**සහකාර මහ ලේකම්**
(உதவிச் செயலாளர் நாயகம்)
(Assistant Secretary-General)
කරුණාකර, කවුරු හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු මන්ත්‍රීවරයෙකුගේ නමක් යෝජනා කරන්න.

**ගරු තේනුක විදානගමගේ මහතා (ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு தேனுக விதானகமகே - கிராமிய மற்றும் பாடசாலை விளையாட்டு உட்கட்டமைப்பு வசதிகள் மேம்பாட்டு இராஜாங்க அமைச்சர்)
(The Hon. Thenuka Vidanagamage - State Minister of Rural and School Sports Infrastructure Improvement)
"ගරු අජිත් රාජපක්ෂ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

**ගරු ඩී. වී. චානක මහතා**
(மாண்புமிகு டி.வி. சானக)
(The Hon. D.V. Chanaka)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු අජිත් රාජපක්ෂ මහතා මූලාසනාරූඪ විය.***
*அதன்படி, மாண்புமிகு அஜித் ராஜபக்ஷ அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. AJITH RAJAPAKSE *took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ප්‍රශ්න අංක 19 -202/2020- (1), ගරු චමින්ද විජේසිරි මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 20 -258/2020- (1), ගරු චමින්ද විජේසිරි මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 21 -718/2020- (2), ගරු ශාන්ත බණ්ඩාර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## කැකිරාව පොලිස් ස්ථානය : අඩුපාඩු
## கெகிராவ பொலிஸ் நிலையம்: குறைபாடுகள்
## KEKIRAWA POLICE STATION: SHORTAGES

612/2020

**22. ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය -(1):

(අ) (i) කැකිරාව පොලිස් ස්ථානය මඟින් ග්‍රාම නිලධාරි කොට්ඨාස 49 ක් පමණ ආවරණය කරන අතර එහි පොලිස් නිලධාරින් 200 ක් පමණ සේවය කරන බවත්;

(ii) එම පොලිස් ස්ථානය පවත්වාගෙන යනු ලබන ගොඩනැඟිල්ල වසර 50ක් පමණ පැරණි බවත්;

(iii) එම පොලිස් ස්ථානයේ ඉතාම අබලන් තත්ත්වයේ පවතින බැරැක්ක භාවිතා කරනු ලබන නිලධාරින් වැසි දිනවලදී ඉතා අපහසුතාවකට පත්වන බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) කැකිරාව පොලිස් ස්ථානයේ පවතින අඩුපාඩු සම්පූර්ණ කිරීම සඳහා මේ වනවිට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பொதுமக்கள் பாதுகாப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கெகிராவ பொலிஸ் நிலையமானது சுமார் 49 கிராம உத்தியோகத்தர் பிரிவுகளை உள்வாங்குவதுடன், அங்கு சுமார் 200 பொலிஸ் உத்தியோகத்தர்கள் சேவையாற்றுகின்றனர் என்பதையும்;

(ii) மேற்படி பொலிஸ் நிலையம் இயங்கும் கட்டிடமானது சுமார் 50 வருட காலம் பழைமையானது என்பதையும்;

(iii) மேற்படி பொலிஸ் நிலையத்தில் மிகவும் சேதமடைந்த நிலையில் காணப்படும் பாளையங்களைப் பயன்படுத்தும் உத்தியோகத் தர்கள் மழைக் காலங்களில் மிகவும் அசௌகரியங்களுக்கு உள்ளாகின்றனர் என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) கெகிராவ பொலிஸ் நிலையத்தில் காணப்படும் குறைபாடுகளைத் தீர்ப்பதற்கான நடவடிக் கைகள் தற்போது மேற்கொள்ளப் பட்டுள்ளனவா;

(ii) ஆமெனில், அந்நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Security:

(a) Is he aware that -

(i) the Kekirawa Police Station covers about 49 Grama Niladhari Divisions and has a force of 200 police officers serving there;

[ගරු ගරු ඉෂාක් රහුමාන් මහතා]

(ii) the building which houses the police station concerned is around 50 years old; and

(iii) the police officers who use its barracks, which are in a state of dilapidation, fall into a serious inconvenience on rainy days?

(b) Will he inform the House -

(i) whether steps have been taken by now to remedy the deficiencies existing at the Kekirawa Police Station; and

(ii) if so, what those steps are?

(c) If not, why?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහජන ආරක්ෂක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඔව්. (නිලධාරීන් 182කි.)

(ii) ඔව්. (වසර 73 ක් පැරණිය.)

(iii) නැත.

ප්‍රමාණවත් බැරැක්ක පහසුකම් ඇත. පැරණි බැරැක්කයේ වහල අලුත්වැඩියා කර ඇති බැවින් ජල කාන්දුවක් සිදු නොවේ.

(ආ) (i) ඔව්.

(ii) 2021 ක්‍රියාකාරී සැලැස්මට අනුව අංග සම්පූර්ණ නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුව හා සම්බන්ධ වෙමින් රුපියල් 63,373,270.06 (හැටතුන් මිලියන තුන්ලක්ෂ හැත්තෑතුන්දහස් දෙසීය හැත්තෑවයි ශත හයක) යුත් බිල්පත් ඇස්තමේන්තුවක් සඳහා විධිමත් ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරමින් ලංසු පත් කැඳවීමට නියමිත බැවින් මෙම වර්ෂය තුළ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට හැකියාව ඇත.

(ඇ) පැන නොනඟී.

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)

මගේ අතුරු ප්‍රශ්නයක් තිබෙනවා. ගරු ඇමතිතුමා දැන් එයිද දන්නේ නැහැ.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

පුළුවන් දෙයක් නම් මම උත්තර දෙන්නම්, ගරු මන්ත්‍රීතුමනි. නැතිනම් ගරු ඇමතිතුමාට ප්‍රශ්නය යොමු කරන්නම්.

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)

ගරු ඇමතිතුමනි, විශේෂ ප්‍රශ්නයක් ඔබතුමාට මම මතු කරන්නේ.

මාතලේ දිස්ත්‍රික්කයේ ගලේවෙල බල ප්‍රදේශයේ police station එක තිබෙන්නේ කුලී පදනමක් මත තාවකාලිකව ගත්ත ඉඩමක. එම ඉඩම 1963දී අබ්දුල් හමීඩ් කියන ව්‍යාපාරිකයා තමයි පොලීසියට බාර දීලා තිබුණේ. ඒ කාලයේ ගිවිසුමක් තිබුණේ නැහැ. දෙගොල්ලන්ගේ සාකච්ඡා අනුව එම ගොඩනැගිල්ල පොලීසියට බාර දීලා තිබෙනවා. එම ගොඩනැගිල්ලේ ප්‍රමාණය අක්කරයයි. 1974 පළමුවැනි මස 01වන දා නබඩගහවත්ත Children's Education Centre එකට එම ගොඩනැගිල්ල සහිත ඉඩමේ අක්කරයක ප්‍රමාණයක් ත්‍යාගයක් වශයෙන් බාර දී තිබෙනවා. හැබැයි, දිගින් දිගටම කුලී පදනම මත ඉඳලා 1997.01.01 දින එදා හිටපු සභාපති ඒ.එච්.එම්. මන්සූර් මහතා මාතලේ පොලීසියේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ඔස්ටින් ගුණතිලකට මාසිකව රුපියල් හයදහසක කුලී පදනමක් මත ගිවිසුමකට ගිහිල්ලා මෙය බාර දීලා තිබෙනවා, ගරු ඇමතිතුමනි. අක්කරයක ඉඩම ගොඩනැගිල්ලත් එක්ක රුපියල් 6,000ක කුලී පදනමට තමයි දීලා තිබෙන්නේ. ඒක ඉතාම කනගාටුදායක තත්ත්වයක්; අසාධාරණයක්. ගිය ආණ්ඩුව තියෙද්දිත් මම එදා හිටපු පොලීසිය භාර ඇමතිතුමා එක පාරක් නොවෙයි, කිහිප සැරයක්ම ගිහිල්ලා හම්බ වුණා. එදා කටින් බතල හිටෙව්වා. මට උත්තරයක් හම්බ වුණේ නැහැ, ගරු ඇමතිතුමනි. ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, අද ඉන්න පොලිසිය භාර ඇමතිතුමාට මේ ප්‍රශ්නය ඉදිරිපත් කරලා විසඳුමක් ලබා දෙන්න කියලා. ඒ ඉඩම එතුමා සමාජයට භාර දීපු දෙයක්; education සඳහා භාර දීපු දෙයක්. එතුමන්ලා දැන් ඉල්ලන්නේ ඒ ගොඩනැගිල්ලයි, ඒ භූමි ප්‍රමාණයයි Education Department එකට ලබා දෙන්න කියලා. ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, ගරු ජනාධිපතිතුමාත් එක්කත් ඒ ගැන සාකච්ඡා කරන්න කියලා. අපේ මුදල් ඇමති බැසිල් රාජපක්ෂ ඇමතිතුමා සමස්ත ලංකාවේම බිලියන ගණනින් සංවර්ධන කටයුතු කරනවා. ඇයි, මේ වාගේ අසාධාරණයක් කරන්නේ ගරු ඇමතිතුමනි? ඔබතුමා ඉදිරිපත් වෙලා මේකට ඉතා ඉක්මනින් විසඳුමක් ලබා දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු මන්ත්‍රීතුමනි, මම ඇමතිතුමාට ඒ ප්‍රශ්නය යොමු කරන්නම්. මේක ඉඩම් ප්‍රශ්නයක්.

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)

නැහැ, නැහැ. ඉඩම් ප්‍රශ්නයක් නොවෙයි.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

නැහැ, මම කියන්නේ ඉඩම් නඩුවක්.

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)

නඩුවක් නැහැ.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ඒක කුලියට දීලා. ඊට පස්සේ තෑගි දීලා. ආපසු කුලිය වැඩි කරලා. මේ පාර්ලිමේන්තුවේ ඉන්න නීතිඥ වෘත්තිය කරපු මන්ත්‍රීවරුන් මේවා ගැන දන්නවා. මේක ඉඩම් නඩුවක් වාගේ.

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)

තවම ගිවිසුමක් නැහැ.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ඒ ප්‍රශ්නය මගේ අමාත්‍යාංශයට අදාළ ප්‍රශ්නයක් නොවෙයි. අද ඇමතිතුමා ඇවිල්ලා හිටියා.

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
ගරු ඇමතිතුමනි, මේ ගැන නඩුවක් උසාවියේත් නැහැ. පොලිස් දෙපාර්තමේන්තුවත් එක්ක agreement එකක් විතරයි තිබෙන්නේ.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
තිබෙන agreements ගැන දන්නවා නේ.

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
රුපියල් 6,000ක කුලියට දීලා තිබෙන්නේ.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
කවුරු හරි ගෙයකට රිංගා ගත්තාම එළවා ගන්න බැහැ, අවුරුදු දහය, පහළොව නඩු යනවා. මම මේ ප්‍රශ්නය ඇමතිතුමාට යොමු කරන්නම්. පොලීසියත් තිබෙන්න එපා යැ.

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
පොලීසිය එපා කියලා අපි කියන්නේ නැහැ. මාතලේ ගලේවෙල ප්‍රදේශයෙන් ඉඩමක් දෙන්න -

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
බැරිද, ඒක භාගය, භාගය බෙදා ගන්න?

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
අපි කැමැතියි, ඔබතුමන්ලා එක්ක සාකච්ඡා කරලා විසඳුමකට එන්න.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ඇමතිතුමාට කියන්නම්, සාකච්ඡා කරන්න කියලා.

## සැරයන් නිලයෙන් පහළ පොලිස් නිලධාරින්: සුදුසුකම්වලට සරිලන උසස්වීම්
## 'சார்ஜன்ட்' பதவிக்குக் கீழுள்ள பொலிஸ் உத்தியோகத்தர்கள்: தகைமைகளுக்கு உகந்த பதவி உயர்வுகள்
## POLICE OFFICERS BELOW RANK OF SERGEANT: QUALIFICATION-BASED PROMOTIONS

733/2020

**23. ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ පොලිස් සැරයන් නිලයෙන් පහළ නිලවල සේවය කරනු ලබන උපාධිධාරී පොලිස් නිලධාරින් සංඛ්‍යාව කොපමණද;

(ii) අධ්‍යාපන සුදුසුකම්වලට සරිලන උසස්වීම් නොලැබීම හේතුවෙන් එම නිලධාරින් දැඩි ලෙස කලකිරීමට හා මානසික පීඩාවකට පත් වී ඇති බව පිළිගන්නේද;

(iii) එසේ නම්, එම නිලධාරින්ගේ අධ්‍යාපන සුදුසුකම්වලට සරිලන උසස්වීම් ලබා දී ඔවුන්ගෙන් ඵලදායී සේවාවක්, ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවට ලබා ගැනීමට කටයුතු කරන්නේද;

(iv) එම නිලධාරින්ට උසස්වීම් ලබා දීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பொதுமக்கள் பாதுகாப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கைப் பொலிஸ் திணைக்களத்தில் பொலிஸ் 'சார்ஜன்ட்' பதவிக்குக் கீழுள்ள பதவிகளில் பணிபுரியும் பட்டதாரி பொலிஸ் உத்தியோகத்தர்களின் எண்ணிக்கை எத்தனை;

(ii) கல்வித் தகைமைகளுக்கு உகந்த பதவியுயர்வுகள் கிடைக்கப்படாமை காரணமாக மேற்படி உத்தியோகத்தர்கள் பாரிய மன விரக்திக்கும் மன அழுத்தத்திற்கும் உள்ளாகியுள்ளனர் என்பதை ஏற்றுக்கொள்வாரா;

(iii) ஆமெனில், மேற்படி உத்தியோகத்தர்களின் கல்வித் தகைமைகளுக்கு உகந்த பதவி உயர்வுகளை வழங்கி அவர்களிடமிருந்து பயனுள்ள சேவையினைப் பொலிஸ் திணைக்களத்திற்குப் பெற்றுக்கொள்வதற்கு நடவடிக்கை எடுக்கப்படுமா;

(iv) மேற்படி உத்தியோகத்தர்களுக்குப் பதவி உயர்வுகளை வழங்குவதற்கு எடுக்கப்படும் நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Security:

(a) Will he inform this House -

(i) the number of graduate police officers serving in the ranks below the rank of Sergeant of Police in the Sri Lanka Police Department;

(ii) whether he admits that the aforesaid officers have been severely disappointed and mentally distressed as they do not get promotions to suit their educational qualifications;

(iii) if so, whether action will be taken to give them promotions to suit their educational qualifications and to obtain a productive service from them for the Sri Lanka Police Department; and

[ගරු ඉෂාක් රහුමාන් මහතා]

(iv) the measures that will be taken to give promotions to the aforesaid officers?

(b) If not, why?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහජන ආරක්ෂක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i)

| | |
|---|---|
| පොලිස් සැරයන් | 90 |
| කාන්තා පොලිස් සැරයන් | 05 |
| පොලිස් කොස්තාපල් | 86 |
| කාන්තා පොලිස් කොස්තාපල් | 23 |
| පොලිස් සැරයන් රියැදුරු | 01 |
| පොලිස් කොස්තාපල් රියැදුරු | 01 |
| එකතුව | 206 |

(ii) නැත.

ශ්‍රී ලංකා පොලිසියේ නියාමන සේවා ගණයේ කනිෂ්ඨ ශ්‍රේණිය සඳහා වන අනුමත බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියට අනුකූලව මෙම නිලධාරීන්ගේ බඳවා ගැනීම් හා තනතුරෙන් තනතුරට උසස් කිරීම් කර ඇත.

(iii) අනුමත බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියට අනුකූලව කටයුතු කරනු ලැබේ.

(iv) ශ්‍රී ලංකා පොලිසියේ නියාමන සේවා ගණයේ පරීක්ෂක ශ්‍රේණිය සඳහා වන අනුමත බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය අනුව සේවා කාලය වසර පහක් සම්පූර්ණ කර ඇති කනිෂ්ඨ ශ්‍රේණියේ උපාධිධාරී නිලධාරීන්ට සීමිත තරග විභාග පදනම යටතේ උප පොලිස් පරීක්ෂක තනතුරට උසස්වීම් ලබා ගැනීමට අවස්ථාව සලසා ඇත.

එමෙන්ම මෙම නිලධාරීන්ට අදාළ වන ශ්‍රී ලංකා පොලිසියේ නියාමන සේවා ගණයේ කනිෂ්ඨ ශ්‍රේණිය සඳහා වන අනුමත බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියට අනුකූලව ඊළඟ තනතුරට උසස්වීම් ලබා දීමේදී ඔවුන්ගේ විශේෂ අධ්‍යාපනික දක්ෂතා, සේවා කාලය, උපාධි හා කුසලතා ඇගයීමට විධිවිධාන සැලසී ඇත.

ඒ අනුව, ශ්‍රී ලංකා පොලිසියේ පොලිස් සැරයන් තනතුරෙන් පහළ නිලවල සේවය කරනු ලබන උපාධිධාරී පොලිස් නිලධාරීන් සඳහා නිසි ක්‍රමවේදයක් යටතේ උසස්වීම් ලබා දීම තුළින් මෙම නිලධරයන්ගේ ඵලදායී සේවාවක් ශ්‍රී ලංකා පොලිසියට ලබා ගැනීමට හැකි වනු ඇත.

(ආ) අදාළ නොවේ.

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)

ගරු ඇමතිතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

නාවික හමුදාව 1950.12.09වනදා, යුද හමුදාව 1949.10.10වන දා, ගුවන් හමුදාව 1951.03.03වන දා, සිවිල් ආරක්ෂක බලකාය 1986.01.01වන දා, පොලිසිය 1866.09.03වන දා තමයි ආරම්භ කර තිබෙන්නේ. දැනට ලංකාවේ පොලිස් නිලධාරීන් 84,000ක් පමණ ඉන්නවා. නමුත්, ඉතා කනගාටුදායක තත්ත්වයක් තිබෙනවා, ගරු ඇමතිතුමනි. ලංකාවේ ගුවන් හමුදාවේ සිට මම කියපු සෑම හමුදාවකම නිලධාරීන්ට ආහාර දීමනාවක් දෙනවා. හැබැයි, පොලිසියේ නිලධාරීන්ට පමණක් ආහාර දීමනාවක් දෙන්නේ නැහැ. ඒ ගැන ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරලා පොලිසියේ නිලධාරීන්ටත් ආහාර දීමනාවක් ලබා දෙන්න කටයුතු කරන්න කියා මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අතිගරු ජනාධිපතිතුමා ජනාධිපති වූ විගස මේ උසස්වීම් ගැන වහාම වැඩ පිළිවෙළක් සකස් කරන්න කියලා නියෝග කළා. එම නිසා ඒ අසාධාරණකම්වලට සාධාරණත්වය ලබා දෙන්න අපි ඉදිරියේදී බලාපොරොත්තු වෙනවා. ඔබතුමාගේ කෑම ප්‍රශ්නය මම විෂය භාර ඇමතිතුමාට යොමු කරන්නම්.

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)

කෑම ප්‍රශ්නය මගේ නොවෙයි, ඇමතිතුමනි. එය පොලිස් නිලධාරීන්ගේ ප්‍රශ්නයක්.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

හරි. හරි. පොලිසියේ තමයි. ඔබතුමා පොලිසිය වෙනුවෙන් පෙනී ඉඳලා නේ මේ ප්‍රශ්න අහන්නේ. මම ඒ විෂය භාර ඇමතිවරයා නොවෙයි. මම මේ ප්‍රශ්නය විෂය භාර ඇමතිවරයාට යොමු කරන්නම්.

## ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව: 2015-2019 දක්වා මිලදී ගත් යන්ත්‍ර සූත්‍ර
### இலங்கை காணி மீட்டல் மற்றும் அபிவிருத்திக் கூட்டுத்தாபனம்: 2015-2019 வரையான பொறித்தொகுதிகள் கொள்வனவு
### SRI LANKA LAND RECLAMATION AND DEVELOPMENT CORPORATION: PURCHASE OF EQUIPMENT FROM 2015-2019

1018/202

**24. ගරු සංජීව එදිරිමාන්න මහතා**
(மாண்புமிகு சஞ்ஜீவ எதிரிமான்ன)
(The Hon. Sanjeeva Edirimanna)

අග්‍රාමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා එවකට පැවති මහා නගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය භාරව කටයුතු කළ අමාත්‍යවරයා/අමාත්‍ය වරුන්ගේ නම් කවරේද;

(ii) එම අමාත්‍යාංශය යටතේ පැවති ආයතනවල නම් කවරේද;

(iii) ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව, ඉහත අමාත්‍යාංශය යටතේ පැවතියේද;

(iv) වර්ෂ 2015 සිට 2019 දක්වා එම ආයතනය භාරව කටයුතු කරන ලද සභාපතිවරයා/සභාපති වරුන්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ඉහත ආයතනයට යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර තිබේද;

(ii) ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය නොකොට රුපියල් මිලියන 670ක් වටිනා යන්ත්‍ර සූත්‍ර මිලදී ගෙන තිබේද;

(iii) එම මිලදී ගැනීමේදී යම් අක්‍රමිකතාවක් සිදු වී තිබේ නම්, එම අක්‍රමිකතාව කවරේද;

(iv) ඒ සඳහා වගකිව යුතු පුද්ගලයන්ගේ නම් කවරේද;

(v) ඒ සම්බන්ධයෙන් විධිමත් විමර්ශනයක් සිදු කර වරදකරුවන්ට එරෙහිව පියවර ගැනීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) 2015ஆம் ஆண்டு தொடக்கம் 2019ஆம் ஆண்டு வரை அப்போது காணப்பட்ட மாநகர மற்றும் மேல் மாகாண அபிவிருத்தி அமைச்சுப் பொறுப்பை வகித்த அமைச்சர்/ அமைச்சர்களின் பெயர்கள் யாவை என்பதையும்;

(ii) மேற்படி அமைச்சின்கீழ் காணப்பட்ட நிறுவனங் களின் பெயர்கள் யாவை என்பதையும்;

(iii) இலங்கை காணி மீட்டல் மற்றும் அபிவிருத்திக் கூட்டுத்தாபனம், மேற்படி அமைச்சின்கீழ் காணப்பட்டதா என்பதையும்;

(iv) 2015ஆம் ஆண்டு தொடக்கம் 2019ஆம் ஆண்டு வரை மேற்படி நிறுவனத்துக்குப் பொறுப்பாகவிருந்த தவிசாளர்/தவிசாளர்களின் பெயர்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி நிறுவனத்திற்குப் பொறித் தொகுதிகளைக் கொள்வனவு செய்கையில் கொள்வனவு நடைமுறைகள் பின்பற்றப்பட்டுள் ளனவா என்பதையும்;

(ii) கொள்வனவு நடைமுறைகள் பின்பற்றப்படாது 6 7 0 மில்லியன் ரூபாய் பெறுமதியான பொறித்தொகுதிகள் கொள்வனவு செய்யப் பட்டுள்ளனவா என்பதையும்;

(iii) மேற்படி கொள்வனவின்போது ஏதேனும் முறைகேடு இடம்பெற்றிருப்பின், அந்த முறைகேடு யாதென்பதையும்;

(iv) அதற்குப் பொறுப்புக்கூறவேண்டிய ஆட்களின் பெயர்கள் யாவை என்பதையும்;

(v) அதுதொடர்பாக முறையான விசாரணை நடாத்தப்பட்டு குற்றவாளிகளுக்கு எதிராக நடவடிக்கை எடுக்கப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Urban Development and Housing:

(a) Will he inform this House -

(i) the names of the Minister/Ministers in charge of the then Ministry of Megapolis and Western Development from 2015 to 2019;

(ii) the names of the institutions which were under that Ministry;

(iii) whether the Sri Lanka Land Reclamation and Development Corporation was under that Ministry; and

(iv) the names of the Chairpersons/Chairperson in charge of that institution from 2015 to 2019?

(b) Will he also inform this House -

(i) whether the procurement procedure had been followed when machines and equipment were purchased to that institution;

(ii) whether machines and equipment to the tune of Rs. 670 million had been purchased without following the procurement procedure;

(iii) whether any irregularity took place in that purchase and if so, what that irregularity is;

(iv) the names of the persons responsible for that; and

(v) whether action will be taken to conduct a formal investigation in this regard and punish the culprits?

(c) If not, why?

**ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා (වෙරළ සංරක්ෂණ හා පහත්බිම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மொஹான் பிரியதர்ஷன த சில்வா - கரையோரப் பாதுகாப்பு மற்றும் தாழ்நில அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Mohan Priyadarshana De Silva -State Minister of Coast Conservation and Low-Lying Lands Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අග්‍රාමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ගරු පාඨලී චම්පික රණවක මැතිතුමා.

(ii) නාගරික සංවර්ධන අධිකාරිය.

ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව.

ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව.

(iii) ඔව්.

(iv) ඔව්.

[ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා]

2015 සිට 2019 දක්වා සිටි සභාපතිවරුන්ගේ නම් පහත පරිදි වේ.

| | නම | පත්වීම් දිනය | ධුරය අවසන් කළ දිනය | කාලය |
|---|---|---|---|---|
| 01 | එම්.එච්.එච්. සල්මාන් මහතා | 2015.01.30 | 2015.08.24 | මාස 07 |
| 02 | අසේල ඉද්දවෙල මහතා | 2015.10.28 | 2018.02.28 | අවු. 03 මාස 04 |
| 03 | රොෂාන් ගුණවර්ධන මහතා | 2018.02.28 | 2018.11.14 | මාස 10 |
| 04 | එන්.පී. තිබ්බටුමුණුව මහතා | 2018.11.15 | 2018.12.30 | මාස 02 |
| 05 | රොෂාන් ගුණවර්ධන මහතා | 2018.12.31 | 2019.12.04 | මාස 11 |

(ආ) (i) ඔව්.

(ii) නැත.

රුපියල් මිලියන 670ක මුදල බේරේ වැව ව්‍යාපෘතියේ මුළු පිරිවැය වේ. එම ව්‍යාපෘතියට 2019 වර්ෂයේදී රුපියල් මිලියන 403.9ක් වටිනා යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කොට නොමැත.

(iii) බේරේ වැව ව්‍යාපෘතිය සඳහා පහත වගුවේ සඳහන් යන්ත්‍ර 03 මිලදී ගැනීමට අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර තිබූ වටිනාකම රුපියල් මිලියන 282ක් වේ. එම මුදල ඉක්මවා රුපියල් මිලියන 404ක ප්‍රමාණයක මිල ගණන් ඉදිරිපත් වී ඇති අතර, අනුමත මුදල ඉක්මවන රුපියල් මිලියන 122ක මුදල සඳහා නැවත අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට ප්‍රසම්පාදන කමිටුව නිර්දේශ කර තිබියදී එම අනුමැතිය ලබා ගැනීමෙන් තොරව භාණ්ඩ මිලදී ගැනීමෙන් අක්‍රමිකතාවක් සිදු වී ඇත.

| වර්ෂය | ව්‍යාපෘතිය | යන්ත්‍රය සහ වටිනාකම | අනුමත වටිනාකම (වැට් රහිත) (රු.) | මිල ගණන් කැඳවීමේදී ඉදිරිපත් කර තිබූ අවම මිල (රු.) | අනුමත වටිනාකම ඉක්මවන වටිනාකම (වැට් රහිත) (රු.) |
|---|---|---|---|---|---|
| 2019 | රොන්මඩ ඉවත් කිරීම, සෝදා හැරීම මඟින් බේරේ වැව පිරිසිදු කිරීමේ ව්‍යාපෘතිය | අඟල් 12 විෂ්කම්භයෙන් යුත් Cutter Suction Dredger යන්ත්‍රය (උපාංග සමඟ) | රුපියල් මිලියන 150.0 | රුපියල් මිලියන 244.7 | රුපියල් මිලියන 94.7 |
| | | අඟල් 6 කැනීම් පොම්ප සහිතව ටොන් 20 පන්තියේ ඇම්ෆිබියස් එක්ස්කැවේටර් යන්ත්‍රය | රුපියල් මිලියන 66.0 | රුපියල් මිලියන 83.3 | රුපියල් මිලියන 17.3 |
| | | අඟල් 12 බූස්ටර් පොම්පය | රුපියල් මිලියන 66.0 | රුපියල් මිලියන 76.0 | රුපියල් මිලියන 10.0 |
| මුළු වටිනාකම | | | රුපියල් මිලියන 282.0 | රුපියල් මිලියන 404.0 | රුපියල් මිලියන 122.0 |

(iv) ඉහත සඳහන් අක්‍රමිකතා සම්බන්ධයෙන් තවදුරටත් විමර්ශනය කිරීම සඳහා රේජීය අමාත්‍යාංශයේ ලේකම්තුමා විසින් 2020.06.26 දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිලි කර ඇති අතර, වර්තමානයේ එම විමර්ශන කටයුතු සිදු කරමින් පවතී. එම විමර්ශන මඟින් ඉදිරියේදී මෙම අක්‍රමිකතාවලට වගකිවයුතු පාර්ශ්ව හඳුනා ගැනීමට කටයුතු කරනු ඇත.

එමෙන්ම, මේ සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණය වෙත අංක B/40201/20 යටතේ 'බී' වාර්තාවක් මඟින් කරුණු වාර්තා කර ඇති අතර, නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අංක CRI/137/2021 හා 2021.06.22 දිනැති ලිපිය මඟින් වැඩිදුර උපදෙස් ඉල්ලා ඇත.

(v) අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සිදු කරන විමර්ශනවලට අමතරව තවදුරටත් විමර්ශනය කිරීම සඳහා 2020.10.15 දින විශ්‍රාමික නියෝජ්‍ය පොලිස්පතිවරයෙකුගේ සභාපතිත්වයෙන් හා රේඛීය අමාත්‍යාංශයේ නියෝජිතයෙකුගෙන් සමන්විත ස්වාධීන පරීක්ෂණ මණ්ඩලයක් පත් කර ඇති අතර, එම පරීක්ෂණ කටයුතු ද සිදු කරමින් පවතී.

(ඈ) අදාළ නොවේ.

**ගරු සංජීව එදිරිමාන්න මහතා**
(மாண்புமிகு சஞ்ஜீவ எதிரிமான்ன)
(The Hon. Sanjeeva Edirimanna)
ස්තුතියි, ගරු රාජ්‍ය අමාත්‍යතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ප්‍රශ්න අංක 25 -42/2020- (1), ගරු හේෂා විතානගේ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 26 -139/2020- (1), ගරු වමින්ද විජේසිරි මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## මඩු, ඔඩ්ඩුසුඩාන්, කණ්ඩාවලෙයි සහ වෙත්තිලකර්ණි සඳහා ප්‍රාදේශීය සභා පිහිටුවීම: ගනු ලබන පියවර

## மடு, ஒட்டுசுட்டான், கண்டாவளை மற்றும் வெற்றிலைக்கேணிக்கான பிரதேச சபைகளை நிறுவுதல்: நடவடிக்கைகள்

## ESTABLISHMENT OF PRADESHIYA SABHAS FOR MADHU, ODDUSUDDAN, KANDAVALAI AND VETTILAIKERNY: STEPS TAKEN

580/2020

**27. ගරු චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)
රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ශ්‍රී ලංකාවේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් සඳහාම එක් ප්‍රාදේශීය සභාවක් බැගින් පිහිටුවා ඇති බවත්;

(ii) මේ වනතෙක් ප්‍රාදේශීය සභාවක් පිහිටුවා නොමැති මන්නාරම දිස්ත්‍රික්කයේ මඩු, මුලතිව් දිස්ත්‍රික්කයේ ඔඩ්ඩුසුඩාන්, කිලිනොච්චි දිස්ත්‍රික්කයේ කණ්ඩාවලෙයි සහ යාපනය දිස්ත්‍රික්කයේ වෙත්තිලකර්ණි යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සඳහා ප්‍රාදේශීය සභා පිහිටුවන ලෙසට අඛණ්ඩව ඉල්ලීම් කළද මේ වනතෙක් එම ඉල්ලීම් ඉටු කර නොමැති බවත්;

(iii) මඩු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් සින්නවලයන්කට්ටු, කාක්කයන්කුලම්, කල්මඩු පියවර-II, ඉරණෛයිඉලුප්පෙයික්කුලම් යන ගම්වල ජීවත්වන ජනතාවගේ අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා කිලෝමීටර් 70ට වඩා වැඩි දුරක් ගෙවා මාන්තෙයි බටහිර ප්‍රාදේශීය සභාව වෙත යාමට සිදු වී ඇති බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) එසේ නම්, අදාළ ප්‍රාදේශීය සභා 04 පිහිටුවීම සඳහා මේ වනවිට ගෙන ඇති පියවර කවරේද;

(ii) ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

அரசாங்க சேவைகள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரிடம் கேட்ட வினா:

(அ) (i) இலங்கையிலுள்ள ஒவ்வொரு பிரதேச செயலகப் பிரிவுக்கும் ஒரு பிரதேச சபை வீதம் நிறுவப்பட்டுள்ளதென்பதையும்;

(ii) இற்றைவரை பிரதேச சபையொன்று நிறுவப்படாத மன்னார் மாவட்டத்தின் மடு, முல்லைத்தீவு மாவட்டத்தின் ஒட்டுசுட்டான், கிளிநொச்சி மாவட்டத்தின் கண்டாவளை மற்றும் யாழ்ப்பாண மாவட்டத்தின் வெற்றிலைக்கேணி ஆகிய பிரதேச செயலகப் பிரிவுகளுக்குப் பிரதேச சபைகளை நிறுவுமாறு தொடர்ச்சியாகக் கோரிக்கைகள் விடுக்கப் பட்டபோதிலும் இற்றைவரை இக்கோரிக் கைகள் நிறைவேற்றப்படவில்லை என்பதையும்;

(iii) மடுப் பிரதேச செயலகப் பிரிவிலுள்ள சின்னவலயங்கட்டு, காக்கையன்குளம், கல்மடு கட்டம்-2, இரணை இலுப்பைக்குளம் ஆகிய கிராமங்களில் வசிக்கும் மக்கள் தங்களுடைய தேவைகளை நிறைவேற்றிக்கொள்வதற்கு 70 கி.மீ மேலதிகமாகப் பயணம்செய்து மாந்தை மேற்குப் பிரதேச சபைக்குச் செல்ல வேண்டியுள்ளதெனவும்;

அவர் அறிவாரா?

(ஆ) (i) ஆமெனில், சம்பந்தப்பட்ட 04 பிரதேச சபைகளை நிறுவுவதற்கு இற்றைவரை மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாவையென்பதையும்;

(ii) அதற்காக எடுக்கப்படும் காலம் யாதென் பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Services, Provincial Councils and Local Government:

(a) Is he aware that -

(i) one Pradeshiya Sabha has been established for each every Divisional Secretary's Division in Sri Lanka;

(ii) requests that Pradeshiya Sabhas be established for Divisional Secretary's Divisions of Madhu in the Mannar District, Oddusuddan in the Mullaitivu District, Kandavalai in the Kilinochchi District and Vettilaikerny in Jaffna District, for which Pradeshiya Sabhas have not been established hitherto, have not been fulfilled so far; and

(iii) people living in the villages named Sinnawalayankattu, Kakkayankulam,

[ගරු චාල්ස් නිර්මලනාදන් මහතා]

Kalmadu Stage-II, Iranai-Iluppaikulam have had to go to the Manthai West Pradeshiya Sabha travelling more than 70 km in order to get their requisite tasks fulfilled?

(b) Will he inform the House -

(i) what steps have been taken towards the establishment of the four Pradeshiya Sabhas referred to above; and

(ii) how long it will take?

(c) If not, why?

**ගරු රොෂාන් රණසිංහ මහතා (පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரொஷான் ரணசிங்க - மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Roshan Ranasinghe - State Minister of Provincial Councils and Local Government)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ශ්‍රී ලංකාවේ පවතින සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් සඳහාම එක් ප්‍රාදේශීය සභාව බැගින් පිහිටුවා නැත.

(ii) මන්නාරම් දිස්ත්‍රික්කයේ මඩු, මුලතිව් දිස්ත්‍රික්කයේ ඔඩ්ඩුසුඩාන්, කිලිනොච්චි දිස්ත්‍රික්කයේ කණ්ඩාවලෙයි හා යාපනය දිස්ත්‍රික්කයේ වඩමාරච්චි නැඟෙනහිර යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 04 සඳහා ප්‍රාදේශීය සභා 04ක් පිහිටුවීමට අදාළව යෝජනා ලැබී ඇති අතර, පවත්නා ප්‍රතිපත්තිය අනුව පළාත් ප්‍රධාන ලේකම් විසින් පත් කරන ලද දිස්ත්‍රික් කමිටු විසින් නිර්දේශ කරන ලද දිස්ත්‍රික් කමිටු වාර්තා ප්‍රධාන ලේකම්ගේ ද නිර්දේශ සහිතව මෙම අමාත්‍යාංශය වෙත ලැබී ඇත.

(iii) ආසන්න වශයෙන් කිලෝමීටර 70ක පමණ දුර ප්‍රමාණයක් ගමන් කළ යුතු වේ.

(ආ) (i) අවශ්‍ය නිර්දේශ ලැබී තිබුණ ද අදාළ ලියකියවිලිවල යම් යම් අපැහැදිලි කරුණු පවතින බැවින් ඒවා පැහැදිලි කර ගනිමින් මඩු, ඔඩ්ඩුසුඩාන්, කණ්ඩාවලෙයි සහ වඩමාරච්චි නැඟෙනහිර ප්‍රාදේශීය සභා පිහිටුවීමේ හැකියාව සම්බන්ධයෙන් තීරණවලට එළඹීම සඳහා 2021.04.30 දින උතුරු පළාතට අදාළව පළාත් සාකච්ඡාවක් පැවැත්වීමට කටයුතු යොදා තිබූ අතර, කොවිඩ්-19 වසංගතය හේතුවෙන් එම සාකච්ඡාව දින නියමයක් නොමැතිව කල් දමන ලදී.

(ii) (පවත්නා කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් නිශ්චිත දිනයක් ප්‍රකාශ කළ නොහැක)

පළාත් පාලන ආයතන සංස්ථාපනය සඳහා තිබිය යුතු අවශ්‍යතා සම්පූර්ණ කර තිබේ නම් මීළඟ පළාත් පාලන මැතිවරණයේදී යෝජිත සභා පිහිටුවීමට හැකිවන පරිදි හා ඊට පෙර මෙම සංස්ථාපන කටයුතු නිම කිරීමට අපේක්ෂා කෙරේ.

(ඇ) අදාළ නොවේ.

**ගරු චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)

நன்றி, கௌரவ இராஜாங்க அமைச்சர் அவர்களே! வட மாகாணத்திலுள்ள மன்னார் மாவட்டத்தில் மடுப் பிரதேச சபையையும் முல்லைத்தீவு மாவட்டத்தில் ஒட்டுசுட்டான் பிரதேச சபையையும் கிளிநொச்சி மாவட்டத்தில் கண்டாவளைப் பிரதேச சபையையும் யாழ். மாவட்டத்தில் வடமராட்சி கிழக்குப் பிரதேச சபையையும் உருவாக்குவதற்கு நான் கடந்த சில ஆண்டுகளாகத் தொடர் முயற்சியை எடுத்துக்கொண்டிருக்கின்றேன். கடந்த வருடம் வட மாகாணப் பிரதம செயலாளருடைய தலைமையில் ஒரு குழு நியமிக்கப்பட்டு, அமைச்சுக்கு அதற்குரிய தரவுகள் அனுப்பப்பட்டிருப்பதாக நீங்கள் கூறியிருந்தீர்கள். கௌரவ இராஜாங்க அமைச்சர் அவர்களே, நான் உங்களிடம் மிகவும் தாழ்மையாகத் தெரிவிக்க விரும்புவது என்னவெனில், இந்த நான்கு பிரதேச சபைகளும் உருவாக்கப்படாத காரணத்தினால் அந்தந்தப் பிரதேச சபைகளுக்குக் கீழிருக்கின்ற மக்கள் அவர்களுடைய சேவைகளைப் பெற்றுக்கொள்வதில் பாரிய சிரமத்தை எதிர்நோக்கியிருக்கிறார்கள். 2021ஆம் ஆண்டு ஏப்பிரல் மாதம் இது தொடர்பான ஒரு கூட்டம் நடைபெற இருந்தது என்றும், கொவிட் தொற்றுக் காரணமாக அது பிற்போடப்பட்டிருக்கின்றது என்றும் நீங்கள் கூறியிருந்தீர்கள்.

கௌரவ இராஜாங்க அமைச்சர் அவர்களே, கொவிட் தொற்று தொடர்ச்சியாக இருக்கின்றது. எனவே, வட மாகாணத்துக்குரிய இந்தப் புதிய நான்கு பிரதேச சபைகளின் உருவாக்கத்துக்கான அந்தக் கூட்டத்தை மிக விரைவில் நடத்த வேண்டும் என்றும் அதை எவ்வளவு காலப்பகுதிக்குள் செய்ய முடியும் என்பதைத் தெரிவிக்குமாறும் நான் கேட்டுக் கொள்கின்றேன்.

**ගරු රොෂාන් රණසිංහ මහතා**
(மாண்புமிகு ரொஷான் ரணசிங்க)
(The Hon. Roshan Ranasinghe)

ගරු මන්ත්‍රීතුමනි, මේ සම්බන්ධයෙන් කරුණු කිහිපයක් මට කියන්න තිබෙනවා. ඔබතුමා අහලා තිබුණා, "හැම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකටම පළාත් පාලන ආයතනයක් තිබෙනවා. මේ කොට්ඨාසවලට එහෙම නැත්තේ ඇයි?" කියලා. උතුරේත්, දකුණේත් හැමවිටම එහෙම වෙන්නේ නැහැ, ගරු මන්ත්‍රීතුමනි. උදාහරණයක් වශයෙන් ගත්තොත් මුහුදුබඩපත්තුව ප්‍රාදේශීය සභාව ගත්තාම, එහි ප්‍රාදේශීය ලේකම් කාර්යාල දෙකක් තිබෙනවා. එකක් වැලිඔය. අනෙක් එක මුහුදුබඩපත්තුව. තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ගත්තත්, එහි තලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ තඹුත්තේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තිබෙනවා. ගල්ගමුව ප්‍රාදේශීය සභාව ගත්තත්, එතැනත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල දෙකක් තිබෙනවා. ඒ තමයි, ඇහැටුවැව සහ ගල්ගමුව. මා මේ කරුණු පැහැදිලි කරද්දී මේ විස්තරය කියන්න ගත්තේ ඔබතුමාට මේ කරුණ අවබෝධ කරන්නයි. උතුරු පළාතට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 34ක් තිබෙනවා, පළාත් පාලන ආයතන 34ක් තිබෙනවා. යාපනයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 15ට පළාත් පාලන ආයතන 17ක් තිබෙනවා. ඒ කියන්නේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට වඩා පළාත් පාලන ආයතන තිබෙනවා. මන්නාරම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 5යි, පළාත් පාලන ආයතන 5යි. වව්නියාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 4යි, පළාත් පාලන ආයතන 5යි. යාපනයේ වාගේම එහිත් වැඩිපුර තිබෙනවා. මුලතිව් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 6ක් තිබෙනවා, පළාත් පාලන ආයතන 4යි තිබෙන්නේ. ඒ වාගේම, කිලිනොච්චි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 4යි, පළාත් පාලන ආයතන 3ක් තිබෙනවා.

ගරු මන්ත්‍රීතුමනි, එක කාරණයක් මා ප්‍රධාන වශයෙන්ම කියන්න ඕනෑ. ජනවාර්ගික පදනම මත පළාත් පාලන ආයතන පිහිටුවන්න අපි කිසිදු මැදිහත්වීමක් කරන්නේ නැහැ. එය ප්‍රජාතන්ත්‍රවාදී විධියට සිදු කළ යුත්තක් විධියට තමයි අපි දකින්නේ. ඒ වාගේම, පළාත් පාලන ආයතනයක් පිහිටුවද්දී කැබිනට් මණ්ඩලය විසින් අපට සම්පූර්ණ කළ යුතු කාරණා 28ක් දීලා තිබෙනවා. ජනගහන ප්‍රමාණය, ජන ඝනත්වය, නිවාස සංඛ්‍යාව, ස්ථිර නිවාස, විදුලි සහ දුරකථන පහසුකම් යනාදී විධියට කරුණු-කාරණා ගොඩක් තිබෙනවා. මේ සියල්ල අධ්‍යයනය කර බලනකොට ඔබතුමා කලින් කිව්වා වාගේ උතුරු පළාත් සභාවෙන් එවන ලද නිර්දේශ තුළ යම් යම් ගැටලුසහගත තැන් තිබෙනවා. එම නිසා ඔබතුමා සඳහන් කළ ඒ කාරණය අපි විශේෂ සැලකිල්ලට අරගෙන, ඉතා ඉක්මනින් සාකච්ඡාවක් යොදාගෙන මේ ප්‍රශ්නයට මැදිහත් වෙලා කටයුතු කරනවා. මහජනතාවගේ පහසුව උදෙසා ආයතන පිහිටුවීම වෙනුවෙන් අපි කොයි වෙලාවේවත් පැකිලෙන්නේ නැහැ. අපි ජනවාර්ගික වශයෙන් බෙදලා ආයතන හදන්න කටයුතු කරන්නේ නැහැ. මේ ප්‍රශ්නයේ දී ඒක අදාළ වෙන්නේ නැති බවත් අපි විශේෂයෙන් දැනුවත් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චාල්ස් නිර්මලනාදන් මන්ත්‍රීතුමනි, තවත් අතුරු ප්‍රශ්න තිබෙනවාද?

**ගරු චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)
கௌரவ இராஜாங்க அமைச்சர் அவர்களே, இன ரீதியாகப் பிரிக்க வேண்டுமென்று நான் எந்தவொரு வாக்கியத்தையும் பயன்படுத்தவில்லை. நீங்கள் தவறுதலாகப் புரிந்துகொண்டீர்களோ அல்லது உரைபெயர்ப்புச் செய்யப் பட்டபோது அதைத் தவறுதலாக எடுத்துக்கொண்டீர்களோ தெரியவில்லை. நீண்டகாலமாக தங்களுடைய பிரதேசத்தில் பிரதேச சபை இல்லாத காரணத்தினால் அந்த மக்கள் மிகவும் சிரமப்படுகின்றார்கள் என்றுதான் நான் கூறினேன். அந்த வகையில், அதற்குரிய முயற்சியை நீங்கள் எடுக்க வேண்டும் என்பதற்காகத்தான் நான் இந்தக் கேள்வியைப் பாராளுமன்றத்தில் எழுப்பியிருந்தேன். உங்களுடைய தொடர் முயற்சிக்கு என்னுடைய வாழ்த்துக்கள்! அடுத்த பிரதேச சபைத் தேர்தல் நடைபெறுவதற்கு முன்பாக இந்தப் பிரதேச சபைகள் உருவாக்கப்பட வேண்டும் என்பதையும் கூறிக்கொண்டு, தங்களுடைய அமைச்சு சார்ந்த ஒரு கேள்வியைத் தங்களிடம் கேட்க விரும்புகின்றேன்.

கௌரவ இராஜாங்க அமைச்சர் அவர்களே, உள்ளூராட்சி அமைச்சின்கீழ் வருகின்ற உள்ளூராட்சிச் சபைகளுக்கு வழங்கப்பட்டிருக்கின்ற Fire Brigade units மன்னார் மாவட்டத்திலும் முல்லைத்தீவு மாவட்டத்திலும் இல்லை. நீண்டகாலமாகத் தொடர்ச்சியான கோரிக்கைகள் விடப் படுகின்றன. அண்மையில் நான் கௌரவ பிரதமர் மஹிந்த ராஜபக்ஷ அவர்களை அவருடைய பாராளுமன்றக் காரியாலயத்தில் சந்தித்து, எழுத்துமூலமான கோரிக்கை ஒன்றையும் விடுத்திருந்தேன். அதற்கு அவர், அவ்வியந் திரங்கள் இறக்குமதி செய்யப்பட இருக்கின்றதென்றும் மிக விரைவில் அது கிடைக்குமென்றும் கூறியிருந்தார். நான் தங்களுடைய அமைச்சினுடைய கவனத்துக்கும் இதனைக் கொண்டுவருகின்றேன். மன்னார் நகர சபைக்கும் முல்லைத்தீவுக் கரைதுறைப்பற்றுப் பிரதேச சபைக்கும் இந்த Fire Brigade units மிக விரைவில் வழங்கப்பட வேண்டும் என்பது அந்தப் பிரதேச மக்களுடைய கோரிக்கையாக இருக்கின்றது. தங்களுக்கு இது தொடர்பாக ஏதாவது தெரிந்தால் பதிலளியுங்கள்! இல்லாவிட்டால், இது தொடர்பிலும் நடவடிக்கை எடுக்க வேண்டுமென்றும் நான் கேட்டுக்கொள்கின்றேன்.

**ගරු රොෂාන් රණසිංහ මහතා**
(மாண்புமிகு ரொஷான் ரணசிங்க)
(The Hon. Roshan Ranasinghe)
ගරු මන්ත්‍රීතුමනි, මම තව කාරණයක් කියන්නම්. පළාත් පාලන ආයතන පිහිටුවද්දී ඔබතුමන්ලා එවලා තිබෙන යෝජනාවට අනුව එක පළාත් පාලන කොට්ඨාසයක් ප්‍රාදේශීය සභා දෙකකට කැඩෙන තත්ත්වයක් තිබෙනවා. අන්න ඒ ගැටලුවත් තිබෙනවා. එම ගැටලුවත් අපි සාකච්ඡාවට ගත යුතු කාරණයක් වෙනවා.

ඊළඟ කාරණය ගත්තොත්, කොවිඩ් -19 වසංගත තත්ත්වය හමුවේ වුවද, අපි රජයක් විධියට මැදිහත් වෙලා කටයුතු කරලා, ගිනි නිවන රථ 15කට වැඩි ප්‍රමාණයක් ගෙන්වලා, ඒවා කොළඹ, කුරුණෑගල, හම්බන්තොට, මහනුවර, යාපනය, කෝට්ටේ වැනි නගර සභා 15කට ලබා දීමට කටයුතු කර තිබෙනවා. ඔබතුමා දිගින් දිගටම මේ දිස්ත්‍රික්ක දෙක ගැන කථා කරනවා. අපි මේ යෝජනාවත් අතිගරු ජනාධිපතිතුමාට ඉදිරිපත් කරනවා. ඒ වාගේම ගරු අග්‍රාමාත්‍යතුමා මේ ගැන හොඳින්ම අවබෝධ කරගෙන ඉන්නවා. මුදල් අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාත් මේකට එතුමාගේ අවධානය දීලා තිබෙනවා. රටේ ආර්ථික මට්ටම අපි කවුරුත් දන්නවා. ඒක ගැන ආයේ අමුතුවෙන් හංගන්න දෙයක් නැහැ. මේ තත්ත්වය පහව ගිහිල්ලා ආර්ථික වශයෙන් අපි ශක්තිමත් වෙලා එනකොට මේ ගැටලුව විසඳන්න අනිවාර්යයෙන්ම අමාත්‍යාංශය විධියට අපි මැදිහත් වෙනවාය කියන එක මේ වෙලාවේදී කියනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ගිනි නිවන රථ සම්බන්ධයෙන් කියපු නිසා ඔබතුමාට කාරණයක් කියන්න තිබෙනවා. මා මැදිහත් වෙලා ඔබතුමාගේත් සම්බන්ධකම් තිබෙන ඔබතුමාගේ දිස්ත්‍රික්කයේ හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාවට ජපානයෙන් ගිනි නිවන රථයක් දීලා තිබෙනවා. මට දැන ගන්න ලැබී තිබෙනවා, ඒ ගිනි නිවන රථය ප්‍රයෝජනයට ගන්නේ නැහැ කියලා. ඔබතුමා මැදිහත් වෙලා ඒක ප්‍රයෝජනයට යොදවන්න. ගුවන් හමුදාවට තමයි ගිනි නිවන ක්‍රියාවලිය හොඳටම කරන්න පුළුවන්. ඒ නිසා ඔබතුමාගේ දිස්ත්‍රික්කයේ හිඟුරක්ගොඩ ගුවන් හමුදා කඳවුරට හෝ ඒ ගිනි නිවන රථය අරගෙන ප්‍රයෝජනයට ගන්න. මොකද, සමහර පළාත් පාලන ආයතනවල ඒ සඳහා පුහුණු නිලධාරීන් නැහැ. මම දන්නේ නැහැ, හිඟුරක්ගොඩට ඒ නිලධාරීන් අරගෙන ඉන්නවාද කියලා. ඔබතුමා මේ ගැන අදම හොයා බලන්න. ඒක ජපානයෙන් ලැබුණු තෑග්ගක්. මම තමයි ඒක අරගෙන දෙන්න මැදිහත් වුණේ.

**ගරු රොෂාන් රණසිංහ මහතා**
(மாண்புமிகு ரொஷான் ரணசிங்க)
(The Hon. Roshan Ranasinghe)
ඔබතුමාගේ ඒ මැදිහත්වීම ගැන අපේ ස්තුතිය පුද කරනවා. ගරු මන්ත්‍රීතුමනි, අපි කඩිනමින් සොයා බලා, ඒ ගිනි නිවන රථය ප්‍රයෝජනයට නොගන්නවා නම්, එය ප්‍රයෝජනයට යොදවන්න කටයුතු කරන්නම්.

## යෝජිත මාලබේ-කොළඹ කොටුව සැහැල්ලු විදුලි දුම්රිය ව්‍යාපෘතිය: ක්‍රියාත්මක කිරීම
## உத்தேச மாலம்பே-கொழும்பு கோட்டை இலகு மின்சார புகையிரதக் கருத்திட்டம்: நடைமுறைப்படுத்தல்
## PROPOSED MALABE-COLOMBO FORT LIGHT RAIL TRANSIT PROJECT: IMPLEMENTATION

170/2020

**28. ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
මුදල් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (3):

(අ) (i) මාලබේ සිට කොළඹ-කොටුව දක්වා සැහැල්ලු විදුලි දුම්රිය ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට යෝජනා වී තිබූ බවත්;

(ii) එම ව්‍යාපෘතිය සඳහා පාංශු පරීක්ෂාව හා ඉඩම් අත්පත්කර ගැනීමට අදාළ මැනුම් කටයුතු සිදු කර ඇති බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) මෙම ව්‍යාපෘතිය තවදුරටත් ක්‍රියාත්මක කරන්නේද;

(ii) එසේනම්, මෙම ව්‍යාපෘතිය සම්බන්ධව ගැනීමට අපේක්ෂිත ඉදිරි පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மாலம்பே தொடக்கம் கொழும்பு கோட்டை வரை இலகு மின்சார புகையிரதக் கருத்திட்டமொன்றைச் செயற்படுத்துவதற்கு முன்மொழியப்பட்டிருந்ததென்பதையும்;

(ii) மேற்படி கருத்திட்டத்திற்கு மண் பரிசோதனை மற்றும் காணிகளைச் சுவீகரிப்பதற்கு ஏற்புடைய நில அளவை நடவடிக்கைகள் மேற்கொள்ளப் பட்டுள்ளதென்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி கருத்திட்டம் தொடர்ந்தும் செயற் படுத்தப்படுமா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி கருத்திட்டம் தொடர்பாக மேற்கொள்வதற்கு எதிர்பார்த்துள்ள நடவடிக் கைகள் யாவையென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Finance:

(a) Is he aware that-

(i) it had been proposed to implement an electric monorail project from Malabe to Colombo Fort; and

(ii) the soil inspection and surveying activities related to land acquisition of the said project ha been carried out?

(b) Will he inform this House -

(i) whether this project will be further implemented; and

(ii) if so, the steps that are expected to be taken in relation to this project in future?

(c) If not, why?

**ගරු ශෙහාන් සේමසිංහ මහතා (සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஷெஹான் சேமசிங்க - சமுர்த்தி, உள்ளக பொருளாதார, நுண்நிதிய, சுயதொழில், தொழில் அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Shehan Semasinghe - State Minister of Samurdhi, Household Economy, Micro Finance, Self-employment and Business Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) මාලබේ සිට කොළඹ - කොටුව දක්වා සැහැල්ලු විදුලි දුම්රිය ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට යෝජනා වී තිබුණි.

(ii) ඔව්.

(ආ) (i) එම ව්‍යාපෘතිය රජය විසින් විදේශ ණය ගැනීම් යටතේ කිරීමට තීරණය කර තිබුණු ව්‍යාපෘතියකි. කොළඹ හා තදාසන්න ප්‍රදේශවල ප්‍රවාහන පහසුකම්වලට එමඟින් ඇති වන ප්‍රතිලාභ ඉතා සීමිත බව ව්‍යාපෘති විශේෂඥයන් විසින් පෙන්වා දී ඇත. දිගින් දිගටම විදේශ ණය මඟින් මෙවැනි ව්‍යාපෘති කිරීම වෙනුවට විදේශ ණය අඩු කරමින් දේශීය හා විදේශීය ආයෝජන මඟින් වාණිජමය වැදගත්කමක් ඇති හා දැනට ක්‍රියාත්මක වන යටිතල පහසුකම්වලට පරිපූරකව අවශ්‍ය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට රාජ්‍ය ආයෝජන ව්‍යාපෘතිවලට ප්‍රමුඛත්වය දීමට ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන ඇති බැවින්, එම ව්‍යාපෘතිය මෙන්ම තවත් එවැනි ව්‍යාපෘති රාශියක් ද ණය මුදල් යටතේ ක්‍රියාත්මක කිරීම නතර කර ඇත.

(ii) 2020 දෙසැම්බර් 31 දින සිට උපදේශන කොන්ත්‍රාත් ගිවිසුම අවසන් කිරීම හේතුවෙන්, අදාළ උපදේශන ආයතනය විසින් අලාභ හා හානි වෙනුවෙන් වන්දි මුදලක් ඉල්ලා ඇති අතර, මෙම මුදල ගෙවීම පිළිබඳව තීරණය කිරීම සඳහා සාමාජිකයන් 11කින් සමන්විත කමිටුවක් 2021 පෙබරවාරි 23 වන දින අමාත්‍ය මණ්ඩල අනුමතිය යටතේ පිහිටුවා ඇත. එම කමිටුව මඟින් ගෙවිය යුතු මුදල හා අදාළ කරුණු පිළිබඳව සාකච්ඡා කරමින් පවතී.

(ඇ) පැන නොනඟී.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

මාලබේ සිට කොළඹ කොටුව දක්වා LRT line එක හදන්න ලබා දෙන JICA ණය මුදලේ පොලී ප්‍රතිශතය බින්දුවයි දශම එකක්. ඒ ව්‍යාපෘතිය නවත්වනවා කියලා රජය ප්‍රතිපත්තිමය තීරණයක් අරගෙන තිබෙන බව දැන ගන්න ලැබී තිබෙනවා. මේ සඳහා ඉඩම් අත්පත් කර ගැනීම්, මැණුම් කටයුතු සඳහා ගිය වියදම අපට ආරංචි විධියට බිලියන 1.5ක් විතර වනවා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඒක ඇත්ත ද?

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு ஷெஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්නේ කිලෝමීටර් 15.7ක දුරක් තිබෙන මාර්ග ව්‍යාපෘතියක් ගැන. ණය පොලී ප්‍රතිශතය කෙසේ වෙතත්, මෙහි සම්පූර්ණ වියදම හැටියට ඇස්තමේන්තුගත කර තිබෙන්නේ ඇමෙරිකානු ඩොලර් මිලියන 2,441ක්. මේකෙන් ඩොලර් මිලියන 1,850ක් තමයි විදේශ ණය හැටියට ලබා ගන්න කටයුතු කරලා තිබෙන්නේ. ඩොලර් මිලියන 591ක් ශ්‍රී ලංකා රජය ආයෝජනය කළ යුතුයි. නමුත් ඒ සඳහා සැලැස්මක් තිබිලාත් නැහැ. නැවතත් මේ ව්‍යාපෘති සියල්ල පිළිබඳ ශක්‍යතා අධ්‍යයනයක් කරලා, පෞද්ගලික අංශයත්, රාජ්‍ය අංශයත් ඒකාබද්ධ ආයෝජනවලට යන්න අපි බලාපොරොත්තු වනවා.

මේ සා විශාල ණය ප්‍රමාණයක් අපේ රටේ ණය ගොන්නට තවත් එකතු කරගන්නේ නැතුව මේවා නවත්වා තිබෙන්නේ. නමුත් ඒකෙන් අදහස් වෙන්නේ නැහැ, මෙම ව්‍යාපෘති අපි ඉදිරියේදී ක්‍රියාත්මක නොකරනවාය කියලා. ඒ සඳහා අවශ්‍ය විශේෂඥ දැනුම වාගේම ඒ සම්බන්ධ ශක්‍යතා අධ්‍යයන වාර්තා තහවුරු වීමෙන් පසුව මම මුලින් සඳහන් කළ ආකාරයට රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයෝජන ඒකාබද්ධ වැඩසටහනක් හැටියට මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කරනවා.

ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට ඔබතුමා ප්‍රශ්නයේ (ආ) (ii) කොටස යටතේ අසා තිබුණු කාරණයට ලබා දුන් පිළිතුරෙහි සඳහන් කළ ආකාරයට, අදාළ උපදේශන ආයතනය විසින් වෙලා තිබෙන අලාභවලට වන්දි ගෙවීමක් කරන්න කියා ඉල්ලා තිබෙනවා. හැබැයි, අපි එම ආයතනයට එසේ ගෙවීමක් කරලා නැහැ. කැබිනට් මණ්ඩලය පත් කළ කමිටුවත් එක්ක මේ වෙනකොට අතිගරු ජනාධිපතිතුමා මේ සම්බන්ධව සාකච්ඡා කරමින් පවතිනවා. ඒ අනුව තමයි අපට කියන්න පුළුවන් වන්නේ මූල්‍යමය වශයෙන් එතැන තිබෙන වටිනාකම මොකක්ද කියන එක. එම නිසා දැනට කිසිවක් තහවුරු කරන්න බැහැ. දැනට ඒ සම්බන්ධව සාකච්ඡා කරමින් පවතින්නේ.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ඒක හරි. ගරු රාජ්‍ය ඇමතිතුමනි, මම ඇසුවේ අලාභ ගැන විතරක් නොවෙයි. ඉඩම් අත්පත් කර ගැනීමට අදාළව යම් කොටසක් ගෙවා තිබෙනවා. මම හිතන විධියට එයට අදාළ සංඛ්‍යාලේඛන නම් ඇති.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. පසුගිය දවස්වල කථා බහක් තිබුණා, කොළඹ නගරය අවට තිබෙන රථ වාහන තදබදය අවම කිරීමේ අරමුණින් public transport සඳහා තමයි මෙම ව්‍යාපෘතිය ගෙනාවේ කියලා. දැන් මේ LRT එක නවත්වන නිසා ඒකට විකල්පයක් විධියට, පැලියගොඩ සිට ඉදිකිරීමට නියමිත කුලුනු මතින් යන අධිවේගී මාර්ගය -highway එක- රාජගිරිය දක්වාත්, රාජගිරියේ සිට අතුරුගිරිය දක්වාත් වීන සමාගමක් එක්ක එකතු වෙලා හදනවා කියලා කථා බහක් තිබුණා. ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු ඇමතිතුමා මේ ප්‍රශ්නයට උත්තර දුන්නත් කමක් නැහැ. එහෙම දෙයක් කෙරෙනවාද, එහෙම ව්‍යාපෘතියක් තිබෙනවාද, මේ කාරණය ඇත්තද කියලා මම අහන්න කැමැතියි.

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு ஷெஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
ඔබතුමා මහාමාර්ග අමාත්‍යාංශයෙන් ඇසිය යුතු ප්‍රශ්නයක අතුරු ප්‍රශ්නයක් තමයි ඒ ඇහුවේ.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ පැත්ත අපේ මරික්කාර් මන්ත්‍රීතුමාටත් බලපාන පැත්තක්. ඒක, එතුමාගේ ඡන්ද දායකයන් ඉන්න ප්‍රදේශයක්. අපි අතුරුගිරිය දක්වා කුලුනු මත ඉදිවෙන අධිවේගී මාර්ගයට මුල් ගල් තබා ඉවරයි. දැන් එහි වැඩ කටයුතු ආරම්භ කරමින් පවතින්නේ. අපි බලාපොරොත්තු වෙනවා, අවුරුදු එකහමාරක් යන්න ඉස්සෙල්ලා එය හදා අවසන් කරන්න.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු ඇමතිතුමනි, පැලියගොඩ ඉඳලා එක පියවරක් විධියට අතුරුගිරිය දක්වා එය ඉදිවෙනවාද? නැත්නම් පියවර දෙකකින් එම කටයුතු කරනවාද? ඒ කියන්නේ රාජගිරිය දක්වා ඉදිකරලා, දෙවැනි පියවර විධියටද අතුරුගිරිය දක්වා යන්නේ?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
අපේ ඉලක්කය අතුරුගිරිය දක්වා යන්නයි. දැනට රාජගිරිය දක්වා ඉදිකිරීමේ වැඩ කටයුතු ආරම්භ කරලා තිබෙන්නේ. අතුරුගිරිය දක්වාම හදනවා. එහෙම හදන එක හොඳයි නේද?

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
අපි කැමැතියි, ඒකට.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
අපි එය අගය කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமை தாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ප්‍රශ්න අංක 29 -245/2020- (1), ගරු මොහමඩ් මුසම්මිල් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 30 -416/2020- (2), ගරු මොහමඩ් මුසම්මිල් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 31 -1277/2020- (1), ගරු තිස්ස අත්තනායක මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## කුඹුක්කන් ඔය වාරි ව්‍යාපෘතිය: විස්තර
### கும்புக்கன் ஓயா நீர்ப்பாசனக் கருத்திட்டம்: விபரம்
### KUMBUKKAN OYA IRRIGATION PROJECT: DETAILS

669/2020

**32. ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) යෝජිත කුඹුක්කන් ඔය වාරි ව්‍යාපෘතිය ආරම්භ කිරීමට අපේක්ෂා කරනු ලබන දිනය කවරේද;

(ii) එහි ඇස්තමේන්තුගත පිරිවැය කොපමණද;

(iii) එම වාරි ව්‍යාපෘතිය වෙනුවෙන් වැය වන මුදල් සපයා ගනු ලබන ක්‍රමවේදය කවරේද;

[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා]

(iv) එම වාරි ව්‍යාපෘතිය අවසන් කිරීම සඳහා ගතවන කාලය කොපමණද;

(v) එම ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) முன்மொழியப்பட்டுள்ள கும்புக்கன் ஓயா நீர்ப் பாசனக் கருத்திட்டத்தை ஆரம்பிப்பதற்கு எதிர்பார்க்கும் திகதி யாதென்பதையும்;

(ii) அதன் மதிப்பீட்டுச் செலவினம் எவ்வளவு என்பதையும்;

(iii) மேற்படி நீர்ப்பாசனக் கருத்திட்டத்திற்காகச் செலவாகும் தொகையினைப் பெற்றுக் கொள்ளும் முறை யாதென்பதையும்;

(iv) மேற்படி நீர்ப்பாசனக் கருத்திட்டத்தினை நிறைவு செய்வதற்கு எவ்வளவு காலம் செல்லும் என்பதையும்;

(v) மேற்படி கருத்திட்டத்தின்மூலம் எதிர்பார்க்கப்படும் பயன்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Irrigation:

(a) Will he inform this House -

(i) the date on which the proposed Kumbukkan Oya Irrigation Project is expected to be started;

(ii) the estimated cost thereof;

(iii) the method of sourcing the money needed for the irrigation project;

(iv) the time that would be spent for the completion of the project; and

(v) the anticipated benefits of the said project?

(b) If not, why?

**ගරු සිරිපාල ගමලත් මහතා (මහවැලි කලාප ආශ්‍රිත ඇළවේලි හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சிறிபால கம்லத் - மகாவலி வலயங்களை அண்டியுள்ள கால்வாய்கள் மற்றும் குடியிருப்புகள் பொது உட்கட்டமைப்பு வசதிகள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Siripala Gamalath - State Minister of Canals and Common Infrastructure Development in Settlements in Mahaweli Zones)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) 2015 අගෝස්තු මස සිට ව්‍යාපෘතියේ මූලික කාර්යයන් ආරම්භ කර ඇති අතර, මේ වනවිට සමාජ ආර්ථික සමීක්ෂණ, පරිසර අධ්‍යයන සහ ඉඩම් අත්පත් කර ගැනීම හා වන්දි ගෙවීම්වලට අදාළ මූලික කටයුතු සිදු කෙරෙමින් පවතින අතර, ව්‍යාපෘතියේ ඉදිකිරීම් ආරම්භ කිරීමට නිශ්චිත දිනයක් ප්‍රකාශ කළ නොහැක.

(ii) දළ ඇස්තමේන්තුව රුපියල් මිලියන 54,000කි.

(iii) මූලික කාර්යයන් සඳහා මෙම වසරේදීද රුපියල් මිලියන 300ක් සලසා ඇති අතර, මහා භාණ්ඩාගාරය මඟින් 2022 වර්ෂයේ සිට සුදුසු ආයෝජන ක්‍රමවේදයක් හඳුන්වා දෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

(iv) දැනටමත් මූලික සමීක්ෂණ යනාදිය සිදු කෙරෙමින් පවතින බැවින්, නිශ්චිත මූල්‍ය සම්පාදන ක්‍රමවේදයක් හඳුන්වා දුන් පසුව වසර හතරකින් නිම කළ හැකි වනු ඇත.

(v)
- කුඹුරු අක්කර 13,415ක් සඳහා දෙකන්නයේ වගාව වෙනුවෙන් වාරි ජලය සැපයීම.
- ප්‍රදේශයේ පවතින උග්‍ර පානීය ජල ගැටලුවට විසඳුමක් ලෙස පානීය ජලය සඳහා ජල ඝනමීටර් මිලියන 12ක් සැපයීම.
- ගිගාවොට් 16ක පුනර්ජනනීය විදුලි බලයක් ජාතික විදුලිබල සැපයුමට ලබා දීම.

(ආ) අදාළ නොවේ.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, මඩොල්සිම, ලුනුගල ප්‍රදේශයෙන් ආරම්භ වී කිලෝමීටර් 116ක් පමණ දුර ගෙවා මුහුදට එකතු වන කුඹුක්කන් ඔය, අපේ ජලාශ පද්ධතිය ඉදිකිරීමේදී පාවිච්චි නොවූ ප්‍රධාන ගංගාවක් විධියට හඳුන්වන්න පුළුවන්. ඒ ගංගාව හරස් කර මොණරාගලට ආසන්නයෙන් ඉදිකරන මේ කියන වේල්ල සහ ව්‍යාපෘතිය තුළින් විශාල සේවයක් විශේෂයෙන් මොණරාගල දිස්ත්‍රික්කයේ ගොවි ජනතාවට සිදු වෙනවා. වගා කළ හැකි ඉඩම් විශාල ප්‍රමාණයක් එම ප්‍රදේශයේ තිබෙන බව අපි දන්නවා. නමුත් ඒ වගා කටයුතුවලට ජලය නොමැතිකම තමයි ප්‍රධාන බාධාව වෙලා තිබෙන්නේ. අපේ රටේ ගොවිතැන ගැන විශේෂයෙන් කථා වෙන කාලයක, අපේ ආහාර සුරක්ෂිතතාව ගැන කථා කරන කාලයක මේක ඉතාම වැදගත් ව්‍යාපෘතියක් විධියට මම දකිනවා.

ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, පළමු අතුරු ප්‍රශ්නය විධියට මා අහන්නේ, මේ ව්‍යාපෘතියට අදාළ වන්දි ගෙවීම පිළිබඳව මේ වන විට පවතින තත්ත්වය මොකක්ද, වන්දි ගෙවලා තිබෙනවාද, වන්දි ගෙවීමට මුදල් තිබෙනවාද, වන්දි ගෙවීම පිළිබඳව නිසි ක්‍රමවේදයක් ක්‍රියාත්මක වනවාද කියායි. ඒ ව්‍යාපෘතිය ගැන දැනට වසර ගණනාවක සිට කථා කරනවා. 2015න් පසුව යහ පාලන ආණ්ඩුව කාලයේත්, ඊට කලින් මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුව කාලයේත් ඒ ගැන කථා වුණා. යම් මට්ටමකට, එනම් ව්‍යාපෘතිය ආරම්භ කළ හැකි කඩ ඉමට දැන් ඇවිත් තිබෙනවා. ඊට අදාළ වන්දි ගෙවීම් සම්බන්ධව ඔබතුමා දැනුවත්ද? ඒ ගැන ඔබතුමාට මොනවාද කියන්න පුළුවන්?

**ගරු සිරිපාල ගමලත් මහතා**
(மாண்புமிகு சிறிபால கம்லத்)
(The Hon. Siripala Gamalath)

ගරු මන්ත්‍රීතුමනි, 2015 වර්ෂයේදී එම කාර්යය ආරම්භ කළත්, 2019 වර්ෂයේදී තමයි එතැන කාර්යාලය open කරලා ඒ වැඩ කටයුතු පටන්ගෙන තිබෙන්නේ. එහි පළමු අදියර වශයෙන් මේ වන විට විශාල වැඩ කොටසක් කරගෙන යනවා. ඒ පිළිබඳ දීර්ඝ විස්තරයක් ඇතුළත් පසුබිම් වාර්තාව මා ළඟ තිබෙනවා. එම ව්‍යාපෘතියේ ප්‍රගතිය සම්බන්ධයෙන් එහි සඳහන් කරුණු කීපයක් මා කියවන්නම්.

- ජලාශයේ අධිගැලීම් සීමාව භූමියේ සලකුණු කිරීම අවසන් කර ඇත.

- ජලාශයෙන් විපතට පත්ව අවතැන් වන පවුල් හා දේපළ හඳුනා ගැනීම සහ තොරතුරු රැස් කිරීම අවසන් කර ඇත.
- ජලාශයට යට වන මැදගම හා බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට අදාළ ඉඩම් අත් පත් කර ගැනීම සඳහා අදාළ ඉඩම් අත් පත් කර ගැනීමේ යෝජනාව ඉඩම් අමාත්‍යාංශය වෙත ලබා දී ඇත.
- ජලාශය ඉදිකිරීමේදී අවහිර වන මාර්ග වෙනුවට ඉදි කිරීමට යෝජිත විකල්ප මාර්ග හඳුනාගෙන ඇති අතර, එහි මැනුම් කටයුතු සිදු කිරීම සඳහා මැනුම් නියෝග නිකුත් කර ඇත.
- පරිසර ඇගැයීම් වාර්තාවට අනුමැතිය ලබා ගැනීම සඳහා පරිසර ඇගැයීම් වාර්තාවේ (EIA) අවසන් කෙටුම්පත අනුමත කිරීමේ බලධාරියා වන, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත භාර දී ඇත.
- නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම සහ සමාජීය බලපෑම ඇගැයීම් වාර්තාවල අවසන් කෙටුම්පත් මේ වන විට සකසා අවසන්ව ඇත.
- ජලාශය ඉදිකිරීමේදී හානියට පත් වන පොදු ස්ථාන හඳුනාගෙන ඇති අතර, එම ස්ථාන නැවත ප්‍රතිස්ථාපනය කිරීම සඳහා සැලසුම් සකස් කරමින් පවතී.
- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් නැවත පදිංචි කිරීම් සිදු කරන ප්‍රදේශය ව්‍යාපෘතිය වෙත නිදහස් කර ගැනීමට අදාළ කටයුතු සිදු කරමින් පවතී. එම ඉඩම් කොටස්වල වට මැනුම් කටයුතු ද අවසන් කර ඇත.
- පහළ නිම්න සංවර්ධන වැටසටහන යටතේ සංවර්ධනය කළ යුතු වම් ඉවුරේ වැව් හා අමුණු 17ක් සහ දකුණු ඉවුරේ වැව් සහ අමුණු 15ක් හඳුනාගෙන ඇත.

මෙහි තිබෙනවා, දීර්ඝ විස්තරයක්. මේ වන විට අවසන් කළ සියලු වැඩ පිළිබඳව අපි මේ වාර්තාවේ සඳහන් කර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම පසුබිම් වාර්තාව මම **සභාගත*** කරනවා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, 1948 වර්ෂයෙන් පටන් ගත්තාම 1977 වර්ෂය වනකල්ම අපේ රටේ ආණ්ඩු පෙරළෙන්න හේතු වුණේ හාල් බව ඔබතුමාත් දන්නවා ඇති. මොකද, 1977දී ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා බලයට පත් වන කොට අපේ රටේ සහල් අවශ්‍යතාවෙන් තුනෙන් දෙකයි අපට සපුරන්න හැකියාව තිබුණේ. අපි ඉතිරි ටික චීනයෙන් ගෙනාවා. ඒ බව ඔබතුමා හොඳින්ම දන්නවා. කඩිනම් මහවැලි ව්‍යාපාරය හදලා, දැවැන්ත ජලාශ හදලා, මට මතක විධියට මෙගාවොට් 621ක විදුලි බල නිෂ්පාදනයක් සිදු කරලා, මහවැලි කලාප විශාල ප්‍රමාණයක් හදලා අපි සහල්වලින් රට ස්වයංපෝෂිත කළා. මා කියන මේ තොරතුරු නිවැරදි නම්, අද වන විට අපේ රටට සහල් මෙට්‍රික්ටොන් ලක්ෂ 30ක් ඕනෑ. නමුත් සහල් මෙට්‍රික්ටොන් ලක්ෂ 45ක්, 50ක් විතර නිෂ්පාදනය වනවා. ඒ නිසා සහල් අතිරික්තය පිළිබඳ ප්‍රශ්නය නැවත ඇවිත් තිබෙනවා. දැන් අපට හාල් වැඩි වෙලා. ඒ බව ඔබතුමා මට වඩා හොඳට දන්නවා. අපේ රට තුළ වී අතිරික්තයක් තිබෙනවා; හාල් අතිරික්තයක් තිබෙනවා. මේ වාගේ ජල ව්‍යාපෘතියක් කරන විට ඒ මඟින් ද අපි තවදුරටත් වී ගොවිතැනට ගියොත් අපේ සහල් අතිරික්තය තවත් වැඩි වෙනවා.

මේ ක්ෂේත්‍රය ගැන විශේෂයෙන් දන්නා ඔබතුමාගෙන් ඊයේ පෙරේදා දවසක මාධ්‍ය විසින් හාල් ගැන ඇහුවාම ඔබතුමා එයට උත්තර දෙන්නේ නැතිව පැත්තකට වනවා මම දැක්කා. මම හිතන විධියට, හරියටම ඔබතුමාගෙන් තමයි හාල් ප්‍රශ්නය ගැන අහන්න ඕනෑ. මොකද, ඔබතුමා මේ ප්‍රශ්නය ගැන සැබෑවටම දන්නා කෙනෙක්. එක පැත්තකින්, ඔබතුමා ගොවි බිම් ප්‍රදේශ නියෝජනය කරන දේශපාලනඥයෙක්. අනෙක් පැත්තෙන්, ඔබතුමා හොඳ ව්‍යවසායකයෙක්. මේ වාගේ ව්‍යාපෘති කරද්දී ඔබතුමන්ලා අධ්‍යයනයක් කර තිබෙනවාද, මේ ව්‍යාපෘති හරහා ඉදිරියේදී මොන වාගේ භෝග ද වගා කරන්න ඕනෑ කියලා? මොකද, අපි දැන් සහල් අතිරික්තයක් නිසා ප්‍රශ්නයකට කොටු වෙලා ඉන්නවා. ගොවියා සහ පාරිභෝගිකයා කියන දෙදෙනාම හිර වෙලා ඉන්නේ. ව්‍යාපාරිකයන් විධියට ඔබතුමන්ලාත් දැන් ආණ්ඩු පෙරළන තත්ත්වයට පත් වෙලා ඉන්නවා; ඔබතුමන්ලා ප්‍රබල වෙලා තිබෙනවා. ඒ නිසායි මේ ප්‍රශ්නය මා ඔබතුමාගෙන් අහන්නේ. ඉදිරියේදී මල්වතු ඔය ව්‍යාපෘතිය එනවා, තවත් වාරි ව්‍යාපෘති ගණනාවක්ම එනවා. ඒ ආශ්‍රිත ගොවි බිම්වල වගා කළ යුතු, නොකළ යුතු, ප්‍රමුඛතාව දිය යුතු ව්‍යාපෘති පිළිබඳ යම් අධීක්ෂණයක්, අධ්‍යයනයක් -රාජ්‍ය ඇමතිතුමා විධියට නොවෙයි- රජය විධියට කර තිබෙනවාද කියා මම ඔබතුමාගෙන් අහනවා. ගරු සිරිපාල ගම්ලත් මැතිතුමනි, ඒ ප්‍රශ්නයට මා ඔබතුමාගෙන් හොඳ පිළිතුරක් බලාපොරොත්තු වෙනවා.

**ගරු සිරිපාල ගමලත් මහතා**
(மாண்புமிகு சிறிபால கம்லத்)
(The Hon. Siripala Gamalath)

අපේ හිතවත් ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමනි, දැන් අපි අපේ අවශ්‍යතා සඳහා විශාල වශයෙන් පිට රටින් භාණ්ඩ ගෙන්වනවා. ඒ නිසා පසු ගිය දවස්වල අපේ අතිගරු ජනාධිපතිතුමාට සිදු වුණා භෝග ආශ්‍රිත නිෂ්පාදන වර්ග 16ක් ගෙන්වීම සම්පූර්ණයෙන් නතර කරන්න. මිරිස්, අල, බී ලූනු වාගේ දේවල් යම් ප්‍රමාණයක් නිෂ්පාදනය කළත්, ඒවා විශාල වශයෙන් ගෙන්වන්න අපට සිද්ධ වෙනවා. ඒ වාගේම රටේ ඇති වන නියඟ, ගංවතුර වාගේ දේවලින් අපේ වගා විනාශ වෙනවා. ඒ හැම තත්ත්වයක් එක්කම ගත් විට, මෙතෙක් අපේ රටට විශාල වශයෙන් අතිරේක භෝග නිෂ්පාදන ආනයනය කරන්න සිද්ධ වෙලා තිබෙන බව පෙනෙනවා. ඒ නිසා මේ වාගේ ව්‍යාපෘතිවලින් අපි ගොවි ජනතාවට හඳුන්වා දෙන්න බලාපොරොත්තු වන්නේ වැඩි ආදායමක් ලබා ගන්න පුළුවන්, අපට වගා කරන්න පුළුවන් සියලු දේ මේ රටේ වගා කිරීමටයි. එවැනි භෝග හඳුන්වා දෙමින්, ඒවා ගැන දැනුවත් කරමින් යන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීම තුළින්, මේ කරන ව්‍යාපෘතිවලින් යල මහ දෙකන්නයේ වී වගාව පමණක් නොව අනෙකුත් භෝග ද වගා කරලා මේ රටේ අවශ්‍යතා සපුරා ගැනීමට හැකියාව ලැබෙයි කියලා අපි විශ්වාස කරනවා. සහල් අතිරික්තයක් ඇති වෙයි කියා බලාපොරොත්තු වෙන්න විධියක් නැහැ, ගරු මන්ත්‍රීතුමනි. අපි දැනටත් වීවලින් ස්වයංපෝෂිතයි කිව්වාට, අපේ පාන් පිටි පරිභෝජනය ඉතාම ඉහළ මට්ටමක තිබෙනවා. ඒවා ඔක්කොම අප පිට රටින් ආනයනය කරන දේවල්. එම නිසායි මේ කාරණය ගැන මා ඔබතුමාට මේ අවස්ථාවේදී පැහැදිලි කළේ.

## "දිගන විලේජ්"හි ගොඩනැඟිලි: බදු දීම
## "திகன விலேஜ்" இலுள்ள கட்டிடங்கள்: குத்தகை
## BUILDINGS AT "DIGANA VILLAGE": LEASE

979/2020

**33. ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)

වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වික්ටෝරියා විදුලි බලාගාරය ඉදි කිරීමේ ව්‍යාපෘතියේ සේවය කරන ලද විදේශිකයන් සඳහා

---

*** පුස්තකාලයේ තබා ඇත.**
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු වේලු කුමාර් මහතා]

කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ "දිගන විලේජ්" හි නේවාසික පහසුකම් ලබා දුන් බවත්;

(ii) එහි කාර්යාල ගොඩනැඟිලි, භෝජනාගාර හා නේවාසිකාගාර ආදිය පවතින බවත් ;

(iii) මේ වන විට එය ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් පාලනය කරනු ලබන බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) "දිගන විලේජ්"හි පවතින කාර්යාල ගොඩනැඟිලි, භෝජනාගාර සහ නේවාසිකාගාර සංඛ්‍යාව;

(ii) ඒවා මේ වන විට භාවිත කරනු ලබන කාර්යයන්;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නේද?

(ඇ) (i) "දිගන විලේජ්"හි ඉදි කර ඇති යම් ගොඩනැඟිල්ලක් පෞද්ගලික පාර්ශ්වයකට/ ආයතනයකට ලබා දී තිබේද;

(ii) එසේ නම්, එය ලබා දෙන ලද පදනම කවරේද;

(iii) එම ගොඩනැඟිල්ල ලබා දී ඇති පෞද්ගලික පාර්ශ්වයේ / ආයතනයේ නම කවරේද;

(iv) එම ප්‍රදේශයේ නීති විරෝධී පදිංචි කිරීම් සිදු වී තිබේද;

(v) එසේ නම්, ඊට එරෙහිව ගන්නා ලද ක්‍රියා මාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නේද?

(ඈ) නො එසේ නම්, ඒ මන් ද?

நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) விக்டோரியா மின் உற்பத்தி நிலைய நிர்மாணக் கருத்திட்டத்தில் பணியாற்றிய வெளிநாட்டவர்களுக்குக் குண்டசாலைப் பிரதேச செயலகப் பிரிவின் "திகன விலேஜ்"இல் தங்குமிட வசதிகள் வழங்கப்பட்டிருந்தன என்ப தையும்;

(ii) அங்கு அலுவலகக் கட்டிடங்கள், உணவகங்கள் மற்றும் தங்குமிட விடுதிகள் போன்றவை உள்ளன என்பதையும்;

(iii) இன்றளவில் அது இலங்கை மகாவலி அதிகாரசபையினால் நிர்வகிக்கப்படுகின்றது என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) "திகன விலேஜ்"இல் காணப்படும் அலுவலகக் கட்டிடங்கள், உணவகங்கள் மற்றும் தங்குமிட விடுதிகளின் எண்ணிக்கையும்;

(ii) அவை இன்றளவில் பயன்படுத்தப்படுவதன் நோக்கங்களும்;

தனித்தனியாக யாவை என்பதை அவர் குறிப்பிடுவாரா?

(இ) (i) "திகன விலேஜ்"இல் நிர்மாணிக்கப்பட்டுள்ள ஒரு கட்டிடம் தனியார் தரப்புக்கு / நிறுவனத்திற்கு வழங்கப்பட்டுள்ளதா என்பதையும்;

(ii) அவ்வாறாயின், அது எந்த அடிப்படையில் வழங்கப்பட்டுள்ளது என்பதையும்;

(iii) குறித்த கட்டிடம் வழங்கப்பட்டுள்ள தனியார் தரப்பின் / நிறுவனத்தின் பெயர் யாது என்ப தையும்;

(iv) அந்தப் பிரதேசத்தில் சட்டவிரோத குடியமர்த் தல்கள் மேற்கொள்ளப்பட்டுள்ளனவா என்ப தையும்;

(v) அவ்வாறாயின், அதற்கெதிராக எடுக்கப் பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Irrigation:

(a) Is he aware that

(i) residential facilities were made available at the "Digana Village" within the Kundasale Divisional Secretary's Division for foreigners who served in the Victoria Power Station Construction Project;

(ii) there are office buildings, cafeterias and hostels; and

(iii) it is governed by the Sri Lanka Mahaweli Authority at present?

(b) Will he state separately -

(i) the number of office buildings, cafeterias and hostels existing at "Digana Village"; and

(ii) the purposes for which they are used at present?

(c) Will he also state -

(i) whether any building that had been constructed at "Digana Village" has been made available to any private party;

(ii) if so, the criterion according to which it was given;

(iii) the name of the party/institution to whom the building has been given;

(iv) whether illegal settling has occurred in that area; and

(v) if so, the measures taken against it?

(d) If not, why?

**ගරු සිරිපාල ගමලත් මහතා**
(மாண்புமிகு சிறிபால கம்லத்)
(The Hon. Siripala Gamalath)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඔව්.

(ii) ඔව්.

(iii) ඔව්.

(ආ) (i)

- කාර්යාල ගොඩනැඟිලි - 07
- භෝජනාගාර - 05
- නේවාසිකාගාර - 250

(ii) (a) ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ කාර්යාල පරිශ්‍රය.
නේවාසික ව්‍යාපාර කළමනාකාර කාර්යාල - 01
ප්‍රධාන වේලි හා ජලාශ මෙහෙයුම් අංශය- 03
මහවැලි ආරක්ෂණ සංවිධානය - 03

(b) දිගන හොලිඩේ රිසෝට් (මේ වනවිට අධිකරණයේ නඩුවක් පවතී.)

(c) නිල නිවාස - 250

| අනු අංකය | භාවිත කරන ආයතනයේ නම | නිල නිවාස ගණන |
|---|---|---|
| 1. | ප්‍රධාන වේලි හා ජලාශ කාර්යාලය | 89 |
| 2. | නේවාසික ව්‍යාපාර කළමනාකාර කාර්යාලය - වික්ටෝරියා කාර්යාලය | 30 |
| 3. | මහවැලි ආරක්ෂක බලකාය | 44 |
| 4. | ලංකා විදුලිබල මණ්ඩලය | 25 |
| 5. | ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය | 32 |
| 6. | දිගන පුනරුත්ථාපන රෝහල | 04 |
| 7. | මධ්‍යම පළාත් සභාව | 04 |
| 8. | දිගන රිසෝට් ආයතනය | 15 |
| 9. | ඉකෝල් ජාත්‍යන්තර පාසැල | 01 |
| 10 | මූලික අධ්‍යයන ආයතනය - IFS | 06 |
| | මුළු එකතුව | 250 |

(ඇ) (i) ඔව්.

(ii) දීර්ඝ කාලීන බදු පදනම මත.

(iii) * දිගන හොලිඩේ රිසෝට් ආයතනය (දැනට අධිකරණයේ නඩුවක් පවතී.)

* ඉකෝල් ජාත්‍යන්තර පාසල.

(iv) නැත. නීත්‍යානුකූල තේරීම්ලාභීන්ට විධිමත්ව ඉඩම් බැහැර කර ඇත.

(v) අදාළ නොවේ.

(ඈ) අදාළ නොවේ.

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)

ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, උත්තරය ලබා දුන්නාට බොහොම ස්තුතියි.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, මම (ඇ) (iii) ප්‍රශ්නයෙන්, "දිගන විලේජ්"හි ගොඩනැගිලි ලබා දී ඇති පෞද්ගලික පාර්ශ්ව හෝ ආයතන ගැන විමසා තිබෙනවා. ඊට පිළිතුරු ලෙස ඔබතුමා ආයතන දෙකක නම් ඉදිරිපත් කළා. ඊට කලින් ලබා දුන් පිළිතුරක ඔබතුමා සඳහන් කළා, "දිගන විලේජ්" හි නිල නිවාස 200 ගණනක් තිබෙනවා කියලා. ඒ නිල නිවාස පෞද්ගලික පාර්ශ්වයන්ට ලබා දී තිබෙනවාද කියලා මට දැන ගන්න අවශ්‍යයි.

**ගරු සිරිපාල ගමලත් මහතා**
(மாண்புமிகு சிறிபால கம்லத்)
(The Hon. Siripala Gamalath)

ඔබතුමා අසා තිබෙන ප්‍රශ්නයට අදාළව මට ලැබුණු තොරතුරු අනුව, මම සඳහන් කරපු ඒ ආයතනවලට තමයි නිල නිවාස ලබා දීලා තිබෙන්නේ. වෙනත් අය ඒ නිල නිවාසවල ඉන්නවාද කියලා පරීක්ෂා කරලා මම ඔබතුමාට කියන්නම්. මහවැලි අධිකාරිය මම සඳහන් කළ ආයතනවලට තමයි නිල නිවාස ලබා දී තිබෙන්නේ.

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, "දිගන විලේජ්" පිහිටා තිබෙන්නේ ඉතා ප්‍රසිද්ධ වටිනා පළාතක බව ඔබතුමාත් දන්නවා. ජාත්‍යන්තර වශයෙන් ප්‍රසිද්ධ Pallekele International Cricket Stadium එක හා Victoria Golf Course එක තිබෙන්නේත් ඒ ප්‍රදේශයේ. මෙවැනි ප්‍රසිද්ධ ප්‍රදේශයක විශාල ගොඩනැඟිලි ප්‍රමාණයක් දීර්ඝ කාලයක් තිස්සේ හරියාකාරව භාවිතයට නොගෙන තිබෙනවා. මේ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරලා, එම ගොඩනැඟිලි මහ ජනතාවගේ ප්‍රයෝජනයට ගත හැකි ලෙස සංවර්ධනය කරලා දුන්නොත් එය ඉතා වටිනා දෙයක්.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, එම ගොඩනැඟිලිවල අනවසර පදිංචිකරුවන් ඉන්නවා. ඒ වාගේම එම ගොඩනැඟිලි අනවසරව පාවිච්චි කරනවා. ඒ පිළිබඳව පරීක්ෂා කරලා, එම ගොඩනැඟිලි මහවැලි අධිකාරියට ලබාගෙන ජනතාවට පාවිච්චි කරන්න පුළුවන් ලෙස සංවර්ධනය කරන්න වැඩ පිළිවෙළක් යොදන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු සිරිපාල ගමලත් මහතා**
(மாண்புமிகு சிறிபால கம்லத்)
(The Hon. Siripala Gamalath)

ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉදිරිපත් කළේ ඉතා හොඳ යෝජනාවක්. ඒ කාරණය මම අවධානයට ගන්නම්. අපි දැනට ආයතනයකට විරුද්ධව නඩු පවරා තිබෙනවා. ඒ නඩුවත් තවම අවසන් නැහැ. ඒ වාගේම, ඒ ආයතනයත්, මහවැලි අධිකාරියට විරුද්ධව නඩු පවරා තිබෙනවා. ඒ ගිවිසුම හරියට ක්‍රියාත්මක වෙලා නැහැ, මහවැලි අධිකාරිය පොරොන්දු වුණු කටයුතු කෙරිලා නැහැ කියලා ඒ ආයතනය මහවැලි අධිකාරියට විරුද්ධව නඩු පවරා තිබෙනවා. ඒ වාගේම ඒ ගොල්ලන්ගේ ආයෝජන කිසි දෙයක් සිද්ධ වෙලාත් නැහැ. ඒ නිසා බලාපොරොත්තු වුණු වැඩ පිළිවෙළ ක්‍රියාත්මක නොවුණු නිසා අපි ඒවා අත්පත් කර ගන්න කටයුතු කරනවා. කිච්චා වාගේම ඉතාම වටිනා ස්ථාන වාගේම සියලු පහසුකම් සහිතව තමයි "දිගන විලේජ්" නිවාස ඇති කරලා තිබෙන්නේ. ඒ නිසා අපි මේවා පිළිබඳ සොයා බලා, ඉතා ඉක්මනින් ඉදිරි කටයුතු කර, ඊට පසුව ඔබතුමාට සියලු තොරතුරු මම දන්වන්නම්.

## වතු වෛද්‍ය සහායකවරු: විස්තර
தோட்ட மருத்துவ உதவியாளர்கள்: விபரம்
ESTATE MEDICAL ASSISTANTS: DETAILS

584/2020

**34. ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)

අග්‍රාමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ වැවිලි ක්ෂේත්‍රය ආශ්‍රිතව වතු වෛද්‍ය මධ්‍යස්ථාන ක්‍රියාත්මක වන බවත්;

(ii) එවැනි මධ්‍යස්ථානයක භාරකරු ලෙස වතු වෛද්‍ය සහායක තනතුර දරන්නෙකු කටයුතු කරන බවත්;

(iii) රෝගීන් පරීක්ෂා කර ඖෂධ නියම කිරීම, එම වතු වෛද්‍ය සහායකවරයා විසින් සිදු කරන බවත්;

එතුමා දන්නේද?

[ගරු වේලු කුමාර් මහතා]

(ආ) (i) වැවිලි ක්ෂේත්‍රය ආශ්‍රිතව මේ වනවිට ක්‍රියාත්මක වන වතු වෛද්‍ය මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම මධ්‍යස්ථානයන්හි සේවය කරනු ලබන වතු වෛද්‍ය සහායකවරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම වතු වෛද්‍ය සහායකවරුන්ගේ සුදුසුකම් කවරේද;

(iv) ඔවුන්ගේ කාර්යභාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) (i) එම වතු වෛද්‍ය සහායකවරුන් විසින් ඉටු කරනු ලබන කාර්යභාරය නීත්‍යානුකූල වන්නේද;

(ii) නොඑසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் பெருந்தோட்டத்துறை சார்ந்ததாகத் தோட்ட மருத்துவ நிலையங்கள் நடைமுறையில் உள்ளன என்பதையும்;

(ii) அத்தகைய ஒரு நிலையத்தின் பொறுப்பாளராக, தோட்ட மருத்துவ உதவியாளர் பதவியை வகிக்குமொருவர் கடமையாற்றுகின்றார் என்பதையும்;

(iii) நோயாளர்களைப் பரிசீலித்து ஔடதங்களைப் பரிந்துரைத்தல், குறிப்பிட்ட தோட்ட மருத்துவ உதவியாளரால் மேற்கொள்ளப்படுகிறது என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) பெருந்தோட்டத்துறை சார்ந்ததாகத் தற்போது இயங்கிவரும் தோட்ட மருத்துவ நிலையங்களின் எண்ணிக்கை யாது;

(ii) மேற்படி வைத்தியசாலைகளில் பணியாற்றும் தோட்ட மருத்துவ உதவியாளர்களின் எண்ணிக்கை யாது;

(iii) மேற்படி தோட்ட மருத்துவ உதவியாளர்களின் தகைமைகள் யாவை;

(iv) அவர்களது விடயப்பொறுப்புக்கள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) மேற்படி தோட்ட மருத்துவ உதவியாளர்களினால் மேற்கொள்ளப்படும் விடயப்பொறுப்பு சட்டரீதியானதா;

(ii) இன்றேல், இது தொடர்பில் மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை;

என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Urban Development and Housing:

(a) Is he aware that -

(i) estate dispensaries are functioning in the plantation sector of Sri Lanka;

(ii) an Estate Medical Assistant works as the overseer to aforesaid centres; and

(iii) aforesaid Estate Medical Assistants examine patients and prescribe medicine?

(b) Will he inform this House -

(i) the number of estate dispensaries functioning in the plantation sector by now;

(ii) the number of Estate Medical Assistants employed at aforesaid centres;

(iii) the qualifications of aforesaid Estate Medical Assistants; and

(iv) their task?

(c) Will he also inform this House -

(i) whether the task of aforesaid Estate Medical Assistants is legal; and

(ii) if not, the measures taken in that regard?

(d) If not, why?

**ගරු ජීවන් තොන්ඩමන් මහතා (වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜீவன் தொண்டமான் - தோட்ட வீடமைப்பு மற்றும் சமுதாய உட்கட்டமைப்பு வசதிகள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Jeevan Thondaman - State Minister of Estate Housing and Community Infrastructure)

Sir, on behalf of the Prime Minister and Minister of Urban Development and Housing, I answer the Question.

(a) (i) Yes, estate dispensaries are functioning in the plantation sector.

(ii) Yes, it is not only Estate Medical Assistants, but government doctors, too, oversee the estate dispensaries.

(iii) Estate Medical Assistants neither examine patients nor prescribe medicines. They only perform first aid.

(b) (i) A number of 299 estate dispensaries are functioning in the plantation sector by now. This includes dispensaries functioned by government doctors as well.

(ii) One hundred and thirty nine Estate Medical Assistants are employed, the breakdown of which is as follows:

| | |
|---|---|
| Estate Medical Assistants | - 21 Nos. |
| Pharmacists | - 73 Nos. |
| Apprentice Pharmacists | - 45 Nos. |
| Total | 139 Nos. |

(iii) a) EMA Certificate
b) Pharmacist Certificate
c) Apprentice Pharmacist Certificate

(iv) MAs only perform first aid.

(c ) (i) It is legal.

(ii) Not applicable.

(d) Not applicable.

ගරු වේලු කුමාර් මහතා
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த நாட்டில் இருக்கின்ற தேசிய சுகாதாரத்துறையின் நடைமுறைகள் எங்களுடைய பெருந்தோட்டப் பகுதியில் செயற்பாட்டில் இல்லை. அதற்குப் பதிலாக தோட்ட மருத்துவ நிலையங்களே தாபிக்கப்பட்டிருக்கின்றன. இத்தோட்ட மருத்துவ நிலையங்கள் தொடர்பில் எங்களுக்கு உடன்பாடு இல்லை. கடந்த காலம் உட்பட இன்றைய 'கொவிட்' சூழ்நிலையில் பெருந்தோட்டத்துறைக்கு மருத்துவ சேவையை வழங்குவதற்கு இருக்கக்கூடிய இந்த மருத்துவ நிலையங்கள் - medical centres - அல்லது அது சார்ந்த அலகுகள் நேரடியாக எவ்வித செயற்பாட்டையும் கொண்டிருக்கவில்லை. அதற்குப் பதிலாக, தோட்ட உட்கட்டமைப்பு அமைச்சினூடாக மலையகத்துக்கான கொரோனா தடுப்புச் செயலணியை அமைக்கின்றோம், 'பிரஜாசக்தி' அமைப்பினூடாகச் செயற் படுகின்றோம் என்றெல்லாம் அறிக்கைகள் வெளியிடப்பட்டன. பெருந்தோட்டத்துறையில் சுகாதார சேவையை அளிக்கின்ற இந்த மருத்துவ நிலையங்கள் செயற்பாட்டில் இருக்கத் தக்கதாக, செயலற்ற ஒன்றை இதற்குள் நுழைப்பதற்கான காரணம் என்ன? இந்தக் காலப்பகுதியிலே எங்களுடைய மக்களைக் 'கொவிட்' தொற்றிலிருந்து மீட்பதற்காக இந்த மருத்துவ நிலையங்களுக்கென விசேட நிதி ஒதுக்கீடுகள் எதுவும் செய்யப்பட்டதா? என நான் உங்களிடம் கேட்கின்றேன்.

ගරු ජීවන් තොන්ඩමන් මහතා
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)

கௌரவ உறுப்பினர் அவர்களே, இப்பொழுது நீங்கள் என்னிடம் சில விடயங்கள் தொடர்பில் கேட்டிருந்தீர்கள். முக்கியமாக 'பிரஜாசக்தி' அமைப்பினூடாக உருவாக்கப்பட்ட கொரோனா தடுப்புச் செயலணி பற்றி கேட்டீர்கள். இதுதொடர்பில் ஒரு விடயத்தை நான் இங்கு தெளிவுபடுத்த விரும்புகின்றேன். உங்களுக்கு நன்றாகவே தெரியும்! நுவரெலியா மாவட்டத்திலுள்ள மக்களுக்கு மட்டுமல்ல, ஒட்டுமொத்த மலையகத்திலுமுள்ள மக்களுக்கும் access to vaccination centres ஒரு பிரச்சினையாக இருந்தது. அதாவது, தடுப்பூசி செலுத்தும் நிலையத்துக்குச் செல்வது என்பது அவர்களுக்குப் பெரிய பிரச்சினையாக இருந்தது. அதுமட்டுமல்லாமல், resource பிரச்சினையும் இருந்தது. இவை எல்லாவற்றையும் நிவர்த்தி செய்வதற்காகத்தான் நாங்கள் 'பிரஜாசக்தி' அமைப்பினூடாக இந்த Task Forceஐ உருவாக்கினோம். அந்த vaccination centres இற்கு நீங்கள் சென்று பார்த்தீர்கள் என்றால், 'பிரஜாசக்தி' அமைப்பினூடாக எத்தனை பேருக்கு நாங்கள் transport வசதிகளை வழங்கியிருக்கின்றோம் என்பது உங்களுக்குத் தெரியவரும். அதுமட்டுமல்லாமல், கிட்டத்தட்ட 1,100 volunteers அங்கு கடமையாற்றுகின்றார்கள். நீங்கள் சொன்ன ஒரு விடயத்தை நான் ஒத்துக்கொள்கின்றேன். அதாவது, பெருந்தோட்டப் பகுதிகளில் இருக்கின்ற medical centres மிகவும் மோசமான நிலையில்தான் காணப்படுகின்றனவென்பதை நாங்கள் ஏற்றுக்கொண்டுதான் ஆகவேண்டும். இது ஓரிரு வருடங்களாக இருக்கின்ற நிலைமை அல்ல. பல ஆண்டுகளாக இப்படித்தான் இருக்கின்றது. இதற்கு ஒரு தீர்வு காணவேண்டும் என்பதற்காகத்தான் நாங்கள் முதலில் பவித்ராதேவி வன்னிஆரச்சி அம்மையார் அவர்கள் சுகாதார அமைச்சராக இருந்தபோது அவரிடம் இது சம்பந்தமாகத் தெரிவித்தோம்.

அதன்பிறகு Cabinet reshuffle செய்யப்பட்டது. இப்பொழுது கௌரவ அமைச்சர் கெஹெலிய றம்புக்வெல்ல அவர்கள் சுகாதார அமைச்சராக இருக்கின்றார். இப்போது நாங்கள் உங்களுக்கு அது தொடர்பாக யோசனை கூற முடியும்; நீங்கள் அதனை ஏற்றுக்கொண்டால் நல்லதென்று நினைக்கிறோம். அதாவது, மலையகத்திலுள்ள அனைத்து அரசியல் தரப்பினர்களும் ஒன்றிணைந்து சுகாதாரப் பிரச்சினை சம்பந்தமாக என்னென்ன தேவைகள் இருக்கின்றதோ அது தொடர்பில் சுகாதார அமைச்சுடன் பேசி அந்தத் தேவைகளைப் பூர்த்திசெய்வது நல்லதென்று நான் நினைக்கின்றேன்.

ගරු වේලු කුමාර් මහතා
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)

கௌரவ சபைக்குத் தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கௌரவ அமைச்சரினது விடைக்கு என்னுடைய நன்றிகளைத் தெரிவித்துக்கொள்வதோடு, நாங்கள் ஒன்றைக் குறிப்பிட வேண்டும். இந்த நாடு சுதந்திரமடைந்ததன் பிறகு இன்று வரையான காலப்பகுதியிலே 2015 இலிருந்து நான்கரை வருடகாலம் தவிர, முற்றுமுழுதாக இந்த உயர் சபையிலே மலையக மக்களின் பிரதிநிதிகளாகவும் அமைச்சர்களாகவும் தாங்கள் இன்று பிரதிநிதித்துவம் செய்யக்கூடிய அந்தக் கட்சியை, அந்தத் தொழிற்சங்கத்தைச் சார்ந்தவர்கள்தான் இருந்திருக்கின்றார்கள். இந்த நாட்டிலே வாழும் ஏனைய சமூகத்தவர்கள் மருத்துவக் கற்கையை நிறைவுசெய்த வைத்தியர்கள்மூலம் மருத்துவச் சேவைகளைப் பெறுகின்றபோது, எங்களது மக்கள், நீங்கள் உங்களது விடையிலே குறிப்பிட்டதுபோல, இரண்டாம் தரமான வைத்திய உத்தியோகத்தர்களை -MBBS பட்டம் பெற்றிராதவர் களைக் கொண்டுதான் அந்தச் சேவையைப் பெறவேண்டிய ஒரு துர்ப்பாக்கிய நிலைமை கடந்த 50 - 60 ஆண்டுகளாக இருந்து வருகின்றது. எனவே, அது தொடர்பாக தாங்கள் பிரதிநிதித்துவம் செய்கின்ற கட்சியினர் என்ன செய்தார்கள்? என்ற கேள்வி எழுகின்றது.

எங்களுடைய நல்லாட்சிக் காலத்தின்போது நாங்கள் இந்த மக்களுக்கான வீடுகளைக் கட்டுகின்றபோது, "அது குருவிக் கூடுகள்" என்றும் "Seven perches காணியை ஏற்காதீர்கள். நாங்கள் வந்தால் 20 perches காணி தருவோம்" என்றும் குறிப்பிட்ட நீங்கள், இன்று அந்த வீடுகளைத் திறந்துவைத்து மக்களுக்குக் கையளிப்பது மகிழ்ச்சியாக இருக்கின்றது. நான் இதனைக் குறிப்பிடுவதற்கான காரணம், நாங்கள் எங்களுடைய நான்கரை வருட காலத்தில் இந்தப் பெருந்தோட்டத்துறையிலே இருக்கின்ற வைத்திய நிலையங்களை -medical centres- தோட்ட வைத் தியசாலைகளைத் தேசிய சுகாதார முறைமைக்குள் கொண்டுவருவதற்கான ஒரு வேலைத்திட்டத்தைச் செய்திருந்தோம். இது தொடர்பான சுகாதாரம் பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவின் முழுமையான அறிக்கையை இந்தப் பாராளுமன்ற அவையில் முன்வைத்திருந்தோம். ஆனால், இந்த 1½ - 2 வருட காலங்களிலே இது தொடர்பான எந்தவிதமான முன்னெடுப்புக்களும் நடைபெறவில்லை. ஆகவே, அந்த அறிக்கையை மையப்படுத்தி தங்களுடைய அமைச்சினூடாக தேசிய சுகாதார முறைமைக்குள் எங்களுடைய மக்களும் பங்கேற்பதற்கான வழிவகைகளை முன்னெடுப்பீர்களா? அதற்காக நீங்கள் செய்திருக்கக்கூடிய வேலைத்திட்டங்கள் ஏதும் இருக்கின்றதா? என்பதை எங்களுடைய மக்களுக்காக விளங்கப்படுத்துமாறு கேட்கின்றேன்.

ගරු ජීවන් තොන්ඩමන් මහතා
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)

நீங்கள் கட்டிய வீடுகளை நாங்கள் கையளித்ததில் உங்களுக்கு மிகவும் மகிழ்ச்சி என்று சொன்னீர்கள். அதற்காக நான் உங்களுக்கு நன்றி சொல்லியே ஆக வேண்டும். ஆனால், அதில் சின்னத் திருத்தம் சொல்ல வேண்டியிருக்கின்றது. நான் அது தொடர்பில் வியாழக்கிழமை தெளிவுபடுத்துகிறேன். ஆனால், அதற்கு முன்னாடி நான் ஒரு விடயத்தைச் சொல்லிவிடுகிறேன். நீங்கள் 699 வீடுகளைத்தான்

[ගරු ජීවන් තොන්ඩමන් මහතා]

முழுமையாக மக்களிடம் ஒப்படைத்திருக்கின்றீர்கள். நீங்கள் இதனை நம்பவில்லையென்றால் right to information மூலம் அமைச்சில் ஆதாரத்தை பெற்றுக்கொள்ளுங்கள்! யாரும் தடுக்கவில்லை. ஆனால், நீங்கள் ஐந்து வருடத்தில் செய்யாத வேலைகளை நாங்கள் பதவிக்கு வந்து ஒரு வருடத்தில் செய்திருக்கின்றோம். மீதியாக இருக்கின்ற 3,301 வீடுகளுக்கும் தண்ணீர், மின்சார வசதிகளை வழங்கத் திட்டமிட்டிருக் கின்றோம்; 1,635 வீடுகளை மக்களிடம் ஒப்படைத் திருக்கின்றோம். இந்த மாதத்திற்குள் 4,000 வீடுகளையும் ஒப்படைப்போம். நீங்கள் அரைகுறையாக விட்டுச்சென்ற வீடுகளை நாங்கள் முழுமையாக முடித்ததையிட்டு நான் மகிழ்ச்சி அடைகின்றேன். இதற்காக உங்களுக்கும் நன்றி சொல்கின்றேன். கட்டிட உதவிகளை வழங்கிய இந்திய அரசாங்கத்திற்கும் நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன்.

நீங்கள் சொன்ன இரண்டாவது விடயம் நியாயமானது. அதாவது, Consultative Committee மூலம் ஒரு documentஐ தயாரித்திருப்பதாகச் சொன்னீர்கள். நாங்கள் அதனை பார்த்துவிட்டு, இரு தரப்பும் சேர்ந்து இதைப் பற்றி பேசி கட்டாயம் ஒரு முடிவு எடுப்போம்! [*இடையீடு*] Seven perches விட ten perches ஆனது three perches அதிகம். நீங்கள் seven perches கொடுத்தீர்கள்; நாங்கள் ten perches கொடுத்தோம். அதுதான் வித்தியாசம். யார் கொடுத்தால் என்ன மக்களுக்கு நன்மை கிடைத்தால் போதும். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි, ගරු රාජ්‍ය අමාත්‍යතුමනි.

**ගරු චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චාල්ස් නිර්මලනාදන් මන්ත්‍රීතුමනි, ප්‍රශ්නයක්ද?

**ගරු චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)
ප්‍රශ්නයක් නොවෙයි. පොඩි යෝජනාවක් විතරයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඉක්මනින් කියන්න.

**ගරු චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)
கௌரவ இராஜாங்க அமைச்சர் அவர்களே, நான் அந்தத் துறைசார் மேற்பார்வைக்குழுவில் அங்கம் வகித்தேன். முன்னாள் பாராளுமன்ற உறுப்பினர் மாண்புமிகு திலகராஜா அவர்கள்தான் இதுதொடர்பாக தொடர்ச்சியாக முயற்சி எடுத்துக்கொண்டிருந்தார். அவரது முயற்சியின் ஒரு கட்டமாக, "சாள்ஸ் MP, நாளைக்கு மலையகப் பிரதேசத்தில் இருக்கின்ற வைத்தியசாலைகளின் அபிவிருத்தி தொடர்பான கூட்டம் இருக்கிறது; அதில் கட்டாயம் கலந்துகொள்ளுங்கள்!" என்று கூட்டத்துக்கு முதல் நாளே என்னிடம் கூறுவார். நான் நினைக்கின்றேன், 03 வருட தொடர் முயற்சியாக இது மேற்கொள்ளப்பட்டது என்று. அப்போதிருந்த சுகாதார சேவைகள் பணிப்பாளர் நாயகம் Dr. Anil Jasinghe அவர்களும் அந்தக் கூட்டங்களில் கலந்துகொண்டார். அவருடைய பங்களிப்புடன்தான் இது தொடர்பில் ஒரு முடிவு எடுக்கப்பட்டது. இந்த விஷயத்தை அவர் எனக்கு ஞாபகப்படுத்தியிருந்தார். நான் 03 வருடங்கள் அந்தக் குழுவுக்குப் பங்களிப்புச் செய்திருக்கின்றேன். அந்த documentஐ Dr. Anil Jasingheதான் தயாரித்திருக்கின்றார். தயவுசெய்து அதை நீங்கள் எடுத்துப் பாருங்கள்! அதை நீங்கள் பார்த்தீர்களென்றால், உங்களுக்கு அதிலுள்ள நன்மைகள் விளங்குமென்று நினைக்கின்றேன். இதனை நான் உங்களுக்கு ஒரு யோசனையாகச் சொல்லுகின்றேன். நன்றி.

**ගරු ජීවන් තොන්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)
கட்டாயம் பார்க்கின்றேன். மிகவும் நன்றி.

## අපනයන සැකසුම් කලාප: විස්තර
ஏற்றுமதிச் செயற்பாட்டு வலயங்கள்: விபரம்
EXPORT PROCESSING ZONES: DETAILS

835/2020

**35.** **ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
අග්‍රාමාත්‍ය සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) ශ්‍රී ලංකාව තුළ පවත්වාගෙන යනු ලබන අපනයන සැකසුම් කලාප සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) එම එක් එක් අපනයන සැකසුම් කලාපය-

(i) ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) අයත්වන භූමි ප්‍රමාණය කොපමණද;

(iii) එම භූමි ප්‍රමාණයෙන් මේ වනවිට භාවිත කර ඇති භූමි ප්‍රමාණය කොපමණද;

යන්නත් වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) (i) ඉදිරියේදී ස්ථාපිත කිරීමට සැලසුම් කර ඇති අපනයන සැකසුම් කලාප සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

යන්න එතුමා තවදුරටත් මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் பொருளாதாரக் கொள்கைகள் மற்றும் திட்டச் செயற்படுத்துகை அமைச்சரும் புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரும் நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) இலங்கையில் நடாத்திச் செல்லப்படும் ஏற்றுமதிச் செயற்பாட்டு வலயங்களின் எண்ணிக்கை எத்தனை என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) மேற்படி ஒவ்வோர் ஏற்றுமதிச் செயற்பாட்டு வலயமும் -

(i) ஆரம்பிக்கப்பட்ட திகதி யாதென்பதையும்;

(ii) கொண்டுள்ள நிலப்பரப்பு எவ்வளவென் பதையும்;

(iii) மேற்படி நிலப்பரப்பில் இதுவரை பயன்படுத் தப்பட்டுள்ள நிலப்பரப்பு எவ்வளவென்பதையும்;

வெவ்வேறாக அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) எதிர்காலத்தில் நிர்மாணிப்பதற்குத் திட்டமிடப் பட்டுள்ள ஏற்றுமதித் தயாரிப்பு வலயங்களின் எண்ணிக்கை எத்தனையென்பதையும்;

(ii) அவற்றின் பெயர்கள் யாவை என்பதையும்;

அவர் மேலும் இச்சபைக்குத் அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Economic Policies and Plan Implementation, Minister of Buddhasasana, Religious and Cultural Affairs and Minister of Urban Development and Housing :

(a) Will he inform this House of the number of Export Processing Zones in Sri Lanka?

(b) Will he also inform this House in relation to each such Export Processing Zone -

(i) the date of commencement;

(ii) the extent of land; and

(iii) the portion that has been used out of that extent of land, separately?

(c) Will he further inform this House -

(i) the number of Export Processing Zones planned to be established in future; and

(ii) their names?

(d) If not, why?

**ගරු ඩී.වී. චානක මහතා**

(மாண்புமிகு டி.வி. சானக)

(The Hon. D.V. Chanaka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අග්‍රාමාත්‍ය සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) 14යි. ඇමුණුම 01 මඟින් විස්තර දක්වා ඇත.

*ඇමුණුම 01*

| අපනයන සැකසුම් කලාප | කර්මාන්ත උද්‍යාන/ කර්මාන්ත කලාප | අපනයන සැකසුම් උද්‍යාන |
|---|---|---|
| කටුනායක, බියගම, කොග්ගල, මීරිගම, සීතාවක, මිරිජ්ජවිල, වතුපිටිවල, හොරණ, පොල්ගහවෙල, මාවතගම සහ බිංගිරිය (අදියර 1) | මහනුවර වගවත්ත කර්මාන්ත උද්‍යානය (අදියර 1) සහ වගවත්ත කර්මාන්ත කලාපය (අදියර 2) | මල්වත්ත |

(ආ) (i), (ii), (iii) ප්‍රශ්න තුනටම අදාළ පිළිතුරු ඇමුණුම 02හි දක්වා ඇත.

*ඇමුණුම 02*

| අපනයන සැකසුම් කලාප/ කර්මාන්ත උද්‍යාන/ කර්මාන්ත කලාප/ අපනයන සැකසුම් උද්‍යාන | ආරම්භක දිනය | මුළු භූමි ප්‍රමාණය (අක්කර) | භාවිත කළ හැකි මුළු භූමි ප්‍රමාණය (අක්කර) | කර්මාන්ත සහ යටිතල පහසුකම් සඳහා භාවිත කළ භූමි ප්‍රමාණය (අක්කර) | ඉඩම් භාවිත ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|---|
| කටුනායක අපනයන සැකසුම් කලාපය | 1978.03.27 | 513.5 | 510 | 493 | 97% |
| බියගම අපනයන සැකසුම් කලාපය | 1983.11.20 | 450.1 | 389 | 379 | 98% |
| සීතාවක අපනයන සැකසුම් කලාපය | 1997.08.11 | 431 | 272 | 266 | 98% |
| හොරණ අපනයන සැකසුම් කලාපය | 1999.10.30 | 391 | 284 | 273 | 96% |
| කොග්ගල අපනයන සැකසුම් කලාපය | 1991.07.14 | 227 | 218 | 208 | 95% |
| මහනුවර කර්මාන්ත උද්‍යානය | 1994.04.08 | 195 | 150 | 141 | 94% |
| පොල්ගහ වෙල අපනයන සැකසුම් කලාපය | 1999.01.20 | 65 | 65 | 61 | 93% |
| මාවතගම අපනයන සැකසුම් කලාපය | 1999.01.17 | 54 | 54 | 49 | 91% |
| වතුපිටිවල අපනයන සැකසුම් කලාපය | 1998.03.22 | 123 | 123 | 123 | 100% |
| මීරිගම අපනයන සැකසුම් කලාපය | 1998.03.19 | 261 | 200 | 127 | 63% |
| මල්වත්ත අපනයන සැකසුම් උද්‍යාන | 1997.03.19 | 33 | 33 | 30 | 92% |
| මිරිජ්ජවිල අපනයන සැකසුම් කලාපය | 1999.12.12 | 566 | 529 | 372 | 70% |
| වගවත්ත කර්මාන්ත උද්‍යාන ය (1 අදියර) | 2004.06.01 | 76 | 70 | 70 | 100% |
| වගවත්ත කර්මාන්ත කලාපය (2 අදියර) | 2014.02.20 | 224 | 224 | 218 | 97% |
| බිංගිරිය අපනයන සැකසුම් කලාපය | 2019.03.04 | 157 | 157 | 93 | 59% |

[ගරු ඩී.වී. චානක මහතා]

මීරිගම කලාපයට අවශ්‍ය විදුලිබල සැපයුම 2023 වන විට ලැබෙතැයි අපේක්ෂා කෙරේ.

බිංගිරිය කලාපයට අවශ්‍ය ජල සැපයුම මා ඔය ජල ව්‍යාපෘතිය මඟින් 2024 වන විට ලැබෙතැයි අපේක්ෂා කෙරේ.

හම්බන්තොට ප්‍රදේශයේ කාර්මික භූ දර්ශනය සැලකිල්ලට ගනිමින් මෙගා පරිමාණ ව්‍යාපෘති සඳහා මිරිජ්ජවිල කලාපය හඳුනාගෙන ඇත.

(ඈ) (i) 04යි.

(ii) 1. බෙහෙත් ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා - ආරබොක්ක, හම්බන්තොට.

2. ඇඟලුම් නිෂ්පාදනය සඳහා - එරාවූර්, මඩකලපුව.

3. හම්බන්තොට - ආරබොක්ක (නව අපනයන සැකසුම් කලාපය).

4. බිංගිරිය අපනයන සැකසුම් කලාපය (2 අදියර). මිල්ලනිය අපනයන සැකසුම් කලාපය.

(ඇ) අදාළ නොවේ.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

බොහොම ස්තුතියි, ගරු රාජ්‍ය ඇමතිතුමනි. ඔබතුමා පැහැදිලි පිළිතුරක් ලබා දුන්නා.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා ඔය ලැයිස්තුව කියෙව්වාම ඔබතුමාටත් පැහැදිලිව පෙනෙනවා, අපේ රටේ දැනට ඉදිවෙලා තිබෙන අපනයන සැකසුම් කලාප 14න් අවසන් වරට ඉදිකළ - විශේෂයෙන් මම නියෝජ්‍ය ඇමතිවරයා විධියට කටයුතු කරනකොට හදපු- බිංගිරිය අපනයන සැකසුම් කලාපය දක්වා වූ අපනයන සැකසුම් කලාප අතිබහුතරයක් ආයෝජනවලින් පිරිලා තිබෙන බව. එම නිසා, නව අපනයන සැකසුම් කලාපවල තිබෙන අවශ්‍යතාව සහ අපනයන සැකසුම් කලාපයක තිබෙන වටිනාකම ඔබතුමාත් පිළිගන්නවා ඇති කියලා මම හිතනවා.

මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. 2019 වර්ෂයේ තුන්වැනි මාසයේ අපි බිංගිරිය අපනයන සැකසුම් කලාපය ආරම්භ කළා. නමුත් කියන්න කනගාටුයි, මේ වන විට එහි යටිතල පහසුකම් නතරවෙලා තිබෙනවා. වතුවත්ත සිට දුම්මලසූරිය, තුම්මෝදර හන්දිය දක්වා වූ මාර්ග ඉදිකිරීම නතරවෙලා තිබෙනවා. එම අපනයන සැකසුම් කලාපය මැදින් ගමන් කරන මාර්ගය ඉවත් කරලා, ඒක අභ්‍යන්තර මාර්ගයක් විධියට පාවිච්චි කරන්න කටයුතු කරලා, ප්‍රධාන මාර්ගය අපනයන සැකසුම් කලාපයේ මායිම ඔස්සේ ගමන් කරන අයුරින් කරන ඉදිකිරීම් කටයුත්තත් මේ වන විට නතරවෙලා තිබෙනවා. ඒ වාගේම, ජල සැපයුමත් අවසන්වෙලා තිබෙනවා. එම නිසා අභ්‍යන්තර ජල පද්ධතියේ කටයුතු නතරවෙලා තිබෙනවා. විදුලි සැපයුම ගත්තොත්, පළමුවැනි කොටසට අවශ්‍ය මෙගාවොට් දෙකේ ඉදිකිරීම් අවසන්වෙලා තිබෙනවා. විශේෂයෙන්ම මම නියෝජ්‍ය ඇමතිවරයා වශයෙන් කටයුතු කරනකොට ගිවිසුම් 6ක් අත්සන් කර තිබුණා. ඉන් තුනක ඉදිකිරීම් ආරම්භ කළා. එකක ව්‍යාපෘති කටයුතු අවසන්වෙලා තිබෙනවා. දැන් එහි නිෂ්පාදන කටයුතු කරනවා. අනෙක් ව්‍යාපෘති තුනේ කටයුතු දැන් නතරවෙලා තිබෙනවා. එම ව්‍යාපෘති තුන සඳහා ආයෝජන නොඑන්න හේතුව තමයි, යටිතල පහසුකම් සැපයීමේ ප්‍රමාදය. බිංගිරිය අපනයන සැකසුම් කලාපයේ යටිතල පහසුකම් සැපයීම කඩිනම් කරන්න ඔබතුමන්ලා කටයුතු කරනවාද, ගරු රාජ්‍ය ඇමතිතුමනි? ඒකට තිබෙන ප්‍රමාදය මොකක්ද, ඒ සඳහා බාධාවක් තිබෙනවාද කියලා මම ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි.

**ගරු ඩී. වී. චානක මහතා**
(மாண்புமிகு டி.வி. சானக)
(The Hon. D.V. Chanaka)

ගරු මන්ත්‍රීතුමනි, යටිතල පහසුකම් දියුණු කරන්න අපි මේ අවුරුද්දේත් රුපියල් මිලියන 400ක් වෙන් කළ බව මම විශේෂයෙන්ම කියන්න ඕනෑ. හැබැයි, අවාසනාවට ඔබතුමන්ලා එදා අපනයන සැකසුම් කලාපය හදන වෙලාවේ රාජ්‍ය ආයතන සමඟ කිසිම ගිවිසුම්ගතවීමක් වෙලා නැහැ. අපි දන්නවා, ඕනෑම ඉදිකිරීමක් කරනකොට -RDA එක සමඟ වෙන්න පුළුවන්, National Water Supply and Drainage Board එක සමඟ වෙන්න පුළුවන්, එහෙම නැත්නම් Ceylon Electricity Board එක සමඟ වෙන්න පුළුවන්- ඒ වැඩ ආරම්භයේදී ඊට කලින් ඒ ආයතන සමඟ අපි ගිවිසුම්ගත වෙන්න ඕනෑ බව. ඒ වාගේම MoUs අත්සන් කරන්න ඕනෑ. ඒ කිසිම දෙයක් නැතිව, තක්සේරු කරන්නේ නැතිව තමයි එම ඉදිකිරීම් කටයුතු සිදුවෙලා තිබෙන්නේ. හැබැයි, අපි මේ අවුරුද්දේ සැප්තැම්බර් මාසය වෙනකොට RDA එකත් එක්ක ගිවිසුමක් අත්සන් කළා. සාමාන්‍යයෙන් ගිවිසුම්ගත නොවී වැඩ කළාට පස්සේ අලුත් ගිවිසුමක් අත්සන් කිරීම ඉතා අමාරුයි. විශේෂයෙන්ම National Audit Office එකෙන් අපට දන්වා එවා තිබුණා, MoUs අත්සන් කර නැති නිසා මේ සඳහා ගෙවීම් කටයුතු කරන්න එපා කියලා. ඒක නිසා ඒ සඳහා ගිවිසුම්ගත වීම ඉතා අපහසු කාර්යයක් වුණා. ඊට පස්සේ නීතිපති උපදෙස් අරගෙන, National Audit Office එක ඇතුළු ඒ සියලුදෙනා එක්ක සාකච්ඡා කරලා මේ වෙද්දී අපි RDA එකත් එක්ක ගිවිසුම්ගතවී තිබෙනවා. ඒ වාගේම, Ceylon Electricity Board එක සහ National Water Supply and Drainage Board එක අතර ගිවිසුම්ගතවීම් දැන් සිදුවෙමින් පවතිනවා. ඒවාට අවශ්‍ය ලේඛන දැන් හදාගෙන යනවා. මේ වෙද්දී පොළොව යට ජල නළ එළා ඉවරයි. විදුලි අවශ්‍යතාව ගත්තොත්, මේ වන විට 2 megawatts ලැබිලා ඉවරයි. තව මෙගාවොට් අටක විදුලිය අපි Ceylon Electricity Board එකෙන් ඉල්ලා තිබෙනවා. ඒ අවශ්‍ය කටයුතු සියල්ලම සිදු වෙනවා. ඒවායේ කිසිම බාධාවක් වෙන්නේ නැහැ. ගිය ආණ්ඩුවේ ඔබතුමන්ලා කටයුතු කරපු ක්‍රමයට අපි කටයුතු කරන්නේ නැහැ. මහින්ද රාජපක්ෂ මැතිතුමා හදපු මත්තල ගුවන් තොටුපොළ ඔබතුමන්ලා වී ගබඩාවක් කළා වාගේ අපි කටයුතු කරන්නේ නැහැ. ඔබතුමන්ලා එහෙම කළා කියලා අපි ඒ සංවර්ධන කටයුතු නවත්වන්නේත් නැහැ. එහි දෙවැනි අදියරේ කටයුතු සඳහා අවශ්‍ය මුදල් අපි වෙන් කරගෙන තිබෙනවා. නීත්‍යානුකූල විධියට, ගිවිසුමට අනුකූල විධියට ඉදිරියේදී අපි ඒ කටයුතු කරනවා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න පෙර නිවැරදි කිරීමක් කරන්න ඕනෑ. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඒ මාර්ගය ඉදිකළේ කොන්ත්‍රාත්කරුවන් නොවෙයි. හරි ඉක්මනින් කොන්ත්‍රාත් කරුවන්ට ලබා දීලා මාර්ග ඉදිකිරීම අපි RDA එකට තමයි භාර දුන්නේ. RDA එක සමඟ ගිවිසුම්ගත වෙලා තමයි ඒ ගොල්ලන් ඒ කටයුත්ත කළේ. ඒ වාගේම වන්දි ගෙවීම සඳහා රුපියල් මිලියන 64ක් උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් වෙත ලබාදී තිබුණා. අඩු තරමින් ඒ වන්දි ගෙවීමවත් තවම සිදුවෙලා නැහැ. ඒ ගැන ඔබතුමා පරීක්ෂා කරලා බලන්න.

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු රාජ්‍ය ඇමතිතුමනි. අපනයන සැකසුම් කලාපවල වැදගත්කම පිළිබඳව ඔබතුමාත් දන්නවා. අපි එදා හම්බන්තොට අපනයන සැකසුම් කලාපයේ ඉදිකිරීම් කටයුතු කරනකොට ඔබතුමන්ලා ඊට විරුද්ධව විශාල ඝෝෂාවක් කළා; ගල් මුල් ප්‍රහාර සිදු කළා; නොයෙක් ප්‍රශ්න ඇති වුණා. නමුත් අද ඒ අපනයන සැකසුම් කලාපයේ කටයුතු ඉතා

කඩිනමින් සිදු වෙනවා. මා විශ්වාස කරන විධියට දැන් ඔබතුමන්ලා එතැන ඖෂධ නිෂ්පාදන අපනයනය ඉලක්ක කරගෙන, කලාපයක් විධියට නම් කරලා තිබෙනවා. මා හිතන විධියට ඒ සඳහා උපාය මාර්ග සංවර්ධන ප්‍රතිලාභ ලබා දීමටත් කටයුතු කරමින් ඉන්නවා. ඔබතුමන්ලා ඒ zone එකම ඒ විධියට declare කරනවාද? එහෙම නැත්නම්, එතැනට එන ආයෝජකයන්ට ඒ ප්‍රතිලාභ ලබා දෙනවාද කියන ප්‍රශ්නය අපට තිබෙනවා. මොකද, zone එක declare කළාම එතැනට එන ආයෝජකයන් ඒක අවභාවිත කළොත්, ඔබතුමන්ලාට ඒක නියාමනය කිරීමේ ප්‍රශ්නයක් ඇති වෙනවා. ඒ නිසා ඔබතුමන්ලා දෙන බදු සහන ඒ එන ආයෝජකයාට ලබා දීම සුදුසුයි කියලා මා හිතනවා. ඔබතුමා මේ පිළිබඳව දක්වන මතය මොකක්ද?

**ගරු ඩී.වී.චානක මහතා**
(மாண்புமிகு டி.வி. சானக)
(The Hon. D.V. Chanaka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු මන්ත්‍රීතුමා කියපු කාරණා දෙකක් නිවැරදි කරන්න ඕනෑ. පළමුවැනි කාරණය මේකයි. කිසිම පෞද්ගලික කොන්ත්‍රාත් සමාගමකට දුන්නාය කියන එක නොවෙයි මා කිව්වේ. ඔබතුමන්ලා RDA එක සමඟවත් ගිවිසුම්ගත වෙලා තිබුණේ නැහැ; MoU අත්සන් කරලා තිබුණේ නැහැ. ඕනෑම දෙයක් කරන රජයේ ක්‍රමවේදයක් තිබෙනවා. ඒ ක්‍රමවේදයෙන් පරිබාහිරව වැඩ කළාම ඒවාට මුදල් ගෙවන්න National Audit Office එකෙන් ඉඩ දෙන්නේ නැහැ. ඒ මුදල් පිළිබඳ විස්තර National Audit Office එකට යනවා, ඊට පසුව COPE එකට යනවා. ඒ නිසා ඒවා ක්‍රමානුකූලව කිරීම තමයි මේ කාලය තුළ සිදු කළේ.

ඔබතුමා කිව්වා, හම්බන්තොට අපනයන කලාපයේ ඉදිකිරීම් කටයුතු කරනකොට අපි ගල් මුල් ගැහුවා, උද්ඝෝෂණය කළා කියලා. නැහැ. පැහැදිලිවම එහෙම දෙයක් වුණේ නැහැ. අපි උද්ඝෝෂණය කළේ, හම්බන්තොට වරාය අවුරුදු 99කට බදු දෙනකොටයි. අපි උද්ඝෝෂණය කළේ, හම්බන්තොට ජනතාවගේ ඉඩම් අක්කර 5,000ක් චීනයට දෙනකොටයි. එහෙම නැතුව, අපනයන කලාප හදන්න එපා කියලා අපි උද්ඝෝෂණය කළේ නැහැ. හැබැයි, ඔබතුමන්ලා මොකක්ද කළේ? එදා වරාය ආසන්න භූමියට, අක්කර 1,000ට ආයෝජන 20ක් ආවා. ඒ ආයෝජන 20 හරවලා යැව්වා. ඒ ආයෝජන 20 නවත්වලා, වැඩ පටන් ගත්ත ලාෆ් සමාගමේ ආයෝජනයට විතරක් ඉඩ දීලා, අනෙක් සියල්ලම හරවලා යැව්වා. එහෙම තමයි ඔබතුමන්ලා ආයෝජන කලාප, වරාය විකිණුවේ. හැබැයි, අපි එහෙම කරන්නේ නැහැ. ඒ වාගේම, මේ අලුතින් හදන කලාපය තුළත් ඔබතුමා කිව්වා වාගේ අක්කර 200ක් පමණයි අපි pharmaceuticalsවලට තියන්නේ. ඒ අක්කර 200 විතරයි pharmaceuticals සඳහා තිබෙන්නේ. හැබැයි, ඒවායේදීත් ඔබතුමා කියන විධියට කාටවත් අනිසි ප්‍රතිලාභ ලැබෙන්න සලස්වන්නේ නැහැ. මොකද, ඔබතුමාත් නියෝජ්‍ය අමාත්‍යවරයා හැටියට හිටපු නිසා මේ ගැන දන්නවා. BOI එකට ඉදිරිපත් කළාම ඒකේ කලාප දෙකක් තිබෙනවා. එකක අටසියයක් තිබෙනවා. අනෙක් ආයෝජන ආවොත්, ඒක pharmaceutical zone එකට යනවාද, නැත්නම් අනෙක් zone එකට යනවාද කියලා තීරණය කරන්නේ BOI එකෙන්. BOI එක ඇතුළේ ඒවා බලන්න නිලධාරීන් ඉන්නවා. ඒවා බලලා නිසි ආකාරයෙන්, සුදුසු අය ආවොත් විතරයි අපි ඒවා ලබා දෙන්නේ. හැබැයි, අපි පැහැදිලිව කියනවා, වෙනදා බෙහෙත් ටික ගෙනෙන්න පිට රටට සල්ලි ටික ගියා, ඩොලර් ටික ගියා. අපි දන්නවා, ලංකාව තුළ 1948න් පසුවම කලාප 14යි හදලා තිබුණේ. හැබැයි, මේ අවුරුදු දෙක තුළ විතරක් අපි කලාප පහක් ආරම්භ කරලා තිබෙනවා. ඒකත් මේ වෙද්දී EIA එක කරලා ඉවර කරලා, වැඩ කටයුතු ආරම්භ කරලා, කලාප තුනකට සූදානම් වෙලාත් ඉවරයි. ඉතුරු කලාප දෙකේත් වැඩ ඉවර කරලා, පුළුවන් තරම් ලංකාවට ආයෝජන ගෙනැල්ලා, ආනයනය කරනවා වෙනුවට අපනයනය කරන්න පුළුවන් වෙළෙඳ පොළක් හදන්න අපි බලාපොරොත්තු වෙනවා.

## රාජ්‍ය ආයතන භාවිතයෙන් ඉවත් කරන ලද වාහන: විස්තර

பாவனையிலிருந்து அகற்றப்பட்ட அரச நிறுவன வாகனங்கள்: விபரம்

VEHICLES WITHDRAWN FROM USE BY STATE INSTITUTIONS: DETAILS

273/2020

**36.ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)

අග්‍රාමාත්‍ය සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) රාජ්‍ය ආයතනවල භාවිතයෙන් පසු ඉවත් කරන ලද වාහන විශාල ප්‍රමාණයක් පවතින බවත්;

(ii) මෙම වාහන දිරාපත් වෙමින් පවතින බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) රාජ්‍ය ආයතනවල භාවිතයෙන් පසු ඉවත් කරන ලද වාහනවල වර්තමාන වටිනාකම කොපමණද;

(ii) එම වාහන පිළිබඳව සංගණනයක් සිදු කර තිබේද;

(iii) එසේ නම්, එම සංගණනය සිදු කරන ලද දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ඇ) (i) රාජ්‍ය ආයතනවල භාවිතයෙන් පසු ඉවත් කරනු ලබන වාහන බැහැර කිරීම සඳහා විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රියාමාර්ගය කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் பொருளாதாரக் கொள்கைகள் மற்றும் திட்டச் செயற்படுத்துகை அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) அரச நிறுவனங்களில் பாவனையின் பின்னர் அகற்றப்பட்டுள்ள வாகனங்கள் பெருமளவில் காணப்படுகின்றன என்பதையும்;

(ii) அவை துருப்பிடித்து வருகின்றன என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) அரச நிறுவனங்களிலிருந்து பாவனையின் பின்னர் அகற்றப்பட்டுள்ள வாகனங்களின் இன்றைய பெறுமதி எவ்வளவென்பதையும்;

(ii) அவ்வாகனங்கள் தொடர்பில் தொகைக் கணிப் பீடு மேற்கொள்ளப்பட்டுள்ளதா என்பதையும்;

(iii) ஆமெனில், அக்கணிப்பீடு மேற்கொள்ளப்பட்ட திகதி யாதென்பதையும்;

அவர் இச்சபையில் குறிப்பிடுவாரா?

(இ) (i) அரச நிறுவனங்களிலிருந்து பாவனையின் பின்னர் அகற்றப்படும் வாகனங்களை அப்புறப் படுத்துவதற்கான முறையான நடவடிக்கைகள் எடுக்கப்பட்டுள்ளனவா என்ப தையும்;

(ii) ஆமெனில், அந்நடவடிக்கைகள் யாவையென்ப தையும்;

அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

[ගරු බුද්ධික පතිරණ මහතා]

asked the Prime Minister and Minister of Economic Policies and Plan Implementation:

(a) Is he aware that -
(i) there is a large number of vehicles in State institutions which have been removed from use; and
(ii) the said vehicles are decaying?

(b) Will he inform this House -
(i) the present value of the vehicles in State institutions which have been removed from use;
(ii) whether a survey has been conducted on the aforesaid vehicles; and
(iii) if so, the date on which the survey was conducted?

(c) Will he also inform this House -
(i) whether a proper mechanism is in place for the disposal of vehicles in State institutions which have been removed from use; and
(ii) if so, what the said mechanism is?

(d) If not, why?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අග්‍රාමාත්‍ය සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඔව්. රාජ්‍ය ආයතනවල භාවිතයෙන් පසු ඉවත් කරන ලද වාහන විශාල ප්‍රමාණයක් පවතී.
(ii) ඔව්. ඇතැම් වාහන දිරාපත් වෙමින් පවතී.

(ආ) (i) ධාවන තත්ත්වයේ නොමැති අපහරණය සඳහා හඳුනා ගනු ලබන වාහන අපහරණය කිරීමේ ක්‍රියාවලියේදී අදාළ ආයතන විසින් එවැනි වාහනවල වටිනාකම තක්සේරු කරනු ලැබේ.
(ii) ඔව්. එම වාහන පිළිබඳව සංගණනයක් සිදු කර තිබේ.
(iii) 2020 අගෝස්තු මස 31 වන දින එම වාහන පිළිබඳව සංගණනයක් සිදු කර ඇත.

(ඇ) (i) ඔව්.
(ii) 2020 අගෝස්තු මස 31 වන දිනට ධාවන තත්ත්වයේ නොපැවති රාජ්‍ය ආයතන සතු වාහන සංඛ්‍යාව පිළිබඳව 2020 අගෝස්තු මස 31 දිනැති අමාත්‍ය මණ්ඩල සන්දේශය ඉදිරිපත් කර, ඒ අනුව අලුත්වැඩියා කර භාවිත කිරීම ඵලදායී වන වාහන ලෙස හඳුනා ගනු ලබන වාහන අලුත්වැඩියා කරන ලෙසට හා අපහරණය කළ යුතු වාහන අපහරණය කිරීමට අවශ්‍ය උපදෙස් හා මාර්ගෝපදේශ රජයේ සියලු ආයතන ප්‍රධානීන් වෙත 2020 ඔක්තෝබර් මස 02 දිනැති චක්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 05/2020 මඟින් නිකුත් කර ඇත. ඒ අනුව ධාවන තත්ත්වයේ නොමැති වාහන අලුත්වැඩියා කිරීම හෝ අපහරණය කිරීම අදාළ රාජ්‍ය ආයතන විසින් සිදු කරනු ලැබේ.

(ඈ) පැන නොනඟී.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු ඇමතිතුමා කැබිනට් ඇමතිවරයකු විධියට කටයුතු කළ නිසා එතුමාට මේ අත්දැකීම ඇති. මේ ප්‍රශ්නය අද ඊයේ සිට තිබෙන ප්‍රශ්නයක් නොවෙයි. මම හිතන්නේ නිදහසින් පස්සේ හැම ආණ්ඩුවක්ම මේ කාරණයට අඩු වැඩි වශයෙන් වග කියන්න ඕනෑ. මුදල් අමාත්‍යාංශයේ වාහන සංචිතය අපි බැලුවොත්, එතැන සිය දහස් ගණනක වාහන තිබෙනවා. අනෙකුත් අමාත්‍යාංශවලත් එහෙමයි. හැම රජයක්ම මේ කාරණයට අවධානය යොමු කළේ නැහැ. ඒ වාගේම දුම්රිය අංගණ -දුම්රිය මැදිරි- දිරමින් පවතිනවා. අඩුම ගණනේ මාස හයකට වතාවක් හෝ අවුරුද්දකට වතාවක් අලුත්වැඩියා කළ හැකි වාහන අලුත්වැඩියා කරන්න ඕනෑ. පළාත් සභාවල, පළාත් පාලන ආයතනවල තත්ත්වයත් එලෙසමයි. ප්‍රයෝජනයට ගන්න බැරි වාහන එක තැනකට රැස් කරලා, මාස හයකට වතාවක්වත් auction එකක් දමන්න පුළුවන් නම් වියදම් අඩු වනවා. අද වාහනයක් auction එකේදී විකිණෙන ගණනට වඩා, අවුරුදු ගණනාවක් ගතවෙලා, එම වාහන දිරුවාට පස්සේ තුට්ටු දෙකට තමයි විකුණන්න වෙන්නේ. සමහර විට ඒ වාහනවලින් කාටවත් ප්‍රයෝජනයක් ගන්නත් බැරි වනවා.

ගිලන් රථ සම්බන්ධ කාරණයත් ඒ වාගේමයි. සමහර මාධ්‍ය ආයතන මැදිහත්වෙලා, එවැනි ගිලන් රථ ප්‍රතිසංස්කරණය කරලා, කොරෝනා වසංගතය වෙනුවෙන් ප්‍රයෝජනයට ගැනීමට ලබා දෙනවා මම දැක්කා. දෙරණ මාධ්‍ය ජාලය "මනුසත් දෙරණ" වැඩසටහන යටතේ එවැනි ගිලන් රථ ලබා දුන්නා. ඒ වාගේම පෞද්ගලික අංශය කැමති නම් මැදිහත්වෙලා -දායකත්වය ලබා දීලා- මේ වාහන මිලදී ගන්න පුළුවන්. Kantale Sugar Factory එක වාගේ තැන්වලත් මේ වාගේ වාහන තිබෙනවා.

මේ වාහන ජාතිය සතු මහා සම්පත්; ජනතාවගේ බදු මුදල්, එහෙම නැත්නම් ලෝකයෙන් ගත් ණය ආධාර. මේ වාහන පිළිබඳව සංගණනයක් කරලා තිබෙනවා කියලා ඔබතුමා සඳහන් කළා. හැබැයි, මේ සංගණනයත් එක්ක ආපසු මාස ගණනාවක් ගත වෙන්නේ නැති වන විධියට ක්‍රියාකාරී සැලැස්මක් - Action Plan එකක් - හදලා, මේ කටයුත්ත කඩිනම් කරන්න රජයට තිබෙන road map එක මොකක්ද?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු බුද්ධික පතිරණ තරුණ මන්ත්‍රීතුමා මේ කාරණය පිළිබඳව ප්‍රශ්නයක් ඇසීම ගැන මම එතුමාට ස්තුතිවන්ත වනවා. අපේ අතිගරු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා මේ ගැටලුව දැක්කා. ඒ නිසා එතුමා බලයට ආපු විගස මේ නියෝගය ලබා දුන්නා. තිබුණු වාහන ගොඩක් අඩු කරලා, ඒ වාහන බෙදා හැරලා, නාස්තිය හා දූෂණය අවම කරන්න කැප වුණු නායකයෙක් තමයි අතිගරු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා.

ඊළඟට, ඔබතුමා කිව්ව විධියට අපි වාහන ගණනාවක් අලුත්වැඩියා කරලා තිබෙනවා. අපේ අමාත්‍යාංශයේත් එහෙමයි. රුපියල් කෝටි ගණනක් වටිනා වාහන අලුත්වැඩියා කළා. ඒ විතරක් නොවෙයි. ඩිපෝවල බස්, ගිලන් රථ අලුත්වැඩියා කරන වෙනම ස්ථානයක් හදලා, ඒ කටයුත්ත සොයා බලන්න රාජ්‍ය ඇමතිවරයෙකුට භාර දුන්නා. ඒ අමාත්‍යාංශවලටත් නියෝග කළා, වහාම මේ වාහන හදන්න, හදන්න බැරි වාහන වෙන්දේසි කරන්න කියලා.

ඒක ඉතාම හොඳ දෙයක් විධියට අපි කවුරුත් දකිනවා. 2015ට කලින් අවස්ථා ගණනාවකදී මේ කටයුත්ත කළා. ගරු

මන්ත්‍රීතුමනි, හැබැයි පසුගිය කාලයේ මේක සිද්ධ වුණේ නැහැ. ඇත්තටම ඔබතුමාට ඒ කාලයේ හොඳ ඇමතිකමක් දීලා මේවා ඔක්කෝම බාර දුන්නා නම් හොඳයි. මොකද, ඔබතුමා දක්ෂයා. ඔබතුමා දක්ෂයා හින්දා තමයි දුන්නේ නැත්තේ. ඔබතුමා මාතර දිස්ත්‍රික්කයේ මනාපවලින් පළමු තැනට ඇවිල්ලාත් ඒ අවස්ථාව දුන්නේ නැහැ නේද බුද්ධික පතිරණ මන්ත්‍රීතුමනි? මාතර දිස්ත්‍රික්කයේ මනාපවලින් පළමු තැනට ඇවිල්ලාත් දුන්නේ නැහැ. ඔබතුමා වාගේ දක්ෂ මන්ත්‍රීවරුන්ට හොඳ ඇමතිකම් දුන්නා නම් ඔබතුමන්ලාගේ ආණ්ඩුව ඒ තරම් ඉක්මනට වැටෙන්නේ නැහැ.

ඔබතුමා කියපු දේවල් ගැන අපි සතුටු වෙනවා. අපි මේ වැඩ පිළිවෙළට අත ගහලා ඉක්මනින්ම මේ කටයුතු කරනවා. ඔබතුමාත් කියනවා වාගේ මේක අපරාධයක්. ඉවත් කර තිබෙන ඇතැම් වාහනවල ගස් පවා පැළවෙලා තිබෙනවා. මේ සම්බන්ධයෙන් මුදල් අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාත් ගිය සතියට කලින් සතියේ අප කැඳවලා නියෝග කෙරුවා, ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මේ දේවල් කරන්නේ නැත්නම් වහාම වාර්තා කරන්න කියලා. ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමනි, මම විශ්වාස කරනවා අපට ඉදිරි මාස 6 ඇතුළතදී මේ දේවල් විසඳන්න පුළුවන් වෙයි කියලා. ඔබතුමා ඇසුවේ හොඳ ප්‍රශ්නයක්. ඔබතුමාට අපි ස්තුතිවන්ත වෙනවා මෙවැනි ප්‍රශ්නයක් අහපු එක ගැන.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)

ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ අවධානයට යොමු කරවන මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. රජයේ රියැදුරු සංචිතය තුළ රියැදුරු මහත්වරු සෑහෙන ප්‍රමාණයක් ඉන්නවා. ඒ අය ඵලදායීව යොදවන ගමන් රජයේ හැම ආයතනයකටම වාහන මිලදී ගැනීමට වඩා, බදු ක්‍රමයට වාහන ලබා ගන්නා වැඩ පිළිවෙළක් සකස් කරනවා නම් හොඳයි. එතකොට ලයිසන්, ඉන්ෂුවරන්ස්වලට, යන මුදල් පිළිබඳ ප්‍රශ්න, තෙල් හොරාට ගැහුවා කියන, කැලි පැන්නුවා කියන ප්‍රශ්න අඩු වෙනවා. බදු ක්‍රමයට වාහන ගත්තාම හයර් එක තමයි ගෙවන්න තිබෙන්නේ. මේ රටේ ගොඩක් පෞද්ගලික ආයතන අනුගමනය කරන්නේ කිලෝමීටර් ගණනට ගෙවන වාහන ගන්න ක්‍රමවේදයයි. ඒ ක්‍රමවේදයම අපටත් පාවිච්චි කරන්න පුළුවන්. ඔබතුමා සතොස භාරව හිටපු ඇමතිවරයෙක්. සතොස ආයතනයේ දැන් ඇතිවෙලා තිබෙන ඛේදනීය තත්ත්වය ගැන ඔබතුමා දන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට විනාඩි කීපයකට කලින් මට හම්බවුණා සුදු ලූනු විකිණීම පිළිබඳ සිදු කර ඇති අභ්‍යන්තර විගණන වාර්තාව. මා මේ වාර්තාව **සභාගත*** කරනවා. ගරු ඇමතිතුමනි, එහි පිටපතක් මම ඔබතුමාටත් එවන්නම්.

මේ හැම දෙයකින්ම පෙනෙන්නේ අපේ මහජන මුදල් අපහරණය නේ. ඔබතුමා කියන විධියට පසුගිය කාලයේත් මෙවැනි දේ වෙන්න ඇති; දැනුත් මෙවැනි දේවල් සිද්ධ වෙන තැන් තිබෙනවා. හෙටත් මෙවැනි දේවල් වෙන්න පුළුවන්. මේවා සමහර තැන්වල පුද්ගලානුබද්ධයි. ඒ නිසා මේ කාරණා පිළිබඳවත් විශේෂයෙන්ම අවධානය යොමු කරන අතරේ, කිලෝමීටර් ගණනට ගෙවන ක්‍රමයට වාහන ලබා ගන්නා ක්‍රමවේදයකට යන එක වාසිදායකද කියලා ඒ වාගේම ගැඹුරු සමීක්ෂණයක් කරලා බැලුවොත් හොඳයි. එතකොට අපේ සංචිතවල ඉන්න රියැදුරු මහත්වරුත් යම් ප්‍රයෝජනයකට ගන්නා ගමන් මහජන මුදල් උපරිම ක්ෂමතාවකින් යුතුව පාවිච්චි කරන්න පුළුවන්. එවැනි ගැඹුරු සමීක්ෂණයක් කරන්න රජයේ අවධානය යොමු කරන්න පුළුවන් ද?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියපු විධියට සමහර තැන්වල රියැදුරන් වැඩියි; සමහර තැන්වල රියැදුරන් අඩුයි. අපේ පළාත් සභාවේ සෞඛ්‍ය අංශය ගත්තාම රියැදුරන් ගණනාවක් අඩුයි. Ambulancesවලටත් රියැදුරන් නැහැ. සමහර වෙලාවට නීත්‍යනුකූල නොවන විධියට පහළ මට්ටමේ ඉන්න අයටත් අපි ඒ රියැදුරු රාජකාරි බාර දීලා තිබෙනවා. කොවිඩ් කාලයේ රියැදුරන් අඩු නිසා කරගන්න දෙයක් නැති නිසා එහෙම කරලා තිබෙනවා. එවැනි ප්‍රශ්නත් තිබෙනවා.

ඊළඟට, ඔබතුමා කියපු ලීසිං, නැත්නම් බදු ක්‍රමයට වාහන පාවිච්චියට ගන්න එක ලාභදායකයි කියලා මමත් ව්‍යාපාරිකයකු හැටියට දකිනවා. සතොස වැනි අත්‍යවශ්‍ය සේවා තිබෙන තැන්වලට ඒ ක්‍රමවේදය වැදගත්. අපි 2010දී සතොස ආයතනය බාර ගන්නකොට ඒ ආයතනය සතු ලොරි ඔක්කෝම තිබුණේ කොට උඩ. ලක්ෂ 49,000ක් ණය වෙලා, වාහනවලට නඩු දාලා, වාහන හොල්ලන්න නොදී උසාවි තීන්දු අරගෙන තිබුණු වෙලාවක අපි ඒ ආයතනයට ලොරි සියයක් ගත්තා. ඒ ලොරි ගත්තේ සතොස ආයතනයේ අත්‍යවශ්‍ය භාණ්ඩ ප්‍රවාහනය කරන්නයි. ඒ විතරක් නොවෙයි, lease එකට වාහන අරගෙන, arrears නැතිව වෙලාවට ගෙවපු ලංකාවේ ආයතන අතර සතොස ආයතනය පළමු ස්ථානයේ සිටින බවට සහතිකයක් හම්බ වුණා. හැබැයි කියන්න කනගාටුයි ගරු මන්ත්‍රීතුමා, ඔබතුමන්ලාගේ හිටපු ඇමතිතුමා කරපු දේවල් ගැන. ඔබතුමා එවැනි දේවල් කෙරුවේ නැහැ. ඔබතුමා ඒ වාගේ තුට්ටු දෙකේ වැඩ කරන මන්ත්‍රීවරයෙක් නොවෙයි. හැබැයි, හිටපු ඇමතිවරයා මාසයකට රුපියල් කෝටි ගණනක් පෞද්ගලික සමාගමකට ලැබෙන විධියට කටයුතු කරලා ඒ ආයතනය සතු ලොරි ටික ඔක්කෝම අයින් කළා. ඒ ලොරි ටික ආපහු re-lease කරලා ඒ සල්ලිත් අරගත්තා. ඒ සල්ලිවලට වෙච්ච දෙයක් නැහැ. ගරු මන්ත්‍රීතුමනි, ඒ දේවල් සම්පූර්ණයෙන්ම පෞද්ගලික සමාගමකට දීලා තිබුණා. මම දන්නේ නැහැ දැනටත් එහෙම ක්‍රියාත්මක වෙනවා ද කියලා. මම ඒ ගැන දන්නේ නැහැ. මේ වාගේ ප්‍රශ්න තිබෙනවා.

සුදු ලූනු ප්‍රශ්නය ගැන ඔබතුමා කිව්වා. සුදු ලූනු ප්‍රශ්නය ගැනත් ගරු ඇමතිතුමාම පැමිණිල්ලක් දාලා ඒ පිළිබඳව හොයනවා. අපේ රජය මේ කිසි දෙයක් හංගන්නේ නැහැ. ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා පැහැදිලිව කිව්වා, දූෂණයෙන් තොරව මේ රට පාලනය කරන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා, නාස්තියෙන් තොර පාලනයක් මේ රටේ ක්‍රියාත්මක කරනවා කියලා. එතුමා ආදර්ශයක් වුණා, එතුමාගේ ජනාධිපති කාර්යාලයේ තිබිච්ච වාහන ටික ඔක්කෝම බෙදා හැරලා, නාස්තිය අවම කරගෙන ක්‍රියා කිරීම හරහා. අපට හම්බ වුණේ ආර්ථික වශයෙන් බින්දුවට වැටිච්ච ආණ්ඩුවක්. අපි තරග කෙරුවේ අන්තිම තැනට නොඑන්න ඇෆ්ගනිස්ථානයත් එක්ක. හැබැයි, මාස දෙක යද්දී කොවිඩ් වසංගතයටත් අපි මුහුණ දෙමින්, ආර්ථිකය වැටෙන්න ඉඩ නොදී නාස්තිය සහ දූෂණය අවම කරපු නිසා තමයි අපට මේ විධියට රට පාලනය කරන්න පුළුවන් වෙලා තිබෙන්නේ. ඒක ඔබතුමන්ලාත් පිළිගන්නවා; අපිත් පිළිගන්නවා. ඔබතුමන්ලාගේ පක්ෂයේ සියලුදෙනාම නම් පිළිගන්නේ නැති වෙයි. සමහර අය කොවිඩ් වසංගතය එක්ක දේශපාලනයත් කරන්න හදනවා. අපි ඔබතුමා කියපු යෝජනා ගැනත් සලකා බලනවා. මේ රටේ වියදම් අඩු කරන්න ගන්න පුළුවන් උපරිම තීන්දු තීරණ ටික අපේ ජනාධිපතිතුමාගේ උපදෙස් අනුව අපි ගන්නවාය කියන එක මම මේ වෙලාවේදී පැහැදිලිව ප්‍රකාශ කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ප්‍රශ්න අංක 37 -300/2020- (2), ගරු එස්.එම්. මරික්කාර් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

## ජාතික, පළාත් සහ ග්‍රාමීය මාර්ග: කුරුණෑගල දිස්ත්‍රික්කය
### தேசிய, மாகாண மற்றும் கிராமிய வீதிகள்: குருணாகல் மாவட்டம்
### NATIONAL HIGHWAYS, PROVINCIAL AND RURAL ROADS: KURUNEGALA DISTRICT

553/2020

**38.ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ පිහිටා ඇති ජාතික මාර්ග, පළාත් මාර්ග සහ ග්‍රාමීය මාර්ගවල දුර ප්‍රමාණය එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) එම මාර්ග අතරින්-

(i) කාපට් අතුරා ඇති මාර්ගවල දුර ප්‍රමාණය;

(ii) තාර දමා ඇති මාර්ගවල දුර ප්‍රමාණය;

(iii) තාර දමා හෝ කාපට් අතුරා නොමැති මාර්ගවල දුර ප්‍රමාණය;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) (i) ඉහත (අ)හි සඳහන් ග්‍රාමීය මාර්ග ප්‍රමාණය එක් එක් පළාත් පාලන ආයතනය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ග්‍රාමීය මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ගනු ලබන ක්‍රියා මාර්ග කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) குருணாகல் மாவட்டத்தில் அமைந்துள்ள தேசிய வீதிகள், மாகாண வீதிகள் மற்றும் கிராமிய வீதிகளின் நீளம் பிரதேச செயலகப் பிரிவுகளின் அடிப்படையில் தனித்தனியாக எவ்வளவென்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) மேற்படி வீதிகளில் -

(i) 'காபட்' இடப்பட்ட வீதிகளின் நீளம்;

(ii) தார் இடப்பட்ட வீதிகளின் நீளம்;

(iii) 'காபட்' அல்லது தார் இடப்படாத வீதிகளின் நீளம்;

எவ்வளவு என்பதையும் தனித்தனியாக அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) மேற்படி (அ)இல் குறிப்பிட்ட கிராமிய வீதிகளின் நீளம் தனித்தனியாக உள்ளூராட்சி மன்றங்களின் அடிப்படையில் எவ்வளவு என்பதையும்;

(ii) மேற்படி கிராமிய வீதிகளைப் புனரமைப்பதற்கு மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவையென்பதையும்;

அவர் மேலும் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Highways:

(a) Will he inform this House, separately, of the total extent of national highways, provincial roads and rural roads located in Kurunegala District on Divisional Secretaries' Divisions basis?

(b) Will he also inform this House separately, out of the aforesaid extents of roads -

(i) the extent of roads that have been carpeted;

(ii) the extent of roads that have been tarred; and

(iii) the extent of roads that have neither been tarred nor carpeted?

(c) Will he further inform this House -

(i) separately, the breakdown of the aforesaid extent of rural roads in (a) above, on Local Government Institutions basis; and

(ii) the measures that will be taken to rehabilitate these rural roads?

(d) If not, why?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) විස්තර ඇමුණුමෙහි දක්වා ඇත. ඇමුණුම **සභාගත*** කරමි.

එය දීර්ඝ විස්තරයක් සහිත ඇමුණුමක්. ගරු මන්ත්‍රීතුමනි, මා එහි පිටපතක් ඔබතුමාටත් එවන්නම්.

(ආ) (i) කිලෝමීටර 1,571.23යි.

(ii) කිලෝමීටර 1,935.92යි.

(iii) කිලෝමීටර 7,740.26යි.

(ඇ) (i)

| | |
|---|---|
| පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව | - මාර්ග 235 |
| බිංගිරිය ප්‍රාදේශීය සභාව | - මාර්ග 735 |
| උඩුබද්දාව ප්‍රාදේශීය සභාව | - මාර්ග 968 |
| නාරම්මල ප්‍රාදේශීය සභාව | - මාර්ග 757 |
| අලව්ව ප්‍රාදේශීය සභාව | - මාර්ග 1,000 |
| කුලියාපිටිය ප්‍රාදේශීය සභාව | - මාර්ග 141 |
| පන්නල ප්‍රාදේශීය සභාව | - මාර්ග 622 |
| ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව | - මාර්ග 29 |
| රිදීගම ප්‍රාදේශීය සභාව | - මාර්ග 23 |
| මාවතගම ප්‍රාදේශීය සභාව | - මාර්ග 21 |
| කුරුණෑගල ප්‍රාදේශීය සභාව | - මාර්ග 05 |
| කුරුණෑගල නගර සභාව | - මාර්ග 69 |
| වාරියපොළ ප්‍රාදේශීය සභාව | - මාර්ග 926 |
| පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව | - මාර්ග 528 |

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

| | |
|---|---|
| නිකවැරටිය ප්‍රාදේශීය සභාව | - මාර්ග 455 |
| ගල්ගමුව ප්‍රාදේශීය සභාව | - මාර්ග 550 |
| ගිරිබාව ප්‍රාදේශීය සභාව | - මාර්ග 210 |
| කොබෙයිගනේ ප්‍රාදේශීය සභාව | - මාර්ග 360 |
| මහව ප්‍රාදේශීය සභාව | - මාර්ග 417 |
| පොල්පිතිගම ප්‍රාදේශීය සභාව | - මාර්ග 1,309 |

(ii) දැනට ක්‍රියාත්මක වන කිලෝමීටර 100,000 මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය යටතේ එම මාර්ග සංවර්ධනය කිරීමට කටයුතු යොදා ඇත.

(ඈ) පැන නොනඟී.

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)

ගරු ඇමතිතුමනි, මම මුලින්ම කියන්න කැමැතියි, කුරුණෑගල දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙකු වන ඔබතුමා මහාමාර්ග ඇමතිවරයා වශයෙන් පත්වීම පිළිබඳව මා සන්තෝෂ වන බව. ඒ, අපේ දිස්ත්‍රික්කයේ මාර්ග ටිකට අදාළ වැඩ දැන් ශීඝ්‍රයෙන් කරගෙන යන නිසායි. ගරු ඇමතිතුමනි, මහ බැංකු වාර්තාව අනුව අපේ රටේ මාර්ග පද්ධතියෙහි දුර ප්‍රමාණය කිලෝමීටර 118,000ක් පමණ වනවා. ඒ අතරින් කිලෝමීටර 271ක් අධිවේගී මාර්ග. ජාතික මාර්ග පද්ධතියේ මාර්ග කිලෝමීටර 12,224ක් තිබෙනවා. පළාත් සභා මාර්ග කිලෝමීටර 18,800කුත්, ග්‍රාමීය මාර්ග කිලෝමීටර 88,000කුත් තිබෙනවා. මා හිතනවා, ඔබතුමා ලබා දුන් පිළිතුරට අදාළව සභාගත කළ ඇමුණුමෙහි ඒ විස්තර තිබෙනවා ඇති කියලා.

මා දන්නා විධියට දැන් වන විට ජාතික මාර්ග පද්ධතියේ සියයට 90ක් විතර කාපට් කර තිබෙනවා. පළාත් මාර්ගත් සියයට 60ක්, 70ක් කාපට් කර තිබෙනවා. ඒ වාගේම, ග්‍රාමීය මාර්ගත් සාමාන්‍යයෙන් සියයට 20ක් විතර කාපට් කර තිබෙනවා. ඔබතුමන්ලාගේ මාර්ග කිලෝමීටර ලක්ෂයේ වැඩසටහන යටතේ, කාපට් කරන්න මාර්ග කිලෝමීටර ලක්ෂයක්ම නැහැ කියලායි මා හිතන්නේ. දැන් ඒ ප්‍රමාණය අඩු වෙලා තිබෙනවා. පසු ගිය රජයත් මාර්ග කාපට් කළා; මේ රජයත් ඒ කටයුත්ත කරනවා. මේ වැඩසටහනේදී ප්‍රමුඛතාව ලබා දෙන්නේ කොහොමද ගරු ඇමතිතුමනි? මේ මාර්ග කාපට් කිරීම සඳහා ප්‍රමුඛතාව ලබා දෙන ක්‍රමවේදය කුමක්ද කියන ප්‍රශ්නය මා ඔබතුමාගෙන් අහන්න කැමැතියි.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ප්‍රමුඛතාව දෙන්නේ මෙහෙමයි, ගරු මන්ත්‍රීතුමනි. කෘෂිකර්මාන්තයට නැඹුරු වෙච්ච ප්‍රදේශවල ගොවි ජනතාවගේ නිෂ්පාදන ඉක්මනින් වෙළෙඳ පොළට ගෙන යන්න පුළුවන් මාර්ග ටික වහාම සංවර්ධනය කරන්න කියලා අතිගරු ජනාධිපතිතුමා උපදෙස් දීලා තිබෙනවා. ප්‍රමුඛතාව අතින් පළමු වැන්න එයයි. ඊළඟ ප්‍රමුඛතාව ලබා දෙන්නේ පාසැල්වලට යන මාර්ගවලට. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් දන්නා පරිදි අපේ පළාතේ නිකවැරටිය, යාපහුව, ගල්ගමුව, බිංගිරිය, පඩුවස්නුවර ආදී ප්‍රදේශවල - කුරුණෑගල පාරවල් නම් හුඟක් දුරට හැදිලා තිබෙන්නේ.- සමහර පාසල්වල දරුවන් uniforms දෙකක් අරගෙනයි පාසලට යන්නේ. බොරළු දූවිල්ල වදින නිසා පාසල ගාවට ඇවිත් ඇඳුම් මාරු කරගෙන තමයි ඒ දරුවන් පාසැල ඇතුළට යන්නේ. ඉක්මනින් පාසැල්වලට යන්න, ඉක්මනින් රෝහල්වලට යන්න පුළුවන් ආකාරයට සංවර්ධනය කරන්න ඒ මාර්ග පද්ධතිවලට අපි ප්‍රමුඛතාව දීලා තිබෙනවා.

ඊළඟ ප්‍රමුඛතාව, මහජන නියෝජිතයන්ගේ ප්‍රදේශවල මාර්ගවලටයි. ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේගේ පැත්තේ බොහෝ අයත් ඉල්ලීම් කර තිබෙනවා. ඒ හැම පාරක්ම "නැහැ බැහැ" නොකියා හදන්න අවශ්‍ය පහසුකම් පක්ෂ භේදයකින් තොරව -ඔබතුමන්ලාගේ මන්ත්‍රීතුමන්ලාට පවා- මා ලබා දී තිබෙනවා. මේ වැඩ පිළිවෙළ අගය කරලා World Bank එකෙන් ඩොලර් බිලියන භාගයක් අපට දීලා තිබෙනවා. එම ගිවිසුම්වලට ඉදිරි සතියේ අපි අත්සන් කරනවා. මාර්ග කිලෝමීටර 118,000ක් කියලා කිව්වාට register වුණේ නැති පාරවල් ගණනාවක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අතිගරු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයේ සඳහන් පොරොන්දුවක් තමයි, මේ රටේ මාර්ග කිලෝමීටර 100,000ක් හදනවා කියන එක. නමුත්, මා දැක්කා සමහර අය කියපු කථා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා නම් එහෙම කියලා නැහැ. ඔබතුමා ව්‍යාපාරිකයෙක්. ඔබතුමා, ඒ වාගේ පටු විධියට බලන දේශපාලනඥයෙක් නොවෙයි. සමහර අය -ඔබතුමන්ලාගේ පක්ෂයේ සමහර අය, වෙනත් පක්ෂවල සිටින සමහර අය- කියා තිබෙනවා, "මෙච්චර කිලෝමීටර ගණනක් නැහැ, මෙච්චර කිලෝමීටර ගණනක් කියලා දූෂණයක් කරන්නයි හදන්නේ" කියලා. එහෙම නැහැ. මා කලිනුත් කිව්වා වාගේ අපේ බලාපොරොත්තුව, මේ රටේ යටිතල පහසුකම් දියුණු කිරීමයි.

එහිදී කෘෂිකාර්මික ප්‍රදේශවල පාරවල් ටික, ග්‍රාමීය පාරවල් ටික හදනවා. ඒ වාගේම, අධිවේගී මාර්ග නිර්මාණය වෙනවා. ඊළඟට iRoad Project එකෙන් මාර්ග හදනවා. මේ හැම එකකින්ම අපි බලාපොරොත්තු වන්නේ, දියුණු මාර්ග පද්ධතියක්. මුළු රටේම රුධිර නාළය තමයි මහා මාර්ග පද්ධතිය.

එදා දක්ෂිණ අධිවේගී මාර්ගය හදද්දී මොනවාද කිව්වේ? ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා නම් එහෙම කිව්වේ නැහැ. ඔබතුමා පටු විධියට බලන්නේ නැහැ. විපක්ෂයේ ඉන්න මේ සමහර අය කිව්වා, දක්ෂිණ අධිවේගී මාර්ගය හදන්නේ රජ පවුලට ඇඹුල්තියල් ගෙනියන්නයි කියලා. "රජ පවුල" කියලා නේ දැන් කියන්නේ. ගරු කථානායකතුමාගෙනුත් සමහර අය අහනවා, "රජතුමාගේ නියෝගද?" කියලා. එහෙම තමයි මඩ ගැහුවේ. රජ පවුලට ඇඹුල්තියල් ගෙනියන්න දක්ෂිණ අධිවේගී මාර්ගය හදනවා කියපු අය ඒ පාරේම ගිහින් අපට බැණ බැණ ඡන්ද කෙරුවා.

පාරවල් හැදෙන්න ඕනෑ. ගරු අශෝක් අබේසිංහ මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලාගේ ආණ්ඩුව කාලයේත් කුරුණෑගල පාරවල් හැදුවා. ඔබතුමාත් හැදුවා, පාරවල් කිහිපයක්. ගරු ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමාත් පාරවල් හැදුවා. අපි ඒවා අගය කරනවා. ඔබතුමායි, මමයි -අපි- එකම දිස්ත්‍රික්කයේ නේ. හැබැයි, ඒවා කරන කොට "පාරවල් හදන එක හොඳ නැහැ" කියලා සමහර අය අකුල් හෙළනවා. සමහරු බොහොම ඊර්ෂ්‍යාවෙන්, වෛරයෙන්, ක්‍රෝධයෙන් ඒ දිහා බලාගෙන ඉන්නේ. අශෝක් අබේසිංහ මහත්මයා එහෙම බැලුවේ නැහැ. එතුමා නම් කිව්වා, "හොඳයි" කියලා. විපක්ෂයේ හුඟක් අය මට එහෙම කියලා තිබෙනවා. නමුත් සමහරු කියන්නේ, "පාරවල් හැදෙන්න හොඳ නැහැ" කියලා. ඒ අයට ඕනෑ, හදන පාරවල් කැඩෙන්න.

අපි ලංකාගම පාර හැදුවා. බලන්න, ඒ පැත්තේ ජනතාවට එමඟින් මොන තරම් සේවයක් වුණාද කියලා. ඒක හදන කොටත් මඩ ගැහුවා. "පරිසරයට හානි කරනවා. ගස් කපනවා" කිව්වා. අපේ හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා මේ ගරු සභාවේ දැන් නැහැ. මම එතුමාට කිව්වා, "මම වාහනය දෙන්නම්. යමු, එහේ ගිහිල්ලා බලමු" කියලා. එතුමා ආවේ නැහැ. දැන් ඒ පාර හදලා ඉවරයි. ඒ ජනතාවට ගාල්ලට එන්න පැය දෙකහමාරක් ගියා. මේ කොළඹ හතට, කටුනායක පාරට, නුවර පාරට සීමා වෙලා තිබ්බ්ච කාපට් පාරවල් ගම්වලටත් ගෙනිච්චේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ යුගයේ. ඒ නිසා තමයි අවුරුදු පහක් යන්න ඉස්සෙල්ලා ජනතාව තමුන්නාන්සේලා පරද්දලා නැවත එතුමාත්, එතුමාගේ සහෝදරයාත් බලයට ගෙනාවේ. පාරවල් හදන එක

[ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා]

හොඳ දෙයක්. ඒ හොඳ දේ "හොඳයි" කියලා ඔබතුමන්ලාත් පාරවල් කාපට් කරන්න පටන් ගත්තා. ඒක ඉතාම හොඳ දෙයක්. අපේ බලාපොරොත්තුව, ඉලක්කය මාර්ග සියල්ල සංවර්ධනය කිරීමයි. හුඟක් අය හිතුවා, "කොවිඩ් වසංගතය වැඩි වෙලා, ආර්ථිකය වැටිලා, ආණ්ඩුවට සල්ලි නැහැ, පඩි ගෙවා ගන්න වත් සල්ලි නැතුව මේ ආණ්ඩුව වැටෙයි" කියලා. හැබැයි, එහෙම වෙලා නැහැ. මාර්ග සංවර්ධන ව්‍යාපෘති අදටත් ක්‍රියාත්මක වෙනවා. පසු ගිය අවුරුදු පහේ කොන්ත්‍රාත්කාරයන් හුඟදෙනෙකු ආර්ථික වශයෙන් වැටිලා සිටියේ. ඔවුන්ගේ සමාගම් පවා දැන් ඉතාම උනන්දුවෙන් ආර්ථිකයට දැවැන්ත හයියක් දෙමින් සිටිනවා කියන එක මම මේ වෙලාවේදී කියනවා. හිටපු රාජ්‍ය ඇමති අපේ ගරු අශෝක් අබේසිංහ මැතිතුමනි, කුරුණෑගල දිස්ත්‍රික්කයේ පාරවල් ටික අපි කොහොම හරි හදමු. කුරුණෑගල ටවුමේ පාරවල් ඔක්කෝම වාගේ දැන් හදලා ඉවරයි. කුරුණෑගල නගරයේ තව පාරවල් දෙකතුනයි හදන්න තිබෙන්නේ. අපි ඒ ඔක්කොම පාරවල් හදා ගනිමු, ඒ පළාත දියුණු වෙන්න.

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
ගරු ඇමතිතුමාට බොහොම ස්තුතියි, ඒ පැහැදිලි කිරීම පිළිබඳව.

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, ජාතික මාර්ග පද්ධතිය මාර්ග සංවර්ධන අධිකාරියට අයිති වුණත් වැඩි මාර්ග ප්‍රමාණයක් අයිතිව තිබෙන්නේ පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට සහ පළාත් පාලන ආයතනවලට. මට දැනගන්න ලැබුණා, පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට මෙම මාර්ග හදන්න දෙන්නේ නැතිව මාර්ග සංවර්ධන අධිකාරිය හරහාම ඒ සෑම පාරක්ම හදනවා කියලා. එහෙම එකක් වෙනවාද? එහෙම නැතිව, පළාත් මාර්ග සංවර්ධන අධිකාරියටත්, ප්‍රාදේශීය සභා, නගර සභාවලටත් පාරවල් හදන්න දීලා තිබෙනවාද කියලා දැන ගන්න කැමැතියි.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ප්‍රාදේශීය සභාවලට, නගර සභාවලට නම් අපි ඒවා දෙන්නේ නැහැ. එහෙම දීලා වැරැද්දක් වුණොත් ලොකු චෝදනාවක් එන්නේ ආණ්ඩුවට විරුද්ධවයි කියලා ඔබතුමන්ලා දන්නවා. පාරවල් හදන්න වයඹ පළාත් සභාවට තවම දීලා නැහැ. මොකද, අපට වයඹ පළාතේ ප්‍රශ්නයක් ආවා. මේ වෙද්දී වෙනත් පළාත් සභා ගණනාවකට අපි ඒ අවස්ථාව දීලා ඉවරයි. වයඹ පළාත් සභාවේ දේශපාලන අධිකාරියෙන් අපට පැමිණිලි ආවා, හදන පාරවල් ඒ අයට නොකියා ඇස්තමේන්තු කරනවා කියලා. එම පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය සහ පළාත් සභාව අතර පැටලිල්ලක් තිබුණා. ඉදිරියේදී ඒවාටත් අවස්ථාව දෙන්න මම අනුමැතිය ලබා දීලා තිබෙනවා. හැබැයි, ප්‍රාදේශීය සභාවලට, නගර සභාවලට නම් ලොකු පාරවල් හදන්න දෙන්නේ නැහැ, හිටපු රාජ්‍ය ඇමතිතුමනි. ඔබතුමා දන්නවා, ඒ ආයතනවලට ඒ කටයුත්ත කරන්න දීලා පාරවල් කැඩෙන්න ගත්තොත් දේශපාලනය කරන අප සියලු දෙනාටම ඒක හොඳ නැති බව. අතිගරු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා කියන්නේ ප්‍රමිතියෙන් යුතු මාර්ග හදන්න කියලා. පෙරේදා අපට එක පාරක් ගැන වාර්තා වුණා, ඒ පාර චුට්ටක් ගැලවිලා තිබෙනවා කියලා. ඒ පාරට අදාළව මුදල් ගෙවන එක අපි වහාම තහනම් කළා.

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
ගරු ඇමතිතුමනි, මට ඔබතුමාගෙන් පැහැදිලි කරගැනීමක් අවශ්‍යයි. අධිවේගී මාර්ගයේ කඩවත-මීරිගම කොටසේ වැඩ කටයුතු කොයි කාලයේද අවසන් කරන්න බලාපොරොත්තු වන්නේ? මා හිතන විධියට අනෙක් එක නම් මේ අවුරුද්දේ විවෘත කරයි. ඔබතුමා නොවැම්බර් මාසයේ විවෘත කරනවා කිව්වා, කුරුණෑගල-මීරිගම කොටස. ඉතිරි ටික හදන්න කොච්චර කල් යයිද? අලුතින් ඉදිකරන කැලණි පාලම කොපමණ කාලයකින් විවෘත කරනවාද?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
මා හිතන විධියට කැලණි පාලමේ කටයුතු තව දවස් 30කින් විතර අවසන් කරන්න අපට පුළුවන් වෙයි. ඊළඟට, මීරිගම-කුරුණෑගල කොටස නොවැම්බර් වෙද්දී අවසන් කරන්න අපි ඉලක්ක කරගෙන තිබෙනවා. එහි ප්‍රශ්නයක් තිබුණා. ගරු මන්ත්‍රීතුමනි, ඒ පළාත නියෝජනය කරන මන්ත්‍රීවරයකු හැටියට, හිටපු රාජ්‍ය ඇමතිවරයකු හැටියට වාගේම හිටපු නියෝජ්‍ය ඇමතිවරයකු හැටියට ඔබතුමා ඒ ගැන දන්නවා. එහි කටයුතු අවුරුද්දකට වඩා පමා වුණා. ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ කැබිනට් මණ්ඩලයේ හිටපු ඇමතිවරයෙකුගේ සමාගමකටයි කොන්ත්‍රාත් එක දීලා තිබුණේ. මමත් එතුමා ගෙන්වා කිව්වා, "අපට දේශපාලන පළිගැනීම් කරන්න අවශ්‍ය නැහැ. පාර හදලා දෙන්න" කියලා.

ඒත් එතුමා හැදුවේ නැහැ. ගරු කිරිඇල්ල මන්ත්‍රීතුමාත් ඒක දන්නවා. එතුමාත් මට පෞද්ගලිකවම කිහිප වතාවක් ඒ පාර ගැන කථා කළා. මොකද, එතුමාටත් නුවරට යන්න බලපාන ප්‍රශ්නයක් මේක. ඉතින් අපි කැබිනට් එකට ගිහිල්ලා තහනම් කරලා, උසාවියටත් ගිහිල්ලා තහනම් නියෝගයක් අරගෙන කටයුතු කළා. අන්තිමට අනෙක් සමාගම් දෙක කෝටි ගණනක පාඩුවක් භාර අරගෙන උසාවියේ පිළිගෙන තිබෙනවා, නොවැම්බර් මාසයේ 15වෙනි දා වෙද්දී අපට පාර හදලා දෙන්න. ගරු මන්ත්‍රීතුමා, නොවැම්බර් මාසයේ අග වෙද්දී හෝ දෙසැම්බර් මාසයේ පළමු සතිය වෙද්දී ඒ පාර විවෘත කරන්න අපට පුළුවන් වෙයි.

ඔබතුමන්ලාගේ ආණ්ඩුව ඇවිල්ලා පළමුවෙනි මාස තුනේ දී කඩවත-මීරිගම දක්වා මාර්ග කොටස හදන්න කොන්ත්‍රාත් දුන්නා. තිබුණු කොන්ත්‍රාත් එක cancel කළා. ඒකෙන් කිලෝමීටරයක් හදන්න රුපියල් ලක්ෂ තිස්දාහකට විතර දීලා තිබුණේ. රුපියල් ලක්ෂ හතළිස්පන්දහසක වැඩි මුදලකට තමයි ඒ කොන්ත්‍රාත් ටික පළමුවෙනි මාස තුනේ දුන්නේ. ඒ කොන්ත්‍රාත් එක දීලා, කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කරලා ඒ මාර්ගයේ වැඩ පටන් ගන්න -අපේ ආණ්ඩුව එනතෙක්- තමුන්නාන්සේලාගේ ආණ්ඩුව මුදල් දුන්නේ නැහැ. [බාධා කිරීමක්] තමුන්නාන්සේ නොවෙයි ඒවා කළේ.

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
ඒක චීන ආයෝජනයක්ද? චීන ණයක්ද?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ඔව්, චීන ආයෝජනයන්. චීන ණයක්. තමුන්නාන්සේලාගේ රජය අවුරුදු හතරහමාරක් තිස්සේ මේ අධිවේගී මාර්ගය හැදුවේ නැහැ. කඩවත ඉඳලා මීරිගම කොටස හදන්නේ නැතිව මීරිගම සිට කුරුණෑගලට හදලා වැඩක් නැහැ.

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
Port City එකේ ප්‍රශ්නයක් තිබුණාද?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

නැහැ. නැහැ. Port City එකේ මොනවාවත් ප්‍රශ්නයක් නොවෙයි. මේක ඔබතුමන්ලාගේ කැබිනට් එකෙන් දුන්න පළමුවෙනි contract එක. ඔබතුමන්ලා පොඩි අය, අහිංසකයි. ඔබතුමන්ලා දන්නේ නැහැ මොනවාද වුණේ කියලා. ලක්ෂ දාහතරදාහක් වැඩියෙන් කොන්ත්‍රාත් දුන්නේ. අපි දීලා තිබුණු ටෙන්ඩර් එක cancel කළා. ඒ වැඩ කරන්න සියයට 15ක් රජයෙන් මුදල් දෙන්න තිබුණා. අන්තිමට අපි ආවාට පස්සේ තමයි රජයෙන් ඒ මුදල් ටික දීලා වැඩ කටයුතු ආරම්භ කරලා තිබෙන්නේ. ඒ වැඩ කටයුතු ගැනත් අද අපි සතුටු වෙන්නේ නැහැ. සියයට 10ක් ආපස්සට තමයි ඒ කොන්ත්‍රාත් සමාගමත් දැනට වැඩ කටයුතු කරගෙන යන්නේ. ඒ නිසා අපි බලාපොරොත්තු වෙනවා දැඩිව කටයුතු කරන්න. එහෙම වැඩ පමා කරන්න දෙන්න විධියක් නැහැ. මේ පාඩුව නිසා

-මේ අවුරුදු හතරහමාරේ පාඩුව නිසා- රුපියල් බිලියන හතළිහකට වඩා රටට පාඩුවක් වෙනවා කියලා අපි ගණන් හදලා තිබෙනවා. ඒක ගැන දැන් අපි පරීක්ෂණයක් කරන්නත් බලාපොරොත්තු වෙනවා. මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලා අහිංසකයි. හැබැයි, ඔබතුමන්ලාගේ ඉහළ අය මෙහෙම තමයි කටයුතු කළේ. මංතීරු හයක් තිබුණු එක, මංතීරු හතරකට අඩු කරලා -පාරෙන් මංතීරු දෙකක් අඩු කරලා- ඒත් බිලියන 66ට කොන්ත්‍රාත් එක දුන්නා. ඉතින් ඒවා කථා කරන්න ගියොත් තව දේවල් කියන්න වෙනවා. අපටත් ඕනෑ ඉක්මනින් මේ කටයුතු කරන්නයි. ඔබතුමාට ඕනෑත් ඒක. කිරිඇල්ල මන්ත්‍රීතුමාටත් ඕනෑ ඒක. අපේ ජනාධිපතිතුමාටත් ඒක ඊටත් ඉහළින් අවශ්‍ය වෙලායි තිබෙන්නේ. එතුමා කියලා තිබෙනවා අහවල් දිනය වෙද්දී මේ වැඩ ඉවර කරන්න කියලා. අපි බලාපොරොත්තු වෙනවා ඉක්මනින් මධ්‍යම අධිවේගී මාර්ගය හදලා ඉවර කරලා රටේ ජනතාවට පාවිච්චි කරන්න භාර දෙන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, I rise to a point of Order.

කඩවත-මීරිගම කොටස පටන් ගන්නකොට මම මහාමාර්ග ඇමති නොවෙයි. හැබැයි, කඩවත-මීරිගම කොටස හදන්න දුන්නේ -2015ට කලින්- මහින්ද රාජපක්ෂ මහත්මයා. මම හිතන හැටියට ඇමතිතුමාට වැරදිලා. අපි 2015දී බලයට එන්න පෙර 2014දී මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුව චීන සමාගමක් සමඟ MoU එකක් අත්සන් කරලා තිබුණා. අපේ ආණ්ඩුව බලයට ආවාට පස්සේ චීන සමාගම අපට මුදල් දුන්නේ නැහැ. ඒකයි වුණේ. මම ඇමති ධුරය දරන කාලයේ අවුරුදු හතරහමාරක් තිස්සේ චීන සමාගම් ගෙන්වලා, ගෙන්වලා කිව්වා මේ මුදල් ටික දෙන්න කියලා. නමුත් චීන සමාගම් අපිත් එක්ක දේශපාලන වශයෙන් විරුද්ධ නිසා මුදල් දුන්නේ නැහැ. 2015ට කලින් තමයි මහින්ද රාජපක්ෂ මහත්මයා ඒ ගිවිසුම අත්සන් කළේ. පොඩ්ඩක් බලන්න.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කිරිඇල්ල මන්ත්‍රීතුමාගේ නමවත් කිව්වේ නැහැ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)

You can check the records.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

මම එතුමාගේ හොඳ කිව්වේ. එතුමා උත්සාහ කළේත් මේ පාර හදන්නයි. [බාධා කිරීමක්] Wait, I am replying. I heard what you said. මම එතුමාට මොකුත් කිව්වේ නැහැ. එතුමාගේ නම කිව්වේත් නැහැ. මම දන්නවා එතුමා හිටපු ඇමති කියලා. නමුත් කොයි නායකයාද මේවාට අත ගැහුවේ, කවුද මේ හොරකම් කළේ කියන එක ඉදිරියේ එළියට එයි. You can go through the records. එතැනදී වුණේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා අත්සන් කරපු ඒවා cancel කළා. Cancel කරලා, රුපියල් ලක්ෂ 31,000ට තිබුණු කිලෝමීටරය, රුපියල් ලක්ෂ 44,000ක් වැනි වැඩි මුදලකට තමයි තමුන්නාන්සේලා පළමුවෙනි කැබිනට් මණ්ඩල තුනකදී දෙන්න කටයුතු කළේ. එතකොට ඔබතුමා නොවෙයි ඇමති. ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ දින 100 ඇතුළත තමයි ඒක දුන්නේ.

එතකොට ඔබතුමා නොවෙයි ඇමති. ඒවා සිද්ධ වුණා. ඒක තමයි ඇත්ත. ඔබතුමා කියනවා, චීනය විරුද්ධ වුණා කියලා. චීනය ඔබතුමන්ලාට එහෙම විරුද්ධ වුණේ නැහැ. ඔබතුමන්ලා අවුරුදු 99කටයි වරාය චීනයට ලියා දුන්නේ! චීනය ඔබතුමන්ලාට විරුද්ධ නැහැ. තමුන්නාන්සේලා එහෙම කියන්නේ බොරුවට. මහින්ද මහත්තයා දුන්නේ නැති වරාය තමයි තමුන්නාන්සේලා දුන්නේ. මේක තමයි ඇත්ත. මේවා වහන්න බැහැ මොන records බැලුවත්. අපි කිසිම රටක් එක්ක ප්‍රශ්නයක් ඇති කර ගත්තේ නැහැ. ඔබතුමන්ලා මුදල් දුන්නේ නැහැ. ඒ කියන්නේ, ණය ගන්නකොට සියයට 15ක් අපි අපේ රටේ මහා භාණ්ඩාගාරයෙන් දෙන්න ඕනෑ. ඔබතුමන්ලා අවුරුදු හතරහමාරක් බුදියාගෙන සිටියා ඒ මුදල් දෙන්නේ නැතිව. ඒ ව්‍යාපෘති cancel කරන්න කිව්වා. Cancel කළාම තවත් අවුරුද්දක්, දෙකක් කල් යනවා. ඇත්තටම cancel කරලා ඒ කරපු ඒවා හොයන්නයි තිබුණේ. හැබැයි, අපි එහෙම කළේ නැහැ. තමුන්නාන්සේලා කළේ එහෙම නේ. පටන් අරගෙන තිබුණු Port City එකට තමුන්නාන්සේලා බොරුවට මඩ ගැහුවා. විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් කිව්වා, "ලංකාවේ තිබෙන කළු ගල් ඔක්කොම කැඩුවත් ඒක පුරවන්න බැහැ" කියලා. එහෙම නේ කිව්වේ. අන්තිමට හිටපු ඇමති ගිහිල්ලා එයාගේ ව්‍යාපෘතියක් වාගේ තමයි Port City එක පෙන්නුවේ. හැබැයි, අපි එහෙම කළේ නැහැ. එදා තමුන්නාන්සේලා Port City එක නතර කළේ නැත්නම් අද ඒ Port City එකේ ප්‍රතිලාභ මේ රටේ අහිංසක මිනිසුන්ට ලැබිලා ඉවරයි. හැබැයි, එහෙම කළේ නැහැ. ඒක තමයි යථාර්ථය.

තමුන්නාන්සේලා විනාශ කරපු ආර්ථිකය භාරගත් ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා ඇවිල්ලා කඩවත සිට දක්වා මීරිගම අධිවේගී මාර්ගය සෑදීමට අවශ්‍ය මුදල් දීලා එහි වැඩ කටයුතු පටන් අරගෙන තිබෙනවා. ඒත් අපි ඒ වැඩ කෙරෙන විධිය ගැන ඒ තරම්ම සතුටු වන්නේ නැහැ. ඒ වැඩ සියයට 10ක් ආපස්සට ගිහින් තිබෙන්නේ. අපි කොන්ත්‍රාත්කරුවන්ට ඔලුව නවන්නේ නැහැ. කොන්ත්‍රාත්කරුවන් දින වකවානු ඇතිව මේ වැඩ කටයුතු අවසන් කරන්න ඕනෑය කියන එක අපි පැහැදිලිව කියනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඒ ප්‍රශ්නයට බොහෝ වෙලාවක් ගතවුණා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
ගරු අමාත්‍යතුමනි, කොට්ටාවෙන් ඇතුළු වුණාම මත්තල දක්වාම යන්න පුළුවන් දක්ෂිණ අධිවේගී මාර්ගය වාගේ, කඩවතින් ඇතුළු කළාම ගලගෙදරින් නික්මෙන්න පුළුවන් විධියට ඒ අධිවේගී මාර්ගයේ වැඩ අවසන් කිරීමට දළ වශයෙන් ඔබතුමන්ලා බලාපොරොත්තු වන්නේ මොන කාලයේද කියලා මට දැනගන්න පුළුවන්ද?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
බුද්ධික පතිරණ මන්ත්‍රීතුමනි, ඔබතුමා හරිම ප්‍රශ්නය ඇහුවා. එතුමාට තමයි මහා මාර්ග ඇමතිකම දෙන්න තිබුණේ ඒ කාලයේ. එතුමාට දුන්නා නම්, එතුමා ඒ පාර හදලා අවසන් කරනවා. ඔබතුමා විශ්වාස කරන්න එකක් නැහැ මේවා. මේ කොන්ත්‍රාත් ඔක්කොම දීලාත්, අන්තිමට බලනකොට අපි ආවාට පස්සේ තමයි අහුවුණේ පළමුවැනි කිලෝමීටර් භාගය හදන්න දීලාත් නැහැ කියලා. There is no connection between Kadawatha and Mirigama. The contract for the first part was not given. ඒක කිලෝමීටර භාගයක විතර පොඩි කෑල්ලක්. ඒවා අමතක කරලා මම කැබිනට් එකට ගිහිල්ලා ඒවාට අවසර ගත්තා. ඒකත් එක්ක අපි බලාපොරොත්තු වෙනවා, ඊළඟ අවුරුදු දෙකක් ඇතුළත -2024 වෙද්දී- මීරිගම කොටස අවසන් කරන්න. ඊළඟට අපි කුරුණෑගලින් පටන්ගත්තා නුවරට යන අධිවේගී මාර්ගය හදන්න. නුවර අධිවේගී මාර්ගයේ කටයුතු දැන් ආරම්භ කරලා ඉවරයි. ඒක අවුරුදු දෙකකින් අවසන් කරන්න අපි බලාපොරොත්තු වෙනවා. දඹුල්ල කොටසේ වැඩත් අපි සැලසුම් කරලා අවසන්. දඹුල්ල කොටසත් ඊළඟ අවුරුදු දෙකහමාර තුළ අවසන් කිරීම තමයි අපේ ඉලක්කය. ඒක ඔබතුමන්ලාටත් හොඳයි, අපටත් හොඳයි. ඊළඟ ඡන්දය ආසන්න වෙනකොට තමුන්නාන්සේලාට ඒ පාරේ ගිහිල්ලා අපට බණින්නත් පුළුවන්. ඒක අපට ගැටලුවක් නොවෙයි.

මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාලයේ අධිවේගී මාර්ග සංස්කෘතිය ගෙනැල්ලා මේ රටේ මිනිසුන්ට අලුත් රටක් නිර්මාණය කළේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා බව මම මේ අවස්ථාවේදී මතක් කරනවා. ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා ඉතිරි අධිවේගී මාර්ග ටික හදනවා විතරක් නොවෙයි, මේ කිලෝමීටර ලක්ෂයටත් අවශ්‍ය කරන සම්පූර්ණ මුදල් දෙන්න නියෝග කරලා තිබෙනවා. ඒ ගැන මුදල් ඇමතිතුමා අප සමඟ සාකච්ඡා කරලා එතුමාගේ සම්පූර්ණ සහයෝගයත් දීලා තිබෙනවා. අපේ බලාපොරොත්තුව අනාගතයේදී මේ පාරවල් ටික සංවර්ධනය කරලා මේ රට අලුත් තැනකට ගෙන එන එක බව මා මතක් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ප්‍රශ්න අංක 39 -601/2020- (3), ගරු උදයන කිරිඳිගොඩ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට ගරු ඇමතුමාගෙන් ගැටඹේ ක්‍රීඩාංගණය ගැන දැනගන්න පුළුවන්ද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එහෙම එකක් ගැන කථා කළේ නැහැ, ගරු මන්ත්‍රීතුමා. ක්‍රීඩාංගණයක් ගැන කථා කළේ නැහැ.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා මගෙන් ඒ ගැන ඇහුවා. අපි ගැටඹේ ප්‍රදේශයේ ගුවන් පාලමක් හදනවා. එතුමා හදපු ළමා උද්‍යානයක කොටසක් එම ගුවන් පාලම තැනීමට යොදා ගන්නවා කියලා එතුමා මගෙන් ඒ ගැන විමසුවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
1998 වර්ෂයේදී ගැටඹේ ප්‍රදේශයේ අක්කරයක ප්‍රමාණයකින් යුත් ළමා ක්‍රීඩාංගණයක් අපි හැදුවා. ගරු ඇමතිතුමනි, ඔබතුමාත් එය දකින්න ඇති. එය මහනුවරට ඇතුළු වෙනකොට දකුණු පැත්තේ තිබෙන්නේ. දැන් ගැටඹේ flyover එකක් හදනවා. මේ flyover එක සඳහා එම ක්‍රීඩාංගණයෙන් භාගයක් ඉවත් කරනවා. මම ක්‍රීඩා ඇමතිතුමාටත් කිව්වා, මේක redesign කරලා, මේ ක්‍රීඩාංගණය බේරා ගන්න අවශ්‍ය කටයුතු කරන්න කියලා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා පෞද්ගලිකවත් මා මුණගැහිලා මේ ගැන කථා කළා. එම ළමා උද්‍යානය එතුමා හදපු එකක්. ඇත්තටම නුවර තිබෙන වාහන තදබදය ගත්තාම, එම ළමා උද්‍යානය තිබෙන ස්ථානය අමාරුම තැනක්, හැම පැත්තකින්ම බැලුවාම. එම නිසා අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා අපට කිව්වා, "නුවරට ඇතුළු වෙනකොට විශාල වාහන තදබදයක් තිබෙනවා. ගැටඹේ ප්‍රදේශයට වහාම ගුවන් පාලමක් හදන්න" කියලා. ඒ අනුව, අපි එහි වැඩ ආරම්භ කළා. ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා මා දැනුවත් කළා, මෙන්න මෙහෙම ප්‍රශ්නයක් තිබෙනවා කියා. ලේකම්තුමා එක්කත් මම ඒ සම්බන්ධයෙන් කථා කළා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉල්ලූ විධියට එම ළමා උද්‍යානය කෙසේ හෝ විශාල කරන්න අපි බලාපොරොත්තු වෙනවා. මේ පාලම හැදීමේදී එයට හානියක් වෙන්න දෙන්නේ නැහැ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා එම ප්‍රශ්නය ගැන හිතන්න එපා. අපි අනිවාර්යයෙන්ම ඒ ගැන බලන්නම්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ප්‍රශ්න අංක 40 -1017/2020- (1), ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා - *[සභා ගර්භය තුළ නැත.]* දෙවන වටය.

ප්‍රශ්න අංක 7 -325/2020- (2), ගරු බුද්ධික පතිරණ මහතා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වන ජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ප්‍රශ්න අංක 8 -326/2020- (1), ගරු බුද්ධික පතිරණ මහතා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වන ජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ලියාපදිංචි ක්‍රීඩා සංගම්: නිලවරණ පැවැත්වීම
### பதிவு செய்யப்பட்ட விளையாட்டுக் கழகங்கள்: தேர்தல்களை நடாத்துதல்
### REGISTERED SPORTS ASSOCIATIONS: CONDUCT OF ELECTIONS

202/2020

**19. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු චමින්ද විජේසිරි මහතා වෙනුවට)**
(மாண்புமிகு புத்திக பத்திரண- மாண்புமிகு சமிந்த விஜேசிறி சார்பாக)
(The Hon. Buddhika Pathirana on behalf of the Hon. Chaminda Wijesiri)
තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි කර ඇති ක්‍රීඩා සංගම් සංඛ්‍යාව හා ඒවායේ නම්;

(ii) එම සංගම් අතරින් නිසි පරිදි නිලවරණ පවත්වා ඇති ක්‍රීඩා සංගම් සංඛ්‍යාව හා ඒවායේ නම්;

(iii) නිලවරණ පැවැත්වීමට බාධා මතු වී ඇති ක්‍රීඩා සංගම් සංඛ්‍යාව හා ඒවායේ නම්;

(iv) නිලවරණ පැවැත්වීමට බාධා මතු වී ඇති ක්‍රීඩා සංගම්වල නිලවරණ පැවැත්වීමට අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

இளைஞர் மற்றும் விளையாட்டுத்துறை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இளைஞர் மற்றும் விளையாட்டுத்துறை அமைச்சின் கீழ் பதிவு செய்யப்பட்டுள்ள விளையாட்டுக் கழகங்கள் மற்றும் அவற்றின் பெயர்கள்;

(ii) மேற்படி கழகங்களுக்கு மத்தியில் உரிய முறையில் தேர்தல்களை நடாத்தியுள்ள விளையாட்டுக் கழகங்களின் எண்ணிக்கை மற்றும் அவற்றின் பெயர்கள்;

(iii) தேர்தல்களை நடாத்துவதில் தடை ஏற்பட்டுள்ள விளையாட்டுக் கழங்களின் எண்ணிக்கை மற்றும் அவற்றின் பெயர்கள்;

(iv) தேர்தல்களை நடாத்துவதில் தடை ஏற்பட்டுள்ள விளையாட்டுக் கழகங்களுக்கான தேர்தல்களை நடாத்துவதற்கு அமைச்சினால் மேற்கொள்ளப்படும் நடவடிக்கைகள்;

யாவையென்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Youth and Sports:

(a) Will he inform this House -

(i) the number of sports associations registered under the Ministry of Youth and Sports and their names;

(ii) out of that number, the number of sports associations which have properly conducted the elections of office bearers and their names;

(iii) the number of sports associations which have had obstacles to conduct elections and their names; and

(iv) the steps the Ministry intends to take to hold elections in the sports associations which have had obstacles to hold elections?

(b) If not, why?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (1) තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි කර ඇති ක්‍රීඩා සංගම් ගණන 68කි.

එම සංගම්වල නම් පහත පරිදි වේ.

1. ශ්‍රී ලංකා දුනු ශිල්ප සංගමය
2. ශ්‍රී ලංකා මේසපන්දු සංගමය
3. ශ්‍රී ලංකා ජල ක්‍රීඩා සංගමය
4. ශ්‍රී ලංකා බැඩ්මින්ටන් සංගමය
5. ශ්‍රී ලංකා ජූඩෝ සම්මේලනය
6. ශ්‍රී ලංකා දැල්පන්දු සම්මේලනය
7. ශ්‍රී ලංකා කායවර්ධන හා ශාරීරික යෝග්‍යතා සම්මේලනය
8. ශ්‍රී ලංකා සවි එසවීමේ සම්මේලනය

[ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා]

9. ශ්‍රී ලංකා පාපැදි සම්මේලනය
10. ශ්‍රී ලංකා ජාතික රයිෆල් සංගමය
11. ශ්‍රී ලංකා හොකී සම්මේලනය
12. ශ්‍රී ලංකා කරාතේ දෝ සම්මේලනය
13. ශ්‍රී ලංකා රුවල් ඔරු සංගමය
14. ශ්‍රී ලංකා රග්බි පාපන්දු සංගමය
15. ශ්‍රී ලංකා බර ඉසිලීමේ සංගමය
16. ශ්‍රී ලංකා ජිම්නාස්ටික් සංගමය
17. ශ්‍රී ලංකා ගොල්ෆ් සංගමය
18. ශ්‍රී ලංකා මල්ලවපොර සම්මේලනය
19. ශ්‍රී ලංකා මෝටර් ක්‍රීඩා සංගමය
20. ශ්‍රී ලංකා පැසිපන්දු සම්මේලනය
21. ශ්‍රී ලංකා මලල ක්‍රීඩා සංගමය
22. ශ්‍රී ලංකා ටෙනිස් සංගමය
23. ශ්‍රී ලංකා බ්‍රිජ් සම්මේලනය
24. ශ්‍රී ලංකා කැරම් සම්මේලනය
25. ශ්‍රී ලංකා ජීවිතාරක්ෂක සංගමය
26. ශ්‍රී ලංකා බොක්සිං සංගමය
27. ශ්‍රී ලංකා බිලියඩ් සහ ස්නූකර් සංගමය
28. ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය
29. ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනය
30. ශ්‍රී ලංකා එල්ලේ සම්මේලනය
31. ශ්‍රී ලංකා චෙස් සම්මේලනය
32. ශ්‍රී ලංකා ආධුනික ඔරු පැදීමේ සංගමය
33. ශ්‍රී ලංකා ස්කොෂ් සම්මේලනය
34. ශ්‍රී ලංකා ටයිකොන්ඩෝ සම්මේලනය
35. ශ්‍රී ලංකා සැහැල්ලු පන්දු ක්‍රිකට් සංගමය
36. ශ්‍රී ලංකා කබඩි සංගමය
37. ශ්‍රී ලංකා පැරාලිම්පික් ක්‍රීඩා සංගමය
38. ශ්‍රී ලංකා මෝටර් සයිකල් ක්‍රීඩා සංගමය
39. ශ්‍රී ලංකා වූෂු සම්මේලනය
40. ශ්‍රී ලංකා තුරඟ තරඟ සංගමය
41. ශ්‍රී ලංකා කඹ ඇදීමේ සම්මේලනය
42. ශ්‍රී ලංකා අත්පන්දු සම්මේලනය
43. ශ්‍රී ලංකා ජාතික වෙඩි තැබීමේ සම්මේලනය
44. ශ්‍රී ලංකා පාරම්පරික කරාතේ සම්මේලනය
45. ශ්‍රී ලංකා යුනිෆයිට් සම්මේලනය
46. ශ්‍රී ලංකා කුදෝ සම්මේලනය
47. ශ්‍රී ලංකා ජු ජිට්සු සම්මේලනය
48. ශ්‍රී ලංකා මොඩර්න් පෙන්ටත්ලෝ සම්මේලනය
49. ශ්‍රී ලංකා කැනොයින් සහ කායකින් සම්මේලනය
50. ශ්‍රී ලංකා රෝල් බෝල් සම්මේලනය
51. ශ්‍රී ලංකා සුමෝ සම්මේලනය
52. ශ්‍රී ලංකා ජාතික රෝද සපත්තු සංගමය
53. ජාතික අංගම්පොර සම්මේලනය
54. ජාතික කඳු නැඟීමේ සංගමය
55. ශ්‍රී ලංකා මුයි තායි සංගමය
56. ශ්‍රී ලංකා කෝ-කෝ සංගමය
57. ශ්‍රී ලංකා ක්‍රිකට්
58. ශ්‍රී ලංකා ත්‍රෝබෝල් සම්මේලනය
59. ශ්‍රී ලංකා ආධුනික සෙපැක්ට්‍රොක්ට්‍රෝ සම්මේලනය
60. ශ්‍රී ලංකා ස්ක්‍රැබල් සම්මේලනය
61. ශ්‍රී ලංකා බෝල් බැඩ්මින්ටන් සංගමය
62. ශ්‍රී ලංකා සර්ෆින් සම්මේලනය
63. ශ්‍රී ලංකා ප්‍රංශ සවාට් සම්මේලනය
64. ශ්‍රී ලංකා ලෝන් බෝල් සම්මේලනය
65. ශ්‍රී ලංකා ඊ ස්පෝර්ට්ස් සංගමය
66. ශ්‍රී ලංකා කඩු ශිල්ප සංගමය
67. ශ්‍රී ලංකා ටෙක්බෝල් සම්මේලනය
68. ශ්‍රී ලංකා ජීට් කුන්ඩෝ සම්මේලනය

(ii) ජාතික ක්‍රීඩා සංගම්/සම්මේලනයන්හි ව්‍යවස්ථාවන්ට අදාළව 2021 වර්ෂයේ නිලවරණ පවත්වන ලද ජාතික ක්‍රීඩා සංගම්/සම්මේලන සංඛ්‍යාව - 40

ඒවායේ නම්

| අංකය | සංගමයේ/සම්මේලනයේ නම | නිලවරණය පවත්වන ලද දිනය |
|---|---|---|
| 01. | ශ්‍රී ලංකා ජල ක්‍රීඩා සංගමය | 2021.05.29 |
| 02. | ශ්‍රී ලංකා කායවර්ධන හා ශාරීරික යෝග්‍යතා සම්මේලනය | 2021.06.01 |
| 03. | ශ්‍රී ලංකා පාපැදි සම්මේලනය | 2021.04.05 |
| 04. | ශ්‍රී ලංකා ජාතික රයිෆල් සංගමය | 2021.05.31 |
| 05. | ශ්‍රී ලංකා රග්බි පාපන්දු සංගමය | 2021.05.29 |
| 06. | ශ්‍රී ලංකා බර ඉසිලීමේ සංගමය | 2021.06.29 |
| 07. | ශ්‍රී ලංකා ගොල්ෆ් සංගමය | 2021.06.01 |
| 08. | ශ්‍රී ලංකා මල්ලවපොර සම්මේලනය | 2021.01.27 |
| 09. | ශ්‍රී ලංකා පැසිපන්දු සම්මේලනය | 2021.01.31 |
| 10. | ශ්‍රී ලංකා මලල ක්‍රීඩා | 2021.04.24 |
| 11. | ශ්‍රී ලංකා ක්‍රිකට් | 2021.05.20 |
| 12. | ශ්‍රී ලංකා ටෙනිස් සංගමය | 2021.05.21 |
| 13. | ශ්‍රී ලංකා බ්‍රිජ් සම්මේලනය | 2021.03.30 |
| 14. | ශ්‍රී ලංකා ජීවිතාරක්ෂක සංගමය | 2021.06.30 |
| 15. | ශ්‍රී ලංකා බිලියඩ් සහ ස්නූකර් සංගමය | 2021.06.28 |
| 16. | ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය | 2021.06.30 |
| 17. | ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනය | 2021.04.04 |
| 18. | ශ්‍රී ලංකා මේසපන්දු සංගමය | 2021.05.29 |
| 19. | ශ්‍රී ලංකා ස්කොෂ් සම්මේලනය | 2021.05.22 |
| 20. | ශ්‍රී ලංකා ටයිකොන්ඩෝ සම්මේලනය | 2021.06.27 |
| 21. | ශ්‍රී ලංකා පැරාලිම්පික් කමිටුව | 2021.05.28 |
| 22. | ශ්‍රී ලංකා මෝටර් සයිකල් ක්‍රීඩා සංගමය | 2021.06.29 |
| 23. | ශ්‍රී ලංකා වූෂු සම්මේලනය | 2021.05.29 |
| 24. | ශ්‍රී ලංකා දුනු ශිල්ප සංගමය | 2021.06.29 |
| 25. | ශ්‍රී ලංකා තුරඟ තරඟ සංගමය | 2021.05.29 |
| 26. | ශ්‍රී ලංකා පාරම්පරික කරාතේ සම්මේලනය | 2021.06.12 |
| 27. | ශ්‍රී ලංකා සැහැල්ලු පන්දු ක්‍රිකට් සංගමය | 2021.06.26 |
| 28. | ශ්‍රී ලංකා ජාතික වෙඩි තැබීමේ සම්මේලනය | 2021.06.29 |
| 29. | ශ්‍රී ලංකා අත්පන්දු සම්මේලනය | 2021.06.02 |
| 30. | ශ්‍රී ලංකා ජාතික රෝද සපත්තු සංගමය | 2021.06.29 |
| 31. | ශ්‍රී ලංකා මොඩර්න් පෙන්ටැත්ලෝන් සම්මේලනය | 2021.05.25 |
| 32. | ශ්‍රී ලංකා කෝ-කෝ සංගමය | 2021.05.23 |
| 33. | ජාතික අංගම්පොර සම්මේලනය | 2021.05.17 |
| 34. | ශ්‍රී ලංකා කුදෝ සම්මේලනය | 2021.05.23 |
| 35. | ශ්‍රී ලංකා කැනොයින් සහ කායකින් සංගමය | 2021.06.30 |

| අංකය | සංගමයේ/සම්මේලනයේ නම | නිලවරණය පවත්වන ලද දිනය |
|---|---|---|
| 36. | ශ්‍රී ලංකා බෝල් බැඩ්මින්ටන් සංගමය | 2021.01.16 |
| 37. | ශ්‍රී ලංකා ලෝන් බෝල් සම්මේලනය | 2021.05.29 |
| 38. | ශ්‍රී ලංකා ඊ ස්පෝර්ට්ස් සංගමය | 2021.05.31 |
| 39. | ශ්‍රී ලංකා සවි එසවීමේ සම්මේලනය | 2021.07.07 |
| 40. | ජාතික කඳු නැඟීමේ සංගමය | 2021.07.01 |

(iii) නිලවරණ පැවැත්වීමට බාධා මතු වී ඇති ක්‍රීඩා සංගම් සංඛ්‍යාව 7කි. ඒවා නම්,

01. ශ්‍රී ලංකා කැරම් සම්මේලනය
02. ශ්‍රී ලංකා හොකී සම්මේලනය
03. ශ්‍රී ලංකා නෙට්බෝල් සම්මේලනය
04. ශ්‍රී ලංකා ජූඩෝ සංගමය
05. ශ්‍රී ලංකා සර්ෆින් සම්මේලනය
06. ශ්‍රී ලංකා ජු ජිට්සු සම්මේලනය
07. ශ්‍රී ලංකා ස්ක්‍රැබල් සම්මේලනය

(iv) 2021.06.30 දිනට නිලවරණ පැවැත්වීමට අපොහොසත් වූ ජාතික සංගම් 5ක නිලවරණ කමිටු පත් කර සංගම් 3ක නිලවරණ ඉදිරියේ දී පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත. අධිකරණ ක්‍රියාමාර්ග මත නිලවරණ පැවැත්වීමට තාවකාලිකව අත්හිටුවා ඇති ශ්‍රී ලංකා හොකී සම්මේලනයේ සහ ශ්‍රී ලංකා කැරම් සම්මේලනයේ නිලවරණය ඉදිරියේ දී අධිකරණය මඟින් ලබාදෙන තීන්දුව මත ක්‍රියාත්මක කරනු ඇත. ශ්‍රී ලංකා ජූ ජිට්සු සම්මේලනය සහ ශ්‍රී ලංකා ස්ක්‍රැබල් සම්මේලනයේ සාමාජිකයන් කිසිවකුත් නිලවරණ කමිටුව හඳුන්වා දීමේ අවස්ථාව සඳහා සහභාගි නොවූ බැවින්, එම සම්මේලන 2හි ලියා පදිංචිය අත්හිටුවීමට ඉදිරියේ දී කටයුතු කිරීමට නියමිතය.

(ආ) පැන නොනඟී.

## ජාතික ක්‍රීඩා විද්‍යායතනය පවත්වන ක්‍රීඩා පාඨමාලා: විස්තර

## தேசிய விளையாட்டுக் கல்வி நிறுவனத்தினால் நடாத்தப்படுகின்ற விளையாட்டுப் பாட நெறிகள்: விபரம்

## SPORTS COURSES CONDUCTED BY NATIONAL ACADEMY OF SPORTS: DETAILS

258/2020

**20.ගරු බුද්ධික පතිරණ මහතා (ගරු චමින්ද විජේසිරි මහතා වෙනුවට)**
(மாண்புமிகு புத்திக பத்திரண- மாண்புமிகு சமிந்த விஜேசிறி சார்பாக)
(The Hon. Buddhika Pathirana on behalf of the Hon. Chaminda Wijesiri)
තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ජාතික ක්‍රීඩා විද්‍යායතනය විසින් පවත්වනු ලබන ක්‍රීඩා පාඨමාලා සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාඨමාලා කවරේද;

(iii) එම එක් එක් පාඨමාලාව මේ වනවිට හදාරන සිසුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ජාතික ක්‍රීඩා විද්‍යායතනය විසින් පවත්වනු ලබන ක්‍රීඩා පාඨමාලාවල ගුණාත්මකභාවය ඉහළ නැංවීමට අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

இளைஞர் மற்றும் விளையாட்டுத்துறை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தேசிய விளையாட்டுக் கல்வி நிறுவனத்தினால் நடாத்தப்படுகின்ற விளையாட்டுப் பாடநெறி களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) மேற்படி பாடநெறிகள் யாவை என்பதையும்;

(iii) மேற்படி ஒவ்வொரு பாடநெறியையும் தற்போது பயிலும் மாணவர்களின் எண்ணிக்கை தனித் தனியே யாது என்பதையும்;

(iv) தேசிய விளையாட்டுக் கல்வி நிறுவனத்தினால் நடாத்தப்படுகின்ற விளையாட்டுப் பாடநெறி களின் தரத்தை மேம்படுத்த அமைச்சு மேற் கொள்ளும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Youth and Sports:

(a) Will he inform this House-

(i) the number of sports courses conducted by the National Academy of Sports;

(ii) the names of those courses;

(iii) the number of students who follow each such course at present, separately; and

(iv) the steps the Ministry intends to take to enhance the quality of the courses conducted by the National Sports Academy?

(b) If not, why?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය විසින් ප්‍රධාන වශයෙන් පාඨමාලා වර්ග 6ක් පවත්වනු ලබයි.

(ii) ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන ක්‍රීඩා පාඨමාලා

(1) උසස් පුහුණු පාඨමාලාව
(2) ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලාව
(3) ශාරීරික යෝග්‍යතා උපදේශක පාඨමාලාව
(4) 13 වසරක අධ්‍යාපනය සහතික කිරීමේ ක්‍රීඩා අභ්‍යාස සහතික පත්‍ර පාඨමාලාව
(5) අදියර පාඨමාලාව
(6) පුහුණුකරුවන් ලියා පදිංචි කිරීමේ වැඩසටහන

[ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා]

(iii) 2021 වර්ෂයේ දී මේ වන විට පවත්වාගෙන යනු ලබන පාඨමාලා සහ ඉගෙනුම ලබන සිසුන් සංඛ්‍යාව

| | | පාඨමාලාව | සිසුන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | | උසස් පුහුණු පාඨමාලාව | 24 |
| 02 | | ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලාව | 57 |
| 03 | | ශාරීරික යෝග්‍යතා උපදේශක පාඨමාලාව | 177 |
| 04 | i | අදියර 01 පාඨමාලාව (බොක්සිං) | 47 |
| | ii | අදියර 1 පාඨමාලාව (ටයිකොන්ඩො) | 34 |
| 05 | i | පුහුණුකරුවන් ලියා පදංචි කිරීමේ වැඩසටහන (කරාටේ) | 92 |
| | ii | පුහුණුකරුවන් ලියා පදිංචි කිරීමේ වැඩසටහන (බොක්සිං) | 21 |
| | iii | පුහුණුකරුවන් ලියා පදිංචි කිරීමේ වැඩසටහන (පිහිනුම්) | 58 |
| | iv | පුහුණුකරුවන් ලියා පදිංචි කිරීමේ වැඩසටහන (හොකී) | 15 |
| | v | පුහුණුකරුවන් ලියා පදිංචි කිරීමේ වැඩසටහන (කබඩි) | 17 |
| | vi | පුහුණුකරුවන් ලියා පදිංචි කිරීමේ වැඩසටහන (කඹ ඇදීම) | 65 |
| 06 | i | අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධව පවත්වන පාසල් සිසුන්ගේ 13 වසරක අධ්‍යාපනය සහතික කිරීමේ පාඨමාලාව | 58 |

(iv)

(1) ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය තුළ පවත්වනු ලබන ප්‍රධාන පාඨමාලා සඳහා NVQ 4,5,6 මට්ටම ලබා දීමට කටයුතු කිරීම.

(2) ලංකාවේ සියලු පුහුණුකරුවන් ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ ලියා පදිංචි කිරීම සඳහා කටයුතු සම්පාදනය කිරීම සහ පිළිගත හැකි පුහුණුකරු බලපත්‍රයක් ලබා දීම.

(3) ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය වෘත්තීය ක්‍රීඩා උපාධියක් පිරිනමන ක්‍රීඩා විශ්වවිද්‍යාලයක් බවට පත් කිරීමට සැලසුම් සකස් කරමින් පවතී.

(4) නවීන පහසුකම් සහිත ක්‍රීඩා විද්‍යාගාරයක් සැකසීමට සැලසුම් කිරීම.

(5) ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය සඳහා බඳවාගනු ලබන කථිකාචාර්යවරු සංඛ්‍යාව වැඩි කිරීම.

(ආ) අදාළ නොවේ.

## අංග සම්පූර්ණ ක්‍රීඩාංගණ ස්ථාපනය කිරීම: සැලැස්ම
## பூரணத்துவமுடைய விளையாட்டு மைதானங்களை அமைத்தல்: திட்டம்
## ESTABLISHMENT OF FULLY-EQUIPPED STADIUMS: PLAN

718/2020

**21. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු ශාන්ත බණ්ඩාර මහතා වෙනුවට)**
(மாண்புமிகு புத்திக பத்திரண - மாண்புமிகு சாந்த பண்டார சார்பாக)
(The Hon. Buddhika Pathirana on behalf of the Hon. Shantha Bandara)
තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) ක්‍රීඩාංගණ සංවර්ධනය කිරීම, ක්‍රීඩා කටයුතුවලට පහසුවක් වන බව එතුමා පිළිගන්නේද?

(ආ) (i) මලල ක්‍රීඩාව සඳහා ශ්‍රී ලංකාව තුළ මේ වනවිට පවතින ජාත්‍යන්තර ක්‍රීඩාංගණ සංඛ්‍යාව කොපමණද;

(ii) දිස්ත්‍රික් මට්ටමින් අංග සම්පූර්ණ ක්‍රීඩාංගණ ස්ථාපනය කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කර තිබේද;

(iii) එසේ නම්, ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

இளைஞர் மற்றும் விளையாட்டுத்துறை அமைச்சரைக் கேட்ட வினா:

(அ) விளையாட்டு மைதானங்களை அபிவிருத்தி செய்வது விளையாட்டு நடவடிக்கைகளுக்கு வசதியாக அமையும் என்பதை அவர் ஏற்றுக்கொள்வாரா?

(ஆ) (i) இலங்கையில் தடகள விளையாட்டுக்கென தற்போது காணப்படுகின்ற சர்வதேச விளையாட்டு மைதானங்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(ii) மாவட்ட மட்டத்தில் முழுமையான வசதிகளுடன் கூடிய விளையாட்டு மைதானங்களை அமைப்பதற்கான முறைமையொன்று ஏற்படுத்தப்பட்டுள்ளதா என்பதையும்;

(iii) ஆமெனில், அதற்காக நிதி ஏற்பாடுகளை ஒதுக்குவதற்கு நடவடிக்கை எடுக்கப்படுமா என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Youth and Sports:

(a) Will he admit that development of stadiums facilitates sports?

(b) Will he inform this House -

(i) the number of international stadiums for athletics in Sri Lanka by now;

(ii) whether a plan has been developed to establish fully-equipped stadiums at district level; and

(iii) if so, whether action will be taken to allocate provisions for that?

(c) If not, why?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) ඔව්.

ක්‍රීඩාංගණ සංවර්ධනය කිරීම වැනි යටිතල පහසුකම් සංවර්ධනය කිරීම මඟින් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට අවශ්‍ය පහසුකම් සපයා දීමක් සිදු වන බැවින් ක්‍රීඩා කටයුතුවලට පහසුවක් සැලසේ.

(ආ) (i) මලල ක්‍රීඩාව සඳහා ශ්‍රී ලංකාව තුළ මේ වන විට ජාත්‍යන්තර ක්‍රීඩාංගණ 2ක් පවතී.

(ii) ඔව්.

2011 වර්ෂයේ දී "ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධනය, පළාත් හා දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ ඉදිකිරීම" යන මැයෙන් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සන්දේශයට අනුව සියලු දිස්ත්‍රික් ආවරණය වන පරිදි පළාත් 9 තුළ හා දිස්ත්‍රික්ක 14ක් තුළ ප්‍රධාන අංගයන් වශයෙන් මීටර් 400 ධාවන පථයක්, පිහිනුම් තටාකයක් හා ගෘහස්ථ ක්‍රීඩාගාරයක් සහිත ක්‍රීඩා සංකීර්ණයක් ඉදිකිරීමට අනුමැතිය ලබා දී ඇත.

ඒ අනුව, දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ වශයෙන් මීටර් 400 ධාවන පථය, මීටර් 25ක මංතීරු 6ක් සහිත පිහිනුම් තටාකයක් හා ගෘහස්ථ ක්‍රීඩාගාරයක් සහිතව මඩකලපුව, මාතර, කළුතර, පොළොන්නරුව, අම්පාර, පුත්තලම, කෑගල්ල හා ගාල්ල යන දිස්ත්‍රික්කවල ඉදි කරන ලද දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ ප්‍රයෝජනය සඳහා ජනතා අයිතියට පත් කර ඇත.

(iii) ඔව්.

2021 වර්ෂයේ දී මන්නාරම, වවුනියාව, ගම්පහ යන දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ ද උතුරු පළාත් ක්‍රීඩා සංකීර්ණය, වයඹ පළාත් ක්‍රීඩා සංකීර්ණය ද නිම කිරීමට යෝජිතය. මොනරාගල, හම්බන්තොට හා මුලතිව් දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ 2022 වර්ෂයේ ප්‍රතිපාදන මඟින් ඉදි කිරීමට යෝජිතය.

(ඇ) අදාළ නොවේ.

## රත්නපුර දිස්ත්‍රික්කයේ පළාත් සභා මාර්ග: සංවර්ධනය

## இரத்தினபுரி மாவட்டத்திலுள்ள மாகாண சபை வீதிகள்: அபிவிருத்தி

## PROVINCIAL COUNCIL ROADS OF RATNAPURA DISTRICT: DEVELOPMENT

42/2020

**25. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු හේෂා විතානගේ මහතා වෙනුවට)**
(மாண்புமிகு புத்திக பத்திரண - மாண்புமிகு ஹேசா விதானகே சார்பாக )
(The Hon. Buddhika Pathirana on behalf of the Hon. Hesha Withanage)
රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කය තුළ තිබෙන පළාත් සභාවට අයත් මාර්ග සංඛ්‍යාව;

(ii) ඒවායේ මුළු දිග කිලෝමීටර;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) පසුගිය රජයේ කාලසීමාව තුළ පළාත් සභා ප්‍රතිපාදන මත සංවර්ධනය කරනු ලැබූ මාර්ගවල නම් කවරේද;

(ii) ඒ සඳහා වැය කළ මුදල කොපමණද;

(iii) දැනට අබලන් තත්ත්වයේ පවතින සෙසු පළාත් සභා මාර්ග සංවර්ධනය කිරීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

அரசாங்க சேவைகள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இரத்தினபுரி மாவட்டத்தில் மாகாண சபைக் குரியதான பாதைகளின் எண்ணிக்கை யாதென் பதையும்;

(ii) அவற்றின் மொத்த நீளம் எத்தனை கிலோ மீற்றர்கள் என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) கடந்த அரசாங்கத்தின் மாகாண சபை நிதி ஒதுக்கீட்டின்மூலம் அபிவிருத்தி செய்யப்பட்ட பாதைகளின் பெயர்கள் யாவை என்பதையும்;

(ii) அதற்கெனச் செலவிடப்பட்ட பணத்தொகை எவ்வளவென்பதையும்;

(iii) தற்போதைக்கு சேதமடைந்த நிலையிலுள்ள மாகாண சபைக்குரிய பாதைகளின் அபிவிருத் தியை மேற்கொள்வதற்கு அமைச்சு மேற் கொள்ளும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Services, Provincial Councils and Local Government:

(a) Will he inform this House -

(i) the number of Provincial Council roads in the Ratnapura District; and

(ii) the total length of those roads in kilometres?

(b) Will he also inform this House -

(i) the names of the roads that were developed under the provisions of the Provincial Council during the period of the previous Government;

(ii) the amount of money spent on developing those roads; and

(iii) the steps that will be taken by the Ministry to develop the other Provincial Council roads that are in a dilapidated condition at present?

(c) If not, why?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) මාර්ග 280යි.

(ii) කිලෝමීටර් 1,468.12යි.

(ආ) (i) මාර්ග නාම ලේඛනය ඇමුණුමෙහි** දක්වා ඇත.

(ii) රුපියල් මිලියන 644යි.

***** පුස්තකාලයේ තබා ඇත.***
*** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*** Placed in the Library.*

[ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා]

(iii) • පළාත් සහා මාර්ග, මහා මාර්ග අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබන කිලෝමීටර් 100,000 වැඩසටහන මඟින් සංවර්ධනය කිරීම.

• ටී කැම්ප් ව්‍යාපෘතිය මඟින් පළාත් සභාවට අයත් මාර්ග සංවර්ධනය කිරීම.

• පළාත් මාර්ග අමාත්‍යාංශයට වාර්ෂිකව වෙන් කරනු ලබන ප්‍රතිපාදන මඟින් මාර්ග සංවර්ධනය කිරීම.

(ඇ) අදාළ නොවේ.

## රැකියා විරහිත උපාධිධාරීන්ට රැකියා ලබාදීමේ වැඩසටහන: විස්තර

## தொழிலற்ற பட்டதாரிகளுக்குத் தொழில் வழங்குவதற்கான நிகழ்ச்சித்திட்டம் : விபரம்

## PROGRAMME TO PROVIDE JOBS FOR UNEMPLOYED GRADUATES: DETAILS

139/2020

**26.ගරු බුද්ධික පතිරණ මහතා(ගරු චමින්ද විජේසිරි මහතා වෙනුවට)**

(மாண்புமிகு புத்திக பத்திரண - மாண்புமிகு சமிந்த விஜேசிறி சார்பாக)

(The Hon. Buddhika Pathirana on behalf of the Hon. Chaminda Wijesiri)

රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනය යටතේ රැකියා විරහිත උපාධිධාරීන්ට රැකියා ලබා දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක වන බව එතුමා දන්නේද?

(ආ) (i) රැකියා විරහිත උපාධිධාරීන්ට රැකියා ලබාදීම සම්බන්ධයෙන් අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග;

(ii) එම වැඩසටහන යටතේ මේ වනතෙක් රැකියා ලබා දී ඇති උපාධිධාරීන්ගේ නම්;

(iii) ඔවුන්ගේ සේවා ස්ථාන;

(iv) ඔවුන්ගේ රාජකාරිවල ස්වභාවය;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

அரசாங்க சேவைகள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) "சுபிட்சத்தின் நோக்கு" கொள்கைப் பிரகடனத்தின்கீழ் தொழில்வாய்ப்பற்ற பட்டதாரிகளுக்குத் தொழில் வாய்ப்பினை வழங்கும் நிகழ்ச்சித்திட்டமொன்று நடைமுறைப்படுத்தப்படுகின்றது என்பதை அவர் அறிவாரா?

(ஆ) (i) தொழில்வாய்ப்பற்ற பட்டதாரிகளுக்குத் தொழில் வாய்ப்புகளை வழங்குவது தொடர்பில் பின்பற் றப்பட்ட நடவடிக்கை முறைகள் யாவை யென்பதையும்;

(ii) மேற்படி நிகழ்ச்சித்திட்டத்தின்கீழ் இற்றைவரை தொழில்வாய்ப்புகள் வழங்கப்பட்டுள்ள பட்ட தாரிகளின் பெயர்கள் யாவையென்பதையும்;

(iii) அவர்கள் பணியாற்றும் தொழில் நிலையங்கள் யாவையென்பதையும்;

(iv) அவர்களின் கடமைப்பணிகளின் தன்மை யாதென்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Services, Provincial Councils and Local Government:

(a) Is he aware that a programme to give jobs to unemployed graduates is in operation under the Manifesto "Vistas of Prosperity and Splendour"?

(b) Will he inform this House-

(i) the methodology followed in respect of giving jobs to unemployed graduates;

(ii) the names of the graduates who have been given jobs under the programme concerned;

(iii) their places of work; and

(iv) the nature of their duties?

(c) If not, why?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**

(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)

(The Hon. Johnston Fernando)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර සභාගත* කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

(අ) ඔව්.

(ආ) (i) අයදුම්කරුවන් අනුව පුහුණුව සඳහා සුදුසුකම් සපුරන ලද අභ්‍යාසලාභීන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කර ප්‍රාදේශීය ලේකම් විසින් සුදුසුකම් පරීක්ෂා කරන ලදී.

අමාත්‍ය මණ්ඩල තීරණ.

- "රැකියා විරහිත උපාධිධාරීන් සහ ඩිප්ලෝමාධාරීන් රැකියාගත කිරීම" මැයෙන් අතිගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද අංක 20/0312/201/008 සහ 2020.02.05 දිනැති අමාත්‍ය මණ්ඩල සන්දේශයට 2020.02.05 නැතිව රැස් වූ අමාත්‍ය මණ්ඩලය විසින් ගත් තීරණය ද,

- "රැකියා විරහිත උපාධිධාරීන් සහ ඩිප්ලෝමාධාරීන් 50,000ක් රැකියාගත කිරීම" මැයෙන් අතිගරු ජනාධිපතිතුමා විසින් 2020.02.18 දිනැතිව ඉදිරිපත් කරන ලද 20/0428/201/008-1 අංක දරන අමාත්‍ය මණ්ඩල සටහන සම්බන්ධයෙන් 2020.02.19 දිනැතිව රැස් වූ අමාත්‍ය මණ්ඩලය විසින් ගත් තීරණය ද,

- අතිගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද අංක 20/1187/301/002 අමාත්‍ය මණ්ඩල සටහනට 2020.08.19 දිනැතිව රැස්වූ අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණ ය ද,

පදනම් කර ගනිමින් රැකියා විරහිත උපාධිධාරීන්ට රැකියා ලබාදීම සඳහා කටයුතු සිදු කරනු ලැබීය.

(ii) ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සම්මුඛ පරීක්ෂණයට යටත්ව 2020/09/02 වන විට පුහුණුව සඳහා සුදුසුකම් ලැබූ අභ්‍යාසලාභී උපාධිධාරීන්ගේ නාමලේඛනය 2020.08.16 දින අමාත්‍යාංශයේ වෙබ් අඩවියෙහි (www.pubad.gov.lk) පළ කර ඇත.

2020/11/23 සහ 2020/12/11 දින වලදී රාජ්‍ය සේවා අමාත්‍යාංශ වෙබ් අඩවියේ පළ කරන ලද නාමලේඛනවල සඳහන් අභ්‍යාසලාභී උපාධිධාරීන් 8,078ක් සඳහා 2020.02.01 දින සිට පුහුණු පත්වීම් ලබාදීමට නියමිතය.

(iii) පුහුණුව සඳහා අනුයුක්ත කර ඇත්තේ එම අභ්‍යාසලාභී උපාධිධාරීන් පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට ය. පුහුණුවෙන් අනතුරුව සේවා අවශ්‍යතාව අනුව පුරප්පාඩුවලට පත් කරනු ලැබේ.

(iv) මූලික පුහුණු පාඨමාලා අදියර 5ක් යටතේ ආරම්භ කරන ලද අතර කොවිඩ් 19 වසංගතය හේතුවෙන් එම වැඩසටහන් තාවකාලිකව අත්හිටුවා සේවාලාභීන්ගේ මෙම අභ්‍යාසලාභීන් ආසන්න රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය ආයතනවල සේවාස්ථ පුහුණුව සඳහා අනුයුක්ත කර ඇත.

(ඇ) ඉහත ආ iv අනුව පැන නොනඟී.

## 2015-2019 දක්වා කපු ආනයනය: විස්තර
2015-2019 வரையான பஞ்சு இறக்குமதி: விபரம்
IMPORT OF COTTON FROM 2015-2019: DETAILS

245/2020

**29.** **ගරු බුද්ධික පතිරණ මහතා (ගරු මොහමඩ් මුසම්මිල් මහතා වෙනුවට)**
(மாண்புமிகு புத்திக பத்திரண - மாண்புமிகு மொஹமட் முஸம்மில் சார்பாக)
(The Hon. Buddhika Pathirana on behalf of the Hon. Mohomad Muzammil)
මුදල් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂයක් තුළ -

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ කපු ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා වැය වූ මුදල කොපමණද;

(iii) එම කපු ආනයනය කළ රටවල් කවරේද;

(iv) එම කපු ආනයනය කළ සමාගම්වල නම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) එම කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට කපු ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2015ஆம் ஆண்டு தொடக்கம் 2019ஆம் ஆண்டு வரையிலான ஒவ்வொரு வருடத்திலும் -

(i) இலங்கைக்கு இறக்குமதி செய்யப்பட்ட பஞ்சின் அளவு யாதென்பதையும்;

(ii) அதற்காகச் செலவிடப்பட்ட பணத்தொகை வெவ்வேறாக யாதென்பதையும்;

(iii) மேற்படி பஞ்சு எந்தெந்த நாடுகளிலிருந்து இறக்குமதி செய்யப்பட்டன என்பதையும்;

(iv) மேற்படி பஞ்சை இறக்குமதி செய்த கம்பெனிகள் யாவையென்பதையும்;

தனித்தனியாக அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) மேற்படி காலப்பகுதியில் இலங்கைக்கு பஞ்சை இறக்குமதி செய்வதற்காகச் செலவாகிய மொத்தத் தொகை எவ்வளவென்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Finance:

(a) Will he inform this House separately, pertaining to each of the years during the period from 2015 to 2019, of-

(i) the quantity of cotton imported into Sri Lanka;

(ii) the money that had been incurred on that;

(iii) the countries from which the cotton was imported; and

(iv) the companies which imported the cotton?

(b) Will he also inform this House the total expenditure on importing cotton into Sri Lanka during the period concerned?

(c) If not, why?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i)

කිලෝග්‍රෑම්

| | 2015 | 2016 | 2017 | 2018 | 2019 |
|---|---|---|---|---|---|
| ශුද්ධ නොකළා වූ, නොපීරූ හෝ විරංජනය කරන ලද කපු | 1,992,077 | 1,570,639 | 1,605,873 | 1,641,442 | 348,041 |
| ශුද්ධ නොකළා වූ, නොපීරූ හෝ විරංජනය නොකරන ලද කපු | 2,433 | 2,091 | 25,992 | 36,225 | 3,349 |
| ශුද්ධ කළා වූ හෝ විරංජනය කරන ලද කපු | 2,980 | 27,836 | 17,053 | - | 7,560 |
| ශුද්ධ කළා වූ හෝ විරංජනය නොකරන ලද කපු | 97,572 | 165,457 | 32,683 | 16,016 | 45,686 |

[ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා]

(ii)

වටිනාකම (රුපියල් මිලියන)

| | 2015 | 2016 | 2017 | 2018 | 2019 |
|---|---|---|---|---|---|
| ශුද්ධ නොකළා වූ, නොපිරූ හෝ විරංජනය කරන ලද කපු | 426 | 395 | 484 | 538 | 127 |
| ශුද්ධ නොකළා වූ, නොපිරූ හෝ විරංජනය නොකරන ලද කපු | 1 | 0.4 | 8 | 14 | 0.7 |
| ශුද්ධ කළා වූ හෝ විරංජනය කරන ලද කපු | 1 | 6 | 6 | - | 3 |
| ශුද්ධ කළා වූ හෝ විරංජනය නොකරන ලද කපු | 13 | 30 | 6 | 3 | 10 |

(iii) චීනය, ජර්මනිය, ග්‍රීසිය, ඉන්දියාව, ඉන්දුනීසියාව, පාකිස්තානය, සිංගප්පූරුව, තායිවානය, තායිලන්තය, ඇමරිකා එක්සත් ජනපදය, වියට්නාමය

(iv) ඔව්.

ශ්‍රී ලංකාවට කපු ආනයනය කළ සමාගම්වල නම් ඇමුණුම 01** හි දැක්වේ.

(ආ) 2015 සිට 2019 දක්වා කාල සීමාව තුළ ශ්‍රී ලංකාවට කපු ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල රුපියල් 2,080,661,013 (රුපියල් මිලියන 2,080)

(ඇ) පැන නොනඟී.

## 2018-2020 දක්වා එතනෝල් නිෂ්පාදනය: විස්තර
## 2018-2020 வரையான எதனோல் உற்பத்தி: விபரம்
## ETHANOL PRODUCTION FROM 2018-2020: DETAILS

416/2020

**30.ගරු බුද්ධික පතිරණ මහතා (ගරු මොහොමඩ් මුසම්මිල් මහතා වෙනුවට)**
(மாண்புமிகு புத்திக பத்திரண - மாண்புமிகு மொஹமட் முஸம்மில் சார்பாக)
(The Hon. Buddhika Pathirana on behalf of the Hon. Mohomad Muzammil)
මුදල් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (2):

(අ) 2018 සහ 2019 යන වර්ෂවල -

(i) ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද එතනෝල් ලීටර ප්‍රමාණය;

(ii) ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන ලද එතනෝල් ලීටර ප්‍රමාණය;

(iii) ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන ලද එතනෝල් ලීටරයක් අළෙවි කරන ලද මිල;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) 2020 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන ලද එතනෝල් ලීටර ප්‍රමාණය;

(ii) 2020 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන ලද එතනෝල් ලීටරයක් අළෙවි කරන ලද මිල;

කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) (i) 2018-2019 යන වර්ෂවල සහ 2020 වර්ෂයේ ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන ලද එතනෝල් ලීටරයක් අළෙවි කරන ලද මිල ගණන් අතර වෙනසක් තිබේද;

(ii) එසේ නම්, එම වෙනස කොපමණද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2018 மற்றும் 2019ஆம் ஆண்டுகளில் -

(i) இலங்கைக்கு இறக்குமதி செய்யப்பட்டுள்ள எதனோல் லீற்றர்களின் அளவு;

(ii) இலங்கையில் உற்பத்தி செய்யப்பட்டுள்ள எதனோல் லீற்றர்களின் அளவு;

(iii) இலங்கையில் உற்பத்தி செய்யப்பட்டுள்ள எதனோல் ஒரு லீற்றர் விற்பனை செய்யப்பட்டுள்ள விலை;

யாதென்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) 2020ஆம் ஆண்டில் இலங்கையில் உற்பத்தி செய்யப்பட்டுள்ள எதனோல் லீற்றர்களின் அளவு யாது;

(ii) 2020ஆம் ஆண்டில் இலங்கையில் உற்பத்தி செய்யப்பட்டுள்ள எதனோல் ஒரு லீற்றர் விற்பனை செய்யப்பட்டுள்ள விலை எவ்வளவு;

என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) 2018 - 2019ஆம் ஆண்டுகளிலும் 2020ஆம் ஆண்டிலும் இலங்கையில் உற்பத்தி செய்யப்பட்டுள்ள எதனோலின் ஒரு லீற்றர் விற்பனை செய்யப்பட்டுள்ள விலைகளுக்கு இடையில் வேறுபாடு உள்ளதா;

(ii) ஆமெனில், அந்த வேறுபாடு யாது;

என்பதை அவர் மேலும் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Finance:

(a) Will he inform this House with respect to the years 2018 and 2019 -

(i) the amount of ethanol imported to Sri Lanka, in litres;

(ii) the amount of ethanol produced in Sri Lanka, in litres; and

(iii) the selling price of a litre of ethanol produced in Sri Lanka?

---

*** පුස්තකාලයේ තබා ඇත.*
*** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*** Placed in the Library.*

(b) Will he also inform this House -

(i) the amount of ethanol produced in Sri Lanka in the year 2020, in litres; and

(ii) the selling price of a litre of ethanol produced in Sri Lanka in 2020?

(c) Will he further inform this House -

(i) whether there is a difference between the prices at which a litre of ethanol produced in Sri Lanka was sold in the years 2018-2019 and in 2020; and

(ii) if so, what that difference is?

(d) If not, why?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 2018 - ලීටර් 12,920,531 (මිලියන 12.92)

2019 - ලීටර් 10,743,734 (මිලියන 10.74)

(ii) 2018 - ලීටර් 13,815,534 (මිලියන 13.81)

2019 - ලීටර් 13,013,006 (මිලියන 13.01)

(iii) ශ්‍රී ලංකාවේ ස්කාගාරවල එතනෝල් ලීටරයක් අළෙවි කරන මිල 2018 - 2019 වර්ෂවලදී සුරාබදු දෙපාර්තමේන්තුව නියම කරන ලද මිලක් අනුව සිදු නොවිය. අදාළ ස්කාගාරය තම අභිමතය පරිදි තම නිෂ්පාදනයේ මිල තීරණය කරයි. කෙසේ නමුත් සුරාබදු දෙපාර්තමේන්තුව සතු තොරතුරු අනුව සකස් කරන ලද මිල ගණන් පිළිබඳව ඇමුණුමෙහි** සඳහන් වේ.

(ආ) (i) ලීටර් 23,651,173 (මිලියන 23.65)

(ii) සුරාබදු දෙපාර්තමේන්තුව සතු තොරතුරු අනුව සකස් කරන ලද මිල ගණන් පිළිබඳව ඇමුණුමෙහි** සඳහන් වේ.

(ඇ) (i) ඔව්. 2018 - 2019 වර්ෂවල සහ 2020 වර්ෂයේ ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන එතනෝල් ලීටරයක් අළෙවි කරන ලද මිල ගණන් අතර වෙනසක් තිබේ. 2020.01.01 දින සිට එතනෝල් ආනයනය රජය විසින් තහනම් කරන ලදී. ඒ අනුව දේශීය සීනි නිෂ්පාදනයේ අතුරු ඵලයක් ලෙස ලැබෙන එතනෝල් සඳහා වැඩි මිලක් ලැබිණි.

(ii) එම වෙනස පිළිබඳව ඇමුණුමෙහි**හි දැක්වේ.

(ඈ) පැන නොනඟී.

---

*** පුස්තකාලයේ තබා ඇත.*
*** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*** Placed in the Library.*

## 2015.01.01-2020.10.01 දක්වා රජය ලබාගත් ණය සහ ආධාර: විස්තර
2015.01.01- 2020.10.01 காலப்பகுதியில் அரசாங்கம் பெற்ற கடன்கள் மற்றும் நிதியுதவிகள்: விபரம்
LOANS AND ASSISTANCE OBTAINED BY GOVERNMENT FROM 2015.01.01-2020.10.01: DETAILS

**31.ගරු බුද්ධික පතිරණ මහතා (ගරු තිස්ස අත්තනායක මහතා වෙනුවට)**
(மாண்புமிகு புத்திக பத்திரண - மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க சார்பாக)
(The Hon. Buddhika Pathirana on behalf of the Hon. Tissa Attanayake)
මුදල් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2015.01.01 දින සිට 2020.10.01 දින දක්වා ශ්‍රී ලංකා රජය විසින් විදේශ රටවල්වලින්, විදේශ නියෝජිත ආයතනවලින් හා බැංකුවලින් ලබා ගෙන ඇති ණය සහ ආධාර ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ණය සහ ආධාර ලබා ගත් අරමුණ, ව්‍යාපෘතිය, වර්ෂය, රට හා අවශ්‍යතාව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) එම ණය සහ ආධාර, ඒවා ලබා ගත් නිශ්චිත අරමුණ වෙනුවෙන් යොදවා ඇති බවට සහතික වන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒමන්ද?

நிதி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை அரசாங்கத்தினால் வெளிநாடுகள், வெளிநாட்டு முகவர் நிறுவனங்கள் மற்றும் வங்கிகளிடமிருந்து 2015.01.01ஆம் திகதி தொடக்கம் 2020.10.01ஆம் திகதி வரையிலான காலப்பகுதியில் பெற்றுக்கொள்ளப்பட்டுள்ள கடன் மற்றும் நிதியுதவி என்பவற்றின் அளவு தனத்தனியே எவ்வளவு என்பதையும்;

(ii) மேற்படி கடன் மற்றும் நிதியுதவிகள் பெற்றுக்கொள்ளப்பட்டமைக்கான நோக்கம், கருத்திட்டம், ஆண்டு, நாடு மற்றும் தேவை என்பன தனித்தனியே யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) மேற்படி கடன் மற்றும் நிதியுதவிகளானவை அவற்றைப் பெற்றுக்கொண்ட நோக்கத்திற்காகவே பயன்படுத்தப்பட்டுள்ளன என்பது தொடர்பில் உத்தரவாதம் அளிக்கின்றாரா என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Finance:

(a) Will he inform this House -

(i) separately, the amounts of loans and assistance obtained by the Sri Lankan Government from foreign countries, foreign agencies and banks from 2015.01.01 to 2020.10.01; and

[ගරු බුද්ධික පතිරණ මහතා]

(ii) separately, the objective, project, year, country and the purpose related to the aforesaid loans and assistance?

(b) Will he inform this House whether any assurance can be given to the effect that the aforesaid loans and assistance have been utilized for the specific objective for which they had been obtained?

(c) If not, why?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:**
* சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :
* Answer tabled:*

(අ) (i) 2015.01.01 දින සිට 2020.10.01 දින දක්වා ශ්‍රී ලංකා රජය විසින් විදේශ රටවලින්, විදේශ නියෝජිත ආයතනවලින් හා බැංකුවලින් ලබා ගෙන ඇති ණය ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් බිලියන 25.6ක් වන අතර, එම කාල පරිච්ඡේදයේදී ලබා ගෙන ඇති ණය සහ ප්‍රදාන ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් මිලියන 834.8කි. මෙහි සඳහන් කර ඇත්තේ රජය විසින් එක් එක් ආයතනය සමඟ ගිවිසුම්ගත වූ ණය හා ප්‍රදාන ප්‍රමාණයයි.

(ii) එම ණය සහ ආධාර ලබා ගත් අරමුණ, ව්‍යාපෘතිය, වර්ෂය, රට සහ අවශ්‍යතාව වෙන් වෙන් වශයෙන් ඇමුණුමෙහි** දක්වා ඇත.

(ආ) ඔව්. එම ණය හා ආධාර, ඒවා ලබා ගත් නිශ්චිත අරමුණ වෙනුවෙන් යොදවා ඇත.

(ඇ) පැන නොනගී.

## කඩුවෙල නගරයේ රථ වාහන තදබදය අවම කිරීම: යෝජිත වැඩ පිළිවෙළ
### கடுவலை நகரில் வாகன நெரிசலைக் குறைத்தல்: உத்தேச வேலைத்திட்டம்
### EASING OF TRAFFIC CONGESTION AT KADUWELA TOWN: PROPOSED REMEDY

300/2020

**37.ගරු බුද්ධික පතිරණ මහතා (ගරු එස්.එම්. මරික්කාර් මහතා වෙනුවට)**
(மாண்புமிகு புத்திக பத்திரண - மாண்புமிகு எஸ்.எம். மரிக்கார் சார்பாக)
(The Hon. Buddhika Pathirana on behalf of the Hon. S.M. Marikkar)
මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) කඩුවෙල නගරයේ පවතින අධික රථ වාහන තදබදය අවම කිරීම සඳහා යම්කිසි වැඩ පිළිවෙළක් රජය විසින් යෝජනා කර තිබේද;

(ii) එසේ නම්, එම වැඩ පිළිවෙළ කවරේද;

(iii) එම වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරනු ලබන දින වකවානු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

නெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கடுவலை நகரத்தில் காணப்படுகின்ற அதிக வாகன நெரிசலைக் குறைப்பதற்கென அரசாங்கத்தினால் ஏதேனும் வேலைத்திட்டம் முன்மொழியப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி வேலைத்திட்டம் யாதென்ப தையும்;

(iii) மேற்படி வேலைத்திட்டம் எப்போது நடை முறைப்படுத்தப்படும் என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Highways:

(a) Will he inform this House -

(i) whether the Government has proposed some arrangement to ease the massive traffic congestion prevailing at the Kaduwela Town;

(ii) if so, what that arrangement is; and

(iii) the date on which that arrangement would be implemented?

(b) If not, why?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:**
* சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :
* Answer tabled:*

(අ) (i) යෝජනා කර ඇත.

(ii) , (iii) කඩුවෙල නගරය පුළුල් කර සංවර්ධනය කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ සැලසුම් අංශය මඟින් ඉදිරිපත් කර ඇති සැලසුම්වලට අදාළව මිනින්දෝරු අධිකාරි (කොළඹ) මඟින් මිනුම් කටයුතු සිදු කර සකස් කරන ලද අනුරේඛ සහ ඉල්ලුම් පත්‍රය, මාර්ග සංවර්ධන අධිකාරියේ ඉඩම් අංශය වෙත ඉදිරිපත් කර ඇති අතර, එහි සිදු කළ යුතු සංශෝධන කිහිපයක් සිදු කිරීම සඳහා මිනින්දෝරු අධිකාරි (කොළඹ) වෙත නැවත ඉදිරිපත් කර ඇත.

තවද, කඩුවෙල නගරයට ආසන්නයේම පවතින කඩුවෙල අතුරුගිරිය මාර්ගය සම්බන්ධ වන වෙලේ හන්දිය ආශ්‍රිතව දැනට පවතින පටු ස්වභාවය නිසා ඇති වී තිබෙන මාර්ග තදබදයට විසඳුමක් ලෙස කඩුවෙල අතුරුගිරිය මාර්ග සංවර්ධන කටයුතුවලට සමගාමීව වෙලේ හන්දිය පුළුල්කොට සංවර්ධනය කිරීමට නියමිත නිර්ණායකයන්ට අනුකූලව සැලසුම් කර, මේ වනවිට විවිධ විදේශ ආධාර ව්‍යාපෘතිය (MFAP) මඟින් කටයුතු සිදු කරනු ලබයි.

තවද, කඩුවෙල මංසන්දිය ආශ්‍රිතව මාර්ගයේ පැවැති ගැටිති සහ කඩතොලු සහිත ස්වභාවය ඉවත් කොට පෙරමුසු අතුරා සංවර්ධනය කර ඇත. කඩුවෙල සිට හංවැල්ල දක්වා මාර්ග කොටසේ ද පවතින ගැටිති සහ කඩතොලු සහිත කොටස ඉවත් කර මීටර 10 පළලට සංවර්ධනය කිරීමට, මාර්ග කිලෝමීටර් 100,000 සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය මඟින් කොන්ත්‍රාත් පිරිනමා ඇත.

(ආ) පැන නොනගී.

---

**** පුස්තකාලයේ තබා ඇත.**
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.
** Placed in the Library.*

## මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය: විස්තර
## மத்திய அதிவேக நெடுஞ்சாலைக் கருத்திட்டம்: விபரம்
## CENTRAL EXPRESSWAY PROJECT: DETAILS

**39. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු උදයන කිරිඳිගොඩ මහතා වෙනුවට)**
(மாண்புமிகு புத்திக பத்திரண - மாண்புமிகு உதயன கிரிந்திகொட சார்பாக)
(The Hon. Buddhika Pathirana on behalf of the Hon. Udayana Kirindigoda)
මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (3):

(අ) මධ්‍යම අධිවේගී මාර්ග -

(i) ව්‍යාපෘතියේ වර්තමාන ප්‍රගතිය කවරේද;

(ii) ව්‍යාපෘතියට මේ වනවිට වැය කර ඇති මුදල කොපමණද;

(iii) ව්‍යාපෘතිය අවසන් කිරීමට වැය කළ යුතු ඉතිරි මුදල කොපමණද;

(iv) ව්‍යාපෘතිය අවසන් කිරීමට යෝජිතව තිබූ දිනය කවරේද;

(v) ව්‍යාපෘතියට අදාළව පසුගිය රජය සමයේ සිදුවූ අක්‍රමිකතා/ප්‍රමාදයන් හේතුවෙන් එය අවසන් කළ හැකි යැයි අනුමාන කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු -

(i) භාර දී ඇති සමාගම් කවරේද;

(ii) ප්‍රමාද කොට ඇති සමාගම්වලට එහි ඉදිකිරීම් කටයුතු නැවත පවරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) (i) මෙම ව්‍යාපෘතියේ මහනුවර නගරයට ආසන්න අවසන් පිවිසුම ඇති ප්‍රදේශය කවරේද;

(ii) මහනුවර සිට ගලගෙදර දක්වා වූ මාර්ගයේ පවතින දැඩි වාහන තදබදය හේතුවෙන් ඒ ඔස්සේ අධිවේගී මාර්ගයට පිවිසීමට විනාඩි 30-45 අතර කාලයක් ගත වන බැවින් මහනුවර ප්‍රදේශයේ ජනතාවට පහසුවෙන් අධිවේගී මාර්ගයට ප්‍රවිෂ්ටවීමට පිවිසුම් මාර්ග සකස් කරන්නේද;

(iii) එසේ නම්, එම අධිවේගී පිවිසුම් ඉදිකරනු ලබන ප්‍රදේශ කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) மத்திய அதிவேக நெடுஞ்சாலை -

(i) கருத்திட்டத்தின் தற்போதைய முன்னேற்றம் யாதென்பதையும்;

(ii) கருத்திட்டத்திற்கு இன்றளவில் செலவிடப் பட்டுள்ள தொகை எவ்வளவென்பதையும்;

(iii) கருத்திட்டத்தை நிறைவு செய்வதற்கு செலவிடப்பட வேண்டியுள்ள எஞ்சிய தொகை எவ்வளவென்பதையும்;

(iv) கருத்திட்டத்தை நிறைவு செய்வதற்கு உத்தேசிக்கப்பட்டிருந்த திகதி யாதென்பதையும்;

(v) கருத்திட்டத்திற்கு ஏற்புடையதாக கடந்த ஆட்சிக் காலத்தில் ஏற்பட்ட முறைகேடுகள்/ தாமதங்கள் காரணமாக அதனை நிறைவுசெய்ய முடியுமென உத்தேசிக்கப்படுகின்ற திகதி யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இக்கருத்திட்டத்தின் நிர்மாணப்பணிகள் -

(i) ஒப்படைக்கப்பட்டுள்ள கம்பனிகளின் பெயர்கள் யாவை என்பதையும்;

(ii) தாமதம் இடம்பெற்றுள்ள கம்பனிகளுக்கு அதன் நிர்மாணப் பணிகள் மீள வழங்கப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) இக்கருத்திட்டத்தின் கண்டி நகருக்கு அண்மித்த இறுதி நுழைவு காணப்படுகின்ற பிரதேசம் யாதென்பதையும்;

(ii) கண்டியிலிருந்து கலகெதர வரையான வீதியில் காணப்படுகின்ற கடுமையான வாகன நெரிசல் காரணமாக அதன் ஊடாக அதிவேக நெடுஞ்சாலைக்குள் பிரவேசிப்பதற்கு 30 - 45 நிமிடங்கள் வரை எடுப்பதால் கண்டி பிரதேச மக்களுக்கு இலகுவாக அதிவேக நெடுஞ்சாலைக்கு பிரவேசிப்பதற்கு நுழைவு வீதி அமைக்கப்படுமா என்பதையும்;

(iii) ஆமெனில், மேற்படி அதிவேக நெடுஞ்சாலை நுழைவுகள் நிர்மாணிக்கப்படும் பிரதேசங்கள் யாவை என்பதையும்;

அவர் மேலும் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Highways:

(a) Will he inform this House in relation to the Central Expressway Project -

(i) the current progress of the project;

(ii) the amount of money spent on the project by now;

(iii) the balance amount of money that should be spent in order to complete the project;

(iv) the date that had been proposed to complete the project; and

(v) the projected date by which the project could be completed owing to the malpractices/delays occurred in the time of the previous Government?

(b) Will he also inform this House -

(i) the companies to which the construction of the project had been entrusted with; and

(ii) whether the constructions will be reassigned to the companies which delayed the construction?

(c) Will he further inform this House-

(i) the area where the last highway entrance nearest to the Kandy City is situated;

[ගරු බුද්ධික පතිරණ මහතා]

(ii) whether convenient expressway entrances will be set up for the benefit of the people of Kandy, since it takes 30 to 45 minutes to enter the Expressway through the Kandy-Galagedara Road due to high traffic congestion; and

(iii) if so, the areas where aforesaid expressway entrances will be set up?

(d) If not, why ?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) අදියර I (කඩවත සිට මීරිගම) - ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇත. භෞතික ප්‍රගතිය සියයට 9කි.

අදියර II (මීරිගම සිට කුරුණෑගල) - මෙම අදියරෙහි ඉදිකිරීම් කටයුතු අවසන් අදියරෙහි පවතින අතර, මෙම වසර අවසන් වනවිට නිම කිරීමට අපේක්ෂිතය. භෞතික ප්‍රගතිය සියයට 96කි.

අදියර III (පොතුහැර සිට ගලගෙදර) - මෙම අදියරේ ඉදිකිරීම් කටයුතු මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ආරම්භ කර ඇති අතර, පළමු කිලෝමීටර් 12හි ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පවතී. ඉඩම් අත්පත් කරගැනීමේ ප්‍රගතිය සියයට 88කි.

අදියර IV (කුරුණෑගල සිට දඹුල්ල) - මෙම අදියරෙහි ඉදිකිරීම් කටයුතු සඳහා කොන්ත්‍රාත්කරු/ආයෝජකයෙකු තෝරා ගෙන ඇති අතර, ඉදිරියේදී ඉදිකිරීම් කටයුතු ප්‍රදානය කිරීමට නියමිතය. ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රගතිය සියයට 68කි.

(ii) අදියර I - රුපියල් මිලියන 48,124.73කි.

අදියර II - අය වැය ප්‍රතිපාදන - රුපියල් මිලියන 8,374.74කි. දේශීය බැංකු ණය රුපියල් මිලියන 112,974.62කි.

අදියර III - රුපියල් මිලියන 7,806.84කි. (අදියර 04හිම ශක්‍යතා අධ්‍යයන කටයුතු සඳහා වූ වියදම, මෙම අදියරෙහි ඉඩම් අත්පත් කර ගැනීම සඳහා වූ වියදම සහ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) සඳහා වූ වියදම)

අදියර IV - රුපියල් මිලියන 587.53කි. (ඉඩම් අත්පත් කර ගැනීම සඳහා වූ වියදම සහ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) සඳහා වූ වියදම)

(iii) අදියර I - රුපියල් මිලියන 128,660.27කි.

අදියර II - රුපියල් මිලියන 27,670.64කි.

අදියර III - රුපියල් මිලියන 133,195.16කි.

අදියර IV - රුපියල් මිලියන 179,243.47කි.

(iv) අදියර I - 2024.09.15 (මෙහි ණය අරමුදල් අනුමත කර නොතිබුණු බැවින් ව්‍යාපෘතිය නිම කරන දිනයක් තීරණය වී නොතිබුණි.)

අදියර II - 2020 දෙසැම්බර්

අදියර III - නිශ්චය කර නොතිබිණි.

අදියර IV - මෙතෙක් නිශ්චය කර නොමැත.

(v) අදියර I - 2024.09.15

අදියර II - 2021 නොවැම්බර්.

අදියර III - 2024 මාර්තු.

අදියර IV - නිශ්චය කර නැත.

(ආ) (i) අදියර I - Metallurgical Corporation of China Ltd.

අදියර II - Tudawe Brothers (Pvt.) Ltd., Consulting Engineers & Contractors (Pvt.) Ltd (CEC) JV, Nawaloka Construction Company, Access Engineering PLC, KDAW Construction, NEM Construction (Pvt.) Ltd., E&C Construction, CML Construction, MTD Construction, V.V. Karunaratne & Company, HOVAEL Construction (Pvt.) Ltd., Maga Engineering (Pvt.) Ltd., KD Ebert & Sons Holding (Pvt.) Ltd.

අදියර III - මෙම අදියරෙහි ඉදිකිරීම් කටයුතු මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් සිදු කරනු ලබයි.

අදියර IV - මෙම අදියරෙහි ඉදිකිරීම් කටයුතු පෞද්ගලික ආයෝජකයන් මඟින් සිදු කිරීමට අපේක්ෂිත අතර, ඉදිරියේදී ඉදිකිරීම් කටයුතු ප්‍රදානය කිරීමට නියමිතය.

(ii) නැත.

(ඇ) (i) ගලගෙදර අන්තර් හුවමාරු මධ්‍යස්ථානය.

(ii) ඔව්.

(iii) 1. කටුගස්තොට - කුරුණෑගල - පුත්තලම මාර්ගයේ කටුගස්තොට සිට ගලගෙදර දක්වා මාර්ගය මංතීරු හතරක් දක්වා පුළුල් කිරීම (කිලෝමීටර් 13)

2. A 009 හා A 010 මාර්ගවලට සම්බන්ධ වන පරිදි කටුගස්තොට නගරයේ මංතීරු හතරකින් යුත් නව අතුරු මාර්ගයක් ඉදිකිරීම (කිලෝමීටර් 0.53)

3. අලදෙනිය - ඊරියගම මාර්ගය පුළුල් කර වැඩිදියුණු කිරීම (කිලෝමීටර් 10)

4. බරිගම - හල්ඔළුව මාර්ගය පුළුල් කර වැඩිදියුණු කිරීම (කිලෝමීටර් 5.75)

5. අරඹේකඩේ - බොක්කාවල - අඹතැන්න මාර්ගයේ, අරඹේකඩේ - බොක්කාවල - පූජාපිටිය මාර්ග කොටස පුළුල් කර වැඩිදියුණු කිරීම (කිලෝමීටර් 2.5)

6. අලවතුගොඩ - පූජාපිටිය මාර්ගය පුළුල් කර වැඩිදියුණු කිරීම (කිලෝමීටර් 8.1)

(ඈ) පැන නොනඟී.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ප්‍රශ්න අංක 40 -1017/2020- (1), ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ප්‍රේමලාල් ජයසේකර මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මම සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභා ගර්භයේ නොසිටි පක්ෂ, විපක්ෂ සියලු මන්ත්‍රීවරුන්ගේ ප්‍රශ්න සියල්ල ඇසීම පිළිබඳව - එම මන්ත්‍රීවරු වෙනුවෙන් - ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමාට මා ස්තුතිවන්ත වෙනවා.

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 3.23ට 2021 ඔක්තෝබර් 05 වන අඟහරුවාදා පූ. භා. 10.00 වන තෙක් කල් ගියේ ය.***

*இதன்படி பி. ப. 3.23 மணிக்கு பாராளுமன்றம், 2021 ஒக்ரோபர் 05, செவ்வாய்க்கிழமை மு.ப. 10.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Parliament adjourned accordingly at 3.23 p.m. until 10.00 a.m. on Tuesday, 05th October, 2021.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.